ජාතිය බලගන්වමින්



වාර්ෂික වාර්තාව 2016

ලංකා බනිජ තෙල් නීතිගත
සංස්ථාව

පටුන

වාර්තාකරණය වෙත අපේ එළැඹුම 2

අපගේ ව්‍යාපාරය 4

දැක්ම, මෙහෙවර සහ අරමුණු 5

අපගේ ව්‍යාපාර මාදිලිය 6

අපගේ නායකත්ව කණ්ඩායම 7

අපගේ වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලය 7

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම 10

සභාපතිතුමාගේ සමාලෝචනය 12

අපගේ මෙහෙයුම් සන්දර්භය සහ උපාය මාර්ගය 14

අපගේ උපාය මාර්ගයන් ක්‍රියාත්මක කිරීම 19

අවදානම් කළමනාකරණ වාර්තාව 29

සංස්ථායික පාලනය 35

විගණන කමිටුවේ වාර්තාව 40

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව 42

මූල්‍ය ප්‍රකාශ 47

විස්තීර්ණ ආදායම පිළිබඳ ප්‍රකාශය 48

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය 49

මුදල් ප්‍රවාහ ප්‍රකාශය 50

ස්කන්ධ වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය 51

මූල්‍ය ප්‍රකාශවලට සටහන් 52

විගණකාධිපති වාර්තාව 83

දස වසරක සාරාංශය 126

මූල්‍ය යෙදුම්වල පදමාලාව 128

වාර්තාකරණය වෙත අපේ එළැඹුම

ජාතිය බලගන්වමින්

මෙය අපගේ දෙවන වාර්ෂික ඒකාබද්ධ වාර්තාවයි. සංස්ථාවේ ක්‍රමෝපායයන්, කාර්ය සාධනය, පාලනය සහ අගය නිර්මාණය කිරීම තුළ වඩා වැඩි පාරදෘශ්‍ය භාවයක් පවත්වාගනිමින් පසුගිය වසරේ සිට අපගේ ක්‍රියාකාරීත්වයන් වාර්තා කිරීමට ඒකාබද්ධ එළඹුමක් යොදා ගනු ලැබීය.

වාර්තාකරණ විෂය පථය සහ සීමාව

මෙම වාර්තාව ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ ව්‍යාපාර මාදිලිය, මෙහෙයුම් සන්දර්භය, ප්‍රමාණාත්මක අවදානම් සහ අවස්ථා සහ 2016 ජනවාරි 01 වනදා සිට 2016 දෙසැම්බර් 31 වනදා දක්වා පාලන සහ මෙහෙයුම් කාර්ය සාධනයට අදාළ තොරතුරු ඉදිරිපත් කරනු ලබයි. මෙම වාර්තා අපගේ උපක්‍රමික ව්‍යාපාර ඒකකයන්ගේ කාර්ය සාධනය ආවරණය කරනු ලබයි. මීට අමතරව, විගණන වාර්තා සමග වාර්ෂික මූල්‍ය ප්‍රකාශද පල කර ඇත. අපගේ සියලුම වාර්තා සඳහා වන වාර්තාකරණ ක්‍රියාවලිය පදනම්ව ඇත්තේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRS / LKAS), යහ පාලනය සඳහා වන රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ සහ 1971 අංක 28 දරන මූල්‍ය පනතයි.

ප්‍රමාණවත් බව වෙත අපේ එළැඹුම

මෙම වාර්තාව මගින්, කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දීර්ඝ කාලීනව අගයන් උත්පාදනය කිරීමේ ලා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතු හැකියාව පිළිබඳ දැනුම්වත් ඇගයීමක් කිරීමට අපේක්ෂා කරන වර්තමාන සහ අනාගත පාර්ශ්වකරුවන් වෙත ප්‍රමාණවත් පිළිබැඳියාවක් ඇතැයි අප විශ්වාස කරන තොරතුරු ඔබ වෙත සපයයි. මෙම වාර්තාව තුළ ඇති සියලු තොරතුරු ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අගය නිර්මාණයේ ලා බලපානු ලබන කරුණුවලට අදාළ වන බව තහවුරු කරගෙන ඇත. අපගේ ව්‍යාපාර ය අවබෝධ කරගැනීම (පිටුව 4 සිට 5), අපගේ ව්‍යාපාර මාදිලිය (පිටුව 6) සහ අපගේ අගය දාමය පුරා අපගේ ක්‍රියාකාරකම් සහ බලපෑම් (පිටුව 14 සිට 18) යනාදිය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව අගයන් නිර්මාණය කරන ආකාරය ඇගයීමට සහ අගයට බලපෑම් කරන ගැටළු හඳුනාගැනීමට පදනම සපයයි. අගයන් නිර්මාණය කිරීමේ ලා අපගේ හැකියාව තීරණය කරනු ලබන්නේ අපගේ මෙහෙයුම් සන්දර්භය (පිටුව 14 සිට 18) සහ ප්‍රතිඵල ලෙස ඇතිවෙන අවදානම් සහ අවස්ථාවන් වලට අපගේ ප්‍රතිචාර (පිටුව 29 සිට 34) මගිනි. අපගේ කාර්ය සාධනය (පිටුව 19 සිට 28), අපගේ නායකත්ව කණ්ඩායම (පිටුව 07 සිට 11) සහ අපගේ යහ පාලන පරිවයන් (පිටුව 35 සිට 39) ද මෙම වාර්තාව තුළින් ඉදිරිපත් කර ඇත. පාර්ශ්වකරුවන් හට දැනගැනීමට අවශ්‍ය වෙනත් කරුණු, අපගේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල සපයා ඇත.

ආරක්ෂණය

කළමනාකාරීත්වයෙන් සහ අභ්‍යන්තර සහ බාහිර ආරක්ෂණය සපයන්නන්ගෙන් ලබාගත් සහතිකය සපයා ගැනීමට අපි ඒකාබද්ධ ආරක්ෂණ මාදිලියක් භාවිතා කරන්නෙමු. අපගේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා විසින් සහතික කර ඇත (පිටුව 83 සිට 125 දක්වා බලන්න). මෙම ක්‍රියාවලීන් ද්විත්වයම, මූල්‍ය සහ මූල්‍ය නොවන දර්ශකයන් සහිත අපගේ ඒකාබද්ධ වාර්තාව දැනුම්දෙනු ලබයි. අපගේ විගණන කමිටුව, වාර්ෂිකව ඒකාබද්ධ ආරක්ෂණ සැලසුම ක්‍රියාත්මක කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අභ්‍යන්තර ආරක්ෂණයක් සපයනු ලබයි. විගණන කමිටු වාර්තාව පිටු අංක 40 සිට 41 දක්වා ඇතුළත් කර ඇත.

අපගේ වාර්ෂික වාර්තාව 2016 තුළ සැරිසැරීම

ඒකාබද්ධ වාර්තාව (IR)

අපගේ ක්‍රමෝපාය සහ ව්‍යාපාර මාදිලිය, මෙහෙයුම් සන්දර්භය, පාලනය සහ මෙහෙයුම් කාර්ය සාධනය පිළිබඳ කෙටි සමාලෝචනයකි.

වාර්ෂික මූල්‍ය ප්‍රකාශ

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්/ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRSs / LKAS) අනුව සකස් කළ අපගේ මූල්‍ය ප්‍රතිඵල, විගණනය කළ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විස්තරාත්මක විශ්ලේෂණය.

ප්‍රධාන කරුණු

වැඩ ආශ්‍රිත අනතුරුකිසිවක් සිදුවී නොමැත

දශකයක් තුළ ඉපයූ ඉහළම ලාභය

ඉපයූ ලාභය රු. බිලියන 53

සේවකයින් 308 දෙනෙකු පුහුණු කෙරිණි

දේශීයව මෙටෝ 1,639,047 නිෂ්පාදනයක් පිරිපහදු කෙරිණි

12% දක්වා වර්ධනයක්

ශුද්ධ ආදායම රු. බිලියන 423

රජය වෙත දායකත්වය

රු. බිලියන 146

අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

මෙම වාර්තාව සම්බන්ධ සම්පූර්ණ වගවීම සහ වගවීම, විගණන කමිටුවේ සහාය ඇතිව ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබේ. මෙම වාර්තාව සැකසීම සහ ඒකාබද්ධ කිරීම සඳහා කණ්ඩායම් සාමාජිකත්වය ඇතුළුව ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය වග කියනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය සාමූහික ලෙස මෙම වාර්තාව සමාලෝචනය කර එහි අන්තර්ගතයෙහි සම්පූර්ණත්වය සහ අවංක බව තහවුරු කර සිටී. මෙම වාර්තාව ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ පැතිකඩ සහ කාර්ය සාධනයෙහි තුලිත සහ මනා පිළිබිඹුවක් බව අධ්‍යක්ෂ මණ්ඩලය විශ්වාස කරයි. විගණන කමිටුවේ නිර්දේශ මත, අධ්‍යක්ෂ මණ්ඩලය 2018.05.11 දින මෙම වාර්තාව අනුමත කරන ලදී.

ඉදිරි දැක්මක් සහිත ප්‍රකාශ

මෙම වාර්තාව ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය තත්ත්වය, ප්‍රතිඵල, මෙහෙයුම් සහ ව්‍යාපාරයන් සම්බන්ධව නිශ්චිත ඉදිරි දැක්මක් සහිත ප්‍රකාශයන්ගෙන් සමන්විත වෙයි. මෙම ප්‍රකාශ සහ පුරෝකථන, සිද්ධිවලට අදාළ වන බැවින් සහ අනාගතයේදී ඇතිවෙන තත්ත්වයන් මත රඳා පවතින බැවින් අවදානම් සහ අවිනිශ්චිතතාවන් සහිත වෙයි. මෙම ඉදිරි දැක්මක් සහිත ප්‍රකාශ මගින් ගම්‍ය වෙන හෝ ප්‍රකාශ වෙන ප්‍රතිඵලයන්ට වඩා සත්‍ය ප්‍රතිඵල සහ සංවර්ධනයන් වෙනස් වීමට සාධක ගණනාවක් බලපෑ හැකිය.

ආයතනයේ නම:
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

නෛතික රාමුව:
1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත යටතේ ව්‍යවස්ථාපිත රාජ්‍ය සංස්ථාවකි

ලියාපදිංචි කාර්යාලය:
609, දොස්තර ඩැනිස්ටර් ඩි සිල්වා මාවත, කොළඹ 09

දුරකථනය: +94 11 5455455

ටෙලිග්‍රෑම්: "LANKA OIL"

කේබල්: CEYPETCO

ටෙලෙක්ස්: 21235 CEPETCO CE

ෆැක්ස් : +94 11 5455400

විද්‍යුත් තැපෑල: cpcsec@ceypetco.gov.lk

වෙබ් අඩවිය: www.ceypetco.gov.lk

බදු ගෙවුම් හඳුනාගැනීමේ අංකය: 409000053

VAT ලියාපදිංචි අංකය: 409000053 - 7000

මූල්‍ය වර්ෂය: ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා

2016 දෙසැම්බර් 31 වන විට අධ්‍යක්ෂ මණ්ඩලය:
ටී.ජී ජයසිංහ මහතා (සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ)
ඩී.සී.එස්. සෙනෙවිරත්න මහතා
පී. ගල්හේන මහතා
එම්.ජී. ජයසේන මහතා
ආර්. හරිස්චන්ද්‍ර මහතා
කේ.ඒ. විමලේන්තිරරාජා මහතා
එස්. ප්‍රනාන්දු මහතා

අනුබද්ධිත සමාගම:
සීමාසහිත ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම,
තෙල් ස්ථාපන, කොලොන්නාව

විගණකවරු:
විගණකාධිපති

බැංකුකරුවන්:
මහජන බැංකුව, කොමර්ෂල් බැංකුව,
ලංකා බැංකුව, හැටන් නැෂනල් බැංකුව

අපගේ ව්‍යාපාරය

රාජ්‍ය ව්‍යාපාරයකි

2016 වසරේදී සේවක සංඛ්‍යාව 2,562 (2015: 2,579)

දේශීය අලෙවිය
රු. බිලියන 440
2015: රු. බිලියන 369

සැකසූ බොර තෙල්
මෙ.ටො.1,746,180
2015: මෙ.ටො.1,692,074

අපි කවුරුද?

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව යනු ජාතියට ඛනිජ තෙල් නිෂ්පාදන සපයන ප්‍රධාන සැපයුම්කරුවා වෙයි. සියලු දෙනාටම වැඩි දුරක් ධාවනය කිරීමට හැකි වෙන අයුරින් අපගේ බෙදාහැරීම් නාලිකා රට පුරාම පැතිර පවතී. අපගේ පිරිපහදු මෙහෙයුම් කටයුතු සපුගස්කන්දේ සිදු කෙරෙන අතර ප්‍රධාන කාර්යාලය කොළඹ 9 පිහිටා ඇත. ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම තුළ 2/3 ක කොටසක් ඇත. ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම ඛනිජ තෙල් ගබඩා කිරීම සහ බෙදා හැරීම සිදු කරනු ලබයි.

අප කරනුයේ කුමක්ද

ජාතියට ප්‍රධාන වශයෙන් ඛනිජ තෙල් නිෂ්පාදන සපයන්නා වශයෙන් රටේ බලශක්ති අවශ්‍යතාවය නිසියාකාරව සැපයීමට අපි වග බලා ගන්නෙමු. අප විසින් බොර තෙල් පිරිපහදුව සිදු කෙරෙන අතර හිඟය සඳහා ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කරනු ලැබේ. අපගේ ප්‍රධාන නිෂ්පාදනයන් වන්නේ පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල්, නැප්තා, ගුවන් යානා තෙල්, දැව් තෙල්, එල්පීජී, එස්බීපී සහ ලිහිසි තෙල් ය. රජයට හිමි ව්‍යාපාරයක් ලෙස ලාභය ඉපයීමේ අරමුණට වඩා සමාජ සහ ආර්ථික තත්ත්වයන් හැසිරවීම මූලික කරගන්නා බැවින් අපගේ නිෂ්පාදනවලින් බොහොමයක් අලෙවි කරනු ලබන්නේ සහන මිල ගණන් යටතේය.

වැඩි දෙනාගේ කැමැත්ත දිනාගත් සේවායෙකු වීම

අප සිදු කරන කාර්යයන් තුළ දීර්ඝ කාලීන සම්බන්ධතාවක් ගොඩනගා ගැනීම ප්‍රධාන වෙයි. අපි රාජ්‍ය අංශය තුළ වැඩි දෙනාගේ කැමැත්ත දිනාගත් සේවායෙකු වන්නෙමු. 2016 වසර අගදී අප පුද්ගලයන් 2,831 ක් සේවයේ යෙදවූ අතර ඉන් 2,562 ක් ස්ථිර සේවකයන්ද, 1 ක් කොන්ත්‍රාත් මතද 268 ක් පුහුණුවන්නන්ද විය.

දැක්ම, මෙහෙවර සහ අරමුණු

දැක්ම

පාරිභෝගිකයාට මුල්තැන ලැබෙන්නාවූද, පරිසර හිතකාමී වූද, කලාපයේ බනිජ තෙල් හා ආශ්‍රිත කර්මාන්ත ක්ෂේත්‍රයෙහි ප්‍රමුඛ ව්‍යාපාරය බවට පත්වීම හා ඒ අතරම අපගේ ජාතියේ සෞභාග්‍යය උදෙසා දායකත්වය සැපයීම.

මෙහෙවර

බනිජ තෙල් පිරිපහදු කිරීම හා උසස්ම තත්වයේ නිෂ්පාදන අලෙවි කිරීම පිළිබඳ විශිෂ්ටත්වය කරා ළඟාවීමේ අභිලාෂය මුදුන්පත්කරගැනීම සඳහා කැපවුණු, එම ක්ෂේත්‍රයේ නිපුණතා ඇති වෘත්තිකයින් කණ්ඩායමක් හා පක්ෂපාති, කාර්යක්ෂම බෙදාහරින්නන් ජාලයක මාර්ගයෙන් පාරිභෝගික අවශ්‍යතාවයන් ඉහළින්ම ඉටු කෙරෙන පූර්ණ විසඳුම් හා සේවාවන් සැලසීම සම්බන්ධයෙන් විශිෂ්ටත්වය සාක්ෂාත් කර ගැනීම මෙන්ම සේවක සහභාගීත්වය හා උසස් තාක්ෂණය උපයෝගී කරගනිමින් ව්‍යාපාර යේ සංවර්ධනය උදෙසා උසස්ම ආචාරධර්මවලට අනුකූලව සෞඛ්‍යය, ආරක්ෂාව හා පාරිසරික යන අංශ කෙරෙහි ඉහළින්ම සැලකිලිමත් වෙමින් ව්‍යාපාරික හවුල්කරුවන්ගේ අභිමතාර්ථයන් මුදුන් පත් කිරීම.

අරමුණු

- ඉහළම මට්ටමේ වෙළෙඳපොළ කොටසක් පවත්වාගැනීම
- තරගකාරී වෙළෙඳපොළ තුළ අලෙවිය, අලෙවිකරණය සහ මෙහෙයුම් විශිෂ්ට අයුරින් පවත්වාගැනීම
- කලාපයේ බලශක්ති මධ්‍යස්ථානය වීමට ශ්‍රී ලංකාව සඳහා ඉහළම දායකත්වය සැපයීම
- සියලුම සේවක මට්ටම්වල ඉහළ මට්ටමේ වෘත්තිකභාවයක් ඇති කිරීම සහ පවත්වාගැනීම
- ඵලදායීතාව සහ කළමනාකාරීත්වය වැඩි දියුණු කිරීමට ව්‍යුහාත්මක වෙනස්කම් සිදු කිරීම
- දක්වා ඇති ප්‍රමිතීන් ඉක්මවා යාම සඳහා ශක්තිමත්, ආරක්ෂාකාරී සහ පරිසර හිතකාමී ක්‍රියාමාර්ග ගැනීම
- ප්‍රජාවේ යහපැවැත්ම සඳහා ජාතික සහ සමාජ බැඳීම් පවත්වාගැනීම
- ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයේ ප්‍රධාන දායකයා බවට පත්වීම
- බනිජ තෙල් අංශය තුළ ශ්‍රී ලංකාවේ පාලනය පවත්වාගැනීම.

අපගේ ව්‍යාපාර මාදිලිය

අපගේ ආදායම

- අලෙවි මිල (රජය මගින් තීරණය කරන ඉහළ සහනදායී මිල)
- අලෙවි ප්‍රමාණය

අපගේ පිරිවැය

- ගෝලීය තෙල් මිල
- විනිමය අනුපාතය
- ශ්‍රමය
- බෙදාහැරීම
- බලශක්තිය
- ප්‍රාග්ධන වියදම
- නඩත්තුව
- බදු
- මූල්‍ය පිරිවැය

පාරිභෝගික අගය ප්‍රස්තුතය

සේවක අගය ප්‍රස්තුතය

කොටස් හිමි අගය ප්‍රස්තුතය

සමාජමය අගය ප්‍රස්තුතය

අපගේ ක්‍රියාකාරකම්

මූලික ක්‍රියාකාරකම්

ආනයන කිරීම - ප්‍රාථමික බොර තෙල්
පිරිපහදු කිරීම - බොර තෙල් පිරිපහදු කළ නිෂ්පාදන බවට
ගබඩා කිරීම - බොර තෙල් සහ පිරිපහදු කළ නිෂ්පාදන
බෙදාහැරීම - දිවයින පුරා පාරිභෝගිකයින්ට

සහය ක්‍රියාකාරීත්වයන්

ව්‍යාපාර උපක්‍රමය
තාක්ෂණික සේවා
පුද්ගල කළමනාකරණය
තොරතුරු තාක්ෂණ සහය
සංස්ථානික සමාජ ආයෝජනය

අපගේ දශ විධ අවදානම්

1. ආර්ථික අවදානම
2. භාණ්ඩ මිල අවදානම
3. ආරක්ෂණ අවදානම
4. වෙළෙඳපොල අවදානම
5. විනිමය අනුපාත අවදානම
6. පොළී අනුපාත අවදානම
7. ද්‍රවශීලතා අවදානම
8. ණය අවදානම
9. සැපයුම්කරුවන් සම්බන්ධ අවදානම

අගය නිර්මාණය කිරීමේ ලා බලපාන අපගේ මෙහෙයුම් සන්දර්භයේ ගැටළු

- සහන මිලට මිල කිරීම
- ඛනිජ තෙල් මිල ගෝලීය වශයෙන් ඉහළ යාම
- විනිමය අනුපාතයන්ගේ වලනය
- තෙල් පිරිපහදු සහ ගබඩා ධාරිතාවෙහි මඳකම
- ලබාගත් ඇඩො ණය පියවීමේ අසීරුතා
- නල මාර්ගය ගරා වැටී තිබීම

අපගේ නායකත්ව කණ්ඩායම

සංස්ථාවක සංස්කෘතිය සහ එහි උපක්‍රමික ඉලක්කයන් ළඟා කර ගැනීමේ හැකියාව රඳා පවතින්නේ නායකත්වයේ ගුණාත්මක බව මතයි. අපගේ අධ්‍යක්ෂ මණ්ඩලය මනා සංස්ථානීය පරිසරයක් ප්‍රවර්ධනය කරන අතර එය සාර්ථක කරගැනීමේ ලා නායකත්වය සපයයි. සෑම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකුම පත්කරනු ලබන්නේ ඔවුන්ගේ නිශ්චිත හැකියාව, සේවා ඉතිහාසය මත පදනම්ව වන අතර එමගින් සමස්තයක් ලෙස අපගේ කාර්ය සාධනයට දායකත්වය දක්වන අතර සංස්ථාවේ මෙහෙයුම්, සමාජ සහ පාරිසරික අරමුණු යථාර්ථයක් කිරීමේ ලා සහය දක්වයි

අපගේ වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලය

දම්මික රණතුංග මහතා (සභාපති)
(2017.05.25 දින සිට)

කේ.ඒ. විමලේන්තිරරාජා මහතා
(2015.11.19 දින සිට)
MBA (ව්‍යාපෘ.කළ), MPhil (රාජ්‍ය ආර්ථිකය), සංවර්ධන අධ්‍යයන සහ රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, ජාත්‍යන්තර කටයුතු පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, LLB – OUSL, BA (ආර්ථික විද්‍යාව) (ගෞරව)- යාපනය, නීතිඥ, ඔස්ට්‍රේලියානු පරිගණක සමාජ සහතිකය
ශ්‍රී ලංකා පරිපාලන සේවා නිලධාරී
ලංකා බැංකුවේ විකල්ප අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ අධ්‍යක්ෂ
මුදල් අමාත්‍යාංශයේ වෙළෙඳ සහ ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්
හිටපු අමාත්‍ය උපදේශක/ අධ්‍යක්ෂ, චීනයේ බීජිං හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය/ විදේශ කටයුතු අමාත්‍යාංශය
සාක් සංවර්ධන අරමුදලේ දේශීය අධ්‍යක්ෂ
කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ අධ්‍යයන පාලක මණ්ඩලයේ සාමාජික
රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් සංගමයේ හිටපු භාණ්ඩාගාර නියෝජිත
හිටපු ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (IT & AR) / CIO රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය, හිටපු සහකාර වැඩසටහන් කළමනාකරු, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ ප්‍රතිසාධන වැඩසටහන්වල ධාරිතා සංවර්ධනය
හිටපු සහකාර ලේකම්, විදේශ ප්‍රදායක ව්‍යාපෘති, නැගෙනහිර සංවර්ධන අමාත්‍යාංශය,
හිටපු සහකාර ලේකම්, සැලසුම් සහ නැවත ගොඩනැංවීම්, වරාය, පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
හිටපු ආධුනික පරිපාලන සේවා නිලධාරී, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
හිටපු සමෘද්ධි කළමනාකරු, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය- වවුනියාව
හිටපු සංවර්ධන වැඩසටහන් සහකාර, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය- වවුනියාව

ඒ.ටී. බණ්ඩාර හේරත් මහතා
(2017.05.29 දින සිට මේ දක්වා)
ජ්‍යෙෂ්ඨ නීතිඥ LLB (ලංකා), ලක්නව් හි භාත්ඛණ්ඩ විශාරද ඩිප්ලෝමාව
ඉඩම් අත්පත්කරගැනීමේ මණ්ඩලයේ හිටපු සාමාජික
කොළඹ කුලී මණ්ඩලයේ හිටපු සභාපති
ශ්‍රී ලංකා වරාය අධිකාරියේ හිටපු අධ්‍යක්ෂ සහ විගණන කමිටු සාමාජික

ආර්.ඒ.න්. ජයසුන්දර මහතා
(2017.05.29 දින සිට මේ දක්වා)
CASL-ආවසරික, HNDA, M AAT, මූල්‍ය , විගණන සහ සංවර්ධන ගිණුම්කරණ ආශ්‍රිත සාමාජික
අධ්‍යක්ෂ, ලංකා ඛනිජ තෙල් තොග පර්යන්ත සමාගම
අධ්‍යක්ෂ, ජාතික ඉතිරිකිරීමේ බැංකුව (FMC)
භාණ්ඩාගාරික, ශ්‍රී ලංකා- චීන සංගමය
භාණ්ඩාගාරික, අන්ධ පුද්ගලයින් සඳහා වන ශ්‍රී ලංකා කවුන්සිලය
භාණ්ඩාගාරික, ශ්‍රී ලංකා- බෙල්ජියම් සංගමය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ හිටපු නියෝජ්‍ය මූල්‍ය කළමනාකරු

එස්. ධනතුංග මහතා

(2017.05.29 දින සිට මේ දක්වා)

ලියාපදිංචි කළමනාකරුවන්ගේ කළමනාකරණය පිළිබඳ ප්‍රදාන උපාධිය, – City & Guild (එජ), ප්‍රජා රැකවරණය පිළිබඳ NVQ 4 මට්ටම, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව - ලන්ඩන් විද්‍යාලය (UK), වෘත්තිය ඇසුරුම්කරණය සහ වරලත්කරණය-Packaging Store Inc. (ඇඑජ), කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව - ශ්‍රීලවිවි, පරිගණක වැඩසටහන්කරණය සහ පද්ධති සැලසුම පිළිබඳ ඩිප්ලෝමාව

හිටපු සභාපති, ලංකා නැව් සංස්ථා සමාගම

හිටපු අධ්‍යක්ෂ ලංකා නැව් නියෝජිතායතන පුද්ගලික සමාගම

සාමාජික, ඛනිජ තෙල් සම්පත් සංවර්ධන කමිටුව (PRDC)

හිටපු අධ්‍යක්ෂ, ලංකා ගල් අඟුරු සමාගම

හිටපු අධ්‍යක්ෂ, මාගම්පුර වරාය කළමනාකරණ සමාගම

ප්‍රවර්ධක/කොටස් හිමි, විවන්ටා ඇසෝසියේටිස් පුද්ගලික සමාගම

අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී- මවුන්ටන් හෝක් පැකේජින්ග් පුද්ගලික සමාගම

හිටපු කළමනාකාර අධ්‍යක්ෂ - ඇඩ්මයර් ටුවර්ස් ඇන්ඩ් ඉවෙන්ට්ස් (එරා), මිඩ්ල්සෙක්ස්

හිටපු ලියාපදිංචි කළමනාකරු -වයිට්වෙදර් කෙයාර් ලිමිටඩ්, වීලි, එසෙක්ස්

ජාත්‍යන්තර ක්‍රිකට් සභාවේ ප්‍රධාන විධායක නිලධාරීගේ හිටපු විධායක සහයක (ICC)-ලන්ඩන්

හිටපු පරිපාලන අධ්‍යක්ෂ සහ සංචාරක සංවිධාන ප්‍රධානි - ශ්‍රී ලංකා ක්‍රිකට්

හිටපු සාමාන්‍යාධිකාරී, MTL/මවුන්ටන් හෝක් පුද්ගලික සමාගම

හිටපු අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී- මවුන්ටන් හෝක් පැකේජින්ග් පුද්ගලික සමාගම

හිටපු ව්‍යාපාර සංවර්ධන කළමනාකරු, මවුන්ටන් හෝක් එක්ස්ප්‍රස් පුද්ගලික සමාගම FedEx Inc. USA හි වරලත් ආයතනය

මර්කන්ටයිල් ක්‍රෙඩිට් සමාගමේ හිටපු වෙළෙඳ පොළ විශ්ලේෂක

ඩබ්.එස්. පෙරේරා මහතා

(2017.05.29 දින සිට මේ දක්වා)

භූ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය - පේරාදෙණිය විශ්ව විද්‍යාලය

ඛනිජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගේ සම්බන්ධීකරණ ලේකම්, වැඩ බලන කළමනාකාර අධ්‍යක්ෂ JCT තෙල් බැංකුව

වරාය හා නාවික අමාත්‍යවරයාගේ හිටපු සම්බන්ධීකරණ ලේකම්

හිටපු පර්යේෂණ සහකාර, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

හිටපු විද්‍යා හා තාක්ෂණ නිලධාරී, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය

2016 අධ්‍යක්ෂ මණ්ඩලය

ටී.ජී ජයසිංහ මහතා (සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ)

(2015.10.12 සිට 2017.01.27 දක්වා)

ප්‍රාදේශීය සංවර්ධන සැලසුම් පිළිබඳ විද්‍යාපති උපාධිය - AIT -තායිලන්තය, සංවර්ධන ප්‍රතිපත්ති සහ සැලසුම්කරණය පිළිබඳ ඩිප්ලෝමාව– UOW – එරා, ප්‍රාදේශීය සංවර්ධන සැලසුම් පිළිබඳ ඩිප්ලෝමාව- UNCRD – නගෝයා, ශාස්ත්‍රවේදී (ලංකා), ශ්‍රී ලංකා සැලසුම් සේවය - i පංතිය

අධ්‍යක්ෂ, ලංකා ඛනිජ තෙල් තොග පර්යන්ත සමාගම

හිටපු ලේකම්, මූල්‍ය කොමිෂන් සභාව

හිටපු සභාපති, තෘතීය සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

හිටපු උප සභාපති, ශ්‍රී ලංකා ජාතික තාක්ෂණික අධ්‍යාපන ආයතනය

හිටපු සාමාජික, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

හිටපු ව්‍යාපෘති අධ්‍යක්ෂ, දකුණු පළාත් සංවර්ධන ව්‍යාපෘතිය

හිටපු නියෝජ්‍ය ප්‍රධාන ලේකම්, සැලසුම් සහ අධීක්ෂණ

ඩී.සී.එස්. සෙනෙවිරත්න මහතා

(2015.10.12 සිට 2017.05.23 දක්වා)

නිෂ්පාදන ඩිප්ලෝමාව, ව්‍යාපාර කළමනාකරණය ඩිප්ලෝමාව

සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ, ලංකා ඛනිජ තෙල් තොග පර්යන්ත සමාගම

සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ, SMS හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම

සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ, ශ්‍රීනරි කම්පනි පුද්ගලික සමාගම

සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ, බ්ලැක් ඩයමන්ඩ් සිකියුරිටි පුද්ගලික සමාගම

සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ, SMS ප්ලාන්ටේෂන්ස් පුද්ගලික සමාගම

සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ, SMS රියැල්ටීස් පුද්ගලික සමාගම

පී. ගල්හේන මහතා
(2015.10.12 සිට 2017.05.22 දක්වා)
ආචාර්ය උපාධිය (හදාරමින්)- කොළඹ, FCMA (UK), CIM සමත්, ව්‍යාපාර කළමනාකරණවේදී (ගෞරව) (2 වන පංතිය) - කොළඹ, ව්‍යාපාර කළමනාකරණපති (කුසලතා)- කොළඹ, ICASL අවසන් අදියර
සභාපති, AAICO දේපළ සංවර්ධන සමාගම
සාමාජික, මහජන උපයෝගිතා කොමිෂන් සභාව
මණ්ඩල අධ්‍යක්ෂ, නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව
අධ්‍යක්ෂ, ටයිටන් පැකේජින්ග් පුද්ගලික සමාගම
හිටපු සභාපති, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය
හිටපු සභාපති,ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
හිටපු සභාපති, ලංකා නැව් සංස්ථා සමාගම
හිටපු සභාපති, ශ්‍රී ලංකා අත්කම් අධ්‍යක්ෂ මණ්ඩලය - ලක්සල
හිටපු අධ්‍යක්ෂ, ලංකා ගල් අඟුරු සමාගම
හිටපු අධ්‍යක්ෂ, GSMB ටෙක්නිකල් සර්විසස් පුද්ගලික සමාගම

එම්.ජී. ජයසේන මහතා
(2015.10.12 සිට 2017.03.02 දක්වා)

ආර්. හරිස්චන්ද්‍ර මහතා
(2015.10.12 සිට 2017.05.28 දක්වා)

ජේ. ඩයස් මහතා
(2016.01.21 සිට 2016.03.03 දක්වා)

එස්. ප්‍රනාන්දු මහතා
(2016.03.17 සිට 2017.05.23 දක්වා)

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම

කළමනාකාර අධ්‍යක්ෂ (වැඩ බලන)
එන්.ආර්.ආර්. ජයසේකර මහතා
BSc Eng. (යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව), MBA, C.Eng., MIE(SL)

තෙල් පිරිපහදුව
පිරිපහදු කළමනාකරු (වැඩ බලන)
ඊ.ඒ.එස්. එදිරිසිංහ මහතා
BSc Eng. (රසායන ඉංජිනේරු විද්‍යාව), C.Eng. (රසායන), MIE(SL), MSLEMA

නියෝජ්‍ය පිරිපහදු කළමනාකරු (නඩත්තු සහ ව්‍යාපෘති) (වැඩ බලන)
ඩී.එම්.පී. දිසානායක මහතා
BSc Eng. (රසායන ඉංජිනේරු), ගෞරව, LLB ගෞරව ., MIE(SL), නීතිඥ

නියෝජ්‍ය පිරිපහදු කළමනාකරු (විද්‍යුත් සහ උපකරණ)
එල්.ජී.එම්.ආර්.පෙරේරා මහතා
BSc Eng. (විද්‍යුත් සහ විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යාව) ගෞරව.

නියෝජ්‍ය පිරිපහදු කළමනාකරු (තාක්ෂණික සේවා)
සී.විරසේකර මහතා
BSc (Eng.), C.Eng., MIE (SL)

කළමනාකරු (මෙහෙයුම් - තොග සහ පර්යන්ත මෙහෙයුම්) (වැඩ බලන)
එන්.බී.එම්.පී. ජීවසිරි මහතා

ලේකම්
සහකාර කළමනාකරු (ලේකම් කාර්යාල) (වැඩ බලන)
ඒ.බී. කෝරළගෙදර මහතා
මානව සම්පත්
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සහ පාලන)
එස්.ඩබ්. ගමගේ මහතා
MBA - PIM-USJP, MSc - WAU-ඕලන්දය, BSc - රුහුණ, PG Dip B&FA - CASL, Assoc. M (CIPD-UK), FCPM

කළමනාකරු (මානව සම්පත්)
කේ.ඩබ්.එස්. පුෂ්පලාල් මහතා
BA (දේශපාලන විද්‍යාව) විශේෂ. ගෞරව- කොළඹ, සහතික ලත් වෘත්තීය සාමාජික, AHRI – ඔස්ට්‍රේලියාව, ACPM

අලෙවිකරණය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවිකරණ)
ඩබ්.එම්.කේ.ආර්.බී. වික්‍රමසිංහ මහතා
MBA - කොළඹ, BSc (රසායන විද්‍යාව) - UOP, M.I.Chem.C, CMSLIM

කළමනාකරු (අලෙවිකරණ)
ඩබ්.ඩී.එල්.සී. අබේගුණවර්ධන මහතා
BSc (ව්‍යා.පරි) – USJP, PGDM (Mgt) - වයඹ

කළමනාකරු (අලෙවිකරණ- ලිහිසි තෙල් සහ විශේෂ නිෂ්පාදන) වැඩ බලන
එම්.එම්. තිලකරත්න මහතා

මූල්‍ය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය)
වී.එන් වීරසූරිය මහතා
B.Sc. (USJP), MBA (PIM), ACA, FCMA, ASA (Aus)

ජ්‍යෙෂ්ඨ මූල්‍ය කළමනාකරු
එම්.සී.ඩී පෙරේරා මෙනවිය
ACA, BCom (Sp) Hons

තොරතුරු තාක්ෂණ කටයුතු
කළමනාකරු (තොරතුරු තාක්ෂණය)
එම්. එස්. ආර්. ප්‍රනාන්දු මහත්මිය
BSc (පරිගණක විද්‍යාව) ගෞරව. – කොළඹ, MIT (IT කළමනාකරණ)– කොළඹ, EMBA - කොළඹ

නීති
ප්‍රධාන නීති නිලධාරි
ආර්.ඒ.කේ.සී ආරියරත්න මහත්මිය
නීතිඥ, ජාත්‍යන්තර නීතිය පිළිබඳ පශ්චාත් නීති ඩිප්ලෝමාව

ආරක්ෂක සහ විමර්ශන
කළමනාකරු (ආරක්ෂක සහ විමර්ශන)
මේජර්. එම්. අර්.එස්.පී. සමරසිංහ මහතා RWP RSP
ගැටුම් නිරාකරණය සහ සාම සූදානම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමාව

තාක්ෂණික සේවා සහ සංස්ථායික කටයුතු
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (තාක්ෂණික සේවා සහ සංස්ථායික කටයුතු) (වැඩ බලන)
එම්.ඒ.ඩී.මල්ලිකාරච්චි මහතා
BSc Eng. (නිෂ්පාදන), MPMI, MIE(SL)

ප්‍රසම්පාදන සහ ගබඩා
කළමනාකරු (ප්‍රසම්පාදන සහ ගබඩා)
එස්.ඩී.එස්. රාජපක්ෂ මහතා
BSc Eng. (යාන්ත්‍රික), C.Eng., කාර්මික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, සැපයුම් සහ ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව

ගුවන් මෙහෙයුම්
කළමනාකරු (ගුවන් - මෙහෙයුම්) (වැඩ බලන)
ආර්. විජයකුමාර් මහතා
EDBA - කොළඹ

ඉංජිනේරු වැඩ සහ පරිශ්‍ර
කළමනාකරු (ඉංජිනේරු වැඩ සහ පරිශ්‍ර)
ජී.පී.කේ. විජේකෝන් මහතා
BSc Eng. (සිවිල් ඉංජිනේරු), AMIE (SL), ව්‍යුහ ඉංජිනේරු සැලසුම් පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව

වාණිජ සහ සැපයුම් දාමය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ සහ සැපයුම් දාමය)
එම්.කේ. ගරුසිංහ මහතා
BSc - කොළඹ, MSc (සමුද්‍ර කටයුතු) - WMU – ස්වීඩනය, MBA - PIM-USJP, MICS (එරා), MISMM, EDBA - කොළඹ, වෘත්තීය නැව් කටයුතු පිළිබඳ ඩිප්ලෝමාව- නෝර්වේ

වාණිජ කළමනාකරු
ඩබ්.කේ.එස්. ගුණවර්ධන මහතා
MSc (සමුද්‍ර කටයුතු) - WMU – ස්වීඩනය, MSc (Mgt & IT) - කැලණිය, BSc. (ගණිතය) විශේෂ. (2 වන පංතියේ ඉහළ) - කැලණිය, MSLIM

කෘෂි රසායන
කළමනාකරු (කෘෂි රසායන)
බී.එස්.එස්. පෙරේරා මහතා
MSc (බෝග විද්‍යාව) - පේරාදෙණිය විශ්ව විද්‍යාලය, BSc (කෘෂිකර්මය) - පේරාදෙණිය විශ්ව විද්‍යාලය

නැව් කටයුතු
කළමනාකරු (නැව් කටයුතු)
පී.ඒ.යූ.ආර්. කරුණාරත්න මහතා
BSc (භෞතික විද්‍යාව)- කොළඹ, කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව– NIBM, කළමනාකරණ පුහුණුව පිළිබඳ පශ්චාත් උපාධි සහතික පත්‍රය

අභ්‍යන්තර විගණනය
කළමනාකරු (විගණන)
ආර්.ඒ.ටී.අයි. රණසිංහ මහතා
ACA, CGMA, ACMA (UK), BSc (ව්‍යාපාර කළම.) – Sp - USJP

සභාපතිතුමාගේ සමාලෝචනය

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඒකාබද්ධ වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම සතුටට කරුණකි.

මෙම වසර, ලෝකයේ ආර්ථික පරිසරය සහ දේශපාලන පරිසරය පමණක් නොව වෙළෙඳපොළ විචල්‍යතාවයන්ද සම්බන්ධවව ගත් විට අවිනිශ්චිතතාවක් පෙන්නුම් කළ වසරක් විය. මෙම තත්වය, ලොව පුරා ව්‍යාපාරයන්ට බලපා ඇති අයුරින්ම අපගේ ව්‍යාපාර යටද බලපා ඇත. රු.බී. 53 ක ඉහළම බදු පසු ලාභයක් ඉපයූ පසුගිය වසර ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා ඉතිහාසය තුළ පසුගිය දශකයේ වැදගත්ම වසර වීම තුළින්, එවැනි තත්වයන් වෙත මුහුණ දීමට අපගේ මෙහෙයුම්වලට ඇති හැකියාව පෙන්නුම් කරයි. මේ තත්වය ඉන්ධන සැපයීමේ හැකියාවෙන් රටට ඵලදායී යමක් කිරීම වෙත තවදුරටත් අවධානය යොමු කිරීමට අහපට ඉඩ සලසයි.

ගෝලීය විචල්‍යතාවයන් මධ්‍යයේ ව්‍යාපාරයේ නිරත වීම

ස්ථාවරත්වය සහ ව්‍යාපාර ලෝකය එක්ව නොපවතී- නැගීම් සහ වැටීම්; ආපසු ගමනයන් සහ විපර්යාසයන් එහි රටාව වේ. ගෝලීය තෙල් කර්මාන්තය පවතින්නේ සංක්‍රමණීය අවධියකය. සීඝ්‍ර වර්ධනයන් සහ සමෘද්ධිමත්භාවය සමග, සංවර්ධනය වන රටවල් වෙතින්, විශේෂයෙන්ම ආසියාව තුළින්, බලශක්ති ඉල්ලුම ඉහළ නැගෙමින් පවතී. අනෙක් අතින්, පාරිසරික අවශ්‍යතා සහ තාක්ෂණික දියුණුව විසින් බලශක්ති කාර්යක්ෂමතාවය පිළිබඳ අප්‍රතිහත උත්සහය සහ බලශක්ති මුසුව වඩා පරිසර හිතකාමී, අඩු කාබන් ඉන්ධන වෙත යොමු වීම තුළින් ලොව පුරා බලශක්ති පරිභෝජනය අඩු වී යනුද දැකිය හැකිය. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවද, පිරිපහදු ඛනිජ තෙල් නිෂ්පාදන සැපයීමේ මෙම ද්විත්ව අභියෝගයන් වෙත අවධානය යොමු කරමින් කාබන් විමෝචනය අඩු කිරීමට උත්සහ දරයි.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෝලීය ඛනිජ තෙල් මිලෙහි විචල්‍යතාවයන් පාලනය කළ නොහැකිය. එමෙන්ම රටේ ප්‍රධානතම ඛනිජ තෙල් සපයන්නා වශයෙන්, ගොලීය මිල ඉහළ යාමත් සමග මිල ඉහළ දැමීම සිදු නොකරන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව පෙට්‍රල් 92, පෙට්‍රල් 95 සහ භූමිතෙල් වලින් පාඩු ලබන ලදී. කෙසේ වෙතත් ව්‍යාපාර අඛණ්ඩත්වය තහවුරු කරගැනීම උදෙසා අපගේ අගයදාම ක්‍රියාවලීන්ගේ සහ අපගේ දීර්ඝ කාලීන ආයෝජන තීරණ තුළ ඇති විචලනයේ බලපෑම් සඳහා සූදානම් වීමටත් ඒවා හඳුනාගෙන විසඳුම් සැපයීමටත් අවශ්‍ය වේ. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, පාඩු අවම කරගැනීමේ අරමුණින් පිරිවැය පරාවර්තිත මිල යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමේ අපේක්ෂාවෙන් පසු වෙයි.

ශ්‍රී ලංකාවේ මෙහෙයුම් සන්දර්භය

ශ්‍රී ලංකා මහ බැංකුවට අනුව, 2016 වසරේ ආර්ථික වර්ධනය 4.4% ක් වන අතර එය පෙර වසරට වඩා අඩු අගයකි. මෙයට අයහපත් කාලගුණ තත්වය සහ මන්දගාමී ලෙස සිදුවූ ලෝක ආර්ථික ප්‍රතිසාධනය හේතු විය. අයහපත් කාලගුණය, බදු ගැලපුම් සහ ඉහළ යන ජාත්‍යන්තර භාණ්ඩ මිල හේතුවෙන් වාර්ෂික උද්ධමනය 4% ක වාර්ෂික සාමාන්‍යයක් පෙන්නුම් කරන ලදී. ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව 2016 වසරේ රුපියලේ සමස්ත අගය අවප්‍රමාණය වීම සියයට 3.83 ක් ලෙස වාර්තා විය. බදු පදනම පුළුල් කිරීමෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පිරිවැය ව්‍යුහයට බලපෑමක් ඇති විය. 2016 වසරේදී, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට දැඩි මූල්‍ය පිරිවැයක් ඇති කරමින් වෙළෙඳපොළ පොළී අනුපාතය ඉහළ යාමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරන ලදී. කෙසේ වෙතත්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ණය ගැනීම් අඩු කිරීම තුළින් තම මූල්‍ය පිරිවැය කපාහැරිය හැකි විය.

ජාතිය බලගන්වමින්

ඛනිජ තෙල් නිෂ්පාදනයන්, රටේ ජීවන වියදම කෙරෙහි සහ එදිනෙදා ජීවිතයට බලපෑම් කරමින් රජයේ ආර්ථික වර්ධන න්‍යාය පත්‍රයේ ප්‍රධානතම සාධකයක් වන බැවින් අපගේ ව්‍යාපාර මෙහෙයුම් කටයුතු ඉතා තීරණාත්මක ක්‍රියාකාරීත්වයකින් හෙබිය.

මහජනයා වෙත බර පැටවීමකින් තොරව ගෝලීය වෙළෙඳපොළ තුළ මිල විචල්‍යතාවයන් අප විසින් දරාගැනීම හේතුවෙන් අපගේ ලාභදායීත්වය අඩු වී තිබේ. අපගේ වටිනාකම් ඔස්සේ මෙහෙයවෙමින්, ගැනීමට තිබූ තීරණ ඉතා අසීරු විය. සමාලෝචනයට බඳුන් වන වසර තුළ දේශීයව පිරිපහදු කළ නිෂ්පාදනය මෙ ටො 1,639,047 ක් වූ අතර බලශක්ති සැපයුම අඛණ්ඩව සිදු කරමින්, රටෙහි ඉල්ලුම සැපිරීමට පිරිපහදු කළ නිෂ්පාදන ආනයනය කිරීමට සිදු විය.

මෙම වසර තුළ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට රු බි 423 ක අගයකින් යුත් ඛනිජ තෙල් නිෂ්පාදන සැපයීමට හැකි වූ අතර එය පෙර වසරට සාපේක්ෂව 12% කින් වැඩි අගයකි. අලෙවි පිරිවැය අඩු වීම හා අලෙවි ප්‍රමාණය වැඩිවීම තුළින් දළ ආදායම පසුගිය වසර හා සාපේක්ෂව 143.89% කින් ඉහළ යනු ලැබිණි. මෙම වසරේදී දශකය තුළ ලැබූ ඉහළම ලාභය වන රු බි 53 ක් ලබමින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලබා ඇති ප්‍රතිඵල පිළිබඳව මම සතුටට පත් වෙමි. එතැනින් නොනැවතී, අපගේ ලාභයෙන් කොටසක් ලෙස රු බි 10 ක් ලාභාංශ ලෙස ශ්‍රී ලංකා රජය වෙත ලබා දීමටද අපට හැකියාව ලැබිණි. මීට අමතරව, බදු සහ විශේෂ ගාස්තු ලෙස රජයේ ඒකාබද්ධ අරමුදලට රු. බි. 137 ක් ලබා දී ඇත. වසර අවසානයේ ඍනාත්මක ශුද්ධ වත්කමෙහි අඩුවීම රු. බිලියන 43 ක් විය.

අනාගතය කරා

රට පුරා ඛනිජ තෙල් නිෂ්පාදන අඛණ්ඩව බෙදාහරිමින් ජාතිය බලගැන්වීමේ කර්තව්‍යය තවදුරටත් සිදු කිරීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව කටයුතු සිදු කරනු ඇත. අපගේ අගයදාමය වර්ධනය කිරීමේ අපේක්ෂාවෙන් තව දුරටත් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරෙනු ඇත. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ආබාධිත පුද්ගලයන් වෙතද විශේෂ අවධානයක් යොමු කරමින් සහ දියුණු සනීපාරක්ෂක පහසුකම් ඇතුළත් කරමින් තම පිරවුම් හල් ස්වයංක්‍රීය කිරීමට සැලසුම් කරමින් සිටී. දීර්ඝකාලීන විසඳුමක් ලෙස, සපුගස්කන්ද පිරිපහදුව සම්පූර්ණයෙන් අලුත්වැඩියා කිරීමට අදහස් කර සිටිමු. අපගේ පවතින පිරිපහදුව සමීපයෙහිම නව පිරිපහදුවක් ස්ථාපනය කිරීමේ අදහසක්ද අපට ඇත. කොළඹ වරායේ සිට කොලොන්නාව වෙත දිවෙන නල මාර්ගය, වසර හතළිහකට පසු 2016 දී අලුත්වැඩියා කිරීම ආරම්භ කළ අතර මෙය ඉක්මණින් අවසන් කිරීමට අපි අපේක්ෂා කරමු.


කෙසේ වෙතත්, ඉදිරි වසර තුළදීද ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ ඛනිජ ඉන්ධන මිල ඉහළ යනු ඇති බවට අපි දකිමු. එනමුදු, මේ වසරේදී සංස්ථාව විසින් ගෙන ඇති තීරණ සහ කළමනාකාරීත්වය විසින් ක්‍රියාත්මක කරන තීරණාත්මක සැලසුම් තුළින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට වර්තමාන අභියෝග ජයගත හැකි වෙනු ඇති බවට මම විශ්වාස කරමි.

ඇගයීම

මෙම ඓතිහාසික ලාභය ළඟා කරගැනීමේ ලා ඉමහත් දායකත්වයක් ලබා දුන් කළමනාකාර අධ්‍යක්ෂ සහ කළමනාකාර කණ්ඩායමට මගේ අවංක කෘතඥතාව පල කිරීමට මම කැමැත්තෙමි. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ආර්ථිකයේ අභියෝගයන් හමුවේ ඉදිරියට ගමන් කිරීමට ශක්තිය සපයන්නේ සංස්ථාව පුරා විවිධ මට්ටම්වල සේවය කරන පුද්ගලයන්ගේ ගුණාත්මක බව නිසා බවට මම දැඩිව විශ්වාස කරමි. අපගේ මෙහෙයුම් කටයුතුවලදී ළඟා කරගත් කාර්ය සාධනය මෙන්ම රජයේ අධිකාරීන්, පාරිභෝගිකයින්, සැපයුම්කරුවන් සහ පුළුල් පාර්ශ්වයන් සමග ඇති කරගෙන ඇති සබඳතාවයන් තුළින්ද මෙය පැහැදිලි වේ. ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ගරු ඇමතිතුමා සහ ගරු නියෝජ්‍ය ඇමතිතුමිය මෙන්ම අනෙකුත් නිලධාරීන් වෙතද මගේ ප්‍රශංසාව පුද කිරීමට කැමැත්තෙමි.

අවසන් වශයෙන්, සංස්ථාව ලාභ ලබන තත්වයකට පත් කිරීම උදෙසා තම කැපවීම, නායකත්වය සහ බුද්ධිමත් බව ප්‍රකට කළ මගේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ටද විශේෂ ස්තුතිය පල කරන්නෙමි. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව තම තීරණාත්මක සහ අපේක්ෂා සහගත කාර්ය සැලසුම සඵල කරගනු ඇති බවත් කෙටි, මධ්‍ය සහ දීර්ඝ කාලීන වශයෙන් සංස්ථාවේ ප්‍රත්‍යාස්ථිතිය පවත්වාගනු ඇති බවත් මම දැඩිව විශ්වාස කරමි.

ස්තුතියි



දම්මික රණතුංග
සභාපති
දිනය 11.05.2018

අපගේ මෙහෙයුම් සන්දර්භය සහ උපාය මාර්ග

අපගේ ව්‍යාපාර මාදිලිය වෙත දැඩි බලපෑම් ඇති කළ අසීරු මෙහෙයුම් සන්දර්භයක් තුළ ඉහළම ලාභ ලැබූ මෙම වසර ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සාර්ථක වසරක් විය. ගෝලීය තෙල් මිලෙහි අඩු වීම සහ අපගේ පාර්ශ්වකරුවන්ගේ වර්ධනය වන අපේක්ෂාවන්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ලාභදායිකත්වය වර්ධනය කිරීමේ ලා ඉවහල් විය.

ජාතිය බලගන්වමින්

වැඩි වූ ආදායම

රු. බිලියන 423 (2015: රු. බිලියන 377)

අලෙවි පිරිවැයේ අඩු වීම

රු. බිලියන 326 (2015: රු. බිලියන 337)

ණය ගැනීම්වල අඩුවීම

රු. බිලියන 194 (2015: රු. බිලියන 268)

පිරිවැය පාලනය කරමින් අපගේ ලාභදායීතාවය වර්ධනය කිරීම

රු. බිලියන 53 (2015: පාඩුව රු. බිලියන 21)

ඔක්ටේන් 95 පෙට්‍රල්වලින් ලීටර එකක් සඳහා පාඩුව

රු. 8.92

පිරිවැය පරාවර්තිත මිල උපායමාර්ගයකින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ලාභදායිතාවය තුලනය කරනු ඇති අතර සෘණාත්මක ශුද්ධ වත්කම් තත්ත්වය අඩු කරනු ඇත.

ජාතිය බලගැන්වීමේ ගමන් මග

අපගේ මෙහෙයුම් සන්දර්භය තුළ අපගේ ව්‍යාපාර මාදිලියට වැදගත් වන ප්‍රධාන කරුණු හයක් අප විසින් හඳුනාගෙන ඇත:

- සහන මිලට මිල කිරීම
- ඛනිජ ඉන්ධන මිල ගෝලීය වශයෙන් ඉහළ යාම
- විනිමය අනුපාතයන්ගේ චලනය
- තෙල් පිරිපහදු සහ ගබඩා ධාරිතාවෙහි මඳකම
- ලබාගත් ඇමරිකානු ඩොලර් ණය පියවීමේ අසීරුතා
- නල මාර්ගය ගරා වැටී තිබීම

සහන මිලට මිල කිරීම

ඛනිජ තෙල් නිෂ්පාදනයන්ගේ දේශීය මිල රජය විසින් තීරණය කිරීම

නූතන ලොව තුළ ඛනිජ තෙල් නිෂ්පාදන අත්‍යවශ්‍ය නිෂ්පාදනයන් බවට පත්ව ඇති අතර ලංකාවේ ජීවන වියදමට ඉන්ධන මිල දැඩිව බලපෑම් කරන බැවින්, ඛනිජ තෙල් නිෂ්පාදනවල දේශීය මිල තීරණය කරනු ලබන්නේ සහන මිල අනුපාතයන් යටතේ රජය විසිනි. එබැවින්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සමස්ත ජාතියේ යහපත උදෙසා තම ලාභදායීත්වය කැපකර ඇත.

සහනදායී මිල හේතුවෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ලැබී ඇති පාඩුව පහත දක්වා ඇත;


නිෂ්පාදනය	සහන මිල (රු.)	ලීටරයකට පාඩුව (රු.)	සමස්ත පාඩුව (රු. මිලියන)	රජයෙන් ලැබුණු සහනාධාරය
පෙට්‍රල් 92	117.00	7.34	8,251	නැත
පෙට්‍රල් 95	128.00	8.92	1,291	නැත
භූමිතෙල් (දේශීය)	49.00	17.81	2,982	නැත

ප්‍රතිමාන අගය	ජයගත යුතු ආකාරය
ඛනිජ තෙල් නිෂ්පාදන සහන මිල යටතේ අලෙවි කිරීමෙන් ආදායම, ලාභදායීත්වය සහ මුදල් ප්‍රවාහවලට සැලකිය යුතු ඍණාත්මක බලපෑමක් ලැබේ. **ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මුදල් ප්‍රවාහ ගැටළුවලට මුහුණ දෙන විට එහි ලාභදායිතාවය පොළී සහිත ණයගැනීම් සමග තවදුරටත් පහළ යයි.**	1. රජයට පිරිවැය පරාවර්තිත, පාරදෘශ්‍ය ඉන්ධන මිල යාන්ත්‍රණයක් හඳුන්වා දීමට පෙළඹවීම් කිරීම 2. 1971 අංක 38 දරන මූල්‍ය පනතේ 17 වගන්තිය අනුව සහනාධාර නිමිකමක් ලබාගැනීම සඳහා රජය සමග සාකච්ඡා කිරීම. 3. වියදම් පාලනය

ඛනිජ ඉන්ධන මිල ගෝලීය වශයෙන් ඉහළ යාම

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ගෝලීය වෙළෙඳපොළ තුළ මිල පැවරුම්ලාභියෙකි.

ශ්‍රී ලංකාවට ඛනිජ තෙල් සම්පත් නොමැති බැවින්, අප ඛනිජ තෙල් නිෂ්පාදන ගෝලීය වෙළෙඳපොළ වෙතින් ආනයනය කළ යුතුය. එමෙන්ම ගෝලීය වෙළෙඳපොළ තුළ ඛනිජ ඉන්ධන මිල පහල යනවිට ඉන්ධන ගබඩා කිරීම සඳහා ප්‍රමාණවත් ගබඩා ධාරිතාවක් එය සතුව නැත. මෙම හේතුව නිසා ගෝලීය වෙළෙඳපොළ තුළ මිල විචල්‍යය සමග ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව අධි සංවේදී වෙයි.




මෙම වසරේ මර්බන් FOB අබුඩාබි මිල 71% කින් ඉහළ ගිය අතර 2016 ජනවාරියේදී තෙල් බැරලයක සාමාන්‍ය මිල ඇ.ඩො 31.695 ක් ව සිට දෙසැම්බර් වන විට බැරලයක මිල ඇ.ඩො 54.817 දක්වා වැඩි වී ඇත. මෙය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මත දැඩි පීඩනයක් ඇති කරන ලදී. මෙම කාල සීමාව තුළම සුපර් ඩීසල් සහ ඔටෝ ඩීසල්ද පිළිවෙළින් 71% සහ 74% කින් වැඩි විය. ආසන්න කාලය තුළ මිල ඉහළට නැඹුරු ප්‍රවණතාවක් දැක්වූ අතර වෙළෙඳපොළ මිලෙහි ඉහළම අගය කෙතරම්ද යන්න හෝ මෙම ප්‍රවණතාව කොතෙක් කල් පවතීද යන්න අපැහැදිලිය.

ප්‍රතිමාන අගය	ජයගත යුතු ආකාරය
ඉහළ මිල විසින් ආන්තිකය සහ මුදල් මත පීඩනයක් ඇති කර ඇත. අප ගෝලීය වෙළෙඳපොල තුළ මිල පැවරුම් ලාභියෙකු වන අතර වෙළෙඳපොළ වෙත බලපෑම් කළ හැක්කේ ඉතාමත් සුළු වශයෙනි.	1. ගෝලීය වෙළෙඳපොල තුළ මිල පහළ යන විට ඛනිජ තෙල් නිෂ්පාදන ගබඩා කර තබාගැනීම සඳහා ගබඩා ධාරිතාව ඉහළ දැමීම. 2. ස්වභාවික වායූන් නිපදවීම සහ සංවර්ධනය කිරීමේ සැලසුම ඇතිව ශ්‍රී ලංකා රජය, ඛනිජ තෙල් ගවේෂණය කිරීමේ උත්සාහයන් දියත් කර ඇත. ඉන්ධන වාණිජකරණ ක්‍රියාවලිය සාර්ථක වන්නේ නම්, ආනයනය කරන ඉන්ධන ප්‍රමාණයක් අඩු කර දේශීය ඉන්ධන භාවිතා කිරීමට අපේක්ෂා කෙරේ.

විනිමය අනුපාතයන්ගේ වලනය

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ශ්‍රී ලංකාවේ ප්‍රධානතම ආනයනකරුවෙකි.

ආනයනය කළ ඛනිජ තෙල් නිෂ්පාදන මත හා විනිමය අනුපාත වලනයන් මත පදනම්වූ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ කාර්යයන් ලාභදායීතාවයට දැඩි බලපෑමක් ඇති කරනු ලබයි. 2016 වසර තුළ සමස්තයක් ලෙස, රුපියලේ අගය ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව 3.83% කින් අවප්‍රමාණය වීමක් වාර්තා කෙරිණි (2015: 9.03%) වසර තුළදී විදේශ විනිමයට සාපේක්ෂව රුපියලේ අගය අවප්‍රමාණය වීම මත ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට රු මිලියන 8,829 ක පාඩුවක් සිදු විය (2015: රු. මිලියන 32,841.59). එමෙන්ම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ඇමරිකානු ඩොලර් මිලදී ගැනීමට අවසර ලැබී තිබුණේ රාජ්‍ය වාණිජ බැංකු දෙකකින් පමණක් වූ අතර අනෙක් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතින් තරගකාරී අනුපාතයකට ඇමරිකානු ඩොලර් මිලදී ගැනීම සීමා කර තිබිණි.



ප්‍රතිඵලය අගය	පයගත යුතු ආකාරය
ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවට වඩා වැඩි විනිමය අනුපාතයකට විදේශ විනිමය ණය පියවීමට සහ ආනයන බිල්පත් පියවීමට ඇති නිසා රුපියලේ අගය අවප්‍රමාණය වීම, අපගේ ලාභදායීතාවට ඉතා අයහපත් ප්‍රතිඵල ලබාදී ඇත. තරගකාරී අනුපාතයන්ට ඇමරිකානු ඩොලර් මිලදී ගැනීමට නොහැකි වීමෙන් විනිමය අනුපාත මගින් සිදුවෙන අලාභයන් වැඩි වී ඇත.	1. රජයෙන් ලැබෙන සහනාධාරය තුළින් විදේශ විනිමය පියවීම 2. සියලුම වාණිජ බැංකු සමග සාකච්ඡා කර තරගකාරී අනුපාතයන්ට ඇමරිකානු ඩොලර් මිලදී ගැනීමට ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවට හැකියාව ලබාදීම.

තෙල් පිරිපහදු සහ ගබඩා ධාරිතාවෙහි මඳකම

බනිජ තෙල් නිෂ්පාදනවල ස්වභාවය හේතුවෙන් විවිධ නිෂ්පාදන වලට වෙන් වූ ගබඩාවන් අවශ්‍ය වේ

බොරතෙල් සහ පිරිපහදු කළ නිෂ්පාදන සඳහා විවිධ ඉන්ධන නිෂ්පාදන ගබඩා කිරීම සඳහා වන වෙනස් ටැංකි වර්ග අවශ්‍ය කෙරේ. බනිජ තෙල් නිෂ්පාදන සඳහා වැඩි වෙන ඉල්ලුමත් සමග වර්තමාන ටැංකි ධාරිතාව සහ පිරිපහදු ධාරිතාව අප්‍රමාණවත් වී ඇති අතර එය පිරිපහදු මෙහෙයුම් කටයුතු ඉහළ නැංවීමට හා අතිරේක ගබඩා ධාරිතාවක් ලබාගැනීමට පොළඹවනු ලබයි. එමෙන්ම, ගෝලීය මිල පහළ ගොස් පැවති විට, අනාගත ඉල්ලුම සඳහා ගත හැකි සාර්ථක ක්‍රියාමාර්ගයක් වශයෙන් ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවට වඩා වැඩි බනිජ තෙල් නිෂ්පාදන ප්‍රමාණයක් ගබඩා කරගත හැකිව තිබිණි. මෙයට ඇති ප්‍රධාන අභියෝගය වන්නේ මූල්‍ය සීමාකම් ය.

පිරිපහදු ක්‍රියාවලිය ඔස්සේ උත්පාදනය වූ යටි නිෂ්පාදන අපනයනය කිරීමෙන් සිදුවූ පාඩුව පහත දක්වා ඇත;

නිෂ්පාදනය	ලීටරයකට පාඩුව (රු.)	සමස්ත පාඩුව (රු. මිලියන)
දැව් තෙල් 800'	19.71	727
නැප්තා	18.54	1,580

ලබාගත් ඇමරිකානු ඩොලර් ණය පියවීමේ අසීරුතා

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට තම අභිමතය පරිදි ඇමරිකානු ඩොලර් ණය පියවීමේ නිදහස නැත.

මූල්‍ය අභියෝගයන්ට මුහුණ දීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ණය ලබාගැනීම මගින් මූල්‍ය සහය ලබාගැනීමට සිදු විය. කෙසේ වෙතත්, එය අභ්‍යන්තරව සහ බාහිරව විවිධ අසීරුතාවලට මුහුණ දෙමින් ඇත. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ඇති බරපතලම අභියෝගය වන්නේ ණය පියවීමට අරමුදල් හිඟකමයි. වෙළෙඳපොළ තුළ ප්‍රමාණවත් ඇමරිකානු ඩොලර් නොමැතිවීම වැනි අරමුදල් තත්ත්වයන්ට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මුහුණ දෙන නමුදු, රටෙහි විනිමය අනුපාත මත වන බලපෑම ණය පියවීම කෙරෙහි බාධා පමුණුවයි. එහි ප්‍රතිඵලයක් ලෙස, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට වඩා වැඩි පොළියක් ගෙවීමට සිදුවෙන අතර අයහපත් ශුද්ධ වත්කම් තත්ත්වය බරපතල තත්වයකට ගෙන එයි.

	රු. මිලියන	විශේෂ සටහන්
මූල්‍ය වියදම	11,404.537	අරමුදල් සපයන්නන් වෙනුවෙන් දරන ලද වියදම්
මූල්‍ය ආදායම	8,374.112	අතිරික්ත මුදල් ආයෝජනයෙන් උපයන ලද පොළිය
පොළී උපයන ආයෝජන	63,626.178	අතිරික්ත මුදල් තුළින් කළ ආයෝජන
පොළී දරන ණය ගැනීම්	193,987.471	මූල්‍ය ගැටළුව විසඳීම පිණිස ලබාගත් අරමුදල්

ප්‍රතිමාන අගය	ජයගත යුතු ආකාරය
ගෙවීමට ඇති ණය ලාභදායිතාවයට ඉතා අයහපත් ලෙස බලපාන අතර නියමිත වේලාවට වාරික නොගෙවීමෙන් අතිරේක පොළී වියදම් එක් වී තවදුරටත් ලාභදායීත්වය පරිහානියට ලක් කරයි.	1. රජය විසින් ලබා දිය යුතු සහනාධාරයෙන් ඇමරිකානු ඩොලර් ණය පියවීමට රජය සමග සාකච්ඡා කිරීම 2. පොළී අනුපාත අඩු කිරීමට බැංකු සමග සාකච්ඡා කිරීම 3. ඵලදායී අරමුදල් කළමනාකරණය 4. ඇමරිකානු ඩොලර් ණය ශ්‍රී ලංකා රුපියල්වලට හැරවීමට බැංකු සහ මහා භාණ්ඩාගාරය සමග සාකච්ඡා කිරීම 5. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට යහපතක් වන ලෙස ඇමරිකානු ඩොලර් ණය පියවන ලෙස ස්වාධිකාරය ඉල්ලා සිටීම

නල මාර්ගය ගරා වැටී තිබීම

ගරා වැටී ඇති නල මාර්ග වැඩි නැව් පමා කුලීවලට හේතු වේ

ආනයනය කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදන වරායේ සිට පයීන්ත වෙත මුදාහැරීමට රට හරහා දිවෙන නලමාර්ග භාවිතා කෙරේ. මෙම නලමාර්ගවල ගරා වැටීම හේතුවෙන් භාණ්ඩ නැව් වෙනින් තෙල් මුදාහැරීමේදී අඩු පීඩනයක් යොදා ගැනීමට සිදුවෙන අතර එහි ප්‍රතිඵලයක් ලෙස නැව් ලැගුම තුළ දැඩි තදබදයක් ඇති වේ. මෙහි අවසන් ප්‍රතිඵලය වන්නේ නැවේ සිට තෙල් මුදාහැරීමට ගතවන කාලය වැඩි වීම සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ඉහළ නැව් පමා කුලියක් ගෙවීමට සිදුවීමයි.

ප්‍රතිමාන අගය	ජයගත යුතු ආකාරය
නැව් පමා කුලී මගින් ආනයන පිරිවැය ඉහළ දමන අතර ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රතිරූපයටද හානි සිදු කර එහි ඵලදායිතාවයට අයහපත් ලෙස බලපායි.	1. මුල් නැව් ලේඛන නොමැති විටක නැව් ආරක්ෂණයක්/ බැංකු හානි රක්ෂණයක් භාවිතා කරන ගොඩබෑම් නැවක් භාවිතා කිරීම 2. නියමිත වේලාවට ලේඛන සැපයීමට සැපයුම්කරුවා අසමත් වන අවස්ථාවලදී, පමා නැව් කුලිය සැපයුම්කරුවාගෙන් අය කරගැනීමට ඒ පිළිබඳව වාණිජ අංශයට දැනුම්දෙනු ලැබේ.

අපගේ උපාය මාර්ගයන් ක්‍රියාත්මක කිරීම: කාර්ය සාධන සාරාංශය

ගෝලීය වාශයෙන් පැවති අභියෝගාත්මක වෙළෙඳ පොළ තත්ත්වයන් පැවතුණද ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රතිඵල ඉතා සුවිශේෂී වේ. ආදායමේ 12.32% ක වැඩිවීමක් සහ අලෙවි පිරිවැයෙහි 3.17% ක අඩු වීමක් පෙන්නුම් කරමින් රු. බිලියන 53 ක පෙර නොවූ ලාභයක් ලැබීමට සංස්ථාවට හැකි විය.

ජාතික බලගන්වමින්

වැඩි වූ දළ ලාභය

රු. බිලියන 97 (2015: රු. බිලියන 40)

විනිමය අනුපාත වලනයෙන් අඩුවූ පාඩුව

රු. බිලියන 9 (2015: රු. බිලියන 33)

අඩු වූ සෘණාත්මක ශුද්ධ වත්කම්

රු. බිලියන 186 (2015: රු. බිලියන 229)

පසුගිය වසර පුරා ගෝලීය තෙල් මිලෙහි විචල්‍යතාවය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට වැදගත් සාධකයක් විය


ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීම 3.83%


ඇමරිකානු ඩොලර් ණය රුපියල් ණය බවට හැරවීමෙන් විනිමය අනුපාතය වෙතින් වන පාඩුව අඩු කරනු ඇත.

කොටස් හිමි අගය ප්‍රස්තුතය

ආදායම

ඛනිජ තෙල් නිෂ්පාදන දේශීය වශයෙන් අලෙවි කිරීමෙන්, අපනයනයෙන් සහ නැව් ඉන්ධන පිරවුමෙන් ආදායම ලැබේ. සමාලෝචිත වසර තුළ දේශීය අලෙවිය ප්‍රධානම ආදායම් මූලාශ්‍රය වූ අතර එය 2015 ට වඩා 19.14% කින් වර්ධනය විය. සමාලෝචිත වර්ෂය තුළදී ගෝලීය වෙළෙඳපොලෙහි මිල විචල්‍යතාවයන් පැවතියද දේශීය ඛනිජ ඉන්ධන මිල ස්ථාවරව පැවති බව සඳහන් කිරීම වැදගත් වේ. දේශීය අලෙවිය ඉහළ නැගුණු විට, අපනයනයෙන් සහ නැව් ඉන්ධන පිරවුමෙන් ලද ආදායම පිළිවෙළින් 21% කින් හා 65% කින් අඩු වී ඇත. අනෙක් අතින්, විකිණුම් බදු 37.68% කින් ඉහළ ගොස් තිබිණි.





2016 වසරේ ආදායමේ සංයුතිය



දේශීය ඛනිජ තෙල් මිල ගණන්


නිෂ්පාදනය	01.01.2014 වන දිනට	2014 සැප් මස සංශෝධනය	2014 දෙසැ මස සංශෝධනය	2015 ජන මස සංශෝධනය	2015 ජූලි මස සංශෝධනය	2015 නොවැ මස සංශෝධනය	31.12.2016 වන දිනට
පෙට්ල්- 90/92	162.00	157.00	150.00	117.00	-	-	117.00
පෙට්ල් -95	170.00	165.00	158.00	128.00	-	-	128.00
ඔටෝ ඩීසල්	121.00	118.00	111.00	95.00	-	-	95.00
සුපර් ඩීසල්	145.00	140.00	133.00	110.00	-	-	110.00
භූමිතෙල් (දේශීය)	106.00	86.00	81.00	59.00	-	49.00	49.00
දැව් තෙල් - 800’	92.20	-	-	82.20	80.00	-	80.00
දැව් තෙල් - 1500’	90.00	-	-	80.00	-	-	80.00
දැව් තෙල් - 3500’	90.00	-	-	80.00	-	-	80.00

වෙනත් ආදායම්

අනෙක් ප්‍රධාන ආදායම් මූලාශ්‍රය වන්නේ භූමිතෙල් සහනාධාර ආදායම වන අතර එය මිලියන 2,982 කි. එය, භූමිතෙල් එහි පිරිවැයට වඩා අඩුවෙන් අලෙවි කිරීම සඳහා රජයෙන් ලැබෙන සහනාධාරයයි. මෙම සහනාධාරය උපචිත පදනමින් හඳුනාගනු ලබයි. කෙසේ වෙතත්, 2016 වසරේදී ලැබූ පාඩුව සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට කිසිදු සහනාධාරයක් නොලැබිණි. වසර තුළදී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව රු මිලියන 293 ක ලාභාංශ ආදායමක් ලැබූ අතර එය ප්‍රධාන වශයෙන්ම ලැබුණේ ලංකා ඛනිජ තෙල් තොග පර්යන්ත සමාගමෙනි.

විනිමය අනුපාත විචල්‍යය

වසර තුළ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් දැරූ විනිමය අනුපාත විචල්‍යය පාඩුව රු මිලියන 8829 ක් වූ අතර එය පෙර වසරට වඩා 73% කින් වැඩි අගයකි. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඛනිජ තෙල් ආනයනය කරන බැවින් මෙම පාඩුවට ප්‍රධාන වශයෙන් හේතුවූයේ විදේශ විනිමයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීමයි. 2016 වසරේදී ශ්‍රී ලංකා රුපියල සාමාන්‍ය වශයෙන් ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව 3.83% ක් අවප්‍රමාණය විය (2015: 9.03%).



විනිමය අනුපාත විචලනයෙන් සිදුවූ පාඩුව

අපගේ උපාය මාර්ග


වසර තුළ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඉපයූ ලාභ වැඩි කරගැනීමට විවිධ උපාය මාර්ගයන් ක්‍රියාත්මක කරනු ලැබීය;

- ✓ ඵලදායී භාණ්ඩාගාර කළමනාකරණයක් තුළින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට එහි මූල්‍ය පිරිවැය රු. බිලියන 3.6 කින් අඩු කරගැනීමට හැකි විය.
- ✓ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව බැංකු අයිරා වෙත නොයනු ඇති බව තහවුරු කරමින් අතිරික්ත මුදල් පොළී උපයන මූලාශ්‍රයන් තුළ ආයෝජනය කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ආදායම රු. බිලියන 3.4 කින් වැඩි වූ අතර බැංකු අයිරා පොළියක් නොදරනු ලැබීය.
- ✓ පාරදෘශ්‍ය ආනයන ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ඉහළ ගුණාත්මක බවකින් යුත් ඛනිජ තෙල් නිෂ්පාදන අඩුම මිලට ලබාගත හැකි විය.
- ✓ බලශක්ති උත්පාදන අංශය වෙතින් ඇතිවන ඉල්ලුම රු. බිලියන 32 ක ලාභයක් උපයමින් හැසිරවීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට හැකි විය. අලෙවි ආදායම පසුගිය වසර හා සාපේක්ෂව 112% කින් වැඩි විය.
- ✓ ගුවන් අංශය තුළ භාවිතා කෙරුණු පිරිවැය පරාවර්තිත මිල පැවතියද ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ ඉල්ලුමේ වැඩිවීම පිළිබිඹු කරමින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මිල තරගකාරී විය.
- ✓ මුල් නැව් ලේඛන ලැබෙන තෙක් රැඳී නොසිට නැව් ආරක්ෂණයක්/ බැංකු හානි රක්ෂණයක් භාවිතා කරන ගොඩබෑම් නැවක් භාවිතා කිරීම
- ✓ රු. බිලියන 9.88 ක් වූ ගෙවිය යුතු බදු සහ රේගු බදු, ත්‍රිවිධ හමුදාව, පොලීසිය සහ දුම්රිය දෙපාර්තමේන්තුව වෙතින් ලැබිය යුතු වෙළෙඳ ණයගැති වටිනාකම් වලට හිලව් කරමින් පියවනු ලැබිණි.

මූල්‍ය ආදායම

2015 වසර සමග සන්සන්දනය කරන විට මූල්‍ය ආදායම 67% කින් වැඩි විය. අරමුදල් කළමනාකරණය ලෙස බැඳුම්කර, ස්ථාවර තැන්පතු සහ ඇමතුම් තැන්පතු වෙතින් පැමිණෙන ආයෝජන ආදායම මෙම වර්ධනය වෙත දායකත්වය ලබා දෙනු ලැබීය.

මූල්‍ය ආදායම



මූල්‍ය වියදම

වසර තුළදී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව රු බිලියන 11.4 ක මූල්‍ය වියදමක් දැරූ අතර එය පෙර වසරට වඩා 24% ක අඩු වීමකි. මෙම වියදම අඩු කරගැනීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව දැඩි ප්‍රයත්නයක් දරන අතර මෙම වසරේදීත් කිසිදු බැංකු අයිරා පොලියක් රහිතව තම අරමුදල් ඵලදායීව කළමනාකරණය කරගැනීමට හැකිවීම ප්‍රශංසනීය වේ. ණය පියවීමත් සමග දීර්ඝ කාලීන ණයවල පොළිය රු. මිලියන 10.63 කින් අඩු වී ඇත. වසර තුළදී 2004 වසරේ සිට නැවත ගෙවීම ආරම්භ වූ භාණ්ඩාගාර ණය (එක්සිම් බැංකුව) පියවීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සමත් විය. එහි පොළී අනුපාතය වර්ෂයකට 12% කි. විදේශ විනිමය බැංකු ණයවල අදාළ අඩුවීමත් සමගම එහි පොළියද රු. මිලියන 3,635 කින් අඩුවී ඇත. 2016 වසර තුළ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව තම ණයෙන් රු.මිලියන 71,200 ක් නැවත ගෙවූ අතර 2015 දී රු. මිලියන 16,049 ක අගයකින් යුත් ණය ලබාගෙන තිබිණි.

ආදායම් බදු වියදම

ලාභදායිතාවයේ සීග්‍ර වර්ධනය හේතුවෙන් ආදායම් බදු වියදම්වලද සීග්‍ර වර්ධනයක් සිදු විය. පවතින බදු නීතිය අනුව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට බදු අයකෙරෙන ආදායම මත රු මිලියන 12,186 ක බද්දක් සහ බෙදිය හැකි ආදායම මත රු.මිලියන 4,340 ක බද්දක් ගෙවීමට සිදු විය.


ලාභදායිකාවය

	2016	2015
දළ ලාභ ආන්තිකය	23%	11%
මෙහෙයුම් ලාභ ආන්තිකය	19%	7%
ශුද්ධ ලාභ ආන්තිකය	13%	(5%)


2015 වසරට සාපේක්ෂව ලාභදායිතා අනුපාත තුළ ධනාත්මක වර්ධනයක් දැකිය හැකිය. ආදායම 12.32% කින් වර්ධනය වූ අතර අලෙවි පිරිවැය 3.17% කින් අඩු වී ඇත. 2015 වසර හා සාපේක්ෂව ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ ඛනිජ ඉන්ධන මිල අඩු වීම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ධනාත්මක බලපෑමක් ඇති කරන ලදී. ඉපයූ දළ ලාභය මෙම වසරේ වියදම් ආවරණය කිරීමට ප්‍රමාණවත් වූ අතර ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලාභාංශ ලෙස රු.මිලියන 10,000 ක් භාණ්ඩාගාරය වෙත ලබාදෙන ලදී.

කළමනාකරණයේ පහසුව පිණිස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව තම මෙහෙයුම් කටයුතු ප්‍රධාන කොටස් අටකට බෙදා ඇති අතර 2016 වසරේදී එම ඒකකවල කාර්ය සාධනය පහත සාරාංශගත කොට ඇත.

අංශ වශයෙන් ආදායම




අංශ වශයෙන් ලාභදායිතාවට දායකත්වය



ප්‍රවාහන අංශය

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඉහළම ආදායම් උත්පාදනව වන අංශය වන්නේ ප්‍රවාහන අංශයයි. වසර තුළදී එය රු.බිලියන 325 ක ආදායමක් ඉපයූ අතර එය 2015 වසර හා සැසඳීමේදී රු.බිලියන 24 ක වැඩි වීමකි. පොදු ජනතාව පුද්ගලික වාහන භාවිතා කිරීමට වැඩි කැමැත්තක් දැක්වීම සහ ස්ථිතික අලෙවි මිල ඉල්ලුම් වැඩි කරන ලදී. වැඩි වශයෙන් සුඛෝපභෝගී වාහන ආනයනය කිරීමත් සමග 95 ඔක්ටේන් පෙට්‍රල් සහ ලංකා සුපර් ඩීසල් පරිභෝජනය පිළිවෙළින් 34.99% ක සහ 35.05% ක වර්ධනයක් වාර්තා කර තිබිණි. විමෝචන රහිත ඉන්ධන සඳහා පාරිභෝගිකයින්ගේ කැමැත්ත වැඩිවීම ඉල්ලුම් වැඩිවීම කෙරෙහි දායක වූ සාධකයකි.


ප්‍රවාහන අංශයේ ලාභය/(පාඩුව)



නිෂ්පාදන සතර සඳහාම වන ඉල්ලුමේ වැඩි වීමක් පැවතියද, ආනයන වියදම සහ අනෙක් අදාළ වියදම් ආවරණය කරගැනීමට පෙට්‍රල් අලෙවි මුදල ප්‍රමාණවත් නොවීම නිසා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට පාඩුවක් සිදු විය. මෙහිදී පිරිවැය පරාවර්තිත මිල සූත්‍රයක අවශ්‍යතාවය හොඳින් පැහැදිලි විය.

බලශක්ති අංශය


බලශක්ති උත්පාදන අංශයෙන් ලාභය



රු බිලියන 91 ක ආදායමක් ලබන බලශක්ති අංශය ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ දෙවන ඉහළම ආදායම් උත්පාදන අංශයයි. අනෙක් අතට රු බිලියන 32.04 ක ලාභයක් උපයමින් එය ලාභදායීතාවයේ ඉහළම දායකයා බවට පත් විය. ඔටෝ ඩීසල් සඳහා වන ඉල්ලුම 334% කින් ඉහළ ගිය අතර රු.බිලියන 7.53 ක ලාභයක් උපයනු ලැබීය. එය පසුගිය වසරට වඩා රු.බිලියන 7.01 ක වැඩි වීමකි. පසුගිය වසර හා සන්සන්දනය කළ විට දැව් තෙල් 800' ඉල්ලුමද 156% කින් වැඩි වූ අතර ඉන් ලද ලාභය රු. බිලියන 16.78 ක් විය. ලාභය, මෙම ලාභය පසුගිය වසරේ ලාභයට වඩා 5 ගුණයකට ආසන්න විය. නැප්තාවල ආදායම රු. බිලියන 12.9 ක් වූ අතර එහි ලාභය රු. බිලියන 4.46 ක් විය. කිසිදු බණ්ඩනයකින් තොරව බලශක්ති ක්ෂේත්‍රය වෙතින් පැමිණි ඉහළ ඉල්ලුම සැපිරීමට හැකිවීම ප්‍රශංසනීයය.

ගුවන් අංශය

ගුවන් අංශයෙන් ලද ලාභය



වසර තුළදී ගුවන් අංශය රු.බිලියන 32.04 ක ආදායමක් ඉපයූ අතර රු. බිලියන 2.26 ක ලාභයක් අත්පත් කරගන්නා ලදී. පිරිවැය පරාවර්තන මිල ක්‍රමයක් හඳුන්වා දීමත් සමග ජෙට් ඒ -1 සහ ඇව්ගෑස් මිල ජාත්‍යන්තර ඉන්ධන මිල සමග අඩු විය. එසේ වුවත්, ජාත්‍යන්තර වෙළෙඳපොලේ මිල සූත්‍රය භාවිතා කර


ඛණ්ඩීය විශ්ලේෂණය

අංශය	අලෙවි ආදායම (රු. මිලියන)	ලාභය/(අලාභය) (රු. මිලියන)	විශේෂ සටහන්
දේශීය	8,587	(2,891)	රජය මගින් නිවේදනය කළ සහන අලෙවි මිල
කෘෂි	41	(90)	ඉහළ කාර්ය මණ්ඩල පිරිවැය සහ නිෂ්පාදනය අඩු මිලකට පිරිනැමීම
නැව් ඉන්ධන පිරවුම	479	(66)	පිරිවැයට අඩුවෙන් දැව් තෙල් අලෙවි කිරීම
අපනයන	3,314	(2,307)	පිරිවැයට අඩුවෙන් ඉන්ධන තෙල් සහ නප්තා අලෙවි කිරීම
ප්‍රවාහනය	325,380	23,298	
බලශක්ති උත්පාදනය	91,073	32,038	
ගුවන්	32,041	2,258	
කර්මාන්ත	14,136	5,351	

දක්වන ලද මිලෙහි තරගකාරීත්වය පෙන්නුම් කරමින් අලෙවි ප්‍රමාණය වැඩි විය. ජෙට් ඒ -1 සඳහා දේශීය පාරිභෝගිකයින්ගෙන් ලැබෙන ඉල්ලුම වැඩි වෙන අතර සංචාරක කර්මාන්තයේ නැගීමත් සමග එය තවදුරටත් වර්ධනය කරගැනීමේ අවස්ථාවක් ඇත.

කර්මාන්ත අංශය

කාර්මික අංශයෙන් ලද ලාභය




ලාභදායිතාවයට දායකත්වය සපයන තෙවන අංශය මෙයයි. කර්මාන්ත අංශයෙන් ලැබුණු ආදායම රු. බිලියන 14.14 ක් වූ අතර එය පෙර වසරට වඩා 5.48% ක අඩු වීමකි. මෙම අඩුවීමට බලපෑ එක් හේතුවක් වූයේ කාර්මික භූමිතෙල් සහ S.B.P. සඳහා ඉල්ලුම් ප්‍රමාණය අඩු වීමයි. කාර්මික භූමිතෙල්, දැව් තෙල් 800', S.B.P.සහ තාර වල අලෙවි මිල අඩු වීමද මෙයට බලපා ඇත. කෙසේ වෙතත්, කාර්මික අංශය වෙතින් ඉපයූ ලාභය රු. බිලියන 5.3 ක් වූ අතර එය 2015 ලාභදායිතාවයට වඩා 244% කින් වැඩි අගයකි. මෙම අංශයේ දැව් තෙල් 800' අළෙවිය ප්‍රධානත්වයක් ගනු ලබන අතර එමගින් ලැබූ ලාභය රු. බිලියන 4.8 ක් විය. මීට පෙර වසරේදී දැව් තෙල් 1500' මගින් රු බිලියන 3.7 ක් ඉපයුවද මෙම වසරේදී එය ශූන්‍ය අගයක් විය. නමුත්, පසුගිය වසරේදී රු. මිලියන270 ක පාඩුවක් ලැබූ අතර මෙම වසරේදී එය ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව ලැබූ ඉතුරුවක් විය. තාර අලෙවිය තුළින් රු. මිලියන 56 ක ලාභයක් ලැබීම ප්‍රශංසනීය වන අතර පසුගිය වසරේදී මෙය පාඩු ලැබූවක් විය. අලෙවි කළ ප්‍රමාණයේ වැඩි වීම හා පිරිවැයට වඩා වැඩි මිල මෙම ලාභදායිතාවයට බලපෑ ප්‍රධාන සාධකයි.

ගෘහස්ථ අංශය


භූමිතෙල් ඉහළ සහන මිලක් යටතේ ලබාදීම හේතුවෙන් ගෘහස්ථ අංශය දිගින් දිගටම පාඩු ලැබීය. අලෙවි කරන ලද ප්‍රමාණය 7.57% කින් වැඩි වූ නමුත් ආදායම 11.09% කින් පහළ බැස තිබිණි. 2015 නොවැම්බර් මසදී රු.49 දක්වා මිල අඩු කිරීම 2016 මුළු වසරටම බලපෑ අතර එය 2015 නොවැම්බර් මාසයෙන් පසු පසු 2015 ආදායමට බලපෑවේය. ජාත්‍යන්තරව බනිජ තෙල් මිලේ පහළ බැසීමක් තිබූ බැවින් පාඩුව පෙර වසරට වඩා අඩු විය. LPG අලෙවිය රු.මිලියන 589 ක් දක්වා අඩු විය. එයට විලෝම වශයෙන් අලෙවියේ අඩුවීම සමග ලැබූ ලාභය රු. මිලියන 92 ක් දක්වා වැඩි වී ඇත.

දේශීය අංශයෙන් ලද ලාභය/ (පාඩුව)



නැව් ඉන්ධන පිරවුම

නැව් ඉන්ධන පිරවුමෙන් ලද ලාභය/(අලාභය)




නැව් ඉන්ධන පිරවුම මගින් ලැබූ ආදායම රු.මිලියන 479 ක් වූ අතර පෙර වසරට වඩා 65% ක අඩුවීමකි. නැව් ඉන්ධන සඳහා දැව් තෙල් අලෙවිය පාඩු මත සිදු කළ නිසා මෙම වසරේදී නැව් ඉන්ධන පිරවුම් තුළින් රු.මිලියන 66 ක පාඩුවක් ලැබීය. කෙසේ වෙතත්, 2015 දී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට දැව් තෙල් පිරිවැයට වඩා ඉහළ මිලකට අලෙවි කළ හැකි විය. ඩීසල් අලෙවිය මගින් පාඩුව යම් තරමකට අඩු කළ කළ මුත් ලාභය දැව් තෙල් මත අලාභය ආවරණය කිරීමට තරම් ප්‍රමාණවත් නොවීය.

අපනයන අංශය

මෙම වසරේදී අපනයන අංශයෙන් ලැබූ පාඩුව රු.බිලියන 2.31 දක්වා අඩු වූ අතර 2015 වසරේදී පාඩුව රු.බිලියන 6.17 ක් විය. නැප්තා සහ දැව් තෙල් සඳහා බලශක්ති අංශයේ ඉල්ලුම වැඩිවීම හේතුවෙන් අලාභ ලබමින් දැව් තෙල් සහ නැප්තා අපනයනය කිරීම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වලක්වනු ලැබීය. එහෙත් අප්‍රමාණවත් ගබඩා ධාරිතාවත් හේතුවෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට පාඩු පිට අතිරික්ත දැව් තෙල් සහ නැප්තා අපනයනය කිරීමට සිදු විය.

අපනයන වෙතින් ලද අලාභය



කෘෂි අංශය

කෘෂි අංශයේ කාර්යසාධනය මේ වසරේදී සතුටුදායක නොවීය. ලැබූ ආදායම රු.මිලියන 41 ක් වූ අතර එහි අලාභය රු. රු.මිලියන 90 කි. ආදායම 73.55% කින් අඩුවී ඇති අතර එහි ප්‍රතිඵලය ලෙස පාඩුව 13.92% කින් අඩුවී ඇත. කෘෂි අංශයේ ප්‍රතිපත්තිය වන්නේ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ වෙළෙඳපොල ඉල්ලුම කළමනාකරණය කිරීම සඳහා රජය විසින් හිමිකම් කියනු ලබන ව්‍යාපාරයක් වශයෙන් සාධාරණ මිල ගණන්වලට කෘෂි රසායන සැපයීම තුළින් රටේ කෘෂිකාර්මික අඩු මිළකට වෙළඳපොළ වෙත ඉදිරිපත් කිරීමයි.

2016 වසරේ අපගේ කාර්ය සාධනය

වසර තුළදී අප වැදගත් ව්‍යාපෘති ගණනාවක් සතුටුදායක ලෙස සම්පූර්ණ කර ඇත.

- ✓ පිරිපහදුව තුළ පොම්ප ඒකකයක් ප්‍රතිස්ථාපනය කිරීම
- ✓ අතිරේක ගුවන් තෙල් (ජෙට් ඒ 1) ටැංකියක් ඉදිකිරීම
- ✓ මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොල, ප්‍රධාන කාර්යාලයේ නව ගබඩා ගොඩනැගිල්ල සහ මුතුරාජවෙල ලිහිසි තෙල් ගබඩාව ජාලකරණය කිරීමේ ව්‍යාපෘතිය සම්පූර්ණ කරන ලදි.
- ✓ කටුනායක, ඔරුගොඩවත්ත සහ ජල පවිත්‍රාගාරය ජීවමිතික පදනම් මධ්‍යගත පැමිණීමේ ක්‍රමයක් ස්ථාපිත කිරීම
- ✓ දිවයින පුරා සිටින ලිහිසි තෙල් අලෙවිකරුවන් සඳහා මධ්‍යගත බිල් පත් සැකසීමේ සහ තොග කළමනාකරණය කිරීමේ පද්ධතියක් සංවර්ධනය කෙරිණි.
- ✓ පිරිපහදුව තුළ නව ටැංකි 5 ක් ඉදිකිරීම සමග එහි ගබඩා ධාරිතාව වැඩි කිරීම.
- ✓ කෘෂි රසායන සඳහා ස්වයංක්‍රීය බෝතල් පිරවීමේ යන්ත්‍රයක් මිලදී ගෙන ස්ථාපනය කිරීම.
- ✓ නව පාලක පැනල සඳහා වැඩි ඉඩක් ලබාගැනීමට ඉන්ධන පිරවුම් පාලන කාමරය නවීකරණය කරන ලදී.
- ✓ නල ආකාරයේ බොයිලේරුවක් මිලදී ගන්නා ලදී.

සංස්ථාවේ මූල්‍ය තත්වය

වත්කම්

වෙළෙඳ සහ වෙනත් ලැබීම්, තොගය සහ ආයෝජන ඇතුළත් වත්කම් 2016 වසර හා සාපේක්ෂව, ණය පියවීම සමග 4% කින් අඩුවී ඇත. තොගය, ප්‍රධාන වශයෙන් බොරතෙල් තොග සහ නිමි නිෂ්පාදන තොග ලෙස 13.55% කින් අඩු වී ඇත. මුදල් හා මුදල් සමාන දෑ 71.54% කින් අඩු වී ඇත. අනෙක් අතින්, කෙටි කාලීන ආයෝජන රු. බිලියන 15.36 කින් වැඩි වී ඇති අතර ණය ගැනීම් අඩු වී ඇත. ණය ගැති ලැබිය යුතු අගය පසුගිය වසරට සාපේක්ෂව රු.බිලියන 14.53 කින් වැඩි වී ඇත. ලංකා විදුලිබල මණ්ඩලයේ ගෙවීමට ඇති ප්‍රමාණය වැඩි වීම මෙයට ප්‍රධාන හේතුව විය.

වගකීම්

ජංගම සහ ජංගම නොවන වගකීම් 2015 වසර හා සාපේක්ෂව රු බිලියන 51 කින් අඩු වී ඇත. ණයගැනීම් රු බිලියන 74 කින් අඩුව ඇති අතර එය මූල්‍ය වියදම් අඩුවීමට හේතු වී ඇත. වසර තුළදී, 2004 වසරේ සිට වාර්ෂික පොළිය 12% ක අනුපාතයකට ගෙවමින් සිටි එක්සිම් බැංකු ණය මුදල ගෙවා නිම කිරීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට හැකි විය. කෙසේ වෙතත්, වෙළෙඳ සහ අනෙකුත් ගෙවීම් 14.4% කින් වැඩි වී ඇති අතර ප්‍රධාන වශයෙන් ගෙවීමට ඇති වගකීම වනුයේ රු. බිලියන 139.81 ක් වූ විදෙස් බිල් පත් ය.


ස්කන්ධය

ලබාගත් ප්‍රශංසනීය ලාභයන් සමග සංස්ථාවේ ඍණාත්මක ශුද්ධ වත්කම් තත්වය වසරින් වසරට සාපේක්ෂව 18.84% කින් අඩු විය. එමෙන්ම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, භාණ්ඩාගරයෙන් සහනාධාර මුදල් අය වීමට තිබියදීත රු. බිලියන 10 ක ලාභාංශ සාඩම්බරයෙන් යුතුව මහා භාණ්ඩාගාරය වෙත ලබාදෙන ලදී.

අපට හොඳින් කළ හැකිව තිබූ දේ

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට පහත බාධාවන් මධ්‍යයේ රු බිලියන 53 ක විස්තීර්ණ ආදායමක් ලැබීමට හැකි විය;

- ✓ රජය මගින් තීරණය කරන අධික සහන මිලක් යටතේ ඛනිජ තෙල් නිෂ්පාදන අලෙවි කිරීම
- ✓ පිරිවැය පරාවර්තිත මිල යාන්ත්‍රණයක් නොමැති වීම
- ✓ 2015 ජනවාරි මසදී දේශීය සිල්ලර මිල සංශෝධනය කෙරුණු අතර ගෝලීය තෙල් මිල ඉහළ ගියද ඉන්පසු මිල සංශෝධනයක් සිදු නොකෙරිණි.
- ✓ 1971 අංක 38 දරන මුදල් පනතේ 17 වන වගන්තියට අනුව සහනදායී මිල යටතේ සිදු කරනු ලැබූ අලෙවියට අදාලව රජය වෙතින් ලැබිය යුතු මුදල් නොලැබීම
- ✓ විනිමය අනුපාතය අවප්‍රමාණය වීමෙන් වූ පාඩුව රු. බිලියන 9 කි
- ✓ රජයට ගෙවූ බදු සහ විශේෂ ගාස්තු රු. බිලියන 137 කි
- ✓ දරන ලද මූල්‍ය වියදම් රු. බිලියන 11 ක් වූ අතර එයට හේතුව වූයේ මූල්‍ය සංරෝධයන් ආවරණය කිරීමට ලබාගත් ණය මුදල් ය.
- ✓ රජය විසින් ගෙවිය යුතු සහනාධාරය මගින් රජයේ බැංකුවලට ගෙවිය යුතු ණය පියවීමට යාන්ත්‍රණයක් නොමැති වීම
- ✓ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොමැති නිසා අපනයනය කළ අතිරික්ත දැව් තෙල් හා නැප්තා මගින් පාඩු ලැබීම.
- ✓ පිරිපහදු කටයුතු වෙතින් අවශ්‍ය ප්‍රමාණයට වඩා ප්‍රාථමික නිෂ්පාදන නිපදවූ බැවින් එම නිෂ්පාදන පාඩු පිට අලෙවි කිරීමට සිදු විය.
- ✓ රට හරහා දිවෙන නල මාර්ග ගරා වැටීම හේතුවෙන් වරායේ නැව්වල සිට පර්යන්ත වෙත අඩු පීඩනයක් යටතේ තෙල් පොම්ප කිරීම හේතුවෙන් වැඩි කාලයක් ගත වන බැවින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ප්‍රමාද නැව් කුලී ගෙවීමට සිදු වීම.



රජයෙන් සහනාධාර සඳහා ලැබිය යුතු මුදල නොලැබීමත් සමග 2008 වසරේ සිට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඍණාත්මක ශුද්ධ වත්කම් තත්වයක් පවත්වාගනිමින් සිටියේය. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට 2007 වසර වන තෙක් සහනාධාර කොටස ලැබිණි. එය අඛණ්ඩව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ලැබුණේ නම්, අප මූල්‍ය අපහසුතාවන්ට හා ණය තත්වයකට පත් නොවනු ඇත. මූල්‍ය වගකීම් නිරාකරණය පිණිස පොළී දරන බැංකු ණය ලබාගැනීමෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය කාර්ය සාධනය අයහපත් අතට හැරවිණි.


අවදානම් කළමනාකරණ වාර්තාව

මෙම පවත්නා දැඩි සමාජ සහ ආර්ථික පරිසරය තුළ රටේ විශාලතම බනිජ තෙල් නිෂ්පාදන සපයන්නා ලෙස ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ අවදානම් කළමනාකරණය එහි මෙහෙයුම් කටයුතුවල අනිවාර්ය අංගයක් ලෙස පවතී.

අවදානම් කළමනාකරණයේ අරමුණු වන්නේ;

- පාරිසරික, වෙළෙඳපොළ සහ අභ්‍යන්තර අර්බුද හේතුවෙන් සංස්ථාව අවදානමට ලක් වීමෙන් ආරක්ෂා කරගැනීම
- වර්ධනය සහ අවදානම නිසි ලෙස තුලනය කිරීම
- දිගු කලක් පැවැත්ම සහතික කිරීම
- අපගේ සේවකයින්, පාරිභෝගිකයින්, පොදු ජනතාව සහ සංස්ථාවේ වත්කම්, ගිනි හෝ අනතුරු වැනි අයහපත් සිද්ධිවලින් ආරක්ෂා කිරීම

ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ අවදානම් කළමනාකරණ රාමුව



ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ අවදානම් කළමනාකරණ රාමුව සංවර්ධනය කර ඇත්තේ සංස්ථාවට බලපාන ප්‍රධාන අවදානම් හඳුනාගැනීම සහ ඒවා විශ්ලේෂණය කිරීමෙන් පසුව රටේ බලශක්ති සැපයුම නිසියාකාරව සිදුවෙන ලෙසට එම අවදානම් කළමනාකරණය කිරීම සඳහාය. එමගින් සංස්ථාවේ අනාගත කටයුතු ස්ථාවර සහ පාලිත ආකාරයකින් සිදු කිරීමටත් ඒ අනුව ඵලදායී ක්‍රමසම්පාදනයකට සහ තීරණය ගැනීමට යොමු වීමටත් සංස්ථාවට හැකියාව ලැබේ.

ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය ආරක්ෂාවේ ප්‍රබල රේඛා දෙකක් මගින් සන්නද්ධ කර ඇත;

1. අභ්‍යන්තර පාලන පද්ධතිය
2. අභ්‍යන්තර විගණනය සහ බාහිර විගණනය

1961 අංක 28 දරන ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථා පනත, 1971 අංක 38 දරන මුදල් පනත. මුදල් රෙගුලාසි, යහපාලනය සඳහා වන මාර්ගෝපදේශ, රාජ්‍ය ව්‍යවසාය සඳහා වන හොඳම පරිචයන් සහ වෙනත් විවිධ රෙගුලාසි, ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ අවදානම් කළමනාකරණ රාමුවට ශක්තිමත් පදනමක් සපයයි.

1. අභ්‍යන්තර පාලන පද්ධතිය

සංස්ථාවට, ඉහත සඳහන් කළ පනත් අනුව පැහැදිලිව නිර්වචනය කරන ලද ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටීන් සහිත විස්තීරණ අභ්‍යන්තර පාලන පද්ධතියක් ඇත. එය සංස්ථාව සම්බන්ධව ඇති අවදානම් හඳුනාගැනීමට, කළමනාකරණය කිරීමට සහ වැලෙක්වීමට හැකියාව ලබාදෙයි.

2. අභ්‍යන්තර සහ බාහිර විගණනය

අභ්‍යන්තර සහ බාහිර විගණන ක්‍රියාකාරීත්වයන් අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය තුළ ඉතා වැදගත් භූමිකාවක් දරයි. හඳුනාගන්නා අවදානම් කළමනාකරණය කිරීම් සඳහා ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගැනීමට හෝ වැඩි දියුණු කිරීම් සඳහා නිර්දේශ කිරීම සඳහා අභ්‍යන්තර සහ බාහිර විගණකවරුන් මූල්‍ය සහ වෙනත් මෙහෙයුම් පද්ධතිවල සැලසුම් සහ ඵලදායිතාවය පරීක්ෂා කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරනු ලබන විගණන කමිටුව වැදගත් විගණන සොයාගැනීම් සහ කළමනාකාරීත්වයේ ප්‍රතිචාර සමාලෝචනය කරයි.

අවදානම් කළමනාකරණය සඳහා වන උපායමාර්ග

අවදානම් කළමනාකරණය සඳහා සංස්ථාව යොදාගන්නා උපාය මාර්ගයන් එම අවදානම්වල ස්වභාවය මත රඳා පවතී. අවදානමක් හඳුනා ගත් පසු ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව පහත ක්‍රියාකාරකම් ගනු ලැබේ;

- සිදුවීමේ හැකියාව වැලැක්වීම, හෝ
- අවදානම වෙනත් පාර්ශවයක් වෙත මාරු කිරීම, හෝ
- අවදානමේ ප්‍රතිඵලයන් පිළිගෙන ඒ අනුව සැලසුම් කිරීම

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පාලන ව්‍යුහය

සංස්ථාවේ අවදානම් කළමනාකරණ රාමුවේ ඵලදායීතාව වෙත හොඳින් සැකසූ පාලන ව්‍යුහයක් මගින් සහය සපයයි.

අවදානම් කළමනාකරණයේ ප්‍රධානතම වගකීම සභාපති ප්‍රමුඛ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරෙන අතර මණ්ඩල සහ විධායක මට්ටම්වල ඇති වෙනත් පාලන කමිටුවලින් සහය ලබයි. එම කමිටු පැහැදිලිව අර්ථ නිරූපණය කළ භූමිකා සහ වගකීම් සමග කටයුතු කරයි.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පාලන රාමුව සංස්ථානීය පාලන වාර්තාව යටතේ 35 වෙනි පිටුව තුළ දක්වා ඇත.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත නිරාවරණිත අවදානම්


සංස්ථාවට ඇති අවදානම් පිළිබඳ කෙටි විස්තරයක් සහ ඒ සඳහා ගෙන ඇති අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග මෙන්ම තවදුරටත් එම අවදානම් වැලැක්වීමේ යෝජනාවන් පහත දක්වා ඇත.

අවදානම	අවදානමෙන් ඇතිවන ප්‍රතිඵලය	අවදානමට ඇති ප්‍රතිචාරය	යෝජනා
ආර්ථික අවදානම			
රටේ උද්ධමන අනුපාතය සංස්ථාව මත දැඩි පීඩනයක් ඇති කරයි. ඛනිජ තෙල් නිෂ්පාදන සැපයීමේ වෙළෙඳපොළ ප්‍රධානියා ලෙස මෙන්ම රජයට අයත් ආයතනයක් වශයෙන් සමහර ඛනිජ තෙල් නිෂ්පාදන, ලාභ ලැබීමේ අරමුණට වඩා සමාජ සහ ආර්ථික තත්ත්වයන් සමනය කිරීමේ අරමුණින් ඉහළ සහන මිලකට ලබාදෙනු ලැබේ ඛනිජ තෙල් මිලේ සුළු වෙනස්කම් සමස්ත ආර්ථිකයටම දැඩි ලෙස බලපානු ලබයි.	උද්ධමන අනුපාතය වැනි ඍණාත්මක ආර්ථික සාධක පිරිවැය වැඩි කරන අතර ආදායම අඩු කරන අතර ලාභයන් ලැබීමේ හැකියාවන් බිඳ දමයි.	සංස්ථාවේ ලාභදායීතාව සහ රටේ සමාජ ආර්ථික තත්ත්වය යන ද්විත්වයම තුලනය කිරීමේ අරමුණින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ඛනිජ තෙල් තරගකාරී මිලගණන්වලට විකිණීමට හැකියාව ලබාදෙමින් පිරිවැය කළමනාකරණ මූලාරම්භයන් ක්‍රියාත්මක කිරීම.	පිරිවැය පරාවර්තිත මිල යාන්ත්‍රණයක් හඳුන්වා දීම
භාණ්ඩ මිල අවදානම			
ශ්‍රී ලංකාවට සම්පත් නොමැති නිසා බොර තෙල් සහ වෙනත් ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කෙරේ. එම නිෂ්පාදනවල මිල සැපයුම්කරුවන් විසින් තීරණය කෙරෙන අතර ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ඒ සම්බන්ධව බලපෑම් කළ නොහැක.	ගෝලීය ඉන්ධන මිල වැඩිවීම අලෙවි මිල, ආන්තිකයන්ට සහ මුදල් තත්වයන්ට ඍණාත්මක ලෙස බලපායි.	තොග සමාලෝචන කමිටුව අඛණ්ඩව රටේ තොග අවශ්‍යතාවය සහ ගෝලීය ඉන්ධන මිල අධීක්ෂණය කරන අතර මනා පිරිවැය ඵලදායීතාවයකින් තොග මිලදී ගනු ලබයි.	• පිරිවැය පරාවර්තිත මිල යාන්ත්‍රණයක් හඳුන්වා දීම • ගෝලීය වෙළෙඳපොල තුළ මිල පහළ යන විට තොග ගබඩා කර තබාගැනීම සඳහා ගබඩා ධාරිතාව ඉහළ දැමීම.

අවදානම	අවදානමෙන් ඇතිවන ප්‍රතිඵලය	අවදානමට ඇති ප්‍රතිචාරය	යෝජනා
නිෂ්පාදන අවදානම			
දේශීයව පිරිපහදු කළ නිෂ්පාදනයන් ලබා ගැනීමට බොරතෙල් සැකසුම් කරනු ලැබේ.	නිමැවුමේ ගුණාත්මක බව සහ නාස්තිය ලාභදායිතාවට බලපායි.	හැකි උපරිම ධාරිතාව සහ ලද හැකි තාක්ෂණය උපයෝජනය කරමින් බොරතෙල් පිරිපහදු කිරීම	• පිරිපහදු මෙහෙයුම් කටයුතු උත්ශ්‍රේණිගත කිරීම • නිමැවුම ගබඩා කිරීමට ගබඩා ධාරිතාව වැඩි කිරීම.
මෙහෙයුම් අවදානම			
අභ්‍යන්තර ක්‍රියාවලීන් සහ පද්ධතීන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඵලදායිතාවයට බලපෑම් කරයි.	ඵලදායී නොවන පාලනයන් සහ ක්‍රමපද්ධතීන්ගේ අසමත් බව කාලයද ඇතුළුව අධික නාස්තියට හේතුවෙන අතර ලාභදායිතාවයට ඍණාත්මකව බලපායි. එමෙන්ම එය ඛනිජ තෙල් නිෂ්පාදන අඛණ්ඩව වෙළෙඳපොළ වෙත සැපයීම කෙරෙහි ඍණාත්මකව බලපානු ලබන අතර සමස්ත රටටම අයහපත් ප්‍රතිඵල ගෙන එයි.	• මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියක්ද ඇතුළුව පැහැදිලිව නිර්වචිත ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටීන් ඇත. • අභ්‍යන්තර පාලන පද්ධතියේ පවතින අසාර්ථකත්වයන් හඳුනාගැනීම් පිණිස අභ්‍යන්තර විගණන අංශය මගින් ඇගයීමක් සිදු කෙරෙමින් පවතී. • සංස්ථාව හා සම්බන්ධ මෙහෙයුම් අවදානම් අවම කිරීම සඳහා ප්‍රසම්පාදන කමිටුව සහ ටෙන්ඩර් ඇගයීමේ කමිටුව යනාදී කමිටු ක්‍රියාත්මක වේ. • ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව එයට අදාළ පනත් සහ රෙගුලාසිවලට අනුව කටයුතු කරයි	පුද්ගලික අංශය සමග තරග කිරීම පිණිස නවතම තාක්ෂණය භාවිතා කරමින් පාලන හා ක්‍රමපද්ධතීන් යාවත් කාලීන කළ යුතුය.
ආරක්ෂණ අවදානම			
ඛනිජ තෙල් නිෂ්පාදන වහා ගිනි ගන්නා සුලු බැවින් ඒවා ආරක්ෂක ප්‍රමිතීන්ට අනුව පරිහරණය කළ යුතුවේ	ආරක්ෂණ ප්‍රමිතීන් නිසි ලෙස අනුගමනය නොකිරීමෙන් ව්‍යාපාරයට පමණක් නොව මිනිස් ජීවිත සහ දේපළ සඳහාද හානි සිදුවේ.	• සෞඛ්‍යය හා ආරක්ෂාව සඳහා වන ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටීන් නිසි ලෙස ක්‍රියාත්මක කෙරේ. • සේවකයින්ට නිරන්තර පුහුණුව ලබාදෙනු ලබේ.	සියලුම සේවකයින්ට අඛණ්ඩව පුහුණුව ලබාදිය යුතුය.
වෙළෙඳපොල අවදානම			
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට පුද්ගලික අංශය සමග තරගයක් පවතී.	තරගකාරීත්වය සහ ආර්ථික තත්ත්වය සමග පාරිභෝගික ආකල්ප වෙනස් වීම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ආදායම, ආන්තික සහ මුදල් තත්වයට බලපායි.	• නිෂ්පාදන සම්භාරය විවිධාංගිකරණය කිරීම • පාරිභෝගිකයින් සමග ගිවිසුම්වලට එලඹීම • ණයකරුවන්ගෙන් මුදල් එක් රැස්කරගැනීම	රජයට සම්බන්ධ ආයතනද ඇතුළු ණය වී ඇති ස්ථානවලින් මුදල් ලබාගැනීම වැඩි කිරීම.

අවදානම	අවදානමෙන් ඇතිවන ප්‍රතිඵලය	අවදානමට ඇති ප්‍රතිචාරය	යෝජනා
මානව සම්පත් අවදානම			
රටට අඛණ්ඩව ඉන්ධන සැපයීම උදෙසා මානව් සම්පත් ඉතා වැදගත් වේ. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මුහුණ දෙන අවදානම් වන්නේ මානව සම්පත් සම්බන්ධ නීතිමය ගැටළු මග හරිමින් හොඳම සේවකයන් ආකර්ෂණය කරගනිමින් පුහුණු කර ඔවුන්ව රඳවා ගැනීමයි.	නුසුදුසු ශ්‍රමික පිරිස, ඉහළ පිරිවැයක් සහ අඩු ලාභයක් ඇති කරමින් මෙහෙයුම් කාර්යක්ෂමතාවයට අයහපත් බලපෑම් ගෙන එයි. එමෙන්ම එය ඛනිජ තෙල් නිෂ්පාදනවල ගුණාත්මක බවට සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නාමයටද අයහපත් ලෙස බලපායි. මානව සම්පත් සම්බන්ධ නීතිමය ක්‍රියාමාර්ග ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අවශ්‍ය වියදමකි.	• සේවකයින් පුහුණු කිරීම • කම්කරු සමිති සමග සාමුහික එකඟතාවයකින් කටයුතු කිරීම තුළින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ සේවකයින් අතර තුලනයක් ඇතිවේ. • සේවක සුබසාධනය සහ වෙනත් ප්‍රතිලාභ ක්‍රමයන් සේවකයින් මෙහි රැඳී සිටීමට ඉවහල් වේ.	කාර්ය සාධනය මත පදනම් වූ තිළිණ සහ උසස්වීම් ක්‍රමයක් හඳුන්වා දීම
තොරතුරු තාක්ෂණ අවදානම			
විශ්වසනීය තොරතුරු නිවැරදි තීරණ ගැනීමට ඉතා වැදගත් වෙන අතර වෙළෙඳපොළ තුළ තරග කිරීමට නවතම තොරතුරු තාක්ෂණය අවශ්‍ය වේ.	තොරතුරු මඳවීම, වැරදි තොරතුරු සහ දත්ත ආරක්ෂාව නොමැති වීම වැරදි තීරණ ගැනීමට මග පාදන අතර එය ලාභදායිතාවය අඩු කර වේලාව වැඩියෙන් වැය කරනු ලබයි.	• ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව එහි ගනුදෙනු වාර්තා කිරීමට SAP පද්ධතිය භාවිතා කරයි. • පරිශීලකයින්ට තොරතුරු තාක්ෂණ පුහුණුව සැපයීම	• SAP පද්ධති පරිපාලන අයිතීන් සම්පූර්ණයෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව යටතට ගැනීම
විනිමය අනුපාත අවදානම			
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ආදායම බොහෝ විට ශ්‍රී ලංකා රුපියල්වලින් සිදු වෙන අතර ඛනිජ තෙල් නිෂ්පාදනවල පිරිවැය සහ ණය ආපසු ගෙවීම සිදු වන්නේ විශාල වශයෙන් ඇමරිකන් ඩොලර්වලිනි.	ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය අවප්‍රමාණය වීම විනිමය අනුපාත අලාභය වැඩි කර ලාභදායිතාවයට සහ මුදල් තත්ත්වයට අයහපත් ලෙස බලපායි.	සියලුම බැංකු විසින් දක්වන විනිමය අනුපාත දෛනිකව අධීක්ෂණය කෙරෙන අතර, බැංකුව විසින් දක්වන අනුපාතයට නොව වෙළෙඳපොළ හැසිරීම් අධීක්ෂණය කර වෙළෙඳපොළ අනුපාතයට ඩොලර් මිලදී ගනු ලැබේ.	• රජයට හිමි වාණිජ බැංකු එකකින් හෝ දෙකකින් මිලදී ගනු වෙනුවට ඕනෑම බලපත්‍රලාභී වාණිජ බැංකු වලින් එකකින් තරගකාරී අනුපාතයන්ට ඇමෙරිකන් ඩොලර් මිලදී ගැනීමට බලය ලබාදීම. • ඇමරිකානු ඩොලර් ණය ශ්‍රී ලංකා රුපියල්වලට හැරවීම
පොළී අනුපාත අවදානම			
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අභ්‍යන්තරිකව අරමුදල් උත්පාදනය කිරීමට නොහැකි වූ විට රටට ඛනිජ තෙල් නිෂ්පාදන අඛණ්ඩව සැපයීම සහතික කිරීම පිණිස අරමුදල් ණයට ගනු ලැබේ.	ණය සඳහා අය කෙරෙන පොළිය, පොළී වියදම සහ මූල්‍ය ගාස්තු හේතුවෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ලාභදායිතාවයට අයහපත් බලපෑමක් ඇති කරයි.	2015 වසරේ 5.5% ක් වූ විදේශ විනිමය ණය පොළී අනුපාතය 5% දක්වා අඩු කරනු ලැබිණි.	• රජය ප්‍රමාදයකින් තොරව සහනාධාර වටිනාකම පියවිය යුතුය. • රජයෙන් ලැබීමට ඇති සහනාධාර බැංකු ණය පියවීමට යොදා ගැනීමට රජයට හැකිය.

අවදානම	අවදානමෙන් ඇතිවන ප්‍රතිඵලය	අවදානමට ඇති ප්‍රතිචාරය	යෝජනා
ද්‍රවශීලතා අවදානම			
කලට වේලාවට සංස්ථාවේ මූල්‍ය වගකීම් සැපිරීමට නොහැකි වීම ද්‍රවශීලතා අවදානමයි.	නියමිත වේලාවන්හිදී පියවීමට නොහැකිවීම නිසා අමතර පොළී ගෙවීමට සිදුවීමෙන් එය පොළී පිරිවැය, මුදල් ප්‍රවාහය සහ වගකීම් තත්ත්වයට අයහපත් ලෙස බලපායි. එමෙන්ම ඉක්මණින් වත්කමක් අලෙවි කරගැනීමට නොහැකි වීමෙන්ද අපේක්ෂිත ලාභදායිතාවයට බාධා ඇති වෙයි.	• සංස්ථාවේ ද්‍රවශීලතා තත්ත්වය නිරන්තරව අධීක්ෂණය කෙරෙන අතර අනාගත ද්‍රවශීල අවශ්‍යතා නිශ්චය කරගනු ලැබේ. • බැංකු සහ මහා භාණ්ඩාගාරය සමග මිත්‍රශීලී සබඳතාවයන් හරහා සංස්ථාව විවිධ ආකාරයේ අරමුදල් ලබාගැනීමේ උපාය මාර්ගයන් සලසා ගෙන ඇත • සංස්ථාවේ ලාභදායිතාවය සහ ද්‍රවශීලතා තත්ත්වය තුලනය කරමින් අතිරික්ත මුදල් සුදුසු ආකාරයෙන් ආයෝජනය කෙරේ.	රජයේ ආයතනද ඇතුළුව ණයකරුවන්ගෙන් මුදල් එකතු කිරීම වැඩි වර්ධනය කිරීම.
ණය අවදානම			
ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව තම නිෂ්පාදන ණය පදනම්න් අලෙවි කරන බැවින් ණය අවදානම උද්ගත වේ. ***1. ගෙවීම් පැහැර හැරීමේ අවදානම*** පාරිභෝගිකයෙකු විසින් ගෙවීම පැහැර හැරීමේදී ඇතිවිය හැකි පාඩුව ගෙවීම් පැහැර හැරීමේ අවදානමයි. ***2. සංකේන්ද්‍රණ අවදානම*** සංකේන්ද්‍රණ අවදානම මතුවන්නේ නිශ්චිත පාරිභෝගිකයෙකුට, අංශයකට හෝ නිෂ්පාදනයට ඉහළ ණය නිරාවරණයක් ඇති වීමෙනි.	යම් පාරිභෝගිකයෙකු, ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවට ඇති ගිවිසුම්ගත බැඳීම් සැපිරීමට අසමත් වන්නේ නම් හෝ තම ගෙවීම ප්‍රමාද කරන්නේ නම් එය මුදල් ප්‍රවාහ ගැටළු ඇති කරන අතර ලාභදායිතාවට අයහපත් ලෙස බලපෑම් කරනු ඇත.	• නිෂ්පාදන වර්ග ගණනාවක් විවිධ අංශ වෙත පිරිනමමින් ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ ලැබීම් හොඳින් විවිධාංගිකරණය කර ඇත. • ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව රජයේ ආයතනවලින් නියමිත ලැබීම්, රජයට ගෙවිය යුතු බදු වෙනුවෙන් කපා හරිනු ලැබේ.	2016 දෙසැම්බර් 31 වන විට 72% කට ආසන්න ණය ගැනි ලැබීම් ප්‍රමාණයක් රජයේ ආයතනවලින් ලැබිය යුතු වූ නිසා රජයේ ආයතනවලට ණය ලබාදීම තවදුරටත් අඩු කිරීම සහ මුදල් අය කරගැනීම සඳහා කටයුතු කිරීම.




අවදානම	අවදානමෙන් ඇතිවන ප්‍රතිඵලය	අවදානමට ඇති ප්‍රතිචාරය	යෝජනා
පාරිසරික අවදානම			
පවතින දේශපාලන, නෛතික සහ සමාජ සන්දර්භයන් ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ මෙහෙයුම්වලට බලපානු ලබයි.	දේශපාලන, නෛතික සහ සමාජ පරිසරයන්ගේ වෙනස ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ තීරණ වෙනස් කරන අතර ඒවා වක්‍ර ලෙස ලාභදායිතාවට බලපායි.	• නියාමන අනුකූලතා නිරන්තරව සමාලෝචනය කිරීම • සමාජ සහ ආර්ථික ස්ථාවරත්වයට බලපෑම් කරන පාර්ශ්වකරුවන් සමග මිත්‍රශීලී සම්බන්ධතා පවත්වා ගැනීම	පාරිසරික අවදානමට මුහුණ දීම පිණිස තවදුරටත් සූදානම් වීම
සැපයුම්කරුවන් සම්බන්ධ අවදානම			
බනිජ තෙල් නිෂ්පාදන ආනයනය කරනු ලබන්නේ ජාත්‍යන්තර වෙළෙඳපොලෙන් වන අතර පහත කරුණු සම්බන්ධව සැපයුම්කරුවන් වෙතින් ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවට පීඩනයක් එල්ල විය; ***1. ගුණාත්මක බව පිළිබඳ අවදානම*** නිෂ්පාදනවල දුර්වලතා සහ අවශ්‍ය තාක්ෂණික ප්‍රමිතීන් රහිත නිෂ්පාදන ගුණාත්මක බව පිළිබඳ අවදානමක් නිර්මාණය කරයි. ***2. රඳාපැවතීමේ අවදානම*** ප්‍රධාන සැපයුම්කරුවන් මත රඳා පැවතීම සහ සැපයුම් අඩාල වීම රඳා පැවතීමේ අවදානමට හේතු වේ.	අඩු ගුණාත්මක බවකින් යුක්ත වූ නිෂ්පාදන සහ වේලාවට නිෂ්පාදන ලබාදීමට නොහැකි වීමෙන් සංස්ථාවේ ප්‍රතිරූපයට හානි සිදුවෙන අතර පාරිභෝගිකයින් සහ ආදායම අහිමි වීමට මග පාදයි.	බනිජ තෙල් නිෂ්පාදන ඇතුළු භාණ්ඩ හා සේවාවන්ගේ ගුණාත්මක බව සහ අඛණ්ඩ සැපයුම් තහවුරු කිරීම පිණිස සංස්ථාව විසින්, තොග සමාලෝචන කමිටුව, ප්‍රසම්පාදන කමිටුව සහ ටෙන්ඩර් ඇගයීම් කමිටුව වැනි අනු කමිටු පිහිටුවා ඇත.	සැපයුම්කරුවන් සමග මිත්‍රශීලී සම්බන්ධතා වැඩි කරගැනීම

සංස්ථායික පාලනය

ප්‍රබල සංස්ථායික පාලනය විසින් පාර්ශවකරුවන්ගේ අගය, සංස්ථාවේ සම්පත් ආරක්ෂා කිරීමටත් උපක්‍රමික වර්ධන අරමුණු ළඟා කරගැනීම උදෙසාත් ශක්තිමත් පදනමක් සපයයි. රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ කමිටුව විසින් සිදු කරන ස්වායත්ත සමාලෝචනය සහ පොදු ජනතාව විසින් ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ මෙහෙයුම් සහ කටයුතු පිළිබඳව දක්වන ලැදියාව, අනුකූලතාවය ඇති කිරීම, ඉහළම මට්ටමේ අවංක බවක් ඇති කිරීම සඳහා ප්‍රධාන මග වන අතර අවසාන වශයෙන් යහපාලනය තහවුරු කරනු ලබයි.

පාලන රාමුව



ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය

සංස්ථාවේ ප්‍රධාන බලවේගය වන්නේ උපක්‍රමික, මූල්‍ය සහ කීර්තිය පිළිබඳ කරුණු සම්බන්ධව තීරණ ගනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලයයි. 1961 අංක 28 දරන ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථා පනත විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ ක්‍රියාකාරීත්ව පරාමිතීන් සකසනු ලබන අතර යහපත් සංස්ථායික පාලනය සහතික කරයි. එමෙන්ම එය අධ්‍යක්ෂවරුන්ගේ භූමිකා සහ වගකීම් මෙන්ම ධුර කාලය සහ මණ්ඩලයේ සංයුතියද දක්වයි. සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරනු ලබන්නේ බනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසිනි. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් අතුරින් එක් සාමාජිකයකු මහාභාණ්ඩාගාරයේ නියෝජිතයෙකු වන අතර එක් අධ්‍යක්ෂවරයෙකු බනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ නියෝජිතයෙකු වෙයි. 2016 වසරේ දී සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ හැර අන් සියලු දෙනා විධායක නොවන අධ්‍යක්ෂකවරු විය. බාහිර විගණකවරුන් විසින් කරන ලද විමසුමට ප්‍රතිචාරයක් ලෙස ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව 2017 වර්ෂේදී සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ ධුර සඳහා පුද්ගලයන් දෙදෙනෙකු පත් කරන ලදී.

සියලුම අධ්‍යක්ෂවරුන්ගේ සාරාංශගත තොරතුරු සහ ඔවුන්ගේ සුදුසුකම් හා අත්දැකීම් මෙම වාර්තාවේ 7 සිට 10 දක්වා පිටුවල අඩංගු වේ.

අධ්‍යක්ෂ	අධ්‍යක්ෂ ධූරයේ තත්වය	පත්වීම් දිනය	අස්වූ දිනය
ටී.ජී ජයසිංහ මහතා (සභාපති /කළමනාකාර අධ්‍යක්ෂ)	විධායක අධ්‍යක්ෂ	12/10/2015	27.01.2017
ඩී.සී.එස්. සෙනෙවිරත්න මහතා	විධායක නොවන අධ්‍යක්ෂ	12/10/2015	23.05.2017
ජේ. ඩයස් මහතා	විධායක නොවන අධ්‍යක්ෂ	21/01/2016	03.03.2016
කේ.ඒ. විමලේන්තිරරාජා මහතා	විධායක නොවන අධ්‍යක්ෂ	19/11/2015	අ/නො
ඕ. ගල්හේන මහතා	විධායක නොවන අධ්‍යක්ෂ	12/10/2015	22.05.2017
ආර්. හරිස්චන්ද්‍ර මහතා	විධායක නොවන අධ්‍යක්ෂ	12/10/2015	28.05.2017
එම්.ජී. ජයසේන මහතා	විධායක නොවන අධ්‍යක්ෂ	12/10/2015	02.03.2017
එස්. ප්‍රනාන්දු මහතා	විධායක නොවන අධ්‍යක්ෂ	17/03/2016	23.05.2017

2018 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලයට සහභාගී වීම

මාසිකව සාමාන්‍ය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වනු ලබන අතර අවශ්‍ය වූ විට විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කැඳවනු ලබේ. ඇරයුම මත ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් රැස්වීම්වලට සහභාගී වේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් නිල න්‍යාය පත්‍රයක් මත පැවැත්වෙන අතර රැස්වීමට පෙර සංස්ථායික කළමනාකාරීත්වය විසින් අදාළ විස්තරාත්මක පසුබිම් තොරතුරු අධ්‍යක්ෂවරුන් වෙත ලබාදෙනු ලැබේ. මෙම වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 17 ක් පවත්වන ලදී. පහත වගුව, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා එක් එක් අධ්‍යක්ෂවරයාගේ පැමිණීම පෙන්වයි

අධ්‍යක්ෂ	ටී.ජී ජයසිංහ මහතා (සභාපති /කළමනාකාර අධ්‍යක්ෂ)	ඩී.සී.එස්. සෙනෙවිරත්න මහතා	ජේ. ඩයස් මහතා	කේ.ඒ. විමලේන්තිරරාජා මහතා	ඕ. ගල්හේන මහතා	ආර්. හරිස්චන්ද්‍ර මහතා	එම්.ජී. ජයසේන මහතා	එස්. ප්‍රනාන්දු මහතා
21/01/2016	√	√	√	√	√	√	√	ප/නැ
16/02/2016	√	√	√	√	√	√	√	ප/නැ
02/03/2016	√	√	√	√	√	√	√	ප/නැ
29/03/2016	√	√	අස්	√	√	√	√	√
01/04/2016	√	√	අස්	√	√	√	√	√
25/04/2016	√	√	අස්	√	√	√	√	√
17/05/2016	√	√	අස්	අව	√	√	√	√
07/06/2016	√	අව	අස්	√	√	√	√	√
29/06/2016	√	අව	අස්	√	√	√	√	√
15/07/2016	√	අව	අස්	√	√	√	√	√
11/08/2016	√	√	අස්	√	√	√	√	√
26/08/2016	√	√	අස්	අව	√	√	√	√
20/09/2016	√	√	අස්	√	√	√	√	√
11/10/2016	√	√	අස්	√	√	√	√	√
31/11/2016	√	√	අස්	√	√	√	√	√
22/11/2016	√	√	අස්	√	√	√	අව	√
15/12/2016	√	√	අස්	අව	√	√	√	අව
රැස්වීම් සංඛ්‍යාව 17	17/17	14/17	3/3	13/17	17/17	17/17	16/17	13/14

√ - සහභාගී විය ප/නැ - පත්කරනැත අස්- අස්වූ
අව- අවසර දුන්

අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වය

1961 අංක 28 දරන ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථා පනත අනුව, අධ්‍යක්ෂවරුන්ට අධ්‍යක්ෂ මණ්ඩලය තුළ වසර තුනකට නොවැඩි ධූර කාලයක් ඇති අතර නැවත පත් කිරීමට යටත් වේ. තීරණ ගැනීමට පෙර, සංස්ථායික කළමනාකාරීත්වයෙන් අදාළ තොරතුරු ලබාගන්නා අධ්‍යක්ෂ මණ්ඩලය අවශ්‍ය වන්නේ නම් බාහිර විෂ්තිකයන් වෙතින්ද තොරතුරු ලබාගනී. අධ්‍යක්ෂ මණ්ඩලයට තම වගකීම් කාර්යක්ෂම ඉටු කිරීම සඳහා කලට වේලාවට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අවශ්‍ය තොරතුරු සැපයීමේ වගකීම සංස්ථායික කාර්ය මණ්ඩලය සතු වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ භූමිකාව

සංස්ථාවේ සාර්ථකවත්වය සහ තිරසරබව සඳහා සමස්ත වගකීම සහ වගවීම ඇත්තේ අධ්‍යක්ෂ මණ්ඩලයටයි. මූලික වශයෙන් එහි භූමිකාව වන්නේ සංස්ථාවේ උපක්‍රමික දිශානතීන් සහ සමස්ත කාර්යසාධනය සඳහා නායකත්වය සැපයීමත් සියලුම පාර්ශවකරුවන්ගේ අභිලාශයන් ආරක්ෂා කිරීමත් ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ භූමිකාව

සංස්ථාවේ සාර්ථකවත්වය සහ තිරසරබව සඳහා සමස්ත වගකීම සහ වගවීම ඇත්තේ අධ්‍යක්ෂ මණ්ඩලයටයි. මූලික වශයෙන් එහි භූමිකාව වන්නේ සංස්ථාවේ උපක්‍රමික දිශානතීන් සහ සමස්ත කාර්යසාධනය සඳහා නායකත්වය සැපයීමත් සියලුම පාර්ශවකරුවන්ගේ අභිලාශයන් ආරක්ෂා කිරීමත් ය.

එමෙන්ම සංස්ථාවේ දැක්ම සාක්ෂාත් කරගැනීම සඳහාත් අධ්‍යක්ෂ මණ්ඩලය වග කියනු ලබයි. මෙම වගකීම ක්‍රියාත්මක කිරීමේදී ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ කාර්ය සාධනය සහ මූල්‍ය ප්‍රතිඵල අධීක්ෂණය කරමින් සහ එහි සංස්ථායික පාලන රාමුවේ ප්‍රධාන භාරකරුවා ලෙස උපාය මාර්ගයන් සාක්ෂාත් කරගැනීම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලයට වගවීමක් ඇත. එමෙන්ම ඔවුන් ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන් සහ ආචාර ධාර්මික ප්‍රමිතීන් සමග අනුගත වීම සම්බන්ධවද වගකියනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලයට තම බලතල සහ වගකීම් ඕනෑම අධ්‍යක්ෂවරයෙකුට හෝ සේවකයෙකුට පැවරිය හැකි අතර එසේ පත්කරන සෑම නියෝජිතයාම, අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව තම බලතල හෝ රාජකාරිය ක්‍රියාත්මක කළ යුතුය. ප්‍රතිපත්ති සකසා ක්‍රියාත්මක කිරීමෙන් සහ ඒවාගේ ඵලදායිතාවය තහවුරු කරමින් ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය උත්සාහ කරයි. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සෘජුවම අභ්‍යන්තර සහ බාහිර විගණකවරු සමග හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ සාමාජිකයින් සියලු දෙනා සමගම සන්නිවේදනයේ යෙදෙයි.

ඉහත කරුණුවලට අමතරව, වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, වාර්ෂික අයවැය, සංස්ථායික සැලසුම, ක්‍රියාකාරී සැලසුම සඳහා අනුමැතිය ලබා දීම සඳහා නිත්‍ය පදනමෙන් මූල්‍ය කාර්ය සාධනය සමාලෝචනය කිරීම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය වගකියනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රධාන පත්කිරීම්, කාර්ය මණ්ඩල උසස්කිරීම්, ප්‍රධාන ප්‍රාග්ධන වියදම් ආයෝජන සහ සංස්ථායික පාරිභෝගිකයින්ට ණය පහසුකම් සම්බන්ධ අනුමැතීන් ලබාදීම් සම්බන්ධවද සොයා බැලේ.

අනු කමිටු

මණ්ඩලයේ ප්‍රධාන රාජකාරීන් සමහරක් ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට විගණන කමිටුවේ සහය ලැබේ. මීට අමතරව උප කමිටු හතරක් ක්‍රියාත්මක වේ- කළමනාකරණ කමිටුව, තොග සමාලෝචන කමිටුව, ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණික ඇගයීම් කමිටුව.

විගණන කමිටුව

විගණන කමිටුව කළමනාකාරීත්වයෙන් ස්වායීන භූමිකාවක් දරනු ලබන අතර අධ්‍යක්ෂ මණ්ඩලයට වගවීම සහිත වෙයි. විගණන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන පරිදි විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වෙයි. විගණන කමිටුවේ සංයුතිය, දරන භූමිකාව, රැස්වීම් ගණන සහ විගණන කමිටු සඳහා සහභාගිවීම සම්බන්ධ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ 40 සහ 41 පිටුවල දක්වා ඇත.

කළමනාකරණ කමිටුව

වසර තුළ, කළමනාකාරීත්ව කමිටුව අධ්‍යක්ෂවරු දෙදෙනෙකු හෝ තිදෙනෙකුගෙන් සමන්විත වූ අතර ඉන් එක් අයෙක් කමිටුවේ සභාපති විය. ක්‍රියාකාරීත්වයන් පිළිබඳ ප්‍රධානියාද මෙම රැස්වීම් සඳහා සහභාගි වේ. සමාලෝචිත වසර තුළදී අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කෙරෙන කරුණු පිළිබඳව සමාලෝචනය කිරීමට තෙවරක් රැස් විය. කමිටුව තම වාර්තාව අවසන් අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කරයි.

වසර තුළ සංයුතිය සහ පැමිණීම

කමිටු සාමාජික	15/02/2016	26/05/2016	08/08/2016	රැස්වීම් සංඛ්‍යාව: 3
ඒ.ජේ.ඩී ඩයස් මහතා	√	අස්	අස්	1/1
පී. ගල්හේන මහතා	√	√	√	3/3
ආර්. හරිස්චන්ද්‍ර මහතා	√	නො	√	2/3
ටී.ජී. ජයසිංහ මහතා	ප/නැ	√	√	2/2
එස්. ප්‍රනාන්දු මහතා	ප/නැ	√	√	2/2
එන්.ආර්.ආර්. ජයසේකර මහතා	√	අව	√	2/3
එස්.ඩබ්ලිව් ගමගේ මහතා	√	√	√	3/3
ජී.ඒ.එස්.පී. ගුණවර්ධන මහතා	√	√	නො	2/3
එම්.කේ. ගරුසිංහ මහතා	√	√	√	3/3
ඩබ්.එස්. පෙරේරා මහතා	√	√	√	3/3
ඩබ්එම්.කේ.ආර්.බී. වික්‍රමසිංහ මහතා	√	√	√	3/3
එස්.පී. විතාන මහතා	√	√	√	3/3
ආර්.ඒ.කේ.සී ආරියරත්න මෙය	√	√	√	3/3
කේ.ඩී.ජී.එන්.අයි සපරමාදු මහතා	√	√	නො	2/3

√ - පැමිණිනො – නොපැමිණි අ – අස්වූ
අව-අවසර දුන් ප/නැ - පත්කර නැත

තොග සමාලෝචන කමිටුව

තොග සමාලෝචන කමිටුව, වර්තමාන තොග තත්ත්වය විශ්ලේෂණය කිරීමෙන් පසු ඉදිරි මාස තුනක කාලය සඳහා තොග අවශ්‍යතාවයන් අගයනු ලබයි එය සතිපතා ලංකා බනිජ තෙල් තොග පර්යන්ත සමාගම, IOC, PUCL සහ ලංවිමනියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් හමුවේ. පුරෝකථනය කළ රටේ ඉල්ලුම, පිරිපහදු නිෂ්පාදන හැකියාව සහ ටැංකි ගබඩා පහසුකම් වෙත අවධානය යොමු කිරීමෙන් පසු ආනයනයන් සහ නැවිගත කිරීම් ප්‍රමාණයන් සැලසුම් කෙරේ. මෙම නිත්‍ය සමීප අයික්ෂණ ක්‍රියාවලිය, රටට අඛණ්ඩව ඉන්ධන සැපයීමට සහ මනා ලෙස සංස්ථාවේ ක්‍රියාවලීන් සිදු කිරීමටත් ආනයන, පිරිපහදු සහ රැඳවීමේ පිරිවැය අඩු කිරීමටත් හැකියාව ඇති කරයි.

ප්‍රසම්පාදන කමිටුව (PC) සහ තාක්ෂණික ඇගයීම් කමිටුව (TEC)

නිෂ්පාදන, භාණ්ඩ, සේවාවන් සහ කාර්යයන් මිලදී ගැනීම සම්බන්ධව ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනය මාර්ගෝපදේශයන් නිකුත් කර ඇත. ප්‍රමාදයන් අවම කිරීමට සහ ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවට වඩාත් වාසිදායක සහ ගුණාත්මකම සේවාවන් මූල්‍ය මය ලෙස ලබාගැනීමට තාක්ෂණික ඇගයීම් කමිටුව සහ ප්‍රසම්පාදන කමිටුව ක්‍රියාත්මක වන්නේ ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනය විසින් නිකුත් කළ මාර්ගෝපදේශයන් යටතේය. ප්‍රසම්පාදන කමිටුව මිලදී ගැනීම්වල අනෙකුත් අංගයන් පිළිබඳව සලකා බලන අතර තාක්ෂණික ඇගයීම් කමිටුව මිලදී ගැනීම්වල තාක්ෂණික කරුණු පිළිබඳව අවධානය යොමු කරයි.

ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව තුළ මිලදී ගැනීමේ අගය මත පදනම්ව පහත ප්‍රසම්පාදන කමිටු ක්‍රියාත්මක වේ.

- දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව
- අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව
- අමාත්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කළ ප්‍රසම්පාදන කමිටුව
- ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව
- ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව

නිමිකාරත්වය සමග ඇති සම්බන්ධතා

සංස්ථාවේ ව්‍යාපාරය රඳා පවතින්නේ සියලුම පාර්ශ්වකරුවන් සමග මිත්‍රශීලි සහ අර්ථාන්විත සම්බන්ධතා ඇති කරගැනීම මතයි. ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව, සංස්ථාව සහ එහි පාර්ශ්වකරුවන් අතර ඇති අන්‍යෝන්‍ය අවබෝධය ප්‍රවර්ධනයේ වැදගත්කම අවබෝධ කරගනී. අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය අනුව සංස්ථාවේ පාලන පාර්ශ්වය සහ හිමි ආයතනය වන්නේ ශ්‍රී ලංකා රජයයි. සංස්ථාව තම මෙහෙයුම් කටයුතු කළමනාකරණය කිරීමේදී බනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරය සහ ශ්‍රී ලංකා මහ බැංකුව සමග සමීපව කටයුතු කරයි. සංස්ථාව විසින් ප්‍රධාන ව්‍යාජ්ත කිරීමේ වැඩසටහන් සඳහා මාර්ගෝපදේශය ලබාගැනීමට සහ අරමුදල් සපයා ගැනීමට මෙම ආයතන සමග සම්බන්ධ වේ. රජය සමග කටයුතු කරන ප්‍රධාන පුද්ගලයා සභාපති/ කළමනාකරණ අධ්‍යක්ෂ වන අතර එවැනි සන්නිවේදනයන් වාචිකව සහ ලිඛිතව සිදු කරනු ලබයි. ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව හැකි හොඳම අයුරින් නෛතිකව අවශ්‍ය කරන සහ වෙනත් අදාළ තොරතුරු රජයට සපයනු ලබයි.

අභ්‍යන්තර පාලන

සංස්ථාවට ක්‍රමාණුකූලව ක්‍රියාත්මක වීම සඳහා ඵලදායී අභ්‍යන්තර පාලනයක් අත්‍යවශ්‍යය. මෙම ක්‍රමපද්ධතිය මගින් අපේක්ෂා කරන්නේ සංස්ථාවේ වත්කම් ආරක්ෂා කිරීම සහ නිසි වාර්තා තබාගැනීමත් විශ්වසනීය තොරතුරු ලබාගැනීමත් ය. අභ්‍යන්තර පාලන ක්‍රම පද්ධතියට සියලුම පාලනයන් අයත් වේ. මූල්‍ය මෙහෙයුම් සහ අනුකූලතා පාලන සහ අවදානම් කළමනාකරණයද එයට අයත් වේ. ප්‍රායෝගිකව ගත් කල අභ්‍යන්තර පාලන ක්‍රමය ප්‍රතිපත්ති සහ ව්‍යාපාර අරමුණු ළඟා කර ගැනීමට නොහැකි වීමේ අවදානම තුරන් කරනවාට වඩා පිළිගත හැකි අවදානම් පැතිකඩක් තුළ ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රධාන අවදානම් ක්ෂේත්‍රයන් කළමනාකරණය කරනු ලබයි. ඒ අනුව, අභ්‍යන්තර පාලන පද්ධතියට කළ හැක්කේ කළමනාකාරීත්වයේ සහ මූල්‍ය තොරතුරු හෝ වාර්තාවල ප්‍රමාණවත් සාවද්‍ය ප්‍රකාශය සම්බන්ධව හෝ මූල්‍ය අලාභයන් හෝ වංචාවන් සම්බන්ධව සාධාරණ එහෙත් පරම නොවන සහතිකයක් ලබා දීම පමණි.

සංස්ථාවේ අභ්‍යන්තර විගණන අංශයට සියලුම අභ්‍යන්තර පාලන ක්‍රියාපටිපාටීන් සහ ඒවායේ ප්‍රමාණවත් බව හා ඵලදායිතාවය සමාලෝචනය කිරීමට හා අභ්‍යන්තර පාලනවල වැඩි දියුණු කිරීම් සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් පවරා ඇත.

අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශය වෘත්තීමය වශයෙන් සුදුසුකම්ලත් වරලත් ගණකාධිකාරි විසින් මෙහෙයවනු ලැබේ. අභ්‍යන්තර පාලන ඇගයීමට, අවදානම් ප්‍රදේශ හඳුනාගැනීමට සහ ගනුදෙනුවල සම්පූර්ණත්වය සනාථ කිරීමට විගණන කමිටුව විසින් අනුමත කරන ලද විගණන සැලසුම් පැවතිණි. මීට අමතරව කළමනාකාරීත්වයට නිරීක්ෂණ සහ නිර්දේශ සැපයීමේ අරමුණින් විශේෂ විමර්ශන කටයුතු කිරීමටත් ඔවුන්ට බලය පවරා ඇත. නිෂ්පාදන අලාභයන් සහ ආදායම් අලාභයන් යන ක්ෂේත්‍රවල අවදානම් හඳුනාගැනීම, විගණකාධිපතිවරයාගේ වාර්තාව සාකච්ඡා කිරීම සහ විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම හා විගණන සැලසුම් සම්පූර්ණ කළ සත්‍ය වැඩකටයුතු සමග කාලානුරූපව සමාලෝචනය කිරීම, විගණන අංශය විසින් සිදු කරන අනෙක් කාර්යයන් ය.

සංස්ථායික කළමනාකාරීත්වය

උපාය මාර්ගික දිශානතිය, සකසන ලද ප්‍රතිපත්ති සහ වරින් වර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන පටිපාටීන් මත පිහිටා සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ විසින් සංස්ථාවේ සාමාන්‍ය කටයුතු කළමනාකරණය කරනු ලබයි. ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ මෙහෙයුම් සහ ප්‍රධාන පරිපාලනය පිරිපහදු මෙහෙයුම් සහ ප්‍රාදේශීය කාර්යාල ඇතුළු ප්‍රධාන කාර්යාල මෙහෙයුම් වශයෙන් පුළුල් ක්ෂේත්‍ර දෙකකට බෙදිය හැකිය.

පිරිපහදු කටයුතු සඳහා පිරිපහදු කළමනාකරු නායකත්වය ලබාදෙන අතර ඔහුට විද්‍යුත් සහ උපකරණ, නිෂ්පාදන සහ මෙහෙයුම්, නඩත්තු හා ව්‍යාපෘති සහ තාක්ෂණික සේවා වැනි ප්‍රධාන තාක්ෂණික අංශයන්ගේ නියෝජ්‍ය පිරිපහදු කළමනාකරුවන් සහය ලබා දෙනු ලබයි.

වඩාත් යහපත් කළමනාකරණයක් සඳහා ප්‍රධාන කාර්යාලය විවිධ ක්‍රියාකාරීත්වයන් යටතේ බෙදා ඇති අතර සෑම අංශයක්ම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයෙකු හෝ කළමනාකරුවෙකු මගින් පාලනය වේ. ඔවුන් සංස්ථාවේ එදිනෙදා කටයුතු සඳහා සභාපති/ කළමනාකාර අධ්‍යක්ෂ වෙත සහය ලබාදෙයි. සංස්ථායික කළමනාකරුවන් හැකියාවන්, අත්දැකීම් වශයෙන් මෙන්ම අධ්‍යාපනිකව උපාධි සහ වෘත්තීය සුදුසුකම් ලැබූ පුද්ගලයන් වේ. ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ සාරාංශගත තොරතුරු සහ ඔවුන්ගේ සුදුසුකම් හා අත්දැකීම් මෙම වාර්තාවේ 10 සිට 11 දක්වා පිටුවල අඩංගු වේ.

අනුකූලතාවය සහ පාරදෘශ්‍යභාවය

අදාළ සියලු නීති, රෙගුලාසි, ප්‍රමිතීන්, හොඳම පරිචයන් සහ භාවිත සංග්‍රහ සමග අනුකූල වීම සංස්ථාවේ සාර්ථකත්වය සහ තිරසර බවට අත්‍යවශ්‍ය වේ. ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ පාලනය පදනම් වන්නේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරුවන්ගේ ආයතනය විසින් නිකුත් කළ සංස්ථායික පාලනය පිළිබඳ භාවිත සංග්‍රහය සහ මුදල් අමාත්‍යාංශය විසින් 2003 වසරේදී නිකුත් කළ යහපාලනය සඳහා වන රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශය මතයි. අධ්‍යක්ෂ මණ්ඩලය, ශක්තිමත් පාලන පරිචයන් ආරක්ෂා කරමින් එම අවශ්‍යතාවයන් අනුව කටයුතු කිරීමට කැප වී සිටී.

ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව තම සියලු කාර්යයන් තුළදී පාරදෘශ්‍යභාවය පවත්වාගැනීමට කටයුතු කරයි. සංස්ථාව, වගවීම සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRS/LKAS) සහ අදාළ රෙගුලාසි සමග අනුකූලව කටයුතු කරයි. අභ්‍යන්තර පාලන ක්‍රමය, 1971 අංක 38 දරන මුදල් පනත අනුව සංස්ථාවේ දෛනික කටයුතු සමග ඒකාබද්ධ කර ඇත. මූල්‍ය ප්‍රකාශන වාර්ෂිකව පල කෙරෙන අතර පාර්ලිමේන්තුවේ සභාගත කෙරේ. මුදල් පනත අනුව, විගණකාධිපතිවරයා සංස්ථාවේ බාහිර විගණනය සිදු කරනු ලබයි.

විගණන කමිටුවේ වාර්තාව

ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනු කමිටුව වේ. මූල්‍ය වාර්තාකරණය සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය ස්වාධීනව අගයන අතර එය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තම අධීක්ෂණ වගකීම් සපුරන බවටද තහවුරු කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අදාළ සුදුසුකම් සහ අත්දැකීම් සහිත විධායක නොවන අධ්‍යක්ෂවරුන් විගණන කමිටුවට පත් කරන අතර එය අධ්‍යක්ෂ මණ්ඩලයට වග වෙයි.

විගණන කමිටුවේ ප්‍රධාන වගකීම්

රාජ්‍ය වාණිජ ව්‍යාපාර වල විගණන කමිටු ඇතිකිරීම සම්බන්ධව නිකුත් කළ භාණ්ඩාගාර චක්‍රලේඛවල දක්වා ඇති වගකීම්, අධිකාරීන් සහ නිශ්චිත රාජකාරී ක්ෂේත්‍රයන් ආවරණය කරමින් කමිටුවේ විගණන ප්‍රඥප්තිය සකස් කර ඇත.

විගණන කමිටුවේ ප්‍රධාන වගකීම් පහත පරිදි වේ;

- අභ්‍යන්තර පාලන පද්ධතීන්ගේ ප්‍රමාණවත් බව, වේලාව සහ පැවතීම සමාලෝචනය කිරීම
- ව්‍යාපාර මෙහෙයුම්වල අනුකූලතාවයන් අධීක්ෂණය කිරීම
- මූල්‍ය වාර්තාකරණ පද්ධතියේ අනාවරණයන්ගේ ප්‍රමාණවත් බව තහවුරු කිරීමට මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය කිරීම.
- භාවිතා කරන ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සංගත භාවය සහ ශ්‍රී ලංකා ඉණුම්කරණ ප්‍රමිතීන් ඇතුළු මූල්‍ය වාර්තාකරණ රෙගුලාසි සමග වන අනුකූලතාවය තහවුරු කිරීම.
- සංස්ථාව නිරාවරණය වන අවදානම්, එම අවදානම් මගහැරීමට ගන්නා ලද ක්‍රියාමාර්ග සහ ඒවායේ ඵලදායිතාවය සමාලෝචනය කිරීම.
- වසරේ විගණන සැලසුම සාකච්ඡා කිරීම සහ අනුමත කිරීම

විගණන කමිටු රැස්වීම් සහ සංයුතිය

විගණන කමිටු රැස්වීම් නිල න්‍යාය පත්‍රයක් මත පැවැත්වෙන අතර රැස්වීමට පෙර ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය විසින් අදාළ විස්තරාත්මක පසුබිම් තොරතුරු සාමාජිකයින් වෙත ලබාදෙනු ලැබේ. පැහැදිලි කිරීම් ලබාගැනීමට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරවරු සහ කළමනාකාරවරු ඇරයුම් මත විගණන කමිටු රැස්වීම්වලට සහභාගි වේ.

සමාලෝචිත වසර තුළ විගණන කමිටු රැස්වීම් හතරක් පැවැත්වූ අතර රැස්වීම්වල සංයුතිය සහ කමිටු සාමාජිකයින්ගේ පැමිණීම පහත පරිදි වේ;

කමිටු සාමාජික	කේ.ඒ. ඩිමලේන්තිරරාජා මහතා	ඒ. ගල්හේන මහතා	ආර්. හරිස්චන්ද්‍ර මහතා	එස්. ඉනාන්දු මහතා	සැම්සුම
21/03/2016	√	√	අව	ප/නැ	2/3
22/06/2016	√	අව	√	ප/නැ	2/3
26/09/2016	√	√	√	අව	3/4
27/12/2016	√	√	√	√	4/4
රැස්වීම් සංඛ්‍යාව: 4	4/4	3/4	3/4	1/2	

√ - පැමිණි අව – අවසර දුන් ප/නැ - පත්කර නැත

විගණන කමිටුවේ සභාපතිවරයා වූයේ කේ.ඒ. ඩිමලේන්තිරරාජා මහතාය. විගණන කමිටු සාමාජිකයින්ගේ කෙටි විස්තරයක් 7 සිට 11 දක්වා පිටුවල දක්වා ඇත. ව්‍යාපාර නිපුණත්වය, මුදල්, නීති සහ අවදානම් කළමනාකරණය පිළිබඳ ඔවුන්ගේ තනි හා සාමූහික දැනුම සහ අත්දැකීම් තම රාජකාරි ඉටු කිරීමේදී එකට මුහුවේ.

වසර තුළදී විගණන කමිටුව විසින් සිදු කරන ලද ප්‍රධාන කාර්යයන්

සමාලෝචිත වසර තුළ සිදු කරන ලද ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ;

- කළමනාකාරීත්වය, විගණකාධිපති සහ අභ්‍යන්තර විගණකවරු සමග අභ්‍යන්තර පාලන ක්‍රමයේ ප්‍රමාණවත් බව සමාලෝචනය කෙරිණි.
- නිකුත් කළ අභ්‍යන්තර විගණන වාර්තා සහ ඒ පිළිබඳ නිරීක්ෂණ සාකච්ඡා කරන ලදී.
- සංස්ථාව මුහුණ දෙනු ලබන ප්‍රධාන උපක්‍රමික ගැටළු සාකච්ඡා කෙරිණි
- 2017 වසර සඳහා වාර්ෂික අභ්‍යන්තර විගණන සැලසුම සමාලෝචනය කර අනුමත කෙරිණි.

අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණනය, විගණන කමිටුව විසින් අනුමත කළ වාර්ෂික විගණන සැලසුම ක්‍රියාත්මක කරයි. එහි ක්‍රියාකාරීත්වයට පහත දේ ඇතුළුව තවත් දේ ඇතුලත් වේ;

- අභ්‍යන්තර පාලන ඇගයීම
- අවදානම් ප්‍රදේශ හඳුනාගැනීම
- ගනුදෙනුවල නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය සනාථ කිරීම
- විවිධ වැදගත් කරුණු සම්බන්ධව කළමනාකාරීත්වයට නිරීක්ෂණ සහ නිර්දේශ සැපයීමට විශේෂ විමර්ශනයන් සිදු කිරීම
- විගණකාධිපතිවරයාගේ වාර්තාව සහ විගණන විමසුම් පිළිතුරු සාකච්ඡා කිරීම
- වාර්ෂික විගණන සැලසුම සහ අභ්‍යන්තර විගණන කාර්යයේ කාර්ය සාධනය කාලානුරූපව සමාලෝචනය කිරීම

විගණන ක්‍රියාවලිය තුළින් හඳුනාගත් කරුණු, අදාළ පාර්ශවයන් වෙත විගණන විමසුම් ඉදිරිපත් කිරීමෙන් ඉසමතු කෙරේ.

වසර තුළදී විගණන කමිටුව විසින් සිදු කරන ලද කාර්යයන්ගේ සාරාංශය

සමාලෝචිත වසර තුළ කමිටුව විසින් පහත කාර්යයන් සිදු කරන ලදී;

- 2015 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වසර සඳහා වූ මූල්‍ය ප්‍රකාශ සාකච්ඡාවට ලක් කරන ලදී.
- අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණවත් බව සමාලෝචනය කළ අතර අදාළ පාර්ශ්වයන් වෙත හඳුනාගත් දුර්වලතා දැනුම් දෙනු ලැබීය.
- අභ්‍යන්තර විගණන වාර්තා පිළිබඳව විගණන කමිටුව සමග සාකච්ඡා කරන ලදී.
- මූල්‍ය ප්‍රකාශ පිළිබඳව විගණකාධිපතිවරයාගේ වාර්තාව සාකච්ඡාවට ලක් කරන ලදී.
- හම්බන්තොට දැවී තෙල් මාරුකිරීම් අධීක්ෂණය කරන ලදී.
- පූර්ව විගණන ක්‍රියාවලට සහභාගි විය
- විගණන කමිටු රැස්වීම් සංවිධානය කරන ලදී

නිගමනය

විගණන කමිටුවේ අදහස වන්නේ අභ්‍යන්තර පාලන පද්ධතිය විසින් සංස්ථාවේ අනුමත ප්‍රතිපත්ති වලට අනුකූලව සංස්ථාවේ කටයුතු නිසිආකාරව ක්‍රියාත්කම වන බවට සහතිකයක් සපයන නමුත්, නිශ්චිත කරුණු සඳහා විගණනක කමිටුවේ නිර්දේශයන්ට අනුකූල වන පරිදි අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් හා විගණන පරීක්ෂණයන් සිදුකළ යුතු බවත්ය.



කේ.ඒ. විමලේන්තිරරාජා
සභාපති-විගණන කමිටුව
කොළඹ
දිනය 2018.05.11

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 1961 අංක 28 දරන ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 32(3) වගන්තියට අනුකූලව 2016 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා සංස්ථාවේ විගණනය කළ මූල්‍ය ප්‍රකාශන මෙසේ ඉදිරිපත් කරනු ලැබේ. මෙම වාර්තාව 11.05.2018 දින අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අනුමත කෙරිණි.

ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව යනු 1961 අංක 28 දරන ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ රජයට අයත් ව්‍යාපාර යකි. මෙය අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් පාලනය කරනු ලැබේ.

සංස්ථාවේ ලියාපදිංචි කාර්යාලය අංක 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09 යන ලිපිනයේ පිහිටා ඇත.

මෙම වාර්ෂික වාර්තාව තුළ ඇතුළත්වන විගණනය කළ මූල්‍ය ප්‍රකාශ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරවරුන්ගේ ආයතනය විසින් නිකුත් කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRSs / LKASs) වලට සහ 1971 අංක 38 දරන මුදල් පනතේ සහ එයට සිදු කළ සංශෝධනය කළ විධිවිධානවලට අනුකූලව සකසා ඉදිරිපත් කරනු ලැබේ.

දැක්ම, මෙහෙවර සහ අරමුණු

සංස්ථාවේ දැක්ම, මෙහෙවර සහ සංස්ථායික අරමුණු මෙම වාර්ෂික වාර්තාවේ 05 වන පිටුව තුළ දක්වා ඇත. එහි දැක්ම සහ අරමුණු ළඟා කරගැනීමේ ලා සියලුම අධ්‍යක්ෂවරුන් සහ සේවකයන් හැකි ඉහළම මට්ටමෙන් ආචාර ධර්ම ප්‍රමිතීන් සහ අවංකභාවය සහිතව තම ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

ප්‍රධාන කාර්යයන්

සංස්ථාවේ ප්‍රධාන කටයුතු වන්නේ ශ්‍රී ලංකාවට බනිජ තෙල් ආනයනය කිරීම, පිරිපහදු කිරීම සහ අලෙවි කිරීමයි. සංස්ථාව විසින් බනිජ තෙල් නිෂ්පාදන සමහරක්ද අපනයනය කරනු ලබයි.

අනුබද්ධිත සමාගම

ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවට එක් අනුබද්ධ ආයතනයක් ඇති අතර එය 2/3 ක කොටස් හිමිකාරීත්වයක් සහිත ලංකා බනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම වේ. ලංකා බනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ ප්‍රධාන කටයුතු වන්නේ ඉන්ධන ගබඩාවන් සහ බෙදාහැරීම් පහසුකම් සැපයීම සහ තොරතුරු තාක්ෂණ සේවා සැපයීමයි.

වසරේ කාර්ය සාධනය සමාලෝචනය

2016 මූල්‍ය වසර තුළ ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ මෙහෙයුම් පිළිබඳ සමාලෝචනයක් සහ එම මෙහෙයුම්වල ප්‍රතිඵල, 19 සිට 28 පිටුවල දක්වා ඇති අතර සභාපතිතුමාගේ සමාලෝචනය තුළත් 12 සහ 13 පිටුවල දක්වා ඇත. මෙම වාර්තා වාර්ෂික වාර්තාව තුළ ඒකාබද්ධ කොටසක් වේ.

සංස්ථාව සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශ

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය), මුදල් කළමනාකරු විසින් නිසි ලෙස අත්සන් කරන ලදුව සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ විගණනය කළ මූල්‍ය ප්‍රකාශ 48 සිට 82 දක්වා පිටුවල දක්වා ඇති අතර මෙය වාර්ෂික වාර්තාවේ කොටසක් වේ.

මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම

සංස්ථාව සහ සමූහයේ කටයුතුවල තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස පිළිබිඹු කරන, සංස්ථාවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශ සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය වගකියනු ලැබේ. අධ්‍යක්ෂවරුන්ගේ මතය වන්නේ, 48 සිට 82 පිටුව දක්වා දිවෙන විස්තීර්ණ ආදායම පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, ස්කන්ධ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය, සහ එහි ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිතීන් පිළිබඳ පනත සහ 1971 අංක 38 දරන මූල්‍ය පනත ප්‍රකාරව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ගේ අවශ්‍යතා අනුව සකසා ඇත.

විගණක වාර්තාව

සංස්ථාවේ විගණකවරයා, විගණකාධිපති විසින් සංස්ථාවේ 2016 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා වන සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශ සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ විගණනය කරන ලද අතර 83 සිට 125 දක්වා පිටුවල විගණකාධිපතිවරයා විසින් ඒ සම්බන්ධව නිකුත් කරන ලද වාර්තාව 1961 අංක 28 දරන ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථා පනත තුළ දක්වා ඇති පරිදි වාර්තා කර ඇත.

වසර තුළ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වෙනස්කම්

සමාලෝචිත වසර තුළ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනසක් සිදු නොවූ අතර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි 'මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීම' අංක 01 ට අදාළ වන පරිදි සකසා ඇත. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සංස්ථාවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන් 52 සිට 82 දක්වා වන පිටුවල දක්වා ඇත.

මූල්‍ය ප්‍රතිඵල

	2016 රු.බිලි.	2015 රු.බිලි.
ආදායම	**475.05**	**414.50**
අඩු කළා : අලෙවි බද්ද (නිෂ්පාදන බද්ද සහ ජාතිය ගොඩනැගීමේ බද්ද)	(51.99)	(37.77)
ශුද්ධ අලෙවි ආදායම	**423.06**	**376.73**
අලෙවි පිරිවැය	(260.44)	(283.48)
අඩු කළා : ආනයන බද්ද (රේ.බ. සහ ව.ගු.ස.බ.)	(66.00)	(53.64)
දළ ලාභය	**96.62**	**39.61**
වෙනත් මෙහෙයුම් ආදායම	0.61	0.37
භූමිතෙල් සහනාධාරය	2.98	3.86
අලෙවි හා බෙදාහැරීම් වියදම්	(14.41)	(13.40)
පරිපාලන වියදම්	(4.38)	(3.59)
හෙජින් වියදම්	-	(3.86)
මූල්‍ය වියදම්	(11.40)	(15.05)
මූල්‍ය ආදායම	8.37	5.01
විනිමය අනුපාත විචලනය	(8.83)	(32.84)
බදුවලට පෙර ලාභය/(පාඩුව)	**69.55**	**(19.89)**

ආදායම සහ ලාභය

ඉහත වගුව මගින් 2016 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂයට අදාළව සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵල දක්වා ඇත.

2016 වසරේ ආංශික පාඩුවේ විස්තර පහත දක්වා ඇත;

අංශය	2016 රු. බිලියන	පාඩුවට හේතුව
ප්‍රවාහනය ඔක්ටේන් 92 පෙට්‍රල්	8.27	• සිල්ලර මිල සහන මිල යටතේ පවතී • රේගු බදු, භාණ්ඩ බදු සහ ව.ගු.ස.බ වැඩි වීම • ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියල අවමප්‍රමාණය වීම • ජාත්‍යන්තර තෙල් වෙළෙඳපොළ තුළ ඛනිජ තෙල් නිෂ්පාදනවල මිල ඉහළ යාමේ ප්‍රවණතාව
ඔක්ටේන් 95 පෙට්‍රල්	1.29	
දේශීය භූමිතෙල්	2.98	• සහන මිල යටතේ විකිණීම
කෘෂි කෘෂි රසායන	0.9	• ඉහළ කාර්ය මණ්ඩල වියදම • රටේ කෘෂිකාර්මික නිෂ්පාදන පිරිවැය අඩු මට්ටමක පවත්වාගෙන යාම සඳහා සිල්ලර මිල සාධාරණ මිලකට සකසා ඇත
නැව් ඉන්ධන පිරවුම දැව් තෙල්	0.68	• දැව් තෙල් අලාභ ලබමින් අලෙවි කෙරේ
අපනයන දැව්තෙල් 800’ නැප්තා	0.73 1.58	• දේශීය ඉල්ලුම අඩු බැවින් සහ ගබඩා ධාරිතාව අඩු බැවින් අඩු මිලකට අපනයනය කිරීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සිදු විය.

බදුකරණය

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතට සහ එහි සංශෝධනවලට අනුව, දළ ලාභයෙන් සියයට විසි පහක් ලාභාංශ ලෙස රජයට ගෙවන්නේ නම් 2011/12 බදු වසරේ සිට වසර 5 ක් සංස්ථාවේ ලාභ සහ ආදායම මත ආදායම් බදු ගෙවීමෙන් නිදහස් කරන ලදී. කෙසේ වෙතත්, 2016 වසරේ සිට සංස්ථාව අපනයන මත 12% කුත් ඉතිරි බදු අය කෙරෙන ආදායම මත 28% කුත් බෙදාහැරිය හැකි ලාභ මත 25% කුත් වන ලෙස ආදායම් බදු ගෙවිය යුතුය.

විශේෂ ගාස්තුව

2014 වසර තුළ මහා භාණ්ඩාගරය රු.බිලියන 10 ක විශේෂ ගාස්තුවක් ගෙවන ලෙස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට උපදෙස් දෙන ලද අතර එය ආදායම් වාර්තාවට පහත පරිදි වියදම් වන ලෙස ගෙවන මෙන් ඉල්ලා සිටින ලදී. 2014 වසර සඳහා මිලියන 250, 2015 වසර සඳහා මිලියන 750 සහ 2016 සිට 2024 දක්වා කාලය තුළ වසරකට මිලියන 1000 බැගින්

දේපළ, පිරියත සහ උපකරණ

සංස්ථාවේ සහ සමූහයේ දේපළ, පිරියත සහ උපකරණවල විස්තර 64 වන පිටුවේ මූල්‍ය ප්‍රකාශවලට සටහන් 08 ලෙස දක්වා ඇත.

දායක ප්‍රාග්ධනය

2016 දෙසැම්බර් 31 වන දිනට සංස්ථාවේ මුළු දායක ප්‍රාග්ධනය රු . මිලියන 28,487 කි. දායක ප්‍රාග්ධනයේ විස්තර 69 වන පිටුවේ මූල්‍ය ප්‍රකාශවලට සටහන් 16 ලෙස දක්වා ඇත.

සංචිත

සංස්ථාවේ සංචිතවල සාරාංශයක් පහත දක්වා ඇත;

	2016 රු. බිලියන	2015 රු. බිලියන
ප්‍රාග්ධන සංචිතය	4.99	4.99
රඳවාගත් ඉපයුම්	(219.33)	(262.46)

ස්කන්ධවල වලනයන් 51 වන පිටුවේ ස්කන්ධවල වෙනස්වීම් ප්‍රකාශයේ දක්වා ඇත.

අධ්‍යක්ෂවරු

2016 දෙසැම්බර් 31 වනදා වන විට සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වූ අධ්‍යක්ෂවරුන්ගේ නම් පහත දක්වා ඇත;

අධ්‍යක්ෂකගේ නම	විධායක/ විධායක නොවන තත්වය
ටී.ජී. ජයසිංහ (සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ)	විධායක අධ්‍යක්ෂ
ඩී.සී.එස්. සෙනෙවිරත්න	විධායක නොවන අධ්‍යක්ෂ
එම්.ජී. ජයසේන	විධායක නොවන අධ්‍යක්ෂ
පී. ගල්හේන	විධායක නොවන අධ්‍යක්ෂ
ආර්. හරිස්චන්ද්‍ර	විධායක නොවන අධ්‍යක්ෂ
කේ.ඒ. විමලේන්තිරරාජා	විධායක නොවන අධ්‍යක්ෂ
එස්. ප්‍රනාන්දු	විධායක නොවන අධ්‍යක්ෂ

දැනට ධූරයන් දරන අධ්‍යක්ෂවරුන්ගේ නම්;

අධ්‍යක්ෂකගේ නම	විධායක/ විධායක නොවන තත්වය
ඩී. රණතුංග (සභාපති)	විධායක අධ්‍යක්ෂ
එන්.ආර්.ආර්.ජයසේකර (කළමනාකාර අධ්‍යක්ෂ)	විධායක අධ්‍යක්ෂ
කේ.ඒ. විමලේන්තිරරාජා	විධායක නොවන අධ්‍යක්ෂ
ආර්.ඒ.එන්. ජයසුන්දර	විධායක නොවන අධ්‍යක්ෂ
එස්. ධනතුංග	විධායක නොවන අධ්‍යක්ෂ
ඩබ්.එස්. පෙරේරා	විධායක නොවන අධ්‍යක්ෂ
ඒ.බී. හේරත්	විධායක නොවන අධ්‍යක්ෂ

අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ විගණන කමිටු රැස්වීම්වල අධ්‍යක්ෂවරුන්ගේ විස්තර 35 සිට 41 පිටු දක්වා ඉදිරිපත් කර ඇත.

වසර තුළ පැවැත්වූ රැස්වීම්වල අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම වාර්ෂික වාර්තාවේ 36 වන පිටුවේ දක්වා ඇත.

අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික

වසර තුළ අධ්‍යක්ෂකවරුන්ට ගෙවූ පාරිශ්‍රමික පහත පරිදි වේ;

	2016 රු. මිලියන	2015 රු. මිලියන
අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික	1.76	2.49

අධ්‍යක්ෂවරුන්ගේ ගිවිසුම් බැඳියාව

සංස්ථාව සමග වන ගිවිසුම් තුළ අධ්‍යක්ෂවරුන්ගේ සෘජු සහ සෘජු නොවන බැඳියාවන් 81 වන පිටුවේ මූල්‍ය ප්‍රකාශනවල 29 වන සටහනේ අනාවරණය කර ඇත.

ආපදා කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන පද්ධතිය

අධ්‍යක්ෂ මණ්ඩලය, අවදානම් පාලනය සඳහා වන සමස්ත වගකීම භාරගනු ලබයි. මෙම අරමුණ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායී සහ විස්තීර්ණ අභ්‍යන්තර පාලන ක්‍රමයක් සංස්ථාව තුළ ස්ථාපිත කර ඇත. අවදානම් කළමනාකරණය සඳහා සංස්ථාව විසින් ගෙන ඇති නිශ්චිත පියවරයන් 29 වන පිටුවේ සිට 34 වන පිටුව දක්වා අවදානම් කළමනාකරණ වාර්තාව තුළ දක්වා ඇත.

සංස්ථායික පාලනය

අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශ

අධ්‍යක්ෂ මණ්ඩලය පහත දේ ප්‍රකාශ කරයි-
(අ) සංස්ථාව, තම ව්‍යාපාර කටයුතුවලදී අදාළ සියලුම නීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ අතර අදාළ නීති හා රෙගුලාසි කිසිවකට පිටින් යන කිසිදු ක්‍රියාවක නිරත නොවීය;

(ආ) අධ්‍යක්ෂවරුන් සංස්ථාව හා සම්බන්ධ සියලු ප්‍රමාණාත්මක බැඳියාවන් ප්‍රකාශ කර ඇත;

(ඇ) ව්‍යාපාරය සහයක උපකල්පනයන් සමග අඛණ්ඩ පැවැත්ම සහිත ව්‍යාපාරයක් වන අතර අධ්‍යක්ෂ මණ්ඩලය සංස්ථාවේ සංස්ථායික/ව්‍යාපාර සැලසුම සමාලෝචනය කර පුර්වේක්ෂිත අනාගතය තුළ සංස්ථාවට තම මෙහෙයුම් කටයුතු කරගෙන යාමට ප්‍රමාණවත් සම්පත් ඇති බවට සෑහීමකට පත්වී ඇත. ඒ අනුව, සංස්ථාවේ සහ එහි සමූහයේ මූල්‍ය ප්‍රකාශ සකස් කරනු ලබන්නේ අඛණ්ඩ පැවැත්ම සංකල්පය පදනම් කරගෙන වන අතර,

(ඉ) අධ්‍යක්ෂවරුන් මූල්‍ය , මෙහෙයුම් සහ අනුකූලතා පාලන හා අවදානම් කළමනාකරණය යනාදිය ආවරණය කරමින් අභ්‍යන්තර පාලනයක් සමාලෝචනයකට ලක් කර ඇති අතර තම ඵලදායීතාවය සහ සාර්ථක අනුකූලතාවය පිළිබඳව මනා සහතිකයක් ලබාගෙන ඇත.

සංස්ථායික පාලන රීති සහ රෙගුලාසිවලට අනුකූල පටිපාටීන් සහ පරිචයන් මෙම වාර්තාවේ සංස්ථායික පාලන වාර්තාවේ 35 වන පිටුවේ සිට 39 පිටුව වන තෙක් පිටුවල දක්වා ඇත.

මානව සම්පත්

සංස්ථාව, සිය ව්‍යාපාර දැක්ම සහ මෙහෙවර යථාර්ථයක් බවට පත්කිරීමේදී මානව සම්පත්වල වටිනා භූමිකාව හොඳින් හඳුනාගනු ලබයි. ඒ අනුව, මානව සම්පත් ප්‍රාග්ධනය වර්ධනය කිරීමට සහ සංස්ථායික ඉලක්ක සහ අරමුණු සාක්ෂාත් කරගැනීමේදී ඔවුන්ගේ දායකත්වය ප්‍රශස්ත කිරීමට පියවර කිහිපයක්ම ගෙන ඇත. අපගේ මානව සම්පත් ප්‍රතිපත්තිය, සෑම වර්ගයකම සේවකයන් හට තම දැනුම සහ හැකියාව වර්ධනය කරගැනීම පිණිස දේශීය සහ විදේශීය පුහුණුව තුළින් ප්‍රමාණවත් අවස්ථාවක් ලබා දීම අවධාරණය කරනු ලබයි. උසස් මට්ටමේ තාක්ෂණික සහ කළමනාකරණ හැකියාවන් සහිත මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම සංස්ථාවේ ප්‍රමුඛතම අරමුණක් බවට පත්ව ඇත.

නොනිමි නඩු කාර්යයන්

සංස්ථාවේ අධ්‍යක්ෂකවරු සහ නීතිඥවරුන්ගේ මතයට අනුව, මූල්‍ය ප්‍රකාශවල 26 වන සටහන යටතේ අනාවරණය කර ඇති අවසන් නොකෙරුණු නඩු ක්‍රියා මාර්ග, සංස්ථාවේ මූල්‍ය ස්ථාවරත්වයට හෝ එහි අනාගත මෙහෙයුම්වලට කිසිදු ප්‍රමාණාත්මක බලපෑමක් නොකරනු ඇත.

නීති සහ රෙගුලාසිවලට අනුකූල වීම

නීති සහ රෙගුලාසිවලට පටහැනි කිසිදු කාර්යයක සංස්ථාව නියැලී නැත.

පාරිසරික ආරක්ෂාව

සංස්ථාව හැකි උපරිම අයුරින් අදාළ පාරිසරික නීති සහ රෙගුලාසිවලට අනුකූලව කටයුතු කර ඇත.

ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂවරුන් තම දැනුමේ ප්‍රකාරව, සියලුම අදාළ නියාමන සහ ව්‍යවස්ථාපිත ආයතනවලට ගෙවීමට නියමිත සියලුම ගෙවීම්, ඇති මූල්‍ය හැකියාවන් මත ගෙවා ඇති බවට සෑහීමකට පත්වේ,

මූල්‍ය ප්‍රකාශයෙන් පසුවට එළඹෙන සිද්ධි/ අවස්ථා

මූල්‍ය ප්‍රකාශ දිනයට පසුව, මූල්‍ය ප්‍රකාශවල සටහන 28 මගින් අනාවරණය කර ඇති අවස්ථාවන් හැර මූල්‍ය ප්‍රකාශවල වෙනස්කම් කළ යුතුවන කිසිදු අවස්ථාවක් උදා වී නැත.

අඛණ්ඩ පැවැත්ම

අධ්‍යක්ෂ මණ්ඩලය සංස්ථායික සැලසුම සකස් කර ඇත්තේ සංස්ථාවේ ප්‍රතිරූපය වර්ධනය කිරීම, මෙහෙයුම් වැඩි දියුණු කිරීම සහ අනාගතයට ශක්තිමත් වාණිජ ශක්‍යතාවයක් සහතික කිරීමේ අරමුණ ඇතිවයි. ඒ අනුව අඛණ්ඩ පැවැත්ම පදනම් කොටගෙන තවදුරටත් මූල්‍ය ප්‍රකාශ සකස් කරනු ලැබේ.

විගණකවරු පත් කිරීම

සංස්ථාවේ විගණක වන්නේ විගණකාධිපතිවරයාය. ඔහු පත් කර ඇත්තේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ව්‍යවස්ථාවේ 154 වගන්තියේ විධි විධානවලට අනුකූලවයි. විගණනය සඳහා වන විගණකගේ පාරිශ්‍රමිකය තීරණය කරනු ලබන්නේ 1961 අංක 28 දරන ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 31 වන වගන්තිය අනුවයි.

විගණකගේ පාරිශ්‍රමිකය සහ සංස්ථාව සමග ගිවිසුම් බැඳියාව


2016 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා රු. මිලියන 2.11 ක් සංස්ථාව විසින් විගණක ගාස්තු ලෙස ගෙවන ලදී.

අධ්‍යක්ෂවරුන්ගේ දැනුමේ ප්‍රමාණයට විගණකවරුන්ට සංස්ථාවේ හෝ එහි අනුබද්ධ ආයතනය සමග කිසිදු වෙනත් සම්බන්ධතාවයක් හෝ බැඳියාවක් නොමැත.

වර්තාවේ අන්තර්ගතය පිළිගැනීම

1961 අංක 28 දරන ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 32(3) වගන්තිය මගින් අවශ්‍ය කෙරෙන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් වාර්ෂික වාර්තාවේ අන්තර්ගතය පිළිගනී.

මෙම වාර්ෂික වාර්තාව සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කළේ:



දම්මික රණතුංග
සභාපති
දිනය 2018.05.11

මූල්‍ය ප්‍රකාශ

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය 48

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය 49

මුදල් ප්‍රවාහ ප්‍රකාශය 50

ස්කන්ධ වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය 51

මූල්‍ය ප්‍රකාශවලට සටහන් 52

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා	සටහන	සංස්ථාව 2016	සංස්ථාව 2015 (යළි ප්‍රකාශිත)	සමූහය 2016	සමූහය 2015* (යළි ප්‍රකාශිත)
		රු.මි.	රු.මිලි	රු.මි.	රු.මි.
ආදායම	2	423,061.051	376,734.487	423,443.612	377,261.652
විකුණුම් පිරිවැය		(326,440.767)	(337,118.644)	(332,651.704)	(343,301.815)
දළ ලාභය		**96,620.284**	**39,615.843**	**90,791.908**	**33,959.837**
වෙනත් මෙහෙයුම් ආදායම්	3	3,588.439	4,233.981	3,772.090	4,744.234
විකුණුම් හා බෙදාහැරීම් වියදම්		(14,411.946)	(13,401.137)	(2,590.776)	(2,740.758)
පරිපාලන වියදම්		(4,383.873)	(3,591.512)	(8,448.049)	(7,169.492)
මෙහෙයුම් ලාභය	4	**81,412.904**	**26,857.175**	**83,525.172**	**28,793.821**
විනිමය අනුපාත විචලනය		(8,828.798)	(32,841.590)	(8,828.798)	(32,841.590)
මූල්‍ය ආදායම්	5	8,374.112	5,011.670	8,464.482	5,037.480
හෙජින් වියදම්		-	(3,864.375)	-	(3,864.375)
මූල්‍ය වියදම්	6	(11,404.537)	(15,048.660)	(11,571.312)	(15,048.660)
බදු පෙර ලාභය /(අලාභය)		**69,553.681**	**(19,885.780)**	**71,589.544**	**(17,923.324)**
ආදායම් බදු	7	(16,526.602)	(634.384)	(17,150.545)	(921.369)
වර්ෂය සඳහා ලාභය/(අලාභය)		**53,027.081**	**(20,520.164)**	**54,439.000**	**(18,844.693)**
වෙනත් විස්තීර්ණ ආදායම්					
ලාභය හෝ අලාභය වර්ගීකරණය නොකරන අයිතම					
විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් මතවන නැවත ඇගයීම් ලාභය /(අලාභය)	18	120.866	(167.186)	364.729	(299.648)
අනෙකුත් විස්තීර්ණ ආදායම් මත බද්ද		-	-	(33.409)	
ලාභයට හෝ අලාභය මත නැවත වර්ගීකරණය කරනු ලබන හෝ නොලබන අයිතම					
අලෙවිය සඳහා පවත්නා මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභය/(අලාභය)	10.1	(10.000)	6.500	(10.000)	6.500
වර්ෂය සඳහා වන අනෙකුත් විස්තීර්ණ ආදායම/ (වියදම්)		110.866	(160.686)	321.320	(293.148)
වර්ෂයේ මුළු විස්තීර්ණ ආදායම/ (වියදම්) බදු පසු		**53,137.946**	**(20,680.850)**	**54,760.320**	**(19,137.841)**
මුළු විස්තීර්ණ ආදායම් සම්බන්ධිත :					
අස්ථිත්වයේ හිමිකරුවන්		53,137.946	(20,680.850)	54,110.625	(19,652.177)
පාලනය කළ නොහැකි අයිතිය		-	-	649.695	514.336
		53,137.946	**(20,680.850)**	**54,760.320**	**(19,137.841)**

මෙහි පෙන්වා ඇති සමහර සංඛ්‍යා2015 මූල්‍ය වාර්තාවලට අනුරූපී නොවෙන අතර සටහන 25 මගින් දක්වා ඇති පරිදි කරන ලද ගැලපුම් පිළිබිඹු කරයි.

52 වන පිටුවේ සිට 82 පිටුව දක්වා වන සටහන් මූල්‍ය ප්‍රකාශවල අත්‍යවශ්‍ය කොටස් වේ.

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනට	සටහන	සංස්ථාව 2016 රු.මි.	සංස්ථාව 2015* (යළි ප්‍රකාශිත) රු.මි.	සමූහය 2016 රු.මි.	සමූහය 2015* (යළි ප්‍රකාශිත) රු.මි.
වත්කම්					
ජංගම නොවන වත්කම්					
දේපළ, පිරියත සහ උපකරණ	**8**	13,505.655	13,871.821	30,305.510	30,525.314
ආයෝජන වත්කම්	**8.3**	41.575	43.022	41.575	43.022
අස්පෘශ්‍ය වත්කම්	**8.4**	-	-	7.609	17.350
පරිපාලිත සමාගමේ ආයෝජන	**9**	5,000.000	5,000.000	-	-
ජංගම නොවන මූල්‍ය වත්කම්	**10**	35,595.461	36,725.282	35,595.461	36,725.283
වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ	**11**	10,326.708	11,675.654	10,768.432	11,389.949
		64,469.399	67,315.779	76,718.588	78,700.918
ජංගම වත්කම්					
තොග	**13**	35,476.885	41,035.111	35,888.223	41,363.947
වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ	**11**	48,397.974	26,859.315	52,446.899	30,564.156
කෙටි කාලීන ආයෝජන	**14**	28,065.844	12,704.860	28,065.844	12,704.859
මුදල් සහ මුදල් සමාන දෑ	**15**	14,579.410	51,058.236	17,034.827	51,806.202
		126,520.114	131,657.522	133,435.793	136,439.164
මුළු වත්කම්		**190,989.513**	**198,973.301**	**210,154.381**	**215,140.082**
ස්කන්ධය සහ වගකීම්					
ප්‍රාග්ධනය සහ සංචිත					
දායක ප්‍රාග්ධනය	**16**	28,487.125	28,487.125	28,487.125	28,487.125
ප්‍රාග්ධන සංචිත	**17**	4,992.686	4,992.686	4,992.686	4,992.686
රඳවාගත් ඉපයුම්		(219,326.658)	(262,464.604)	(209,094.494)	(253,270.777)
පාලනය කළ නොහැකි අයිතිය		-	-	7,616.937	7,096.913
මුළු ස්කන්ධය		(185,846.847)	(228,984.793)	(167,997.746)	(212,694.053)
ජංගම නොවන වගකීම්					
විශ්‍රාම ප්‍රතිලාභ බැඳියාව	**18**	753.561	861.114	1,987.632	2,414.251
විලම්බිත බදු	**23**	-	-	1,005.757	544.863
ණය සහ ණය ගැනීම්	**19**	265.858	341.817	1,176.909	1,740.668
		1,019.419	1,202.931	4,170.298	4,699.782
ජංගම වගකීම්					
වෙළෙඳ ණය සහ වෙනත් ගෙවිය යුතු දෑ	**20**	182,095.327	159,171.227	179,661.102	155,054.462
ණය හා ණය ගැනීම් ජංගම කොටස	**19.1**	37.980	361.664	525.780	857.619
කෙටි කාලීන ණය ගැනීම්	**21**	193,683.634	267,222.272	193,794.948	267,222.272
		375,816.940	426,755.163	373,981.829	423,134.353
මුළු ස්කන්ධය සහ වගකීම්		**190,989.513**	**198,973.301**	**210,154.381**	**215,140.082**

*මෙහි පෙන්වා ඇති සමහර සංඛ්‍යා 2015 මූල්‍ය වාර්තාවලට අනුරූපී නොවෙන අතර සටහන 25 මගින් දක්වා ඇති පරිදි කරන ලද ගැලපුම් පිළිබිඹු කරයි.

පිටු අංක 52 සිට 82 පිටුව දක්වා වන සටහන් මූල්‍ය ප්‍රකාශවල අන්තර්ගත කොටසකි.
මෙම මූල්‍ය ප්‍රකාශ 2016 දෙසැම්බර් 31 දිනට ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ කටයුතු සහ ලාභය සම්බන්ධව සත්‍ය සහ සාධාරණ දැක්මක් සපයයි.

වී එන් විරසූරිය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය)

එම්.සී.ඩී පෙරේරා
මූල්‍ය කළමනාකරු

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වග කිව යුතු වේ. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් තබන ලද්දේ,

දම්මික රණතුංග
සභාපති

කේ.ඒ. විමලේන්තිරරාජා
අධ්‍යක්ෂ

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා	සටහන	සංස්ථාව		සමූහය	
		2016	2015* (යළි ප්‍රකාශිත)	2016	2015* (යළි ප්‍රකාශිත)
		රු.මි.	රු.මි.	රු.මි.	රු.මි.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබෙන මුදල් ප්‍රවාහ	**24**	68,415.926	24,772.897	72,468.682	24,916.837
				-	
පොළී ගෙවීම්	6	(11,404.537)	(15,048.660)	(11,579.468)	(15,048.660)
විශ්‍රාම පාරිතෝෂික ගෙවීම්	18	(122.286)	(68.623)	(234.210)	(167.891)
ආදායම් බදු/ ඩබ්.එච්.ටී. ගෙවීම්		(2,357.487)	(409.006)	(2,526.976)	(409.006)
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් උත්පාදනය වූ/(භාවිතා කළ) ශුද්ධ මුදල්		54,531.617	9,246.608	58,128.029	9,291.280
ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ලද මුදල් ප්‍රවාහ					
දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද මුදල		42.332	36.151	93.603	44.463
දේපළ, පිරියත සහ උපකරණ අත්පත්කර ගැනීම්	8	(477.658)	(972.115)	(1,391.070)	(1,162.087)
ලාභාංශ ආදායම		292.502	0.004	0.002	0.004
ලැබූ පොළිය	5	8,374.112	5,011.670	8,464.482	5,037.480
භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජනය		1,183.072	(27,761.865)	1,183.072	(27,761.865)
ස්ථාවර තැන්පතු තුළ ආයෝජනය		(15,424.235)	300.704	(15,424.235)	300.704
				-	
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා භාවිතා කළ ශුද්ධ මුදල්		(6,009.875)	(23,385.451)	(7,074.146)	(23,541.301)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ					
ප්‍රාග්ධන ආයෝජනය		-	24,987.125	-	24,987.125
ගෙවූ ලාභාංශ		(10,000.000)	-	(10,162.500)	-
ලබාගන්නා ලද අලුත් ණය/ණය ආපසු ගෙවීම		(71,200.033)	16,048.986	(71,973.537)	14,997.932
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද/ (භාවිතා කළ) ශුද්ධ මුදල්		(81,200.033)	41,036.111	(82,136.037)	39,985.057
මුදල් හා මුදල් සමාන දෑවල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)		(32,678.292)	26,897.268	(31,082.154)	25,735.036
වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ		44,700.416	17,803.148	45,448.382	19,713.346
වර්ෂය අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ	**15**	**12,022.125**	**44,700.416**	**14,366.228**	**45,448.382**

*මෙහි පෙන්වා ඇති සමහර සංඛ්‍යා 2015 මූල්‍ය වාර්තාවලට අනුරූපී නොවෙන අතර සටහන 25 මගින් දක්වා ඇති පරිදි කරන ලද ගැලපුම් පිළිබිඹු කරයි.

පිටු අංක 52 වන පිටුවේ සිට 82 පිටුව දක්වා වන සටහන් මූල්‍ය ප්‍රකාශවල අන්තර්ගත කොටසකි.

ස්කන්ධය වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

	දායක ප්‍රාග්ධනය	ප්‍රාග්ධන සංචිතය	ආදායම් සංචිත	මුළු ස්කන්ධය
	රු.මි.	රු.මි.	රු.මි.	රු.මි.
2015 ජනවාර් 1 දිනට	**3,500.000**	**4,992.686**	**(240,749.436)**	**(232,256.750)**
පූර්ව කාලසීමා ගැලපුම් (සටහන 25)			(1,034.318)	(1,034.318)
2015 ජනවාරි 1 වනදාට යළි ප්‍රකාශිත ශේෂය	**3,500.000**	**4,992.686**	**(241,783.754)**	**(233,291.068)**
වර්ෂය සඳහා ලාභය *			(20,520.164)	(20,520.164)
අනෙකුත් විස්තීර්ණ ආදායම්			(160.686)	(160.686)
ප්‍රාග්ධන සංචලන සඳහා නිකුත් කළ භාණ්ඩාගාර බැඳුම්ක	24,987.125	-	-	24,987.125
2015 දෙසැ 31 දිනට යළි ප්‍රකාශිත ශේෂය	**28,487.125**	**4,992.686**	**(262,464.604)**	**(228,984.793)**
වර්ෂය සඳහා ලාභය *	-	-	53,027.081	53,027.081
අනෙකුත් විස්තීර්ණ ආදායම්			110.866	110.866
ගෙවූ ලාභාංශ			(10,000.00)	(10,000.00)
2016 දෙසැ 31 දිනට	**28,487.125**	**4,992.686**	**(219,326.658)**	**(185,846.847)**

සමූහය

	දායක ප්‍රාග්ධනය	ප්‍රාග්ධන සංචිතය	ආදායම් සංචිත	කොටස් කරුවන්ගේ අරමුදල්	පාලනය කළ නොහැකි අයිතිය	මුළු ස්කන්ධය
	රු.මි.	රු.මි.	රු.මි.	රු.මි.	රු.මි.	රු.මි.
2015 ජනවාරි 1 දිනට	**3,500.000**	**4,992.686**	**(232,584.282)**	**(224,091.596)**	**6,582.577**	**(217,509.019)**
පූර්ව කාලසීමා ගැලපුම් (සටහන 25)			(1,034.318)	(1,034.318)	-	(1,034.318)
2015 ජන 1 වන දිනට යළි ප්‍රකාශිත ශේෂය	**3,500.000**	**4,992.686**	**(233,618.600)**	**(225,125.914)**	**6,582.577**	**(218,543.337)**
වර්ෂය සඳහා ලාභය *			(19,403.183)	(19,403.183)	558.490	(18,844.693)
වෙනත් විස්තීර්ණ ආදායම්			(248.994)	(248.994)	(44.154)	(293.148)
ප්‍රාග්ධනය වැඩිකිරීම සඳහා නිකුත් කරන ලද භාණ්ඩාගාර	24,987.125	-	-	24,987.125	-	24,987.125
2015 දෙසැ 31 දිනට යළි ප්‍රකාශිත ශේෂය	**28,487.125**	**4,992.686**	**(253,270.777)**	**(219,790.966)**	**7,096.913**	**(212,694.053)**
වර්ෂය සඳහා ලාභය	-	-	53,896.412	53,896.412	542.588	54,439.000
වෙනත් විස්තීර්ණ ආදායම්			214.213	214.213	107.107	321.320
ගෙවූ ලාභාංශ			(10,000.000)	(10,000.000)	(162.500)	(10,162.500)
2015 සඳහා ඒකාබද්ධ ගැලපුම්			65.658	65.658	32.829	98.487
2016 දෙසැ 31 දිනට	**28,487.125**	**4,992.686**	**(209,094.494)**	**(175,614.683)**	**7,616.937**	**(167,997.746)**

*මෙහි පෙන්වා ඇති සමහර සංඛ්‍යා2015 මූල්‍ය වාර්තාවලට අනුරූපී නොවෙන අතර සටහන 25 මගින් දක්වා ඇති පරිදි කරන ලද ගැලපුම් පිළිබිඹු කරයි.
පිටු අංක 52 වන පිටුවේ සිට 82 පිටුව දක්වා වන සටහන් මූල්‍ය ප්‍රකාශවල අන්තර්ගත කොටසකි.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

1.1 සංස්ථායික තොරතුරු

පොදු විස්තර

1961 අංක. 28 දරණ ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථා පනත මඟින් පිහිටුවන ලද ශ්‍රී ලංකාවේ පිහිටා ඇති රාජ්‍ය සංස්ථාවකි. අංක. 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09 ලිපිනයේ ප්‍රධාන කාර්යාලය පිහිටා ඇත.

ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම්වල ස්වභාවය

ආනයනය	ප්‍රධාන කාර්යයන්
ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව	බනිජ තෙල් ආනයනය, පිරිපහදු කිරීම සහ ශ්‍රී ලංකාව තුළ අලෙවි කිරීම .
අනුබද්ධ ආයතනය ලංකා බනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම	බනිජ තෙල් නිෂ්පාදන ගබඩා කිරීම සහ බෙදාහැරීම

මව් සමාගම සහ පරිපාලිත සමාගම

සංස්ථාව බනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ විෂයපථයට අයත් වේ. අධ්‍යක්ෂවරුන්ගේ මතය අනුව සංස්ථාවේ පාලන පාර්ශ්වය සහ හිමි ආයතනය වන්නේ ශ්‍රී ලංකා රජයයි.

නිකුත් කිරීම සඳහා අධිකාරීත්වය ලබාදීමේ දිනය

2017 දෙසැම්බර් 21 වන දින අධ්‍යක්ෂ මණ්ඩල විධිනියෝගයක් අනුව 2016 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ එහි සමූහයේ මූල්‍ය ප්‍රකාශනය නිකුත් කිරීම සඳහා අවසර ලැබිණි.

අනුකූලතාව පිළිබඳ ප්‍රකාශය

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්ව ප්‍රකාශය, ස්කන්ධ වෙනස් වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශවලට සටහන් ඇතුළත් ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශ, 1971 අංක 38 දරන මුදල් පනතේ සහ පසුකාලීන සංශෝධන විධිවිධාන සහ ශ්‍රී ලංකා ගනකාධිකාරවරුන්ගේ ආයතනය විසින් නිකුත් කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලට (SLFRSs / LKASs) අනුකූලව සකසන ලදී.

1.2 පිළියෙළ කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශ උපචිත පදනමින් සහ සාධාරණ අගයට මනින ලද අලෙවි කිරීමට ඇති මූල්‍ය වත්කම් සහ බැඳීම්වල වර්තමාන අගය අනුව මනින ලද ප්‍රතිලාභ බැඳීම් හැර ඓතිහාසික පිරිවැය පදනම යටතේ සකසන ලදී.

ඉදිරිපත් කිරීම සහ ශ්‍රිතීය මුදල්

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇති අතර විශේෂිතව වෙනස් කොට දක්වා ඇති නම් මිස අගයන් ආසන්න රුපියල් මිලියනයට වටයා ඇත.

ද්‍රව්‍යමය භාවය සහ සමූහනය

සමාන අයිතමයන්ගේ සෑම ප්‍රමාණාත්මක පංතියක්ම මූල්‍ය ප්‍රකාශවල වෙන් කර දක්වා ඇත. අසමාන ස්වභාවයක් ඇති හෝ කාර්ය භාරය අතින් අසමාන වන අයිතම, ප්‍රමාණාත්මක නොවන්නේ නම් වෙන වෙනම ඉදිරිපත් කර ඇත.

ඒකාබද්ධ කිරීමේ පදනම

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ සංස්ථාව සහ එහි අනුබද්ධ ආයතනයට (එක්ව ‘සමූහය’ ලෙස හැඳින්වේ) අදාළ වේ.

අනුබද්ධ ආයතන යනු සමූහය මගින් පාලනය කරන ආනයනයන් ය. සමූහය ආයෝජකයා සමග සම්බන්ධ වීමේදී විවල්‍යයන්ට නිරාවරණය වූ විට හා එම විවල්‍යයන් සම්බන්ධව ආයෝජකයා බලය යොදවා එයට බලපෑම් කරන විට පාලනය සිදුවේ.

විශේෂයෙන් සමූහයට ආයෝජකයෙකු පාලනය කළ හැක්කේ සමූහයට පහත දේ ඇත්නම් පමණි:

- ආයෝජකයා මත බලය (ආයෝජකයාගේ අදාළ කාර්යයන් වෙනස් කිරීමට හැකියාව ලබාදෙන හිමිකම්)
- ආයෝජකයා සමග සම්බන්ධ වීමේදී විචල්‍යයන් වෙත නිරාවරණය හෝ අයිතිය
- ආයෝජකයාගේ ප්‍රතිඵලවලට බලපෑම් කිරීමට බලය යෙදවීමට ඇති හැකියාව.

සාමාන්‍යයෙන් බොහෝ ඡන්ද අයිතීන් පාලනයේ ප්‍රතිඵලයක් බවට පිළිගැනේ. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ කොටස් 2/3 කට හිමිකම් කියන අතර එය තමාගේ අනුබද්ධ ආයතනයක් බවට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සලකයි.

ඉහත පාලන සංරචයකයන්ගෙන් එකකට හෝ කිහිපයකට වෙනස්කම් ඇති බවට සාධක සහ තත්ත්වයන් ඇත්නම් ආයෝජකයෙක් පාලනය කරන්නේද නැතිද යන්න පිලිබඳව සමූහය යළි ඇගයීමක් සිදු කරයි. අනුබද්ධ ආයතනයක් ඒකාබද්ධ කිරීම ආරම්භ වන්නේ සමූහය අනුබද්ධ ආයතනයේ පාලනය ලබාගන්නා විට වන අතර අවසන් වන්නේ සමූහයට එම ආයතනය සම්බන්ධ පාලනය අහිමි වීටයි. සමූහය විසින් පාලනය ලබාගත් දින සිට අවසන් වන දිනය දක්වා වසර තුළදී අනුබද්ධ ආයතනයක් විසින් ලබාගත් හෝ අපහරණය කළ වත්කම්, හිමිකම්, ආදයම සහ වියදම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශයට ඇතුළත් වේ.

අනෙක් විස්තීර්ණ ආදායම්වල එක් එක් සංරචකයන්ගේ ලාභය හෝ පාඩුව සමූහයේ හිමි ආයතනයේ ස්කන්ධ හිමිකරුවන් හට සහ පාලනය නොකරන පාර්ශ්ව වලට අදාළ වේ.

වෙනත් අයුරකින් දක්වා නොමැති කල්හි අනුබද්ධ ආයතනයේ මූල්‍ය ප්‍රකාශය සැකසෙන්නේ සමූහයේ ගිනුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව වන අතර ආයතන සියල්ලට දෙසැම්බර් මස 31 න් අවසන් වන පොදු මූල්‍ය වසරක් ඇත.

සමූහය තුළ අන්තර් ශේෂ සහ ගනුදෙනු, ආදායම් සහ වියදම්, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ සැකසීමේදී ඉවත් කෙරෙනු ලැබේ.

1.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම්

සංස්ථාව විසින් යොදාගනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර වර්ෂවල භාවිතා කරන ලද ප්‍රතිපත්ති සමඟ අනුගත වී ඇත.

සන්සන්දනාත්මක තොරතුරු

වඩාත් පැහැදිලි ලෙස ඉදිරිපත් කිරීම සහ පවත්නා වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ සැසඳිය හැකිවන පරිදි අවශ්‍ය අවස්ථාවලදී පෙර වර්ෂවල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය සංශෝධනය කර ඇත.

අඛණ්ඩ පැවැත්ම

මෙම මූල්‍ය ප්‍රකාශ සකසා ඇත්තේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ සමූහය අඛණ්ඩ පැවැත්මක් සහිත බව හෙවත් පුරෝකථනය කළ හැකි අනාගතය තුළ ක්‍රියාත්මක වන බවට වන උපකල්පනය මතයි. එබැවින් 2016 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා සකස් කළ මූල්‍ය ප්‍රකාශ අනුව සංස්ථාවට හා සමූහයට පිළිවෙළින් රු මිලියන 185,847 හා රු මිලියන 167,998 ක සෘණාත්මක ස්කන්ධ තත්වයක් ඇතත් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට එහි මෙහෙයුම් ප්‍රමාණාත්මකව අඩු කිරීමට හෝ ඇවර කිරීමට හෝ අදහසක් නැති බවට උපකල්පනය කෙරේ.

තීරණාත්මක ගිණුම්කරණ විනිශ්චයන් ඇස්තමේන්තු සහ උපකල්පනයන්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ සැකසීමේදී සමහර තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු සහ උපකල්පනයන් කළ යුතු වේ. එමෙන්ම සංස්ථාවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාළ කිරීමේ ක්‍රියාවලිය තුළ කළමනාකාරීත්වයේ විනිශ්චයන්ද අවශ්‍ය වේ. විනිශ්චයන් සහ ඇස්තමේන්තු ඓතිහාසික අත්දැකීම් මත සහ තත්වයන් අනුව සාධාරණ ලෙස සැලකෙන අපේක්ෂාවන් ඇතුළු වෙනත් සාධක මත සිදු කෙරේ. එබැවින්, සත්‍ය අත්දැකීම සහ ප්‍රතිඵල විනිශ්චයන් සහ ඇස්තමේන්තුවලින් වෙනස් විය හැකිය. ඇස්තමේන්තු සහ උපකල්පනයන් නිරන්තර පදනමින් සමාලෝචනය කෙරුණු අතර ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සංශෝධනයන් හඳුනාගැණිනි. ඉහළ මට්ටමේ විනිශ්චයන් අවශ්‍ය වන හෝ සංකීර්ණතාවයන් මතුවන හෝ මූල්‍ය ප්‍රකාශවලට විනිශ්චයන් සහ ඇස්තමේන්තුව අවශ්‍ය යැයි සිතෙන ක්ෂේත්‍ර පහත පරිදි අදාළ සටහන් තුළ විස්තර කෙරේ:

- නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් - පාරිතෝෂිකය සටහන් අංකය 1.4.9
- මූල්‍ය වත්කම් හානිකරණය සටහන් අංකය 1.4.11
- දේපළ, පිරියත සහ උපකරණවල ඵලදායී ආයුකාලය: සටහන් අංකය 1.4.5
- විලම්භිත බදුකරණය සටහන 1.4.2

1.4 ප්‍රධාන ගිණුම් ප්‍රතිපත්තිවල සාරාංශය

1.4.1 ආදායම හඳුනාගැනීම

සංස්ථාවට ආර්ථික ප්‍රතිලාභ ගලා එනු ඇති ප්‍රමාණයට සහ ආදායම විශ්වසනීය ලෙස මැනිය හැකි ප්‍රමාණයට ආදායම හඳුනාගනු ලැබේ. ලැබුණු හෝ ලැබිය යුතු ආදායම, වෙළෙඳ වට්ටම් සහ විකිණුම් බදු අඩු කිරීමෙන්

සාධාරණ අගය අනුව ආදායම මනිනු ලැබේ. ආදායම හඳුනාගැනීමේ අරමුණු සඳහා පහත නිශ්චිත නිර්ණායක භාවිතා කෙරේ.

භාණ්ඩ අලෙවිය

භාණ්ඩ වලට අදාළ ප්‍රමාණවත් අවදානම් හා ප්‍රතිලාභ වල හිමිකම ගැණුම්කරු අතට පත්වන විට භාණ්ඩ විකිණීමේ ආදායම හඳුනාගනු ලබයි.

පොළී ආදායම් සහ වියදම්

පොළී වියදම සහ ආදායම් ක්‍රමක්ෂය පිරිවැය, මගින් මැන සියලු මූල්‍ය උපකරණ ඵලදායී පොළී අනුපාත ක්‍රමය භාවිතා කර වාර්තා කර ඇති අතර උපචිත පදනමින් හඳුනාගෙන ඇත.

ලාභාංශ

ගෙවීම් ලැබීමට කොටස්කරුවන්ගේ අයිතිය තහවුරු වූ විට ලාභාංශ ආදායම හඳුනාගනු ලබයි.

කුලී ආදායම

බදු කොන්දේසි මත රේඛිය පදනමින් කුලී ආදායම ගණනය කරනු ලබයි.

දේපළ, පිරියත සහ උපකරණ අලෙවියෙන් ලාභය/(පාඩුව)

දේපළ, පිරියත සහ උපකරණ අලෙවියෙන් ලැබූ ලාභය/(අලාභය), අලෙවිය සිදු කරනු ලැබූ කාලපරිච්ඡේදය තුළ හඳුනාගනු ලබන අතර, වෙනත් ආදායම් ලෙස වර්ගීකරණය කරනු ලබයි.

ආයෝජන ආරක්ෂණ වෙතින් ලැබෙන ලාභ හෝ පාඩු

ස්කන්ධ කොටස් අලෙවිය සහ මූල්‍ය උපකරණ අලෙවිය මඟින් ලබාගන්නා ලද ඉපැයීම් හෝ අලාභ එම ගනුදෙනු සිදුවන දිනයට ගණනය කර ඇත.

භූමිතෙල් සහනාධාරය

මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් නිකුත් කරන ලද අංක. 77IP/1/83/(1)T යන ලිපිය සහ 1971 අංක. 38 දරණ මූල්‍ය පනතේ 17 වන වගන්තිය ප්‍රකාර, පිරිවැයට වඩා අඩු මිලකට භූමිතෙල් අලෙවි කල විට සහනාධාර ලැබීමට සංස්ථාව හිමිකම් කියයි. සහනාධාරය උපචිත පදනමින් හඳුනාගෙන ඇත.

වෙනත් ආදායම්

උපචිත පදනම මත වෙනත් ආදායම් හඳුනාගෙන ඇත.

1.4.2 වියදම හඳුනාගැනීම

ව්‍යාපාරය සිදු කිරීමේදී සහ දේපළ, පිරියත සහ උපකරණ කාර්යක්ෂමව නඩත්තු කිරීමේදී දරන ලද සියලු වියදම් එම කාලය සඳහා වන ආදායම් ප්‍රකාශයෙන් අය කර ඇත.

බදුකරණය

කාලය සඳහා වන බදු වියදම් වර්තමාන සහ විලම්භිත බදු තුළ අඩංගු වේ.

(i) වර්තමාන බදු

වර්තමාන සහ පෙර කාලයන්ට අයත් වර්තමාන ආදායම් බදු වත්කම් සහ වගකීම්, මූල්‍ය ප්‍රකාශ තුළ ආදායම් සහ වියදම් ලෙස වාර්තාවූ සංරචකයන් සහ 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත සහ එයට සිදුවූ සංශෝධනවල විධිවිධාන මත පදනම්ව බදුකරණ ආයතන වෙත ගෙවන ලද හෝ ඒ වෙතින් ලැබිය යුතු මුදල් අනුව මනිනු ලැබේ.

(ii) විලම්භිත බදු

මූල්‍ය තත්ව ප්‍රකාශ දිනය වන විට වත්කම් හා වගකීම් වල බදු පදනම හා මූල්‍ය වාර්තාකරණ කාර්යයන් සඳහා ඒවායේ ධාරනීය අගය අතර වූ තාවකාලික විචලන මත වගකීම් ක්‍රමය උපයෝගී කර ගනිමින් විලම්භීත ආදායම් බදු සඳහා ප්‍රතිපාදන වෙන් කෙරෙයි.

ව්‍යාපාර සංකලනයක් නොවන ගනුදෙනුවක වත්කම් හෝ බැරකම් පිළිබඳව මූලික හඳුනාගැනීම මඟින් විලම්භීත කරන ලද ආදායම් බදු ගෙවීම හැර බදු ගෙවීම්වල සෑම තාවකාලික වෙනසක්ම විලම්භීත බදු මඟින් හඳුනාගෙන ඇති අතර, එය ගණකාධිකරණ ලාභ හෝ බදු ලාභ හෝ අලාභ වෙත බලපෑමක් නොකරයි.

අඩු කළ හැකි තාවකාලික විචලන, උපයෝගි නොකල බදු වත්කම් හා බදු අලාභ වල ඉදිරියට ගෙන ගිය අගය සඳහා වූ බදු පැනවිය හැකි ලාභයක් තිබීමේ සම්භාවිතාවක් තිබෙනතාක් හා අඩු කළ හැකි තාවකාලික විචලන උපයෝගි නොකළ බදු වත්කම් හා අලාභ වල ඉදිරියට ගෙන ගිය අගය ඒ සඳහා උපයෝගි කළ හැකි නම් අඩු කළ හැකි තාවකාලික විචලන වලට අදාළ විලම්භීත ආදායම් බදු වත්කම් හැර ව්‍යාපාරික සංකල්පයක් නොවන ගනුදෙනුවක් නොවන්නා වූද එම ගනුදෙනු අවස්ථාවේදී ගණනය කළ ලාභය හෝ බදු පැනවිය හැකි ලාභය හෝ පාඩුවට බලපෑමක් නොවන්නා වූද වත්කම් හෝ වගකීමක් මුලවරට හඳුනාගැනීමේදී පැනනගින විලම්භීත ආදායම් බදු වත්කම් පිළිගැනේ.

සෑම මූල්‍ය තත්ව ප්‍රකාශ දිනකම විලම්බිත ආදායම් බදු වත්කම් අගය සමාලෝචනයට පාත්‍රවී සමස්ථයක් වශයෙන් උපයෝගි කරගෙන ප්‍රමාණවත් බදු පැනවිය

හැකි ලාභයක් තිබීමේ සම්භාවිතාව තවදුරටත් වෙළඳ නොවන තරමට එම විලම්බිත ආදායම් බදු වත්කමින් අඩුකෙරේ.

විලම්බිත ආදායම් බදු වත්කම් හා වගකීම් ගණනය කරනුයේ වත්කම අලෙවිකරණ හෝ වගකීම් පියවන වසරට අදාළ අපේක්ෂිත බදු අනුපාතය අනුව වන අතර, එය පදනම්ව ඇත්තේ ශේෂපත්‍ර දිනයට බලපවත්වන හෝ ප්‍රමාණාත්මකව බලපවත්වන බදු අනුපාත හා බදු නීතින්ය. ස්කන්ධයේදී සජුවම හඳුනාගෙන තිබෙන අයිතම වලට අදාළ විලම්බිත ආදායම් බදු හඳුනාගෙන තිබෙනුයේ ආදායම් ප්‍රකාශයේ නොව ස්කන්ධයේය.

(iii) විකුණුම් බදු

වත්කම් මිලදී ගැනීමේදී හා සේවාවන් ලබාගැනීමේදී දරන ලද විකුණුම් බදු, බදු අධිකාරින්ගෙන් අයකරගත නොහැකි අවස්ථාවන්හිදී වත්කම් හා වියදම්හි කොටසක් ලෙස හඳුනාගන්නා අවස්ථාවන්හිදී හැර ආදායම්, වියදම් හා වත්කම් විකුණුම් බදු වටිනාකම හැර හඳුනාගෙන ඇත. බදු බලධාරින්ට අදාළව ලැබිය යුතු හා ගෙවිය යුතු අලෙවි බදු මුදල මූල්‍ය තත්ව ප්‍රකාශයේ ලැබිය යුතු මුදල් හා ගෙවිය යුතු මුදල් යටතේ ඇතුලත්ය.

ණය ගැනීම් පිරිවැය

වත්කම් වල අපේක්ෂිත භාවිතය හෝ අලෙවිය සඳහා සුදානම් වීම පිණිස ප්‍රමාණවත් කාලපරිච්ඡේදයක් අවශ්‍යයෙන්ම ලබා ගන්නා වත්කම් පවරා ගැනීම්, ඉදිකිරීම් හෝ නිෂ්පාදනය කිරීම් සඳහා සෘජුවම බලපානු ලබන සාමාන්‍ය සහ විශේෂිත ණය ගැනීම් පිරිවැය, එවැනි වත්කම් අපේක්ෂිත භාවිතයට ලක්කිරීම හෝ අලෙවි කිරීම සඳහා ප්‍රමාණවත් පරිදි සුදානම් වන තුරු පිරිවැයට එකතු කර ඇත.

1.4.3 විදේශ විනිමය ගනුදෙනු

ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ ක්‍රියාකාරී සහ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය ලෙස ශ්‍රී ලංකාවේ නිල මුදල් ඒකකය වන රුපියල යොදාගෙන තිබේ.
විදේශ විනිමය පදනම් කරගෙන සිදුවන ගණුදෙනු ඒ ඒ විදේශ මුදල් ඒකකයන්ට අදාළව ගණුදෙනුව සිදුව පැවති දිනයට අදාළවන විදේශ විනිමය අනුපාතිකය යොදාගෙන දේශීය ව්‍යවහාර මුදල් පදනම යොදගෙන මූලික වශයෙන් ගිණුම් වල වාර්තා කිරීම සිදුකරයි. එහිදී ඇතිවන විදේශ විනිමය වාසි හා පාඩු ආදායම් ගිණුමට ගලපනු ලබයි. විදේශ මුදල් ඒකකයන්ගේ ස්වරූපයෙන් දක්වා ඇති මූල්‍ය වත්කම් හා වගකීම් දේශීය ව්‍යවහාර මුදල් ඒකකයට අදාළව මූල්‍ය තත්ව ප්‍රකාශ දිනයට පැවති විනිමය අනුපාත යොදාගෙන පරිවර්තනය සිදුකරනු ලබයි. මූල්‍යමය නොවන ස්වරූපයේ පවතින සියළු දෑ ඓතිහාසික පිරිවැය පදනමට අනුව එම ගනුදෙනුව සිදුවන මුල් දිනට පැවතුනු විදේශ විනිමය අනුපාතයට පරිවර්තනයකර වාර්තා කරයි. වෙළෙඳපොළ සාධාරණ මිල අනුව විදේශ විනිමයෙන් අගය කළ මුදල් නොවන අයිතම සාධාරණ අගය තීරණය කළ දිනයේ විනිමය අනුපාතය භාවිතා කර පරිවර්තනය කරනු ලැබේ. සාධාරණ අගය අනුව අගය කළ මුදල් නොවන අයිතම පරිවර්තනයෙන් ලැබෙන ලාභ හෝ පාඩු, අයිතමයේ සාධාරණ අගය වෙනස් වීමෙන් ලැබෙන ලාභය හෝ පාඩුව අනුව හඳුනාගනු ලැබේ.

1.4.4 ජංගම හා ජංගම නොවන වර්ගීකරණය

ජංගම/ජංගම නොවන වර්ගීකරණය මත පදනම්ව මූල්‍ය තත්ව ප්‍රකාශය තුළ සමුහය වත්කම් සහ වගකීම් ඉදිරිපත් කරයි. වත්කමක් ජංගම ලෙස වර්ගීකරණය කෙරෙනුයේ:

- නිශ්කාශනය වන හෝ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ අලෙවි කිරීමට හෝ පරිභෝජනයට හැකි වූ විට
- මූලිකවම වෙළෙඳ අරමුණු සඳහා තබාගත් විට
- වාර්තාකරණ කාලසීමාවෙන් පසු මාස දොළහක් තුළ නිශ්කාශනය වන බවට අපේක්ෂා කරන විට

හෝ

- වාර්තාකරන දිනයෙන් පසු අවම වශයෙන් මාස දොළහකටවත් පසු වගකීමක් පියවීම පිණිස භාවිතා කිරීම හෝ හුවමාරු කිරීම සීමා නොකළ මුදල් හෝ මුදල් සමාන දෑ

අනෙක් සියල්ල ජංගම නොවන වත්කම් ලෙසට වර්ගීකරණය කෙරේ

වගකීමක් ජංගම ලෙස වර්ගීකරණය කෙරෙනුයේ:

- සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ පියවීමට අපේක්ෂා කරන විට
- මූලිකවම වෙළෙඳ අරමුණු සඳහා තබාගත් විට
- වාර්තාකරණ කාලසීමාවෙන් පසු මාස දොළහක් තුළ පියවීමට ඇති විට.

හෝ

- වාර්තාකරණ කාල සීමාවෙන් පසු අවම වශයෙන් මාස දොළහක් සඳහා වගකීමක් පියවීමෙන් විලම්භනය කිරීමට කොන්දේසි විරහිත අයිතියක් නැත

සමූහය අනෙක් සියලු වගකීම් ජංගම නොවන ලෙස වර්ගීකරණය කරයි.

විලම්භිත බදු වගකීම් ජංගම නොවන වගකීම් ලෙස වර්ගීකරණය කෙරේ.

1.4.5 දේපළ, පිරියත සහ උපකරණ

දේපළ, පිරියත හා උපකරණ වලට අදාල එදිනෙදා සේවා වියදම් හැර සමුච්චිත ක්ෂය වීම සහ සමුච්චිත හානි කරන වටිනාකම අඩු කළ පිරිවැයට දක්වනු ලැබේ.

මිණුම්

වත්කම් ලෙස සැලකෙන දේපළ පිරියත හා උපකරණ එකි වත්කම් අත්පත් කර ගැනීම හෝ ඉදිකිරීම හෝ අහඹු වියදම් සමඟ වන තක්සේරු කිරීම සඳහා සෘජුවම අදාල වන මිලට මූලික වශයෙන් මැනීම සිදු කරයි .

ස්ව ඉදිකිරීම් වත්කම්වල පිරිවැයවලට, ද්‍රව්‍ය පිරිවැය, සෘජු ශ්‍රමය හෝ වත්කම එහි අපේක්ෂිත භාවිතාව සඳහා ක්‍රියාකාරී තත්වයකට ගෙන ඒම පිණිස වැය කළ වෙනයම් පිරිවැය සහ එම අයිතම පිහිටා ඇති භූමියෙන් ඉවත් කිරීමට සහ ප්‍රතිස්ථාපනය කිරීමට යන පිරිවැය සහ සුදුසු වත්කම් ණයට ගැනීමේ පිරිවැය ඇතුළත් වේ. එවැනි පිරිවැයට, දේපළ, පිරියත සහ උපකරණවල කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමට සිදුවන අවස්ථාවන්වලදී දරන්නට සිදුවෙන පිරිවැය පිළිගැනීමට අවශ්‍ය උපමානයන් සපුරා තිබේ නම් එයද ඇතුළත් වේ.

පිරිවැය ආකෘතිය

පිරියත සහ උපකරණ සඳහා සංස්ථාව විසින් පිරිවැය ආකෘතියක් අදාල කර ගන්නා අතර, මිලදි ගන්නා හෝ ඉදිකිරීමේදී වන පිරිවැය ඒ සමඟ ඇතිවිය හැකි අනුෂාංගික වියදම්ද අඩුවෙන් ඒකරාශී කරන ලද ක්ෂය වීම සහ ඕනෑම ඒකරාශී කරන ලද හානිකරන අලාභයන්ද සමඟ වාර්තා කරනු ලබයි.

පසු පිරිවැය

දේපළ, පිරියත සහ උපකරණ ප්‍රතිශ්ඨාපනය කිරීමේ පිරිවැය, අයිතමන්ගේ අනාගත ආර්ථික ප්‍රතිලාභ සංස්ථාව වෙත ලැබේ නම් සහ එම පිරිවැය නියත වශයෙන්ම මැනිය හැකි නම් එම කොටසේ පවත්නා මිලට හඳුනාගෙන ඇත.

ප්‍රතිෂ්ඨාපනය කිරීමේ පිරිවැය

දේපළ පිරියත සහ උපකරණයක අනාගත ආර්ථික ප්‍රතිලාභය ප්‍රතිෂ්ඨාපනය කිරීමට හෝ පවත්වා ගැනීමට සිදු කරන අලුත්වැඩියාවන් සහ නඩත්තුව සඳහා වන පිරිවැය, ආදායම් ප්‍රකාශය වෙතින් වැය වූ ලෙස සඳහන් කෙරේ.

ඉවත් කිරීම

දේපළ, පිරියත හා උපකරණවල පවත්නා වටිනාකම, ඒවා විකිණීමේදී හෝ එමඟින් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ නොලැබෙන අවස්ථා වලදී, ඉවත් කර ඇත. දේපළ, පිරියත සහ උපකරණ ඉවත් කිරීම මඟින් වන ලාභය හෝ අලාභය එම අයිතමය ඉවත් කරනු ලබන අවස්ථාවේදී අදායම් ප්‍රකාශයේ අන්තර්ගත කර ඇත.

ක්ෂය වීම

ඉඩම්වලට අනියත ආයුකාලයක් ඇති බවට පිළිගැනෙන බැවින් ක්ෂය වීම්වලට අයත් නොවේ. විවිධ වර්ගයේ වත්කම් භාවිතා කිරීම ආරම්භ වූ දිනයේ සිට ඒවායේ තක්සේරු ආයුකාලයට ගැලපෙන කාල සීමාවන් තුළ සෘජු රේඛීය පදනමෙන් ක්ෂය වීම් ගලපනු ලබයි. වත්කම ශේෂ පත්‍රයෙන් ඉවත් කෙරෙන විට ක්ෂය වීම නවතී.

ව්‍යාපාර සැලසුම් සහ උපාය මාර්ග, අපේක්ෂිත භාවිත මට්ටම සහ අනාගත සංවර්ධනයන් වැනි සාධක, කළමනාකරණ විනිශ්චයන් භාවිතා කරමින්, සමූහය වාර්ෂිකව දේපළ පිරියත සහ උපකරණවල තක්සේරුගත ඵලදායී ආයුකාලයන්, අවශේෂ අගයන් සහ ක්ෂය වීම් ක්‍රමය සමාලෝචනය කරයි.

වත්කම්වල තක්සේරුගත ඵලදායී ආයුකාලය පහත පරිදි වේ:

8.5

වත්කම්		වසර
ගොඩනැගිලි		වසර 35 - 50
ටැංකි		වසර 20 - 40
නල මාර්ග		වසර 5 - 40
පිරියත සහ යන්ත්‍රසූත්‍ර		වසර 5 - 10
දොඹකර සහ පොම්ප		වසර 10 - 15
වාහන		වසර 4 - 5
ගෘහ භාණ්ඩ, සවිකිරීම් සහ කාර්යාල උපකරණ		වසර 3 - 10
බෝයාව		වසර 10
SPBM පහසුකම් - ටැංකි		වසර 40
මත්තල ගුවන් පහසුකම් - ඉන්ධන නල		වසර 40
	ඉන්ධන නල පද්ධතිය	වසර 40
	අභ්‍යන්තර මාර්ග ජාලය සහ වැට	වසර 20
	මීටර් සහ විද්‍යුත් පද්ධතිය	වසර 10
	ගිනි නිවීම් ක්‍රම පද්ධතිය	වසර 10
	වෙනත් වත්කම්	වසර 08
මුතුරාජවෙල - PLEM		වසර10

අවම වශයෙන් එක් එක් මූල්‍ය වසර අවසානයේදීවත්, වත්කම්වල අවශේෂ අගයන්, ඵලදායී ආයුකාලය සහ ක්ෂයවීමේ ක්‍රමය සමාලෝචනය කර අවශ්‍ය නව ගලපනු ලබයි.

කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන්

කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් පිරිවැයට දක්වා ඇත. ගොඩනැගිලි ඉදිකිරීම්, ප්‍රධාන යන්ත්‍රාගාරය සහ යන්ත්‍රසූත්‍ර සහ පද්ධති සංවර්ධනය, වැනි සෘජුවම දරන ලද ප්‍රාග්ධන මට්ටමේ වියදම් ප්‍රාග්ධනීකරණය වීමට නියමිතය.

මූල්‍ය වත්කම් හානිකරණය

දේපළ පිරියත සහ උපකරණ වල ධාරණ ප්‍රමාණය නැවත අයකර ගැනීමට නොහැකි ලෙස ඇතැම් අවස්ථා වෙනස්වීම් වලදී පෙන්නුම් කරන විට ඒවා හානිකරණය කිරීම සඳහා සමාලෝචනය කරනු ලබයි. වත්කම් ධාරණ ස්වභාවය ඒවායේ නැවත අයකර ගත හැකි ප්‍රමාණය ඉක්මවා යන ප්‍රමාණය සඳහා හානිකරණය වන අලාභ හඳුනාගෙන ඇත. නැවත අයකර ගත හැකි ප්‍රමාණය වනුයේ වත්කම් වල සාධාරණ අගයෙන් විකුණුම් පිරිවැය සහ භාවිත අගය අඩුකිරීමේදී වන ඉහළ ප්‍රමාණයයි. හානිකරණය කිරීම ඇගයීම සඳහා වෙන් වෙන් වශයෙන් හඳුනාගත හැකි මුදල් ප්‍රවාහ (මුදල් උත්පාදන ඒකක) සඳහා අඩුම මට්ටමින් වත්කම් කාණ්ඩ කර ඇත. අඩු වූ මූල්‍ය නොවන වත්කම් සෑම වාර්තාකරන දිනයකදීම අඩුකිරීම ආපසු හැරවිය හැකි වන පරිදි සමාලෝචනය කර ඇත.

1.4 6 ආයෝජනපරිපාලිත සමාගම්වල ආයෝජනය

අනුබද්ධ ආයතනය තුළ ආයෝජනය, කිසියම් අපහායන පාඩුවක් ඇත්නම් අඩු කර පිරිවැය අනුව සඳහන් කර ඇත.

ආයෝජන වත්කම්

හඳුනා ගැනීමේ පදනම

ආයෝජන දේපළ යනු කුලී ඉපැයීම සඳහා පවත්වාගෙනයන දේපළ හෝ ප්‍රාග්ධනය ඉහළ නැංවීම සඳහා හෝ එම අවස්ථා දෙකම සඳහා රඳවා ගත් එහෙත් ව්‍යාපාරයේ සාමාන්‍ය ක්‍රියාවලියේදී අලෙවි කිරීමක් සිදුනොවන දේපළ වේ.

මැණිම

මූල්‍ය ප්‍රකාශනවල පිරිවැය ක්‍රමය යටතේ ආයෝජන වත්කම් ගණනය කර ඇත. ඒ අනුව, වත්කමක් ලෙස හඳුනා ගැනීමෙන් අනතුරුව, දේපළ එහි පිරිවැයෙන් සමුච්චිත ක්ෂයවීම් සහ හානිකරණය කරන ලද අලාභයන් අඩුකර දක්වා ඇත.

ක්ෂයවීම්

මිලදිගත් දින සිට ඉවත් කරන ලද දිනය දක්වා වත්කම්වල වර්ගයේ ඇස්තමේන්තුගත ආයුකාලය පදනම් කරගෙන සරල රේඛීයව ක්ෂයවීම් දක්වා ඇත.

ඉවත්කිරීම

ඉවතලන අවස්ථාවලදී හෝ අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ නොමැති නිසා වත්කම් සම්පූර්ණයෙන්ම ඉවත් කළ විට ආයෝජන ඉවත් කරනු ලබයි. භාවිතයේ වෙනසක් ඇති අවස්ථාවලදී පමණක් ආයෝජන දේපළ මාරු කිරීම් සිදු කරනු ලබයි.

1.4 7 තොග

තොග තක්සේරු කරනු ලබනුයේ පිරිවැය හා ශුද්ධ උපලබ්ධිත අගය යන දෙකෙන්ම වඩාත් අඩු අගයටය. ශුද්ධ උපලබ්ධිත අගය යනු සම්පූර්ණ කිරීමට ඇස්තමේන්තුගත පිරිවැය හා අලෙවිය ක්‍රියාත්මක කිරීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය අඩුකිරීමෙන් පසු සාමාන්‍ය ව්‍යාපාරික කටයුත්තක් වශයෙන් අදාළ අගයට විකිණිය හැකි මිලයි. ශුද්ධ උපලබ්ධිත අගය අගයනු ලබන්නේ මෑතකාලීන වෙළෙඳපොළ ගනුදෙනු ඔස්සේ වාර්තාකරණ දිනයට පවතින වෙලෙඳපොළ තත්වයන් සහ මිල සලකා බලමිනි.

භාණ්ඩ තොග වර්තමාන තත්වයට ගෙන ඒමට අදාල වූ පිරිවැය පහත දැක්වෙන පිරිවැය සූත්‍රයන් උපයෝගි කරගෙන ගණනය කරනු ලබයි.

අමුද්‍රව්‍ය	- පෙර පිවිසි පෙර නිකුතු පදනම මත ගැනුම් මිල
නිමි භාණ්ඩ a) පිරිපහදු කළ නිෂ්පාදන b) ආනයන	සෘජු ද්‍රව්‍ය, සෘජු කුලී හා ණය ගැනීමේ පිරිවැය හැර සාමාන්‍ය මෙහෙයුම් ධාරිතාවය පදනම් වූ නිෂ්පාදන පොදු කාර්ය පිරිවැයේ උචිත අනුපාත අගය. - පෙර පිවිසි පෙර නිකුතු පදනම මත ගැනුම් මිල
නොනිමි වැඩ a) පිරිපහදු කළ නිෂ්පාදන ආ)ආනයන	 සෘජු ද්‍රව්‍ය, සෘජු කුලී හා ණය ගැනීමේ පිරිවැය හැර සාමාන්‍ය මෙහෙයුම් ධාරිතාවය පදනම් වූ නිෂ්පාදන පොදු කාර්ය පිරිවැයේ උචිත අනුපාත අගය - පෙර පිවිසි පෙර නිකුතු පදනම මත ගැනුම් මිල
වෙනත් නිමි භාණ්ඩ	- බරතැබූ සාමාන්‍ය පදනම මත මිලදී ගැනිම් පිරිවැය
පරිභෝජන භාණ්ඩ සහ අමතර කොටස්	- බරතැබූ සාමාන්‍ය පදනම මත මිලදී ගැනිම් පිරිවැය

1.4.8 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් හා මුදල් සමාන දෑ යනු අත ඇති මුදල්, ඉල්ලුම් තැන්පතු හා වටිනාකම වෙනස්වීමේ සුළු අවදානමකට පමණක් භාජනය විය හැකි හා මුදල්වලට ක්ෂණිකව පරිවර්තනය කළ හැකි කෙටි කාලීන ද්‍රවශීල ආයෝජනයන් ය. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණු සඳහා මුදල් හා මුදල් සමාන දෑ වලට ඇතුළත් වනුයේ අත ඇති මුදල්, බැංකු තැන්පතු හා බැංකු අයිරාවල ශුද්ධ හිඟ අගයන් ය. කෙටි කල් පිරීමේ ආයෝජනයන්ද, එනම් ලබාගත් දිනයේ සිට තුන් මසක් හෝ ඊට අඩු, මුදල් සමාන දෑ ලෙස සැලකේ.

1.4.9 ප්‍රතිපාදන සහ වගකීම්

ප්‍රතිපාදන

ආර්ථික ප්‍රතිලාභයන් පිළිඹිබු කරන සම්පත් ගලායාමේ සම්භාවිතාවයන්ට අදාළ බැදියාව පියවීම සඳහා අවශ්‍ය වූ විට බැදියාවේ අගය සම්බන්ධයෙන් විශ්වාසනීය ඇස්තමේන්තුවක් සකස් කළ හැකි වීම හා අතීත සිද්ධීන් හේතුකොටගෙන සංස්ථාවට වත්මන් (නීතිමය හෝ සම්මුතියකින්) බැදියාවක් තිබෙන විට ප්‍රතිපාදන හඳුනා ගැනේ. ප්‍රතිපාදන සියල්ලම හෝ ඒවායින් කොටසක් ප්‍රතිපූර්ණය කිරීම සමාගමක් අපේක්ෂා කරන විට එවැනි ප්‍රතිපූර්ණයන් හඳුනාගන්නේ වෙනම වත්කමක් වශයෙනි. නමුත් මෙය බලපානුයේ ප්‍රතිපූර්ණය නියත වශයෙන් සහතික නම් පමණි .කිසියම් ප්‍රතිපාදනයන් වෙනුවෙන් වූ වියදම් ඕනෑම ප්‍රතිපූර්ණයක ආදායම් ප්‍රකාශනයක ඇතුළත් කෙරේ .මුදලේ වර්තමාන කාල අගයේ බලපෑම වැදගත් නම් මුදලේ කාල අගයේ ප්‍රවර්තන වෙළඳ අගය පිළිඹිබු වන බදු අය කිරීමට පෙර අනුපාතිකයන් මත අපේක්ෂිත මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීමෙන් හා අදාල පරිදි වගකීමට ආවේනික වූ අවදානම මත ප්‍රතිපාදන තීරණය වේ .වට්ටම් යොදා ගන්නා විට කාලයාගේ ඇවෑම නිසා ප්‍රතිපාදනයේ වැඩි වීම පොළී වියදමක් ලෙස සලකනු ලැබේ .

නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් - පාරිතෝෂිකය

පාරිතෝෂික සම්බන්ධව මූල්‍ය තත්ව ප්‍රකාශය තුළ හඳුනාගත් වගකීම, ප්‍රක්ෂේපණ ඒකක ණය ක්‍රමය භාවිතා කර වාර්තාකරණ කාල සීමාව අවසන වගකීමේ වර්තමාන අගයයි. නිශ්චිත බැඳීමේ වර්තමාන අගය, උපකල්පන ගණනාවක් භාවිතා කරමින් උපචිත පදනම මත තීරණය කරන සාධක මත රඳා පවතී. පාරිතෝෂික පිරිවැය තීරණය කිරීම සඳහා භාවිතා කරන මෙම උපකල්පනයන්ට, වට්ටම් අනුපාතිකය, අපේක්ෂිත කාර්ය මණ්ඩල පිරිවැටුම සහ වැටුප් වර්ධක අනුපාතය ඇතුලත් වේ. මෙම උපකල්පනයන්ට සිදු කරන කිසියම් වෙනස්කමක් පාරිතෝෂික බැඳීමේ ධාරක අගයට බලපායි.

කළමනාකාරීත්වය සෑම වසරක් අවසානයේදීම සුදුසු වට්ටම් අනුපාතය තීරණය කරයි. මෙය, නිශ්චිත ප්‍රතිලාභ බැඳීම පියවීම සඳහා අවශ්‍ය කරන බවට අපේක්ෂා කරන තක්සෙරු කළ අනාගත මුදල් ප්‍රවාහයේ වර්තමාන අගය තීරණය කිරීම සඳහා භාවිතා කළ යුතු පොළී අනුපාතයයි. වට්ටම් අනුපාතය තීරණය කිරීමේදී, කළමනාකාරීත්වය ශ්‍රී ලංකාව තුළ සංස්ථායික බැඳුම්කර සඳහා ගැඹුරු වෙළෙඳපොළක් නොමැති කල්හි රජයේ බැඳුම්කරවල පොළී අනුපාතය සලකා බලයි. නිශ්චිත ප්‍රතිලාභ බැඳීම සඳහා වන අනෙකුත් ප්‍රධාන උපකල්පනයන් වර්තමාන වෙළෙඳපොළ තත්වයන් මත පදනම් වේ.

LKAS 19 - සේවක ප්‍රතිලාභ සමග අනුකූලව සියලුම ස්ථීර සේවකයන්ගේ සේවය ආරම්භයේදී විශ්‍රාම ප්‍රතිලාභ සඳහා ප්‍රතිපාදන සලසා ඇත. කෙසේ වෙතත් 1983 අංක 12 දරන පාර්තෝෂික ගෙවීම යටතේ, සේවකයෙකු සම්බන්ධව වගකීම ලැබෙන්නේ අඛණ්ඩ සේවයේ වසර 5ක් සම්පූර්ණ වීමෙන් පමණි. මේය බාහිරව අරමුදල් සපයන නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් නොවේ.

උපචිත ලාභ සහ පාඩු අය කෙරෙන්නේ ඒවා ඇතිවෙන කාල සීමේවේ විස්තීර්ණ ආදායම තුළයි.

නිශ්චිත දායක සැලසුම- සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

අදාළ නීතිරීති සහ රෙගුලාසිවලට අනුකූලව සේවකයෝ සේවක අර්ථ සාධක අරමුදලට දායක වෙති. සංස්ථාව සේවක මාසික දළ වැටුපෙන් 15% ක් හා 3% ක් පිළිවෙළින් සේවක අර්ථ සාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල දායක කරන අතර සේවකයන් විසින් සේවය සපයන කාලවල වියදම් ලෙස ආදායම් ප්‍රකාශයේ වාර්තා කරනු ලබයි.

1.4.10 ප්‍රාග්ධන සංචිතය

රජයේ ඒකාබද්ධ අරමුද්ලින් නිශ්චිතව ලැබූ මුදල් හා ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු අලෙවියෙන් ලැබුණු ශුද්ධ අගය (අවසානයේදී ලංක ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට නිකුත් කළ ප්‍රාග්ධනය) ප්‍රාග්ධන සංචිතයට බැරකර ඇත

1.4.11 මූල්‍ය උපකරණ

සමූහය උපකරණයන්ගේ ගිවිසුම්ගත විධිවිධානවල පාර්ශ්වයක් වූ විට මූල්‍ය වත්කම් සහ වගකීම් සාධාරණ අගයකින් හඳුනාගැනේ. මූල්‍ය වත්කම් සහ වගකීම් (ලාභ හෝ පාඩු තුළින් සාධාරණ අගයක ඇති මූල්‍ය උපකරණ හැර) අත්පත් කරගැනීම හෝ නිකුත් කිරීමට සෘජු ලෙස සම්බන්ධ වන ගනුදෙනු පිරිවැය, මූලික හඳුනාගැනීමේදී සුදුසු ලෙස මූල්‍ය උපකරණයන්ගේ සාධාරණ අගයට එක් කිරීම හෝ අඩු කිරීම හෝ කරනු ලැබේ. ගනුදෙනු පිරිවැය, ලාභ හෝ පාඩු තුළ ඉක්මනින්

හඳුනාගැනෙන ලාභ හෝ පාඩු තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය උපකරණ අත්පත්කරගැනීමට සම්බන්ධ වේ.

වත්කම් වෙතින් මුදල් ප්‍රවාහ ලැබීමට ඇති හිමිකම කල් ඉකුත් වූ විට හෝ සමූහය විසින් හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ මාරු කළ විට මූල්‍ය වත්කම් ශේෂ පත්‍රයෙන් ඉවත් කෙරේ. ගිවිසුම තුළ නිශ්චිතව දක්වා ඇති බැඳීම අවලංගු කර හෝ කල් ඉකුත් වී විට මූල්‍ය වගකීම් මූල්‍ය තත්ව ප්‍රකාශයෙන් ඉවත් කෙරේ.

මූලික හඳුනාගැනීමේදී, සමූහය විසින් පහත වර්ගයන් යටතේ මූල්‍ය උපකරණ වර්ගීකරණය කරනු ලැබේ:

(I) ණය සහ ලැබීම්

ණය සහ ලැබීම් යනු ව්‍යුත්පත්න නොවන සහ සක්‍රිය වෙළෙඳපොළ තුළ දක්වා නොමැති ස්ථිර හෝ තීරණය කළ හැකි ගෙවීම් වේ. සමූහයේ ණය සහ ලැබීම්වලට වෙළෙඳ ලැබීම්, කාර්ය මණ්ඩල ණය සහ මුදල් සමාන දෑ අයත් වන අතර, ජංගම සහ ජංගම නොවන වත්කම් යන දෙකටම ඇතුළත් වේ. ණය සහ ලැබීම්, ඵලදායී පොළී අනුපාත ක්‍රමය භාවිතා කර ක්‍රමක්ෂය පිරිවැය මගින් මනිනු ලැබේ. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කෙරෙන්නේ EIR හි අනන්‍ය කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සහ අත්පත්කරගැනීමේ වට්ටම් සැලකිල්ලට ගෙනය.

(ii) කල්පිරීමේ ආයෝජන

ස්ථිර හෝ තීරණය කළ හැකි ගෙවීමක් සහ ස්ථිර කල්පිරීමක් ඇති මූල්‍ය වත්කම්, කල්පිරීම දක්වා රඳවාගත් ගනයට අයත් වන අතර එය කෙරෙන්නේ එම වත්කම් කල් පිරීම දක්වා රඳවා තබාගැනීමට සමූහයට හැකියාව සහ ධනාත්මක අදහස ඇති විටය.

මූලික මැනීමෙන් පසුව කල්පිරීමේ ආයෝජන ඵලදායී පොළී අනුපාත ක්‍රමය භාවිතා කර ක්‍රමක්ෂය පිරිවැය මගින් මනිනු ලැබේ. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කෙරෙන්නේ ඵලදායී පොළී අනුපාත හි අනන්‍ය කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සහ අත්පත්කරගැනීමේ වට්ටම් සැලකිල්ලට ගෙනය.

ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ කල් පිරීමේ අයෝජනවලට, කල් පිරිම දක්වා රඳවාගැනීමේ අදහස අනුව ලබාගත් භාණ්ඩාගාර බැඳුම්කර අයත් වේ.

(iii) අලෙවිය සඳහා ලද හැකි ආයෝජන (AFS)

අලෙවිය සඳහා ලද හැකි ආයෝජන යනු මෙම වර්ගයට නම් කරන ලද හෝ වෙනත් වර්ගයක් යටතේ වර්ගීකරණය නොකළ ව්‍යුත්පත්න නොවන අලෙවි ආයෝජනයන් වේ. සංස්ථාවේ අලෙවිය සඳහා ලද හැකි ආයෝජනවලට ස්කන්ධ ආරක්ෂණ (ලැයිස්තුගත කළ සහ නොකළ) තුළ ආයෝජනයන් අයත් වේ. අලෙවිය සඳහා ලද හැකි ආයෝජන මූල්‍ය වත්කම් වෙනත් විස්තීර්ණ ආදායම් තුළ හඳුනාගත් උපලබ්ධි නොවූ ලාභ හෝ පාඩු සමග සාධාරණ අගය මත මැනුම් කර ආයෝජන ශේෂ පත්‍රයෙන් ඉවත් කෙරෙන තෙක් අලෙවිය සඳහා ලද හැකි ආයෝජන සංචිතය තුළට බැර කෙරෙන අතර එහිදී සමුච්ඡිත ආදායම හෝ පාඩුව අනෙක් මෙහෙයුම් ආදායම තුළ හඳුනාගැනේ, නැතහොත් ලාභ හෝ පාඩු ප්‍රකාශයට අලෙවිය සඳහා ලද හැකි ආයෝජන සංචිතය වෙතින් සමුච්ඡිත පාඩුව නැවත වර්ගීකරණ කරන විට ආයෝජනය හානිකරණය වන ලෙස තීරණය කෙරේ. දක්වන ලද ස්කන්ධ ආයෝජනවල සාධාරණ අගයන් තීරණය කෙරෙන්නේ සක්‍රිය වෙළෙඳපොල තුළ මිල මගිනි.

(iv) ක්‍රමක්ෂය පිරිවැය අනුව මූල්‍ය වගකීම්

ක්‍රමක්ෂය පිරිවැය අනුව මූල්‍ය වගකීම්වලට වෙළෙඳ සහ අනෙකුත් ගෙවීම්, ණය ගැනීම් සහ කෙටි කාලීන ණය ගැනීම් අයත් වේ.

මූලික හඳුනාගැනීමෙන් පසුව, පොළී දරන ණය සහ ණය ගැනීම් ක්‍රමක්ෂය පිරිවැය අනුව ඵලදායී පොළී අනුපාත ක්‍රමය භාවිතා කර මනිනු ලැබේ. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කෙරෙන්නේ ඵලදායී පොළී අනුපාත හි අනන්‍ය කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සහ අත්පත්කරගැනීමේ වට්ටම් හෝ ආධික්‍යය සැලකිල්ලට ගෙනය. ඵලදායී පොළී අනුපාත ක්‍රමක්ෂය, ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය තුළ අන්තර්ගත වී ඇත.

මූල්‍ය වත්කම් හානිකරණය

සෑම වාර්තාකරණ දිනකම, සමූහය විසින් මූල්‍ය වත්කමක් හානිකරණය වී ඇති බවට විෂය මූලික සාක්ෂ්‍යයක් ඇතිද යන්න අගයනු ලබයි. අපහායන පාඩුවක් සඳහා විෂය මූලික සාක්ෂ්‍යයක් ඇතිද යන්න තීරණය කිරීමට භාවිතා කරන නිර්ණායක වලට පහත දේ ඇතුළත් වේ:

- ණයකරුවාගේ පැහැදිලි මූල්‍ය මය අපහසුතාවය;
- පොළී හෝ මුදල ගෙවීම පැහැර හැරීම;
- ණය ගනු ලැබූ තැනැත්තා බංකොලොත් වන බවට හෝ වෙනත් මූල්‍ය මය අසංවිධානාත්මක බවකට පත්වීමට ඉඩ ඇතිවීම
- ගෙවීම පැහැර හැරීමට බලපාන හිඟයන්ගේ වෙනස්කම් හෝ ආර්ථික තත්වයන්ගේ වෙනස්කම් වැනි තක්සේරු කළ අනාගත මුදල් ප්‍රවාහවල මැනිය හැකි අඩුවීමක් පවතින බවට නිරීක්ෂණය කළ හැකි දත්ත

ස්කන්ධ ආරක්ෂාව සම්බන්ධව ගත් විට ආරක්ෂණයේ පිරිවැයට වඩා එහි සාධාරණ අගය දිගින් දිගටම අඩුවීමද වත්කම් හානිකරණය බව පෙන්වන ලක්ෂණයකි. මෙම තීරණයට වැදගත් විනිශ්චයක් අවශ්‍ය වේ. මෙය විනිශ්චය කිරීමේදී කළමනාකාරීත්වය තවත් බොහෝ සාධක අතර මෙම සාධක ඇගයීමට ලක් කරයි; ආයෝජනයක සාධාරණ අගය එහි පිරිවැයට වඩා අඩුවෙන ප්‍රමාණය සහ කාල සීමාව, මූල්‍ය මය සුවතාවය සහ ආයෝජකයින් වෙත පෙනී යන කෙටි කාලීන ව්‍යාපාර පෙනුම සහ කර්මාන්ත සහ ආංශික කාර්යසාධනය, තාක්ෂණයේ වෙනස්වීම්, මෙහෙයුම් සහ මූල්‍ය මුදල් ප්‍රවාහ ඇතුළු සාධක.

එවැනි සාක්ෂ්‍යයන් පවතින්නේ නම්, සංස්ථාව අපහායන පාඩුවක් පහත පරිදි හඳුනාගනු ලබයි:

(i) ක්‍රමක්ෂය වූ පිරිවැය අනුව මූල්‍ය වත්කම් පාඩුව යනු ණයෙහි හෝ ලැබීම්වල ක්‍රමක්ෂය පිරිවැය හා උපකාරකවල මුල් ඵලදායී පොළී අනුපාතයෙන් වට්ටම් කළ තක්සේරුගත අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන අගයන්ගේ වෙනසයි. වත්කමෙහි ධාරක ප්‍රමාණය දීමනා ගිණුමක් භාවිතා කර මෙම ගිණුමෙන් ඍජුව හෝ වක්‍රව අඩු කෙරේ.

(ii) අලෙවිය සඳහා ලද හැකි වත්කම: සමුච්ඡගත අපහායන පාඩුව යනු වත්කමෙහි මුල් පිරිවැය සහ මැනීමේ දිනයේදී එහි සාධාරණ අගය අතර වෙනසයි, මෙහිදී විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගත් අපහායන පාඩු අඩු කෙරේ.

1.6 නිකුත් කළ එහෙත් තවමත් ක්‍රියාත්මක නොවන ගිණුම්කරණ ප්‍රතිපත්ති

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරවරුන්ගේ ආයතනය විසින් පහත SLFRS නිකුත් කර ඇති අතර ඒවා ක්‍රියාත්මක වන්නේ අනාගතයේදී බැවින් මෙම මූල්‍ය ප්‍රකාශ සැකසීමේදී ඒවා අදාළ කර නැත. එම SLFRS මගින් සමූහය විසින් වර්තමානයේ සකසන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මත යම් බලපෑමක් තිබෙනු ඇති අතර අනාගත මූල්‍ය ප්‍රකාශ සඳහා පදනම් වෙනු ඇත.

ආ) SLFRS 9 - මූල්‍ය උපකාරක: වර්ගීකරණය සහ මැනීම

නිකුත් කරන ලද SLFRS 9 මගින් LKAS 39 හට ආදේශ වීමේ පළමු අදියර පිළිබිඹු කෙරෙන අතර මූල්‍ය උපකාරකවල වර්ගීකරණය සහ මැනීමට අදාළ වේ. මෙයට මූල්‍ය වත්කම්වල හානිකරණය ගණනය කිරීම සඳහා වන නව අපේක්ෂිත ණය පාඩු මාදිලියද ඇතුළත් වේ.

මෙම ප්‍රමිතිය 2018 ජනවාරි මස 01 වෙනි දිනෙන් පසු බලාත්මක වෙනු ඇත.

ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්වල අපහායන පාඩුව, පාඩුවේ අගය අඩු වන්නේ නම් හා එම අඩුවීම අපහායනය හඳුනාගැනීමෙ පසුව එන තත්ත්වයකට විෂයමූලිකව සම්බන්ධ වන්නේ නම්, ඉන්පසු කාලයේදී ප්‍රත්‍යාවර්තනය කෙරේ. අලෙවිය සඳහා ඇති සක්‍රීය උපකාරකවල අපහායන පාඩු ප්‍රත්‍යාවර්තනය නොකෙරේ.

අලෙවිය සඳහා ලද හැකි ස්කන්ධ උපකාරක හානිකරණය වන්නේ කවදාදැයි තීරණය කිරීමට සමූහය LKAS 39 මාර්ගෝපදේශය අනුගමනය කරයි.

1.5 අසම්භාව්‍ය බැරකම්, නඩු කටයුතු සහ බැඳීම්

ආර්ථික ප්‍රතිලාභ හුවමාරු කිරීම නිශ්චිත නොවන අවස්ථා වලදී හෝ ස්ථීර ගණනය කළ නොහැකි විට, වර්තමාන ගෙවීම් හෝ නිශ්චිත නොවන අනාගත සිදුවීම් මගින් පමණක් පැවැත්ම තහවුරු වන ගෙවීම් අවිනිශ්චිත වගකීම් ලෙස හැඳින්වේ. මූල්‍ය තත්ව ප්‍රකාශය තුළ මෙම ගෙවීම් හඳුනාගෙන නොමැති නමුත් අසම්භාව්‍ය වගකීම් දුරස්ථ ඒවා නොවේ නම්, ඒවා අනාකරණය කර ඇත.

අ) SLFRS 9 - මූල්‍ය උපකාරක: වර්ගීකරණය සහ මැනීම

ආ) SLFRS 15- පාරිභෝගිකයින් සමග ගිවිසුම් වෙතින් ආදායම

ආදායම හඳුනාගත යුත්තේද, එසේනම් කොපමණක්ද සහ කෙදිනද යන්න තීරණය කිරීම සඳහා විස්තීර්ණ රාමුවක් SLFRS 15 මගින් ස්ථාපිත කරයි. එය, LKAS 18 ආදායම, LKAS 11 ඉදිකිරීම් කොන්ත්‍රාත් සහ IFRIC 13 පාරිභෝගික ලැදියා වැඩසටහන ඇතුළුව පවතින ආදායම් හඳුනාගැනීමේ මාර්ගෝපදේශයට ආදේශ වෙයි. මෙම ප්‍රමිතිය 2018 ජනවාරි මස 01 වෙනි දිනෙන් පසු බලාත්මක වෙනු ඇත.

එම ප්‍රමිති බලාත්මක වීමෙන් පසුව සංස්ථාව ඒවා අදාළ කරගනු ඇත. මෙම මූල්‍ය ප්‍රකාශ පල කරන දිනය වන විට විස්තරාත්මක සමාලෝචනය නොනිමි ලෙස පැවති අතර මූල්‍ය ප්‍රතිඵල නිසි ලෙස තක්සේරු කළ නොහැක.

1.7 නව දේශීය ආදායම් පනත

2017 සැප්තැම්බර් 07 වන දින නව දේශීය ආදායම් පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සම්මත වූ අතර 2018 අප්‍රේල් 1 වනදා සිට බලාත්මක වේ. එම පනත මගින් සමූහය විසින් වර්තමානයේ සකසන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මත යම් බලපෑමක් තිබෙනු ඇති අතර අනාගත මූල්‍ය ප්‍රකාශ සඳහා පදනම් වෙනු ඇත.

පනත බලාත්මක වීමෙන් පසුව සංස්ථාව එයට අනුකූලව කටයුතු කරනු ඇත. මෙම මූල්‍ය ප්‍රකාශ පල කරන දිනය වන විට විස්තරාත්මක සමාලෝචනය නොනිමී ලෙස පැවති අතර මූල්‍ය ප්‍රතිඵල නිසි ලෙස තක්සේරු කළ නොහැක.

2. ආදායම	සංස්ථාව		සමූහය	
	2016 රු.මි	2015 රු.මි.	2016 රු.මි.	2015 රු.මි.
දේශීය	439,454.172	368,847.714	439,454.172	368,399.502
අපනයන	35,117.794	44,279.605	35,117.794	44,279.605
නැව් ඉන්ධන පිරවුම	478.988	1,368.369	478.988	1,363.413
පර්යන්ත ගාස්තු හා වෙනත්	-	-	382.561	980.332
මුළු ආදායම	475,050.954	414,495.688	475,433.515	415,022.852
අඩු කළා : නිෂ්පාදන බද්ද හා ජා.ගො.බ.	(51,989.903)	(37,761.201)	(51,989.903)	(37,761.200)
ශුද්ධ ආදායම	**423,061.051**	**376,734.487**	**423,443.612**	**377,261.652**

3. වෙනත් මෙහෙයුම් ආදායම්	සංස්ථාව		සමූහය	
	2016 Rs. Mn	2015 Rs. Mn	2016 Rs. Mn	2015 Rs. Mn
ආයෝජන දේපළ මත ආදායම	38.634	47.590	38.634	47.590
භූමිතෙල් සහනාධාරය	2,982.000	3,860.000	2,982.000	3,860.000
සේවක ණය පොළිය	161.980	173.181	477.960	530.949
කුලී ආදායම්	18.512	12.251	21.089	56.030
දේ.පි.උ. අපහරණය මගින් ලාභය/(පාඩුව)	36.414	20.212	87.659	28.524
පිරවුම් හල් උපකරණ අලෙවියෙන් ලාභය	15.429	16.642	15.429	16.642
ලාභාංශ ආදායම	292.502	0.004	0.002	0.004
විවිධ ආදායම්	42.968	104.100	149.317	204.495
	3,588.439	**4,233.981**	**3,772.090**	**4,744.234**

4. මෙහෙයුම් ලාභය	සංස්ථාව		සමූහය	
	2016 රු.මි.	2015 රු.මි.	2016 රු.මි.	2015 රු.මි.
පහත සඳහන් වියදම් ගෙවීමෙන් පසු ප්‍රකාශිත මෙහෙයුම් ලාභය				
අධ්‍යක්ෂවරුන්ගේ වේතන	1.762	2.487	9.114	2.487
විගණකවරුන්ගේ වේතන	2.108	1.000	3.874	1.000
ක්ෂයවීම් (සටහන 8)	642.800	758.605	749.721	698.950
දැන්වීම් වියදම්	37.491	30.057	37.491	30.057
නීති ගාස්තු සහ වෙනත් වෘත්තීය ගාස්තු	125.467	67.119	125.467	67.119
අවසර නොදුන් වැටි	1,345.762	1,280.392	1,345.762	1,280.392
මහා භාණ්ඩාගාරයට විශේෂ ගාස්තු	1,000.000	750.000	1,000.000	750.000
බොල් ණය/කපා හරින ලද ණය	-	8.405	-	8.405

5. මූල්‍ය ආදායම්	සංස්ථාව		සමූහය	
	2016 රු.මි.	2015 රු.මි.	2016 රු.මි.	2015 රු.මි.
			-	
භාණ්ඩාගාර බිල්පත්, ස්ථාවර තැන්පතු සහ ඉල්ලුම් තැන්පතු වලින් ලද පොළී ආදායම	4,142.347	2,930.491	4,232.716	2,956.301
නේවාසික විදේශ මුදල් ගිණුම් වෙතින් පොළී ආදායම	0.883	1.045	0.883	1.045
ණය ඉන්වොයිස් සහ කල් ඉකුත් වූ වෙළෙඳ ණය මත පොළී ආදායම	26.748	42.664	26.748	42.664
ලංචම්/පෙ. විදුලි සමාගම්/ගුවන් තෙල් ණය වෙතින් පොළී ආදායම	676.857	1,105.732	676.857	1,105.732
භාණ්ඩාගාර බැඳුම්කර මත පොළී ආදායම	3,527.277	931.738	3,527.277	931.738
	8,374.112	**5,011.670**	**8,464.482**	**5,037.480**

6. මූල්‍ය වියදම්	සංස්ථාව		සමූහය	
	2016 රු.මි.	2015 රු.මි.	2016 රු.මි.	2015 රු.මි.
දීර්ඝකාලීන ණය පොළී	50.513	61.147	217.288	61.147
විදේශ විනිමය බැංකු ණය පොළී	11,340.254	14,975.672	11,340.254	14,975.672
වෙනත් මූල්‍ය පිරිවැය	13.770	11.841	13.770	11.841
	11,404.537	**15,048.660**	**11,571.312**	**15,048.660**

7. බදු වියදම්	සංස්ථාව		සමූහය	
	2016 Rs. Mn	2015 Rs. Mn	2016 Rs. Mn	2015 Rs. Mn
ජංගම බදු :				
ජංගම ආදායම් බදු	12,186.470	634.384	12,401.254	746.274
පෙර වසරවල ඌන ප්‍රතිපාදන	-	-	45.782	28.308
බෙදාහැරිය හැකි ලාභය මත බද්ද	4,340.132	-	4,340.132	94.906
විලම්භිත බද්ද:				
තාවකාලික වෙනස්කම් ඇති වීම සහ ප්‍රත්‍යාවර්තනය	-	-	363.38	51.881
ආදයම් බදු වියදම් - ආදායම් ප්‍රකාශය	**16,526.602**	**634.384**	**17,150.545**	**921.369**
ආදායම් බදු වියදම්-වෙනත් විස්තීර්ණ ආදායම	**-**	**-**	**33.409**	**-**
මුළු ආදායම් බදු වියදම්	**16,526.602**	**634.384**	**17,183.955**	**921.369**

ජංගම බදු වියදම් සහ බදුවලට පෙර ලාභයේ සසඳුමක් පහත දක්වා ඇත:

බදුවලටපෙර ගිණුම්කරණ ලාභය	**69,553.681**	**(19,885.780)**	**71,589.544**	**(17,923.324)**
			-	-
එකතු කළා: ඉඩනොදුන් වියදම්	1,086.100	858.445	2,363.373	2,078.744
අඩු කළා: ඉඩදිය හැකි වියදම් සහ නිදහස් කරන ආදායම	(3,309.971)	(2,689.360)	(4,495.215)	(3,886.062)
ගැලපුම්කළ වෙළෙඳ ලාභය	**67,329.811**	**(21,716.694)**	**69,457.702**	**(19,730.642)**
අඩු කළා: බදු අලාභ	(23,563.094)	(1,380.693)	(24,410.830)	(2,001.046)
එකතුකළා: වසරේ බදු අලාභ	-	25,363.045	-	25,363.045
බදු අය කළ හැකි ආදායම	**43,766.717**	**2,265.659**	**45,046.872**	**3,631.358**
ආදායම් බදු				
28%	12,136.716	**634.384**	12,136.716	**634.384**
සහන අනුපාත	49.754		264.538	**111.890**
පෙර වසරේ ඌන ප්‍රතිපාදන	-	-	45.782	28.308
බෙදා හැරිය හැකි ලාභය මත බදු	4,340.132	-	4,340.132	94.906
ආදායම් ප්‍රකාශයේ විලම්භිත බදු	-	-	363.378	51.881
තාවකාලික වෙනස්කම් ඇති වීම සහ ප්‍රත්‍යාවර්තන ඕ.සී.අයි.	-	-	33.409	-
ආදායම් බදු වියදම	**16,526.602**	**634.384**	**17,183.955**	**921.369**

2006 අංක 10 දරන දේශීය ආදායම් පනත සහ එයට සිදු කළ සංශෝධනවලට අනුව සංස්ථාව තම දළ ලාභයෙන් සියයට විසි පහක් ලාභාංශ ලෙස ගෙවන්නේ නම් 2011/12 බදු වසරේ සිට වසර 5 ක කාලයක් ලාභය මත ආදායම් බදු ගෙවීමෙන් නිදහස් කෙරිණි.

කෙසේ වෙතත්, සංස්ථාව කිසිදු ලාභාංශයක් රජයට නොගෙවූ නිසා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව නිදහස් කළ ආදායම් බදු සඳහා තක්සේරු නිකුත් කරමින් සිටී 2011/12, 2012/13, 2013/14 සහ 2014/15 ඇගයීම් වසර සඳහා පිළිවෙළින් රු.65,115,350, රු. 91,665,432, රු. 99,942,556 සහ රු.. 723,091,623 අගයන්ට තක්සේරු කර ඇත. ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව මේ සම්බන්ධව වලංගු අභියාචනයන් සිදු කර ඇත.

8. දේපළ, පිරියත සහ උපකරණ	ඉඩම් සහ ගොඩනැගිලි	පැවරූ දේපළ	පිරියත, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	SPM සංකීර්ණය	මෝටර් වාහන	ගෘ./සවිකිරීම්, කා.උප සහ වෙනත් වත්කම්	නොනිමි ප්‍රාග්ධන වැඩ	සංස්ථාවේ එකතුව	සමූහයේ එකතුව
	රු.මි.	රු.මි.	රු.මි.	රු.මි.	රු.මි.	රු.මි.	රු.මි.	රුගමි.	රු.මි.
8.1.පිරිවැය									
01/01/2016 දිනට ශේෂය	4,436.351	1.016	8,747.344	2,142.422	851.790	2,163.890	3,494.321	21,837.133	49,443.830
එකතු කිරීම්/මාරු කිරීම්	56.329		2,289.298		151.143	45.125	(2,064.237)	477.658	1,391.069
2015 සඳහා ඒකාබද්ධ ගැලපුම්									-
ඉවත් කිරීම්	(0.019)		(6.266)		(13.251)	(4.823)		(24.358)	(118.599)
									-
31/12/2016 දිනට ශේෂය	**4,492.661**	**1.016**	**11,030.376**	**2,142.422**	**989.683**	**2,204.191**	**1,430.084**	**22,290.433**	**50,716.300**
8.2 ක්ෂය වීම්									
01/01/2016 දිනට ශේෂය	573.626	0.397	4,209.625	1,290.634	338.794	1,552.235	-	7,965.311	18,884.598
වර්ශය සඳහා අය කිරීම	112.730		526.115		134.640	64.422	-	837.907	1,638.847
ඉවත් කිරීම්			(0.367)		(13.251)	(4.823)	-	(18.441)	(112.656)
									-
31/12/2016 දිනට ශේෂය	686.357	0.397	4,735.372	1,290.634	460.184	1,611.834	-	8,784.778	20,410.789
31.12.2016 දිනට ශුද්ධ පොත් වටිනාකම	**3,806.304**	**0.619**	**6,295.003**	**851.788**	**529.499**	**592.358**	**1,430.084**	**13,505.655**	**30,305.510**
31.12.2015 දිනට පිරිවැය	4,436.351	1.016	8,747.344	2,142.422	851.790	2,163.890	3,494.321	21,837.133	49,409.912
31.12.2015 දිනට ගිණුම්ගත ශේෂය	573.626	0.397	4,209.625	1,290.634	338.794	1,552.235	-	7,965.311	18,884.598
31.12.2015 දිනට ශු.පො.ව (යළි ප්‍රකාශිත)	**3,862.724**	**0.619**	**4,537.719**	**851.788**	**512.996**	**611.654**	**3,494.321**	**13,871.821**	**30,525.314**

තක්සේරු දෙපාර්තමේන්තුවෙන් සිදු කළ තක්සේරුවට අනුව සංස්ථාවේ ඉඩම් සහ ගොඩනැගිලිවල අගය රු මිලි **12,658** කි.

8.3 ආයෝජන දේපල	සංස්ථාව		සමූහය	
	2016	2015 යළි ප්‍රකාශිත	2016	2015 යළි ප්‍රකාශිත
	රු.මි.	රු.මි.	රු.මි.	රු.මි.
පිරිවැය				
වසර මුල ශේෂය (යළි ප්‍රකාශිත)	57.891	37.607	57.891	37.607
එකතු කළා: එක් කිරීම් / මාරු කිරීම්	-	20.285	-	20.285
වසර අවසානයේ ශේෂය	57.891	57.891	57.891	57.891
ක්ෂයවීම්				
වසර ආරම්භයේ ශේෂය (යළි ප්‍රකාශිත)	14.869	9.879	14.869	9.879
එකතු කළා: මාරු කිරීම		3.543		3.543
එකතු කළා: වසර සඳහා අය කිරීම	1.447	1.447	1.447	1.447
වසර අවසානයේ ශේෂය	16.316	14.869	16.316	14.869
ශුද්ධ පොත් අගය	**41.575**	**43.022**	**41.575**	**43.022**

ආයෝජන වත්කම්වලට කොළඹ තර්ස්ටන් පාරේ දේපළ, මල් පාර දේපළ සහ කුලියට ලබාදුන් පිරවුම්හල් අයත් වේ.

විස්තරය	සාධාරණ අගය
	රු.මි.
අංක.80, මල් පාර කොළඹ 07	40.000
අංක 22/1, තර්ස්ටන් පාර, කොළඹ	
පිරවුම් හල්	18.283

ආයෝජන දේපළවල සාධාරණ අගය පදනම් වන්නේ 2012 සහ 2016 වසරේදී සංස්ථාවට සම්බන්ධ නැති ස්වාධීන තක්සේරුකරුවන් සහිත තක්සේරු දෙපාර්තමේන්තුවෙන් සිදු කළ තක්සේරු කිරීම් මතය.

8.4 අස්පෘශ්‍ය වත්කම්	ERP පද්ධතිය	SAP බලපත්‍රය	සමූහය ස්වයංක්‍රීය පද්ධතිය	එකතුව
	රු.මි.	රු.මි.	රු.මි.	රු.මි.
පිරිවැය/ධාරක අගය				
වසර ආරම්භයේදී ශේෂය	412.497	9.380	37.793	459.670
එක් කිරීම්/මාරුකිරීම්	-	-	-	-
වසර අවසානයේදී ශේෂය	**412.497**	**9.380**	**37.793**	**459.670**
ක්‍රමක්ෂය කිරීම්				
වසර ආරම්භයේදී ශේෂය	411.410	6.111	24.600	442.320
වසරේ අය කිරීම	0.304	1.876	7.560	9.741
වසර අවසානයේදී ශේෂය	411.714	7.987	32.160	452.061
ධාරක අගය				
31.12.2016 දිනට	**0.783**	**1.393**	**5.633**	**7.609**
31.12.2015 දිනට	**1.040**	**4.216**	**12.094**	**17.350**

9. පරිපාලිත සමාගම් වල ආයෝජන	සංස්ථාව		සංස්ථාව		සමූහය	
	2016	2015	2016	2015 යළි ප්‍රකාශිත	2016	2015 යළි ප්‍රකාශිත
	හිමිකාරත්ව,	හිමිකාරත්ව,	රු.මි.	රු.මි.	රු.මි.	රු.මි.
ලංකා බනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම	66.67%	66.67%	5,000.000	5,000.000	-	-
			5,000.000	**5,000.000**	**-**	**-**

10. ජංගම නොවන මූල්‍ය වත්කම්		සංස්ථාව		සමූහය	
		2016	2015 යළි ප්‍රකාශිත	2016	2015 යළි ප්‍රකාශිත
	Note	රු.මි	රු.මි	රු.මි	රු.මි
ලයිස්තුගත ස්කන්ධ ආයෝජන	10.1	29.500	39.500	29.500	39.500
ලයිස්තුගත නොවූ ස්කන්ධ ආයෝජන	10.2	5.626	5.626	5.626	5.626
ස්කන්ධ නොවන ආයෝජන	10.3	35,560.335	36,680.156	35,560.335	36,680.157
		35,595.461	**36,725.282**	**35,595.461**	**36,725.283**

10.1. ලයිස්තුගත ස්කන්ධ ආයෝජන	සංස්ථාව		සමූහය	
	2016	2015 යළි ප්‍රකාශිත	2016	2015 යළි ප්‍රකාශිත
	රු.මි	රු.මි	රු.මි	රු.මි
ලංකා සිමෙන්ති සමාගම				
සාමාන්‍ය කොටස් සඳහා එකකට රු. 10/ බැගින් 5,000,000 ගෙවන ලදී	39.500	33.000	39.500	33.000
සාධාරණ අගය ස්කන්ධය වෙත මාරු කිරීම	(10.000)	6.500	(10.000)	6.500
	29.500	**39.500**	**29.500**	**39.500**

10.2. ලයිස්තුගත නොවූ ස්කන්ධ ආයෝජන	සංස්ථාව		සමූහය	
	2016	2015 යළි ප්‍රකාශිත	2016	2015 යළි ප්‍රකාශිත
	රු.මි.	රු.මි.	රු.මි.	රු.මි.
එක්සත් ප්‍රවෘත්ති පත්‍ර ලංකා සමාගම				
රු 10/- බැගින් වූ සාමාන්‍ය කොටස් 61,206	0.539	0.539	0.539	0.539
ලංකා ලේලන්ඩ් සමාගම				
රු. 10 බැගින් වූ සාමාන්‍ය කොටස් 100	0.001	0.001	0.001	0.001
ඉන්ටර්නැෂනල් කෝපරේටිව් පොට්‍රෝලියම් ඇසෝසියේෂන්				
සම්පූර්ණයෙන්ම ගෙවූ ඇඩෝ 100/- කොටස් 5,499				
ඇ. ඒ. ජනපදයේ පිහිටුවන ලද	5.086	5.086	5.086	5.086
	5.626	**5.626**	**5.626**	**5.626**

අලෙවිය සඳහා වන ආයෝජන පිරිවැයට සිදු කළ නිසා ලයිස්තුගත නොවූ ආයෝජන පිරිවැයට වර්ගීකරණය කර ඇත .
වාර්තාකරණ දිනයට ණය අවදානම් නිරාවරණය වන්නේ අලෙවිය සඳහා ලද හැකි ලෙස වර්ගීකරණය කරන ලද ස්කන්ධ ආරක්ෂණවල ධාරක අගයයි.
අලෙවිය සඳහා ලද හැකි ලෙස වර්ගීකරණය කළ මූල්‍ය වත්කම් කිසිවක් අපහායනය වී නැත .

10.3 ස්කන්ධ නොවන ආයෝජන	සංස්ථාව		සමූහය	
	2016	2015 යළි ප්‍රකාශිත	2016	2015 යළි ප්‍රකාශිත
	රු.මි.	රු.මි.	රු.මි.	රු.මි.
ස්ථාවර තැන්පතු ආයෝජන	5.000	5.000	5.000	5.000
භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජන	35,555.335	36,675.156	35,555.335	36,675.157
	35,560.335	**36,680.156**	**35,560.335**	**36,680.157**

11 . වෙළෙඳ සහ අනෙකුත් ලැබීම්	සංස්ථාව			
	2016		2015 යළි ප්‍රකාශිත	
	ජංගම රු.මි.	ජංගම නොවන රු.මි.	ජංගම රු.මි.	ජංගම නොවන රු.මි.
වෙළෙඳ ලැබීම්	33,262.256		18,734.682	
වෙනත් ලැබීම්	6,804.863	0.667	3,859.510	286.372
තැන්පතු සහ පූර්ව ගෙවීම්	1,315.836	7,372.314	1,291.124	8,687.995
අත්තිකාරම්	6,971.339		2,924.956	
සේවකයින්ට ණය සහ අත්තිකාරම් ගෙවීම	43.681	2,953.727	49.044	2,701.287
	48,397.974	**10,326.708**	**26,859.315**	**11,675.654**

ශ්‍රී ලංකන් ගුවන් සේවා සමාගම විසින් රු.7,900,000,000 ක පියවීමක් ඇමරිකන් ඩොලර් වලට හැරවීමේදී සිදුවූ රු. 307,063,541/- ක විනිමය විවලනයක් (ලාභයක්) 2015 වසරේ මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගනු ලැබ තිබිණි. ශ්‍රී ලන්කන් සමාගම සමග අබණ්ඩව කළ සාකච්ඡාවන් පරිදි මෙම විනිමය විවලනය සමානව ශ්‍රී ලන්කන් සමාගම සහ සංස්ථාව අතර බෙදා ගැනීමට එකඟ වෙනු ලැබිණි. ඒ අනුව අදාළ අනුමැතිය ලබාගැනීම සඳහා සංස්ථාව සහ ශ්‍රී ලන්කන් සමාගම අදාළ රෙගුලාසිය අමාත්‍යාංශයට මෙම කරුණ ඉදිරිපත් කර ඇත.

	සමූහය			
	2016		2015 යළි ප්‍රකාශිත	
	ජංගම රු.මි.	ජංගම නොවන රු.මි.	ජංගම රු.මි.	ජංගම නොවන රු.මි.
වෙළෙඳ ලැබීම්	34,404.904	-	18,539.259	-
වෙනත් ලැබීම්	6,804.863	0.667	5,273.516	7,969.288
තැන්පතු සහ පූර්ව ගෙවීම්	2,301.942	7,372.314	1,293.132	719.374
අත්තිකාරම්	6,971.339	-	2,924.956	-
සේවකයින්ට ණය සහ අත්තිකාරම් ගෙවීම	1,963.851	3,395.451	2,533.294	2,701.287
	52,446.899	**10,768.432**	**30,564.156**	**11,389.949**

වෙළෙඳ ලැබීම්වල හානිකරණය සඳහා වන ප්‍රතිපාදන හි හැසිරීම පහත දක්වා ඇත.

	සංස්ථාව	
	2016	2015 යළි ප්‍රකාශිත
	රු.මි.	රු.මි.
ජනවාරි 1 වන දිනට ශේෂය	52.099	45.272
අඩු කළා; පියවා ගන්නා ලද ප්‍රමාණය	-	(1.391)
අඩු කළා කපා හළ මුදල	(1.092)	(0.001)
එකතු කළා: වසරේ ප්‍රතිපාදන	(1.386)	8.219
දෙසැම්බර් 31 වනදාට ශේෂය	**49.621**	**52.099**

12 මූල්‍ය උපකරණ	සංස්ථාව		සමූහය	
වර්ගය අනුව මූල්‍ය වත්කම්	2016	2015 යළි ප්‍රකාශිත	2016	2015 යළි ප්‍රකාශිත
	රු.මි	රු.මි	රු.මි	රු.මි
ණය හා ලැබීම්				
වෙළෙඳ හා වෙනත් ලැබීම්	38,476.763	21,467.349	41,981.305	23,685.259
බැංකු මත තැන්පත් කිරීම්	27,149.417	11,725.182	27,149.417	11,725.182
අතැති මුදල් හා බැංකු මුදල්	14,579.410	51,058.236	17,034.827	51,806.202
අලෙවිය සඳහා ලද හැකි මූල්‍ය වත්කම්			-	-
ලයිස්තුගත හා ලයිස්තුගත නොවූ ස්කන්ධ ආයෝජන	35.126	45.126	35.126	45.126
කල්පිරීම් දක්වා රඳවා ගත්			-	-
භාණ්ඩාගාර බැඳුම්කර මත ආයෝජන	36,476.761	37,659.833	36,476.761	37,659.833
එකතුව	**116,717.477**	**121,955.727**	**122,677.437**	**124,921.603**

වර්ගය අනුව මූල්‍ය වගකීම්	සංස්ථාව		සමූහය	
	2016	2015 යළි ප්‍රකාශිත	2016	2015 යළි ප්‍රකාශිත
	රු.මි.	රු.මි.	රු.මි.	රු.මි.
කුමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම්				
ණය ගැනීම්	193,987.471	267,925.753	195,497.637	270,106.264
වෙළෙඳ හා අනෙකුත් ගෙවීම්	146,061.828	133,852.746	143,480.550	140,744.649
එකතුව	**340,049.300**	**401,778.499**	**338,978.187**	**410,850.913**

12.1 මූල්‍ය උපකරණයන්ගේ සාධාරණ අගය

පහත දක්වා ඇත්තේ සමූහයේ මූල්‍ය උපකරණ ලෙස මූල්‍ය ප්‍රකාශයේ දක්වා ඇති මූල්‍ය උපකරණවල ධාරක ප්‍රමාණයන් සහ සාධාරණ අගය අනුව සන්සන්දනයකි.

සංස්ථාව		ධාරක අගය		සාධාරණ අගය	
දෙසැම්බර් 31 දිනට		**2016**	**2015**	**2016**	**2015**
		රු.මි.	**රු.මි.**	**රු.මි.**	**රු.මි.**
මූල්‍ය වත්කම්					
ජංගම නොවන මූල්‍ය වත්කම්					
ලයිස්තුගත ස්කන්ධ ආයෝජන	12.1.1	29.500	39.500	29.500	39.5
ලයිස්තුගත නොවූ ස්කන්ධ ආයෝ	12.1.2	5.626	5.626	5.626	5.626
ස්ථාවර තැන්පතු ආයෝජන	12.1.3	5.000	5.000	5.000	5.000
භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජන	12.1.1	35,555.335	36,675.156	32,758.459	36,056.856
වෙළෙඳ සහ වෙනත් ලැබීම්	12.1.4	38,476.763	21,467.349	38,476.763	21,467.349
කෙටි කාලීන ආයෝජන					
බැංකු තැන්පතු	12.1.3	27,144.417	11,720.182	27,144.417	11,720.182
රාජ්‍ය බැඳුම්කර	12.1.1	921.426	984.677	912.937	986.56
මුදල් හා මුදල් සමාන දෑ	12.1.4	14,579.410	51,058.236	14,579.410	51,058.236
එකතුව		**116,717.477**	**121,955.727**	**113,912.112**	**121,339.314**
මූල්‍ය වගකීම්					
ණය සහ ණය ගැනුම්	12.1.3	303.838	703.481	303.838	703.481
වෙළෙඳ සහ වෙනත් ගෙවීම්	12.1.4	146,061.828	133,852.746	146,061.828	133,852.746
කෙටි කාලීන ණය ගැනීම්	12.1.4	193,683.634	267,222.272	193,683.634	267,222.272
		340,049.300	**401,778.499**	**340,049.300**	**401,778.499**

12.1.1 ලයිස්තුගත ස්කන්ධ සහ භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජනවල සාධාරණ අගය පදනම් වන්නේ වාර්තාකරණ දිනයේදී වෙළෙඳපොළේ දක්වන මිල මතයි.

12.1.2 පිරිවැයට ගෙන එන ලයිස්තුගත නොවූ ස්කන්ධ ආයෝජනවල සාධාරණ අගය ආයෝජනයේ ප්‍රමාණාත්මක බව සලකා බලා එහි සාධාරණ අගයට සමාන බව උපකල්පනය කෙරේ.

12.1.3 තැන්පතු සහ ණය හා ණය ගැනුම් ඇගයෙන්නේ පොළී අනුපාත, බැංකුවේ ණය යෝග්‍යතාවය සහ උපකරණයේ අවදානම් ලක්ෂණ යනාදී ප්‍රමිතීන් මත පදනම්වය. 2016 දෙසැම්බර් 31 දිනට තැන්පතු, ණය සහ ණය ගැනුම්වල ධාරක අගයන් ඒවායේ සාධාරණ අගයන්ගෙන් ප්‍රමානාත්මකව වෙනස් නොවේ.

12.1.4 මුදල් හා මුදල් සමාන දෑ, වෙළෙඳ හා වෙනත් ලැබීම්, වෙළෙඳ හා වෙනත් ගෙවීම් සහ කෙටි කාලීන ණය ගැනුම් ඒවායේ ධාරක අගය ආසන්න කරනුයේ එම උපකරණවල කෙටි කාලීන කල් පිරීම් හේතුවෙනි.

13. තොග	2016	2015 යළි ප්‍රකාශිත	2016	2015 යළි ප්‍රකාශිත
	රු.මි	රු.මි	රු.මි	රු.මි
බොර තෙල්	11,099.275	12,336.721	11,099.275	12,336.721
වෙනත් අමු ද්‍රව්‍ය	1,455.355	870.473	1,455.355	870.473
නිමි නිෂ්පාදන	18,921.623	24,647.197	18,926.799	24,647.197
අන්තර්මධ්‍ය නිෂ්පාදන	1,392.528	846.270	1,390.817	846.270
වෙනත් ද්‍රව්‍ය හා සැපයුම්	3,009.276	2,732.212	3,549.874	3,061.048
අඩු කළා: මන්දගාමී ලෙස චලනය වන අයිතම සඳහා ප්‍රතිපාදන	(401.172)	(397.761)	(533.896)	(397.761)
	35,476.885	**41,035.111**	**35,888.223**	**41,363.947**

14. කෙටි කාලීන ආයෝජන	සංස්ථාව		සමූහය	
	2016	2015 යළි ප්‍රකාශිත	2016	2015 යළි ප්‍රකාශිත
	රු.මි	රු.මි	රු.මි	රු.මි
බැංකු තැන්පතු	27,144.417	11,720.182	27,144.417	11,720.182
රාජ්‍ය බැඳුම්කර	921.426	984.677	921.426	984.677
	28,065.844	**12,704.860**	**28,065.844**	**12,704.859**

15. මුදල් හා මුදල් සමාන දෑ	සංස්ථාව		සමූහය	
	2016	2015 යළි ප්‍රකාශිත	2016	2015 යළි ප්‍රකාශිත
	රු.මි	රු.මි	රු.මි	රු.මි
මුදල් හා මුදල් සමාන දෑ සඳහා අදාල උපාංග				
බැංකුවේ සහ අතැති මුදල්	14,579.410	51,058.236	17,034.827	51,806.202

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණු සඳහා මුදල් හා මුදල් සමාන දෑවලට පහත දේ අයත් වේ:

	සංස්ථාව		සමූහය	
	2016	2015 යළි ප්‍රකාශිත	2016	2015 යළි ප්‍රකාශිත
	රු.මි	රු.මි	රු.මි	රු.මි
මුදල් හා මුදල් සමාන දෑ	14,579.410	51,058.236	17,034.827	51,806.202
බැංකු අයිරා (සටහන 21)	-	(2,738.249)	(111.314)	(2,738.249)
	14,579.410	**48,319.987**	**16,923.513**	**49,067.953**
එකතු කළා/අඩු කළා: විදේශ මුදල් පරිවර්තනය සඳහා ගැලපුම්	(2,557.285)	(3,619.571)	(2,557.285)	(3,619.571)
	12,022.125	44,700.416	14,366.228	45,448.382

16. දායක ප්‍රාග්ධනය	සංස්ථාව		සමූහය	
	2016	2015 යළි ප්‍රකාශිත	2016	2015 යළි ප්‍රකාශිත
	රු.මි	රු.මි	රු.මි	රු.මි
ජනවාරි 1 දිනට	28,487.125	3,500.000	28,487.125	3,500.000
භාණ්ඩාගාරය විසින් ප්‍රාග්ධන වැඩි දියුණුකිරීම් සඳහා නිකුත් කළ භාණ්ඩාගාර බැඳු	-	24,987.125	-	24,987.125
දෙසැම්බර් 31 දිනට	**28,487.125**	**28,487.125**	**28,487.125**	**28,487.125**

පාර්ලිමේන්තුව මගින් කිසිදු බලයලත් ප්‍රාග්ධන ප්‍රමාණයක් නිශ්චය කර නැත.

17. ප්‍රාග්ධන සංචිත	සංස්ථාව		සමූහය	
	2016	2015 යළි ප්‍රකාශිත	2016	2015 යළි ප්‍රකාශිත
	රු.මි	රු.මි	රු.මි	රු.මි
දෙසැ 31 ට ශේෂය	4,992.686	4,992.686	4,992.686	4,992.686

2003 වසරේදී ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමට වත්කම් පැවරුම පොත් අගයට සිදුකර ඇත. ඉන්පසු පුද්ගලීකරණ ක්‍රියාවලියේදී එකඟ වූ අගයන් මත පදනම්ව වාර්තා කිරීමට තීරණය කෙරිණි. මෙහි ප්‍රතිඵලය ප්‍රාග්ධන සංචිතය තුළ ගලපා ඇත.

18. විශ්‍රාම ප්‍රතිලාභ බැඳීයාව	සංස්ථාව		සමූහය	
	2016	2015 යළි ප්‍රකාශිත	2016	2015 යළි ප්‍රකාශිත
	රු.මි.	රු.මි.	රු.මි.	රු.මි.
ජනවාරි 1 දිනට ශේෂය	845.526	648.362	2,398.663	1,990.666
අඩු කළා: වසර තුළ කළ ගෙවීම්	(122.286)	(68.623)	(401.713)	(167.891)
	723.240	579.739	1,996.950	1,822.775
එකතු කළා: වර්ථමාන සේවා පිරිවැය	40.761	40.628	105.981	129.441
පොළී පිරිවැය	94.838	57.974	233.841	146.799
ආයුගණක (ලාභය)/අලාභය	(120.866)	167.186	(364.729)	299.648
	737.973	845.526	1,972.045	2,398.663
එකතු කළා: චීන වරාය /එල්එල්එල්/නයිලෝන්/ඕපීඑස්ටීඑල් සේවක ප්‍රතිලාභ	15.588	15.588	15.588	15.588
දෙසැ 31 දිනට ශේෂය	**753.561**	**861.114**	**1,987.632**	**2,414.251**
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම මත වියදම				
ආදායම් ප්‍රකාශය				
වර්තමාන සේවා පිරිවැය	40.761	40.628	105.981	129.441
පොළී පිරිවැය	94.838	57.974	233.841	146.799
	135.599	**98.601**	**339.823**	**276.240**
වෙනත් විස්තීර්ණ ආදායම්				
ආයුගණක (ලාභය)/අලාභය	(120.866)	167.186	(364.729)	299.648
	(120.866)	**167.186**	**(364.729)**	**299.648**
මූලික ආයුගණක උපකල්පනයන් පහත පරිදි වේ:				
අපේක්ෂිත වැටුප් වර්ධක	1%	1%		
අපේක්ෂිත සේවක මණ්ඩල පිරිවැටුම	4.4%	3.8%		
පොළී/වට්ටම් අනුපාතය	13%	10%		
විශ්‍රාම යන වයස	60 years	60 years		
සේවක සංඛ්‍යාව	2577	2579		

18.1 භාවිතා කළ ආයුගණක උපකල්පනයන්ගේ සංවේදීතාවය

2016 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම සමග නිත්‍ය කළ සියලුම අනෙක් විචල්යයන් සමග භාවිතා කළ ප්‍රධාන උපකල්පනයන්ගේ විය හැකි වෙනස්වීම්වලට වන සංවේදීතාවය පහත වගුව මගින් දැක්වේ. මූල්‍ය තත්ව ප්‍රකාශයේ සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ සංවේදීතාවය වනුයේ ලාභය හෝ අලාභය සහ වසරේ විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම මත වට්ටම් අනුපාතයේ සහ වැටුප් වර්ධනයේ උපකල්පිත වෙනස්කම්වල බලපෑමයි

උපකල්පනය	උපකල්පනයේ වෙනස	සංස්ථාව ආදායම් ප්‍රකාශය මත සංවේදීතා බලපෑම	විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම මත සංවේදීතා බලපෑම
		2016	2016
		රු.මි.	රු.මි.
වට්ටම් අනුපාතය @13%	ඒකක 1% කින් වැඩි විය	(36.321)	(36.321)
	ඒකක 1% කින් අඩු විය	26.406	26.406
වැටුප් වර්ධකය @ 1%	ඒකක 1% කින් වැඩි විය	30.101	30.101
	ඒකක 1% කින් අඩු විය	(40.040)	(40.040)

19. ණය සහ ණය ගැනීම්	2016	2015 යළි ප්‍රකාශිත	2016	2015 යළි ප්‍රකාශිත
	රු.මි.	රු.මි.	රු.මි.	රු.මි.
බනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමට නොපැවරූ L.T. ණය				
භාණ්ඩාගාර (A.D.B)ණය	265.858	341.817	265.858	341.817
මහජන බැංකුව	-	-	911.051	1,398.851
	265.858	**341.817**	**1,176.909**	**1,740.668**
19.1. ණය සහ ණය ගැනීම්වල වර්තමාන කොටස				
බනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමට නොපැවරූ L.T. ණය				
භාණ්ඩාගාර (A.D.B)ණය	37.980	75.959	37.980	75.959
බනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමට පැවරූ L.T. ණය				
භාණ්ඩාගාර (Exim Bank) ණය	-	285.705	-	285.705
මහජන බැංකුව	-	-	487.800	495.955
	37.980	**361.664**	**525.780**	**857.619**

	සංස්ථාව		සමූහය	
19.2. දෙසැම්බර් **31** වන දා සිට වසර පහකින් ගෙවිය හැකි ණය පහත පරිදිය:	**2016**	**2015** යළි ප්‍රකාශිත	**2016**	**2015** යළි ප්‍රකාශිත
	රු.මි.	රු.මි.	රු.මි.	රු.මි.
වසර 2 ක් තුළ ගෙවිය යුතු මුදල	75.959	437.623	1,051.559	1,715.238
වසර 3-5 ක් තුළ ගෙවිය යුතු මුදල	227.878	265.858	651.129	883.050
	303.838	**703.481**	**1,702.688**	**2,598.288**

ණය ගැනීම්වල ධාරක අගය සාධාරණ අගය ලෙස සැලකේ.

(අ) භාණ්ඩාගාර (A.D.B) ණය (පොළිය වසරකට 14.0%)- 2001 ජූලි මස සිට රු.මි.37.977 බැගින් වූ අර්ධ වාර්ෂික වාරික හතළිහකින් ගෙවිය හැකිය.

(ආ) භාණ්ඩාගාර (Exim Bank) ණය - (පොළිය වසරකට 12.0%) 2004 ඔක්තෝබර් මස සිට අවසන් ණය අගයෙන් අර්ධ වාර්ෂික සම වාරික 24 කින් ගෙවිය හැකිය.

20. වෙළෙඳ සහ අනෙකුත් ගෙවීම්	සංස්ථාව		සමූහය	
	2016	2015 යළි ප්‍රකාශිත	2016	2015 යළි ප්‍රකාශිත
	රු.මි.	රු.මි.	රු.මි.	රු.මි.
ගෙවිය යුතු විදේශ බිල්පත්	139,805.406	121,662.975	139,805.406	122,751.071
වෙනත් ණය කරුවන්			-	
- දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු මුදල	36,033.499	25,318.481	36,180.551	25,896.710
- උපචිත වියදම්	4,967.092	10,455.853	1,250.427	4,684.150
- නැවත ගෙවිය යුතු හා වෙනත්	1,289.330	1,733.918	2,424.718	1,722.531
	182,095.327	**159,171.227**	**179,661.102**	**155,054.462**

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු මුදලට නිෂ්පාදන බදු, ජා.ගොඩ.බ. සහ ආදායම් බදු ඇතුළත් වේ. යළි ගෙවනු ලබන එකතු කළ අගය මත බදු අනෙකුත් ලැබීම් යටතේ ඇතුලත් කර ඇත.

21. කෙටි කාලීන ණය ගැනීම්	සංස්ථාව		සමූහය	
	2016	2015 යළි ප්‍රකාශිත	2016	2015 යළි ප්‍රකාශිත
	රු.මි.	රු.මි.	රු.මි.	රු.මි.
බැංකු සහ වෙනත් ණය			-	
- එක් වසරක් ඇතුළත සම්පූර්ණයෙන් ගෙවිය යුතු ණය	193,683.634	264,484.023	193,683.634	264,484.023
- බැංකු අයිරා	-	2,738.249	111.314	2,738.249
	193,683.634	**267,222.272**	**193,794.948**	**267,222.272**

ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව වෙනුවෙන් ලංකා බැංකුව සහ මහජන බැංකුව වෙත නිකුත් කළ ඇඩ්ඩා මී 1,550 ක් සඳහා භාණ්ඩාගාර ඇපකර මගින් එය සහතික කර ඇත.
සැපයුම්කරුවන්ට ගෙවිය යුතු ආනයන බිල්පත් මූල්‍යයනය කිරීමට කෙටි කාලීන ණය ලබාගෙන ඇත..
අදාළ වන පොළී අනුපාතය වර්ෂයකට 5.5% කි.

22. සේවකයින්	සංස්ථාව		සමූහය	
	2016	2015 යළි ප්‍රකාශිත	2016	2015 යළි ප්‍රකාශිත
	රු.මි.	රු.මි.	රු.මි.	රු.මි.
22.1 කාර්ය මණ්ඩල පිරිවැය				
වැටුප් හා වේතන	4,109.662	3,905.211	9,213.139	8,557.779
නිර්වචනය කරන ලද දායක සැළැස්ම	443.150	358.952	892.698	772.247
නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැළැස්ම (සටහන 18)	14.733	265.787	(24.906)	575.888
	4,567.545	**4,529.950**	**10,080.931**	**9,905.914**

22.2 සේවකයින් සංඛ්‍යාව		
පරිපාලන හා අලෙවිකරණ	1,238	1,140
නිෂ්පාදන	908	1,020
ආරක්ෂක	431	419
	2,577	**2,579**
22.3 කොන්ත්‍රාත් හා තාවකාලික සේවකයින්	1	2

23. විලම්භිත බදු-සංස්ථාව

සංස්ථාව රු.මි. 249,279 ක බදු පාඩුවක් ඉදිරියට ගෙන ආ අතර (2015 රු.මි. 272,842) එය අනාගත බදු ලාභයන්ගෙන් පියවීමට හැකිය. විලම්භිත බදු වත්කම් එම රු.මි.69,798 (2015 දී රු.මි.76.396) ක පාඩුව තුළ ගිණුම්ගත කර නැත.

	සමූහය	
	2016	2015
23.1 විලම්භිත බදු කාණ්ඩය	රු.මි.	යළි ප්‍රකාශිත රු.මි.
කාල සීමාව ආරම්භයේ ශේෂය	544.863	492.982
2015 සඳහා ඒකාබද්ධ ගැලපුම්	64.107	-
තාවකාලික වෙනස්කම් ඇතිවීම සහ ප්‍රත්‍යාවර්තනය - ආදායම් ප්‍රකාශය	363.378	51.881
වෙනත් විස්තීර්ණ ආදායම්	33.409	-
කාලසීමාව අවසානයේ ශේෂය	**1,005.757**	**544.863**
විලම්භිත බදු වත්කම්	(241.366)	(315.773)
විලම්භිත බදු වගකීම්	1,247.123	860.636
ශුද්ධ විලම්භිත බදු වගකීම්	**1,005.757**	**544.863**

23.2 හඳුනාගත් විලම්භිත බදු වත්කම් සහ වගකීම්	**2016-රු මි.**		**2015-රු මි.**	
	තාවකාලික වෙනස	විලම්භිත බදු වගකීම්/ (වත්කම)	තාවකාලික වෙනස	විලම්භිත බදු වගකීම්/ (වත්කම)
විලම්භිත බදු වගකීම්				
දේපළ, පිරියත සහ උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම්	9,103.086	1,247.123	8,606.367	860.637
විලම්භිත බදු වත්කම්				
තොගය	(132.724)	(18.183)	(195.55)	(19.55)
ප්‍රතිපාදන	(184.952)	(25.338)	(172.058)	(17.206)
සේවක ප්‍රතිලාභ සැලසුම	(1,234.071)	(169.068)	(1,553.14)	(155.31)
බදු අලාභය	(210.045)	(28.776)	(1,236.988)	(123.699)
	7,341.294	**1,005.757**	**5,448.634**	**544.863**

24.මෙහෙයුම් මඟින් උපදවන ලද මුදල්	සංස්ථාව		සමූහය	
	2016	2015 යළි ප්‍රකාශිත	2016	2015 යළි ප්‍රකාශිත
	රු.මි.	රු.මි.	රු.මි.	රු.මි.
අබන්ධ මෙහෙයුම් මඟින් බදු පෙර ලාභය/(අලාභය)	**69,553.681**	**(19,885.780)**	**71,589.544**	**(17,923.324)**
ගැලපුම් :				
ක්ෂය වීම්	839.354	717.818	1,640.295	1,542.721
ක්‍රමක්ෂය කිරීම	-	-	9.741	30.007
විදේශ මුදල් පරිවර්තනය	1,062.286	52.042	1,062.286	52.042
ලාභාංශ ආදායම	(292.502)	(0.004)	(0.002)	(0.004)
පොළී ලැබීම්	(8,374.112)	(5,011.670)	(8,464.482)	(5,037.480)
හානිකරන සඳහා දීමනා			(39.054)	36.044
පොළී වියදම්	11,404.537	15,048.660	11,571.312	15,048.660
විශ්‍රාමික ගෙවීම් සඳහා ප්‍රතිපාදන	135.599	98.601	339.823	276.240
දේපළ, පිරියත සහ උපකරණ අලෙවියෙන් (ලාභය)/අලාභය	(36.414)	(20.212)	(87.660)	(28.524)
	-	-	-	-
කාරක ප්‍රාග්ධනය වෙනස්කම් වලට පෙර මෙහෙයුම් ලාභය / (අලාභය)	**74,292.430**	**(9,000.544)**	**77,621.803**	**(6,003.618)**
කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්				
තොග (වැඩිවීම්)/අඩුවීම්	5,558.227	22,546.642	5,475.724	22,585.899
වෙළෙඳ සහ අනෙකුත් ලැබීම්වල (වැඩිවීම්)/අඩුවීම්	(20,189.713)	16,293.162	(21,261.227)	13,353.763
වෙළෙඳ සහ අනෙකුත් ගෙවීම්වල (වැඩිවීම්)/අඩුවීම්	8,754.984	(5,066.363)	10,632.381	(5,019.207)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උත්පාදනය වන / (භාවිතා වන) මුදල්	**68,415.926**	**24,772.897**	**72,468.682**	**24,916.837**

25. සමාපේක්ෂයන් යළි ප්‍රකාශය

LKAS 8 අනුව පහත සාපේක්ෂ අගයන් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම්, ගිණුම්කරණ තක්සේරුවල වෙනස්කම් සහ දෝෂ තුළ යළි ප්‍රකාශ කර ඇත.

25.1 31/12/2014 දිනෙන්අවසන් වූ වසරේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය සැසඳුම

			සංස්ථාව		සමූහය	
	සටහන	ගැලපුම	පෙර වාර්තා කළ	යළි ප්‍රකාශිත	පෙර වාර්තා කළ	යළි ප්‍රකාශිත
		රු.මි.	රු.මි.	රු.මි.	රු.මි.	රු.මි.
ආදායම			525,182.094	525,182.094	527,168.712	527,168.712
විකුණුම් පිරිවැය			(499,955.539)	(499,955.539)	(506,834.181)	(506,834.181)
දළ ලාභය			25,226.555	25,226.555	20,334.531	20,334.531
වෙනත් මෙහෙයුම් ආදායම	25.5.1	(0.025)	3,506.475	3,506.450	3,963.939	3,963.914
අලෙවි සහ බෙදාහැරීම් වියදම	25.5.2	59.655	(11,532.812)	(11,473.157)	(1,760.156)	(1,700.501)
පරිපාලන වියදම්	25.5.3	42.431	(5,154.127)	(5,111.696)	(8,332.450)	(8,290.019)
මෙහෙයුම් ලාභය			12,046.090	12,148.152	14,205.863	14,307.925
විනිමය අනුපාත විචල්‍යය			(967.489)	(967.489)	(967.489)	(967.489)
මූල්‍ය ආදායම	25.5.4, 25.5.5 & 25.5.6	(537.525)	4,030.057	3,492.532	4,058.754	3,521.229
මූල්‍ය වියදම			(13,979.634)	(13,979.634)	(13,979.634)	(13,979.634)
බදුවලට පෙර ලාභය			**1,129.025**	**693.561**	**3,317.495**	**2,882.031**
බදු වියදම	25.5.7	(598.854)	-	(598.854)	**(275.168)**	(874.022)
බදුවලට පසු ලාභය			**1,129.025**	**94.707**	**3,042.327**	**2,008.009**
වෙනත් විස්තීර්ණ ආදායම්						
විශ්‍රාම ප්‍රතිලාභ සැලසුමේ යළි මැනුම් ලාභය/(අලාභය)			(112.498)	(112.498)	(152.495)	(152.495)
වසරේ අනෙක් විස්තීර්ණ වියදම්			(112.498)	(112.498)	(152.495)	(152.495)
පාලනය නොකරන පොළිය		-	-	-	**(624.435)**	**(624.435)**
වසරේ මුළු විස්තීර්ණ ආදායම/(වියදම)		**(1,034.318)**	**1,016.527**	**(17.791)**	**2,265.397**	**1,231.079**

25.2 01/01/2015 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශයේ සැසඳුම

			සංස්ථාව		සමූහය	
	සටහන	ගැලපුම	පෙර වාර්තා කළ	යළි ප්‍රකාශිත	පෙර වාර්තා කළ	යළි ප්‍රකාශිත
		රු.මි.	රු.මි.	රු.මි.	රු.මි.	රු.මි.
වත්කම්						
ජංගම නොවන වත්කම්						
දේපළ, පිරියත සහ උපකරණ	25.5.2 & 25.6.1	57.289	13,591.470	13,648.759	30,879.895	30,937.184
ආයෝජන වත්කම්	25.6.1	2.37	25.362	27.728	25.362	27.728
අස්පෘශ්‍ය වත්කම්					47.358	47.358
පාලිත සමාගම් තුළ ආයෝජනය			5,000.000	5,000.000	-	-
ජංගම නොවන මූල්‍ය වත්කම්	25.5.4	(85.96)	10,027.557	9,941.594	10,027.557	9,941.594
වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ			12,047.778	12,047.778	11,190.663	11,190.663
		(26.308)	40,692.167	40,665.859	52,170.835	52,144.527
ජංගම වත්කම්						
තොග			63,581.753	63,581.753	63,949.846	63,949.846
වෙළෙඳ ණය සහ අනෙකුත් ලැබිය යුතු දෑ	25.5.4 & 25.5.6	(438.836)	43,120.185	42,681.349	44,457.037	44,018.201
ආදායම් බදු ලැබීම්	25.5.5 & 25.5.7	(637.769)	962.151	324.382	962.151	324.382
කෙටි කාලීන ආයෝජන	25.5.6	26.189	11,994.697	12,020.886	11,994.697	12,020.886
මුදල් හා මුදල් සමාන දෑ	25.5.1	(0.025)	21,474.788	21,474.763	23,384.985	23,384.960
		(1,050.441)	141,133.573	140,083.132	144,748.716	143,698.275
මුළු වත්කම්		**(1,076.749)**	**181,825.740**	**180,748.991**	**196,919.551**	**195,842.802**
ස්කන්ධ සහ වගකීම්						
ප්‍රාග්ධනය සහ සංචිත						
දායක ප්‍රාග්ධනය			3,500.000	3,500.000	3,500.000	3,500.000
ප්‍රාග්ධන සංචිතය			4,992.686	4,992.686	4,992.686	4,992.686
රඳවාගත් ඉපයුම්	25.1	(1,034.318)	(240,749.436)	(241,783.754)	(232,584.282)	(233,618.600)
පාලනය කළ නොහැකි අයිතිය					6,582.577	6,582.577
මුළු ස්කන්ධය		(1,034.318)	(232,256.750)	(233,291.068)	(217,509.019)	(218,543.337)
ජංගම නොවන වගකීම්						
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්			663.950	663.950	2,006.255	2,006.255
විලම්බිත බදු			-	-	492.982	492.982
ණය සහ ණය ගැනීම්			703.481	703.481	2,590.131	2,590.131
			1,367.431	1,367.431	5,089.368	5,089.368
ජංගම වගකීම්						
වෙළෙඳ ණය සහ වෙනත් ගෙවිය යුතු දෑ	25.5.3	(42.431)	164,280.022	164,237.591	160,416.364	160,373.933
ණය සහ ණය ගැනීම්වල වර්තමාන කොටස			647.369	647.369	1,135.168	1,135.168
කෙටි කාලීන ණය ගැනීම්			247,787.669	247,787.669	247,787.669	247,787.669
		(42.431)	412,715.059	412,672.628	409,339.202	409,296.771
මුළු ස්කන්ධය සහ වගකීම්		**(1,076.749)**	**181,825.740**	**180,748.991**	**196,919.551**	**195,842.802**

25.3 31/12/2015 දිනෙන් අවසන් වූ වසර සඳහා විස්තිර්ණ ආදායම් ප්‍රකාශයේ සන්සන්දනය

			සංස්ථාව		සමූහය	
	සටහන	ගැලපුම්	පෙර වාර්තා කළ	යළි ප්‍රකාශිත	පෙර වාර්තා කළ	යළි ප්‍රකාශිත
		රු.මි.	රු.මි.	රු.මි.	රු.මි.	රු.මි.
ආදායම			376,734.487	376,734.487	377,261.652	377,261.652
විකුණුම් පිරිවැය			(337,118.644)	(337,118.644)	(343,301.815)	(343,301.815)
දළ ලාභය			39,615.843	39,615.843	33,959.837	33,959.837
වෙනත් මෙහෙයුම් ආදායම්			4,233.981	4,233.981	4,744.234	4,744.234
අලෙවි සහ බෙදා හැරීම් වියදම්	25.5.2	216.764	(13,617.901)	(13,401.137)	(2,957.522)	(2,740.758)
පරිපාලන වියදම්	25.5.3	(27.947)	(3,563.565)	(3,591.512)	(7,141.545)	(7,169.492)
මෙහෙයුම් ලාභය			26,668.358	26,857.175	28,605.003	28,793.821
විනිමය අනුපාත විචල්‍ය			(32,841.590)	(32,841.590)	(32,841.590)	(32,841.590)
මූල්‍ය ආදායම	25.5.4, 25.5.5 & 25.5.6	101.323	4,910.347	5,011.670	4,936.157	5,037.480
හෙජින් වියදම්			(3,864.375)	(3,864.375)	(3,864.375)	(3,864.375)
මූල්‍ය වියදම්			(15,048.660)	(15,048.660)	(15,048.660)	(15,048.660)
බදුවලට පෙර ලාභය			**(20,175.920)**	**(19,885.780)**	**(18,213.464)**	**(17,923.324)**
බදු වියදම්	25.5.7	924.879	**(1,559.263)**	(634.384)	**(1,846.248)**	(921.369)
බදුවලට පසු ලාභය/(අලාභය)			**(21,735.183)**	**(20,520.164)**	**(20,059.712)**	**(18,844.693)**
වෙනත් විස්තිර්ණ ආදායම්						
විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් මත යළි මැනුම් ලාභය/(අලාභය)			(167.186)	(167.186)	(299.648)	(299.648)
අලෙවිය සඳහා ලද හැකි මූල්‍ය වත්කම්වල ශුද්ධ ලාභය/(අලාභය)			6.500	6.500	6.500	6.500
වසරේ වෙනත් විස්තිර්ණ වියදම්			(160.686)	(160.686)	(293.148)	(293.148)
පාලනය නොකරන පොළිය		-	-	-	**(514.336)**	**(514.336)**
වසරේ මුළු විස්තිර්ණ වියදම		**1,215.019**	**(21,895.869)**	**(20,680.850)**	**(20,867.196)**	**(19,652.177)**

25.4 31/12/2015 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශයේ සැසඳුම

			සංස්ථාව		සමූහය	
වත්කම්	සටහන	ගැලපුම්	පෙර වාර්තා කළ	යළි ප්‍රකාශිත	පෙර වාර්තා කළ	යළි ප්‍රකාශිත
ජංගම නොවන වත්කම්		රු.මි.	රු.මි.	රු.මි.	රු.මි.	රු.මි.
දේපළ, පිරියත සහ උපකරණ	25.5.2 & 25.6.1	257.955	13,613.866	13,871.821	30,267.359	30,525.314
ආයෝජන දේපළ	25.6.1	18.464	24.558	43.022	24.558	43.022
අස්පෘශ්‍ය වත්කම්					17.350	17.350
පාලිත සමාගම් තුළ ආයෝජනය			5,000.000	5,000.000	-	-
ජංගම නොවන මූල්‍ය වත්කම්	25.5.4, 25.5.8 & 25.6.2	(124.122)	36,849.405	36,725.282	36,849.405	36,725.283
වෙළෙඳ ණය සහ අනෙකුත් ලැබිය යුතු දෑ			11,675.654	11,675.654	11,389.949	11,389.949
		152.297	67,163.483	67,315.779	78,548.620	78,700.918
ජංගම වත්කම්						
තොගය			41,035.111	41,035.111	41,363.947	41,363.947
වෙළෙඳ ණය සහ අනෙකුත් ලැබිය යුතු දෑ	25.5.4	(269.279)	27,128.594	26,859.315	30,833.435	30,564.156
කෙටි කාලීන ආයෝජන්	25.5.4 & 25.5.6	(17.057)	12,721.916	12,704.860	12,721.916	12,704.859
මුදල් හා මුදල් සමාන දෑ	25.5.1	(0.025)	51,058.261	51,058.236	51,806.227	51,806.202
		(286.361)	131,943.882	131,657.522	136,725.525	136,439.164
මුළු වත්කම්		**(134.064)**	**199,107.365**	**198,973.301**	**215,274.145**	**215,140.082**
ස්කන්ධ සහ වගකීම්						
ප්‍රාග්ධනය සහ සංචිත						
දායක ප්‍රාග්ධනය	25.5.8	(12.875)	28,500.000	28,487.125	28,500.000	28,487.125
ප්‍රාග්ධන සංචිත			4,992.686	4,992.686	4,992.686	4,992.686
රඳවාගත් ඉපයීම්	25.1 &25.3	180.701	(262,645.305)	(262,464.604)	(253,451.478)	(253,270.777)
පාලනය කළ නොහැකි අයිතිය					7,096.913	7,096.913
මුළු ස්කන්ධය		167.826	(229,152.619)	(228,984.793)	(212,861.879)	(212,694.053)
ජංගම නොවන වගකීම්						
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම			861.114	861.114	2,414.251	2,414.251
විලම්බිත බදු					544.863	544.863
ණය සහ ණය ගැනීම්			341.817	341.817	1,740.668	1,740.668
		-	1,202.931	1,202.931	4,699.782	4,699.782
ජංගම වගකීම්						
වෙළෙඳ ණය සහ වෙනත් ගෙවිය යුතු දෑ	25.5.3, 25.5.5 & 25.5.7	(301.889)	159,473.117	159,171.227	155,356.351	155,054.462
ණය සහ ණය ගැනීම්වල වර්තමාන කොටස			361.664	361.664	857.619	857.619
කෙටි කාලීන ණය ගැනීම්			267,222.272	267,222.272	267,222.272	267,222.272
		(301.889)	427,057.053	426,755.163	423,436.242	423,134.353
මුළු ස්කන්ධය සහ වගකීම්		**(134.063)**	**199,107.365**	**198,973.301**	**215,274.145**	**215,140.082**

		2014	2015	එකතුව
25.5	25.5 පූර්ව කාලීන ගැලපුම්වල ස්වභාවය	රු.මි.	රු.මි.	රු.මි.
25.5.1	සුළු ආදායම්වලට බැර කළ සිටි බැංකු ගිණුම් වැසීමෙන් ලැබුණු මුදල් නිවැරදි කිරීම	(0.025)	-	(0.025)
25.5.2	මත්තල ගුවන් තොටුපොලේ ගුවන් ඉන්ධන ගබඩා පහසුකම් සහ ඉන්ධන හයිඩ්රන්ට් පද්ධතියේ අධිප්‍රතිපාදිත ක්ෂය වීම් ප්‍රත්‍යාවර්තනය	59.655	216.764	276.419
25.5.3	සේඳඳ සහ සේනිහාඅ වෙත ගෙවිය යුතු 2015 ප්‍රත්‍යාවර්තික ශේෂය අධි ප්‍රතිපාදනය ගැලපීම් සහ උපයන විට වෙත ගෙවිය යුතු ශේෂයන්ගේ ප්‍රතිපාදන ගැලපීම් සහ වසර 25 දායකත්ව සංවත්සර වියදම්	42.431	(27.947)	14.483
25.5.4	භාණ්ඩාගාර බැඳුම්කර මත අධිප්‍රකාශිත පොළී ආදායම නිවැරදි කිරීම	(350.242)	(42.341)	(392.583)
25.5.5	භාණ්ඩාගාර බැඳුම්කර මත පොළී ගැලපුම් සඳහා ජාතික බදු ගැලපුම්	(38.915)	(4.705)	(43.620)
25.5.6	2014 වසරේ ගලපන ලද ස්ථාවර තැන්පතු පොළී ගැලපුම් 2015 දී හඳුනාගැනීම	(148.368)	148.369	0.001
25.5.7	2012, 2013 සහ 2014 වසර සඳහා 2015 දී කරන ලද ආදායම් බදු ප්‍රතිපාදනය සහ යළි ප්‍රකාශිත ලාභය අනුව 2014 වසරේ ආදායම් බදු ප්‍රතිපාදනය ගැලපීම්	(598.854)	924.879	326.025
25.5.8	මහා භාණ්ඩාගාරයෙන් ලබුණු උපදෙස් මත වට්ටම් අගයකට ලැබුණු භාණ්ඩාගාර බැඳුම්කර වාර්තා කිරීම්	-	(12.875)	(12.875)
				167.826

25.6	25.6 ප්‍රතිවර්ගීකරණය				
	වඩා හොඳ ඉදිරිපත් කිරීමක් සඳහා හා වර්තමාන වසර සමග සන්සන්දනය කිරීමට හැකි වෙන පරිදි පෙර වසරේ මූල්‍ය ප්‍රකාශවල පහත වර්ගීකරණ සංශෝධනය කරනු ලැබ ඇත.				
	ප්‍රතිවර්ගීකරණය	පෙර වර්ගීකරණය	2014 රු.මි.	2015 Rs. Mn	එකතුව රු.මි.
25.6.1	ආයෝජන දේපළ	දේපළ, පිරියත සහ උපකරණ	2.37	16.10	18.46
25.6.2	කෙටි කාලීන ආයෝජන	ජංගම නොවන මූල්‍ය වත්කම්	-	39.00	39.00
25.6.3	පරිපාලන වියදම්	විශේෂ ගාස්තුව	250.00	750.00	1,000.00

26 අසම්භාව්‍ය වගකීම්, බැඳීම් සහ නඩු ක්‍රියාමාර්ග

අසම්භාව්‍ය වගකීම්

2016 දෙසැම්බර් 31 වන විට ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ අසම්භාව්‍ය වගකීම් පහත පරිදි වේ:

නැව් පමාකුලී ඉල්ලීම් ඇමරිකානු ඩොලර් 3,887,935 කි. කෙසේ වෙතත්, වාර්තාකරණ දිනයෙන් පසු සාකච්ඡා/බේරුම්කාර ක්‍රියාවලිය මත පදනම්ව ඉහත වගකීම් මූල්‍ය ප්‍රකාශ තුළ හඳුනාගැනෙනු ඇත.

ඉහත දේට අමතරව මූල්‍ය ප්‍රකාශ දිනය වන විට පැවති වෙනත් ප්‍රමාණාත්මක අසම්භාව්‍ය වගකීමක් නොතිබිණි.

බැඳීම්

2016 දෙසැම්බර් 31 වන විට ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රමාණාත්මක බැඳීම් පහත පරිදි වේ:

බැංකු වෙත බැඳීම්

සංස්ථාව, වසර අවසානයෙන් පසු ප්‍රසම්පාදනය සිදු කරන බොර තෙල් සහ පිරිපහදු කළ බනිජ තෙල් නිෂ්පාදන ආනයනය කිරීම සඳහා ලංකා බැංකුවේ සහ මහජන බැංකුවේ පිළිවෙළින් රු මිලියන 13,474 සහ රු මිලියන 3,264 ක (ඇමරිකානු ඩොලර් මී. 88.795 සහ ඇමරිකානු ඩොලර් මී. 21.513)අගයකින් යුතු ණයවර ලිපි ස්ථාපිත කරන ලදී.

වාර්තාකරණ දිනය වන විට නිම නොවී පැවති නඩු

2016 දෙසැම්බර් 31 වන විට නිරාකරණය නොවූ නඩු 243 ක් තිබිණි. ඒවා පහත දක්වා ඇත.

නඩු වර්ගය	නඩු ගණන	
	සංස්ථාව	සමූහය
කම්කරු උසාවියේ නඩු	01	05
මහේස්ත්‍රාත් අධිකරණ නඩු	06	14
දිස්ත්‍රික් අධිකරණනඩු	111	120
මහාධිකරණ නඩු	16	17
අභියාචනාධිකරණ නඩු	13	15
ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු	19	23
මානව හිමිකම් කොමිසම	24	24
කම්කරු දෙපාර්තමේන්තුව	27	28

ඉහත නඩු අතරින් පහත නඩු ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවට විෂයමූලික වේ;

කොමර්ෂල් බැංකුව, හෙජින් ගනුදෙනු සම්බන්ධ ඇමරිකානු ඩොලර් 8,648,300 ක් සහ එහි පොළිය ඉල්ලා කොළඹ වාණිජ අධිකරණයේ නඩුවක් ගොනු කර ඇත.

ඉහත නඩු මගින් ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ස්ථාවරත්වයට කිසිදු ප්‍රමාණාත්මක බලපෑමක් සිදු නොවන බවට දරන මතය හේතුවෙන් කිසිදු අදාළ ක්‍රියාමාර්ගයක් ගෙන නැත.

27 වාර්තාකරණ දිනයට පසු සිදුවීම්

වාර්තාකරණ දිනයට පසු සිදුවූ සෑම මූල්‍යමය වටිනාකමක් සහිත සිදුවීමක්ම අවශ්‍ය අවස්ථාවන් හිදී සලකා බලා අදාල මූල්‍ය ප්‍රකාශවලට නිසි ගැලපීම්/අනාවරණයන් සිදු කර මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇත.

28 මූල්‍ය අවදානම් කළමනාකරණය

සංස්ථාවේ ක්‍රියාමාර්ග විවිධ මූල්‍ය අවදානම්වලට නිරාවරණය වේ; වෙළෙඳපොල අවදානම (විනිමය අවදානම, පොළී අනුපාත අවදානමද ඇතුළුව), ණය අවදානම, ද්‍රවශීලතා අවදානම සහ මිල අවදානම. අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත කළ ප්‍රතිපත්ති යටතේ කළමනාකාරීත්වය විසින් ආපදා කළමනාකරණය සිදු කරගෙන යනු ලබයි. සංස්ථාවේ මෙහෙයුම්වලට අදාළව කළමනාකාරීත්වය මූල්‍ය අවදානම ඇගයුම් කෙරේ. සංස්ථාවේ සමස්ත අවදානම් කළමනාකරණ වැඩසටහන් සංස්ථාවේ මූල්‍ය කාර්යසාධනයට අයහපත් බලපෑමක් ඇතිවීම අඩු කිරීමේ අපේක්ෂාවෙන් ක්‍රියාත්මක වේ.

සංස්ථාවේ ප්‍රධාන මූල්‍ය උපකරණ, ස්ථාවර තැන්පතු, රාජ්‍ය ආරක්ෂණ, ඇමරිකානු ඩොලර් තැන්පතු සහ මුදල් යනාදියගෙන් සමන්විත වේ. මෙම මූල්‍ය උපකරණ වල ප්‍රධාන අරමුන වන්නේ සංස්ථාවේ ද්‍රවශීලතාවය නඩත්තු කිරීම සහ ආයෝජනය කළ අරමුදල් මත වන මූල්‍ය ප්‍රතිලාභ උපරිමකරණය කිරීමයි. සංස්ථාවට, එහි ව්‍යාපාරික කටයුතුවලින් එන වෙළෙඳ ලැබීම් සහ වෙළෙඳ ගෙවීම් වැනි වෙනත් විවිධ මූල්‍ය උපකාරක ඇත.

(a) වෙළෙඳපොල අවදානම

(i) විදේශ විනිමය අවදානම

සංස්ථාව බනිජ තෙල් නිෂ්පාදන ආනයනය කරන විට විනිමය අනාවරණය මගින් මූලික වශයෙන් ඇමරිකානු ඩොලර් සම්බන්ධව, ඇතිවෙන විනිමය හුවමාරු අවදානමට අනාවරණය වේ. දේශීය ගනුදෙනුවලදී සංස්ථාවේ විනිමය ශ්‍රී ලංකා රුපියල් වන අතර වාර්තාකරණ අරමුණුවලදී අනෙක් සියලුම විනිමය විදේශ විනිමය ලෙස සැලකේ. සමහර බැංකු ශේෂ, වෙළෙඳ ලැබීම් සහ වෙළෙඳ ගෙවීම් විදේශ විනිමයෙන් නාමකරණය කරයි.

අනෙකුත් සියලු විචල්‍යයන් ස්ථායීව පවතින විට ඇමරිකානු ඩොලර් නාමකරණය කළ වගකීම්වල සාධාරණ අගයේ සිදුවෙන වෙනස්කම් හේතුවෙන් සංස්ථාවේ බදුවලට පෙර ලාභය ඇමරිකානු ඩොලර් විනිමය අනුපාතයේ විය හැකි වෙනස්කම්වලට වන සංවේදීතාවය පහත වගුවෙන් පෙන්වයි

	2016 දෙසැම්බර් 31 දිනට අගය ඇමරිකානු ඩොලර්. මිලියන	වසර අවසාන විනිමය අනුපාතය	විනිමය අනුපාතයේ වෙනස්කම	බදුවලට පෙර ලාභය මත බලපෑම* රු. මිලියන
ණය සහ ණයගැනුම් (ඇමරිකානු ඩොලර්)	1,276.38	151.744	1% වැඩිවීම	(1,936.84)
වෙළඳ සහ අනෙකුත් ගෙවීම් (ඇමරිකානු ඩොලර්)	926.74	151.744	1% වැඩිවීම	(1,406.27)

* බදුවලට පෙර ලාභය මත වන බලපෑම යනු කෘත්‍යාත්මක විනිමය ශ්‍රී ලංකා රුපියල් වූ විට ඇමරිකානු ඩොලර් වලින් නම් කරන ලද අදාළ වගකීම්වල සාධාරණ අගයේ වෙනස්කමේ ප්‍රතිඵලයක් වේ.

ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇති සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශ පරිවර්තන සහ ගනුදෙනු අවදානම යන දෙකම තුළින් විදේශ විනිමය උච්චාවචනයන්ගේ බලපෑම ලබයි. විදේශ විනිමය අනුපාතවල වෙනස්කම්, ප්‍රමාණාත්මක පිරිවැය, මිලදී ගැනීම් සහ විදේශ විනිමය මගින් විවිධ පාර්ශ්වවලින් ලබාගත් සේවා යනාදියට බලපායි. විශේෂයෙන්ම, ශ්‍රී ලංකා රුපියල ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව අඛණ්ඩව අවප්‍රමාණය වීම මගින් ආනයනය කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදන සහ වෙනත් මිලදී ගැනීම්වලින් ඇතිවන බලපෑම මත මෙහෙයුම් සහ මූල්‍ය ප්‍රතිඵලවලට ඍජුවම බලපායි.

(ii) පොළී අනුපාත අවදානම

සංස්ථාවේ පොළී අනුපාත අවදානම මතුවන්නේ රාජ්‍ය ආරක්ෂණ සහ ස්ථාවර තැන්පතු ආකාරයෙන් වන ආයෝජන සහ ණය ගැනීම් වෙනිනි. සැපයුම්කරු ණය සම්බන්ධව ගත් විට පවතින වෙළෙඳපොළ අනුපාත වෙතින් පොළී අනුපාත විශාල වශයෙන් වෙනස් වේ. රාජ්‍ය වාණිජ බැංකු දෙක තුළින් සාකච්ඡා කරන ලද පොලී අනුපාත තුළින් විදේශ විනිමය ණය ලබාගනී. සංස්ථාව අඛණ්ඩ පදනමින් පොළී නිරාවරණ විශ්ලේෂණය කරන අතර ලන්ඩන් අන්තර් බැංකු පිරිනැමුම් අනුපාතය (LIBOR) සහ මුදල් වෙළෙඳපොළ අනුපාත අධීක්ෂණය කරයි.

(b) ණය අවදානම

ණය අවදානම යනු, පාරිභෝගිකයෙකු ගිවිසුම්ගත බැඳීම් සැපිරීමට අසමත් වූ විට සංස්ථාවට සිදුවෙන මූල්‍ය පාඩුවයි. සංස්ථාවේ පාරිභෝගිකයින් බොහෝමයක් ස්වාධීනව ශ්‍රේණිගත කර නොමැති බැවින් පාරිභෝගිකයින්ගේ ගුණාත්මක බව සලකනුයේ ඔවුන්ගේ මූල්‍ය තත්ත්වය, අතීත අත්දැකීම් සහ වෙනත් ගුණාත්මක සාධක මතය. සංස්ථාව ණය ප්‍රතිපත්තියක් ස්ථාපනය කර ඇති අතර ණය සීමාවක් ලබා දීමට පෙර සෑම නව පාරිභෝගිකයෙකුම ණය යෝග්‍යතාවය සඳහා තනි තනිව විශ්ලේෂණය කෙරේ සංස්ථාවේ ණය ප්‍රතිපත්තිය සැපිරීමට අසමත් වන පාරිභෝගිකයින්ට සංස්ථාව සමග ගනුදෙනු කළ හැකි වන්නේ මුදල් පදනම මත පමණි.

මුදල් සහ මුදල් සමාන දැවලින්ද බැංකු සහ මූල්‍ය ආයතනවල තැන්පතුවලින් මෙන්ම ගෙවීමට ඇති ලැබීම් සහ බැඳීම් සහිත ගනුදෙනු ඇතුළු පාරිභෝගිකයින්ට ණය නිරාවරණය මගින්ද ණය අවදානම ඇතිවේ.

(c) ද්‍රවශීලතා අවදානම

සංස්ථාවේ මූල්‍ය අංශය මගින් මුදල් ප්‍රවාහ සැලසුම්කරණය සහ පුරෝකථනය කරනු ලබයි. තම විවිධ මූල්‍ය බැඳීම් සහ වඩා හොඳ ප්‍රතිඵල සඳහා කෙටි කාලීන අතිරික්ත සම්පත් ප්‍රශස්ත ලෙස උපයෝජනය තුළින් මූල්‍ය අංශය අඛණ්ඩවම ලද හැකි අරමුදල් අධීක්ෂණය කරයි.

කාරක ප්‍රාග්ධනය කළමනාකරණය සඳහා ශේෂයට ඉහළින් තබාගත් අතිරික්ත මුදල්, ඉතිරිකිරීමේ ගිණුම් සහ කෙටි කාලීන යළි මිලදී ගැනීම් ආයෝජන/ පොළී උපයන මූල්‍ය උපකරණ තුළ ආයෝජනය කෙරේ. වාර්තාකරණ දිනය අනුව, සංස්ථාව විසින් රඳවාගත් මුදල් සහ මුදල් සමාන දෑ රු මිලියන 14,579 ක් සහ කෙටි කාලීන තැන්පතු රු මිලියන 28,066, ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කිරීම පිණිස මුදල් ප්‍රවාහ උත්පාදනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පහත වගුව ගිවිසුම්ගත කල් පිරීමේ දිනයට ඉතිරිව ඇති කාලසීමාව මත පදනම්ව සංස්ථාවේ වියුත්පන්න වගකීම් අදාළ කල් පිරීමේ කාණ්ඩවලට බෙදා ඇති අයුරු පෙන්වයි.

2016 දෙසැම්බර් (ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)					
	මාස 3 කට අඩු	**මාස 3 සිට මාස12 දක්වා**	**අවුරුදු 1 සිට 2 දක්වා**	**අවුරුදු 3 සිට -5 දක්වා**	**අවුරුදු 5 ට වැඩි**
බැංකු ණය ගැනුම්	48,421	145,263			
දීර්ඝ කාලීන ණය			76	228	-
	48,421	**145,263**	**76**	**228**	-

(d) මිල අවදානම

සංස්ථාව, ඇමරිකානු ඩොලර් සහ වෙනත් විනිමය මගින් ආනයනය කරන ඛනිජ තෙල් නිෂ්පාදන (බොරතෙල් සහ නිමි නිෂ්පාදන) සහ විදේශ රටවලින් ආනයනය කෙරෙන අනෙක් අමුද්‍රව්‍ය සම්බන්ධ භාණ්ඩ මිල අවදානමට නිරාවරණය වී ඇත. ඛනිජ තෙල් නිෂ්පාදනවල දේශීය සිල්ලර අලෙවි මිල තීරණය කිරීමේදී ජාත්‍යන්තර ඉන්ධන මිල වලනයන් අනුව පිරිවැය පරාවර්තිත යාන්ත්‍රණයක් ක්‍රියාත්මක නොවේ. සංස්ථාව නිරන්තරව සතිපතා තොග සමාලෝචන රැස්වීම් පවත්වන අතර එහිදී අවශ්‍ය අනාගත ආනයන සඳහා අනාගත නිෂ්පාදන අවශ්‍යතා සාකච්ඡා කර සැලසුම් කෙරේ. එමෙන්ම සංස්ථාව, සුදුසු හා කාලීන කළමනාකාරීත්ව තීරණ ගැනීමට ඛනිජ තෙල් නිෂ්පාදනවල මූල්‍ය තොරතුරු ලබාදීමෙන් මහා භාණ්ඩාගාරය සමග සම්බන්ධතා පවත්වයි.

29. ගිවිසුම් සහ අදාළ පාර්ශ්ව ගනුදෙනු තුළ අධ්‍යක්ෂවරුන්ගේ බැඳියාව

ප්‍රධාන කළමනාකාරීත්වයේ පිරිස් වෙත ගෙවීම්

	සංස්ථාව	
	2016	2015
		යළි ප්‍රකාශිත
	රු.මි	රු.මි
කෙටි කාලීන ප්‍රතිලාභ	1.762	2.487

අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රධාන කළමනාකාරීත්වයේ පිරිස් ලෙස සැලකේ. ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපති/කළමනාකරණ අධ්‍යක්ෂක වන ටී.ජී. ජයසිංහ මහතා සහ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ සභාපති/කළමනාකරණ අධ්‍යක්ෂක වන ඩී.සී.එස්. සෙනෙවිරත්න මහතා සංස්ථාවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කිරීම හැර කිසිදු අධ්‍යක්ෂවරයෙකුට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ හෝ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ ගිවිසුම් සම්බන්ධව කිසිදු සෘජු හෝ වක්‍ර සබඳතාවයක් නැත.

අදාළ පාර්ශ්ව සමග පහත ගනුදෙනු සිදු කෙරිණි.

ගනුදෙනුව	2016	2015
		යළි ප්‍රකාශිත
	රු.මි.	රු.මි.
අදාළ පාර්ශ්ව වෙත අලෙවි කිරීම් සහ ලබාදුන් සේවා		
අනුබද්ධ ආයතනය		
ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම	452.532	499.772
අනෙක් අදාළ පාර්ශ්ව		
ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය	19.600	24.300
	472.132	524.072
අදාළ පාර්ශ්ව වෙතින් ලැබුණු සේවා		
අනුබද්ධ ආයතනය		
ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම	11,835.401	10,667.359
	11,835.401	10,667.359
අදාළ පාර්ශ්ව වෙත ලබාදුන් ණය පියවීම		
අනුබද්ධ ආයතනය		
ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම	285.705	571.409
අදාළ පාර්ශ්ව වෙතින් ලැබිය යුතු මුදල් *		
අනුබද්ධ ආයතනය		
ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම	302.870	495.603
අනෙක් අදාළ පාර්ශ්ව		
ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය	8.145	12.416
	311.015	508.019
අදාළ පාර්ශ්ව වෙත ගෙවිය යුතු මුදල්		
අනුබද්ධ ආයතනය		
ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම	3,589.441	5,828.676

මුදල් ප්‍රමාණයන් වර්ගීකරණය කර ඇත්තේ පිළිවෙළින් වෙළෙඳ සහ අනිකුත් ලැබීම් සහ වෙළෙඳ හා අනෙකුත් ගෙවීම් වශයෙනි.

අදාළ පාර්ශව සමග ගනුදෙනුවල කොන්දේසි සහ නියමයන්

අදාළ පාර්ශව වෙත සිදු කරන අලෙවි කිරීම් සහ කරන ලද මිලදී ගැනීම් අතේ දුරින් කෙරෙන ගනුදෙනුවල ඇති නියමයන්ට සමානව කෙරේ. වසර අවසානයේ ගෙවීමට ඇති ශේෂයන් අනාරක්ෂිත වන අතර පොළී රහිතවේ. අදාළ පාර්ශවවල ලැබීම් සහ ගෙවීම් සම්බන්ධව කිසිදු රක්ෂණයක් නැත.

30 ප්‍රාග්ධනය කළමනාකරණය

ප්‍රාග්ධන කළමනාකරණයේ මූලික අරමුණ වන්නේ ප්‍රශස්ත ප්‍රාග්ධන ව්‍යුහයක් පවත්වාගැනීම සහ ප්‍රධාන පාර්ශවකරුවන්ගේ බැඳියාවන් ආරක්ෂා කරමින් අඛණ්ඩ පැවැත්ම පවත්වා ගැනීමයි. වර්තමාන වසරේදී රු මිලියන 53,138 ක ලාභයක් ඉපයීමට සහ එය සෘණාත්මක ශුද්ධ වත්කම් තත්වය අඩු කිරීමට සංස්ථාවට සහ සමූහයට හැකි විය. කෙසේ වෙතත්, 2016 දෙසැම්බර් 31 දා වන විටත් ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව රු මිලියන 185, 846 ක සෘණාත්මක ශුද්ධ වත්කම් තත්වයක් පැවතිණි. (සමූහය: රු. මිලියන 167,998) එයට හේතුව වුයේ 2008 සිට පැවති සමුච්ඡිත අලාභයයි. ශ්‍රී ලංකා රජයේ මූල්‍ය සහය රහිතව සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පවත්වාගැනීමට සංස්ථාවට ඇති හැකියාව පිළිබඳව සැක සහිත බව බාහිර විගණකවරු තම විගණන වාර්තාව තුළ සඳහන් කර ඇත.

සංස්ථාව විසින් දරන ලද සුවිසල් පාඩුවලට විශාල වශයෙන් හේතු වූයේ සිල්ලර මිල රජය මගින් තීරණය කරන බැවින් බනිජ තෙල් නිෂ්පාදන ඉහළ සහන මිලකට අලෙවි කිරීමයි. එවැනි පාඩු ආවරණය කරගැනීමට 1971 අංක 38 දරන මුදල් පනතේ 17 වන වගන්තිය අනුව සංස්ථාව රජයේ සහනාධාර ලැබීමට හිමිකම් ලබයි. සංස්ථාවට සහනාධාර ලබාදෙන්නේ නම් සෘණාත්මක ශුද්ධ වත්කම් තත්වය ජයගත හැකිය.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය எனது இல. My No. } පිඹරි/ඒ/සිපිසි/1/16/01 මෙහි අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2018 මාර්තු 07 දින

සභාපති

ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව

ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ හා එහි පරිපාලිතයෙහි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සි) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන සහ ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ හා එහි පරිපාලිතයෙහි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1961 අංක 28 දරන ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 31 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සි) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. පරිපාලිතයෙහි මූල්‍ය ප්‍රකාශන විගණන කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා පොදු පරිවයේ යෙදෙන වරලත් ගණකාධිකාරී සමාගමක සහාය මා විසින් ලබා ගන්නා ලදි.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයෙහි දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

(අ) තත්ත්වාගණනය කළ මතය - ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

මෙම වාර්තාවේ 2.2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

(ආ) තත්ත්වාගණනය කළ මතය - සමූහය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ හා එහි පරිපාලිතයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 සමූහයේ මූල්‍ය ප්‍රකාශන

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයන් සැකසීමේදී සමාගම් අතර සිදුවන ගනුදෙනු ඉන් ඉවත් විය යුතුය. කෙසේ වෙතත් රු.මිලියන 39.66 ක් හා රු.මිලියන 1,104.15 ක ලැබිය යුතු ශේෂයන් හා ගෙවිය යුතු ශේෂයන් ඉන් ඉවත් කිරීමේදී යම් විෂමතාවයන් ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව හා ලංකා ඛණිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමෙහි මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබුණි.
විස්තර පහත දැක්වේ.

අයිතමය	සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුල දැක්වෙන ශේෂය	ලංකා ඛණිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමෙහි මූල්‍ය ප්‍රකාශන තුල දැක්වෙන ශේෂය	වෙනස
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
ලංකා ඛණිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමෙන් ලැබිය යුතු ශේෂය ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු ශේෂය	302.87	263.21	39.66
ලංකා ඛණිජ තෙල් තොග ගබඩා පර්යන්තයට ගෙවිය යුතු ශේෂය ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට ලැබිය යුතු ශේෂය	3,589.44	4,693.59	1,104.15

(ආ) ලංකා ඛණිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමෙහි පහත සඳහන් හේතූන් මත පදනම්ව තත්ත්වාගණනය කළ මතයක් එම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රකාශ කරන ලදි.

i. විශ්‍රාම ගැන්වීමේ ප්‍රතිලාභ හා වෛද්‍ය ප්‍රතිලාභ සඳහා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ සේවකයන් වෙනුවෙන් ලංකා ඛනිජතෙල් සංස්ථා සකසුරුවම් සමිතිය විසින් ගෙවන ලදි. මෙම සකසුරුවම් සමිතිය මඟින් විශ්‍රාම ගැන්වීමේ දී එහි

සාමාජිකයන්ට අමතර බාග වැටුපක් සේවා වර්ෂ ගණනට ගෙවනු ලබයි. ඒ අනුව සකසුරුවම් සමිතිය සංස්ථාපනය මගින් CPSTL ආයතනයේ සේවකයන් හට පශ්චාත් සේවක ප්‍රතිලාභ හා සුදුසුකම් ලබන පශ්චාත් සේවක ප්‍රතිලාභ ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත අංක 19 (LKAS-19) අනුව ආයුගණන ක්‍රමවේදයක් හා ගිණුම්ගත කිරීමක් සිදු කර නොතිබුණි.

ii. ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාවෙන් ලැබිය යුතු රු.මිලියන 4,857.2ක් වෙළෙඳ හා වෙනත් ලැබීම් තුල ඇතුලත්ව තිබුණි. ඉහත ශේෂය සම්බන්ධයෙන් ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාවෙන් ලද ශේෂ සනාථ කිරීමේ ලිපියට අනුව රු.මිලියන 652 මතබේදයට තුඩු දෙනු ගනුදෙනු සිදු වී තිබුණි. (2015 රු.මිලියන 336) මෙයින් රු.මිලියන 163.5 (2015 රු.මිලියන 163.5) සඳහා හානිකරණය සිදු කර තිබුණි. ඒ අනුව හානිකරණ වෙන් කිරීම රු.මිලියන 489ක් (2015 රු. මිලියන 173) අඩුවෙන් සටහන් වී තිබුණි.

iii. 2017 සැප්තැම්බර් 07 දින පාර්ලිමේන්තුව විසින් අවසර ලබා දුන් දේශීය ආදායම් කෙටුම්පත අනුව 2018 අප්‍රේල් 01 දින සිට අදාල වන පරිදි සමාගම් සඳහා බදු අනුපාතය සියයට 28 වේ. මෙම කෙටුම්පත අනුව වෙන් කිරීම ගරු කථානායකතුමා සහතික කිරීම මත සිදු වේ. මෙම කෙටුම්පත් සම්බන්ධයෙන් ඇතිවන යම් බලපෑම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනයන්හි අනාවරණයක් සිදුකර නොතිබුණි.

2.2.2 සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන

2.2.2.1 ලංකා බණිජ තෙල් නීතිගත සංස්ථාවේ අසුභවාදී ශුද්ධ වත්කම් තත්ත්වය

2016 වර්ෂය සඳහා මෙහෙයුම් කටයුතු වලින් රු.මිලියන 53,027 ක බදු පසු ශුද්ධ ලාභයක් සහ රු. මිලියන 53,137 ක මුළු විස්තීර්ණ ආදායමක් ලැබීම සහ සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු. මිලියන 185,847 ක සෘණාත්මක ශුද්ධ වත්කම් තත්ත්වයක් පැවතීම කෙරෙහි අවධානය යොමු කෙරේ. සමාලෝචනයට භාජනය වූ වර්ෂයේ විනිමය අනුපාතික විචලනයේ සෘණාත්මක බලපෑම සහ පසුගිය වසරවල සිදුවන හෙජිං ගනුදෙනුවල ප්‍රතිඵලයක් ලෙස සංස්ථාව විසින් දරනු ලැබූ අතිවිශාල පාඩු එම සෘණ ශුද්ධ වත්කම් තත්ත්වයට හේතු විය.කෙසේ වුවද සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ සංස්ථාවේ මූල්‍ය කාර්ය සාධනය වර්ධනය වී තිබුනද පසුගිය වසරවලදී පැවති අතිවිශාල පාඩු නිසා ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ තවදුරටත් සෘණ ශුද්ධ වත්කම් තත්ත්වය පැවතීමට හේතු විය.

2.2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රීලංගිප්‍ර) අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) **ශ්‍රී.ලං.ගි. ප්‍රමිති 19 - සේවක ප්‍රතිලාභ**

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 1.3 අනුව, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල (SMEs) භාවිතය සඳහා පමණක් අවසර දෙනු ලැබූ මෘදුකාංගය භාවිතයෙන් **ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය** යොදා ගෙන සංස්ථාව විසින් විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය ගණනය කර තිබුණි. ඒ අනුව, ප්‍රමිතියේ සඳහන් නියමයන්ට අනුකූලව පාරිතෝෂික සඳහා වෙන් කිරීම් සිදුකර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) **ශ්‍රී.ලං.ගි. ප්‍රමිති 24 - සම්බන්ධිත පාර්ශව පිළිබඳ හෙලිදරව් කිරීම**

සංස්ථාව සහ ප්‍රධාන කළමනාකාර නිලධාරීන් අතර සම්බන්ධිත පාර්ශව මැදිහත්වීම මූල්‍ය ප්‍රකාශනවල නිසි ලෙස අනාවරණය කර නොතිබුණි.

2.2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ රු.මිලියන 989.9 ක වටිනාකමින් යුත් චෙක්පත් 581 ක වලංගු කාලය 2016 දෙසැම්බර් 31 දිනට ඉකුත් වී තිබුණි. තවද, ඉහත ඉදිරිපත් නොවූ චෙක්පත් අතර 2016 ජූනි 28 දින රේගු අධ්‍යක්ෂ ජනරාල් නමින් නිකුත් කළ රු. මිලියන 972.25 ක චෙක්පතක් ඇතුලත් වී තිබුණි.කෙසේ වෙතත් මේ සම්බන්ධව සුදුසු ගිණුම්කරන ප්‍රතිකර්ම යෙදීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි. මේ නිසා මුදල් හා අදාල වගකීම් ගිණුම් ඒම වටිනාකමට සමාන අගයකින් අඩුවෙන් සටහන් වී තිබුණි.

(ආ) ඒකාබද්ධ කිරීමේදී, අන්තර් ශාඛා ගනුදෙනු ඉවත් විය යුතු වේ. කෙසේ වෙතත් මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කරන වර්ෂය අවසානයේදී අන්තර් ශාඛා වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු රු. 1,397,300 ක ශේෂයක් නිරීක්ෂණය කරන ලදි. එබැවින් මූල්‍ය ප්‍රකාශන තුල දැක්වෙන වෙලඳ හා අනෙකුත් ලැබීම් ශේෂය ඒ හා සමාන අගයකින් අධිතක්සේරු වී තිබුණි. එම නිසා විගණනයේදී අන්තර් ශාඛා ගිණුම් වාර්තා කිරීමේ හා පියවීමේ නිරවද්‍යතාවය හා සම්පූර්ණත්වය පිළිබඳව විවේචනාත්මක සැකයක් මතු වේ.

(ඇ) මූල්‍ය ප්‍රකාශන තුල 2011/2012 සිට 2014/2015 දක්වා වන වර්ෂයන් සඳහා ආදායම් බදු තක්සේරු එකතුවක් වශයෙන් 2015 වර්ෂයේදී රු. 924,879,000 ක් දක්වා තිබුණි. කෙසේ වෙතත් විගණනය සඳහා ලබාදුන් තොරතුරු වලට අනුව එම කාලපරිච්ඡේදය තුල සැබෑ ආදායම් බදු තක්සේරුව රු. 1,409,169,766 ක් හා ඒ පිළිබඳ වූ දඩ අයකිරීම වශයෙන් රු 157,439,252 ක් විය. ඒ අනුව 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලට අනුව නොගෙවූ ආදායම් බදු සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදනය රු. 484,290,530 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) විගණනයට සපයන ලද තොරතුරු වලට අනුව 2015 හා 2016 වර්ෂයන් සඳහා නොගෙවූ ජාතිය ගොඩනැගීමේ බදු මත දේශීය අදායම් දෙපාර්තමේන්තුව විසින් පනවන ලද අමතර තක්සේරු කල වටිනාකම රු 1,703,895,425කි. කෙසේ වෙතත් සලක බලන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ජාතිය ගොඩනැගීමේ බදු ලෙස සඳහන් වූයේ රු 410,300,842ක ප්‍රමාණයකි. එබැවින් 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ජාතිය ගොඩනැගීමේ බද්ද රු. 1,293,594,583ක් අඩුවෙන් පෙන්වා තිබුණි.

(ඉ) විගණනයට සැපයූ තොරතුරු අනුව 2016 වර්ෂයට නැව් පමා කුලිය වූ රු.353,737,477 ක වටිනාකම, උපචිත නැව් පමා කුලී රු. 173,504,644 කින් සහ ගෙවන ලද නැව් පමා කුලී රු. 180,232,833 කින් සමන්විත විය. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අනුව රු. 173,504,644 ක උපචිත වටිනාකම පමණක් ගිණුම්ගත කර ඇත.

(ඊ) 2014 වර්ෂය තුලදී මහා භාණ්ඩාගාරයේ ඉල්ලීම මත විශේෂ ගාස්තුවක් ලෙස මහා භාණ්ඩාගාරයට බණිජ තෙල් නීතිගත සංස්ථාව රු. මිලියන 10,000 ක් ගෙවා තිබූ අතර එය 2014 වර්ෂයේ ආදායමට එරෙහිව කපා හැරිය යුතු වුවත් ඒ වෙනුවට ලැබිය යුතු ලෙස ගිණුම් ගත කර තිබුණි. ඒ අනුව, රු.මිලියන 250 , රු.මිලියන 750 හා රු.මිලියන 1,000 ක් පිළිවෙලින් 2014,2015 සහ 2016 වර්ෂ සඳහා ආදායමට එරෙහිව කපාහැර තිබුණි. එහි

ප්‍රතිඵලයක් ලෙස ශුද්ධ මෙහෙයුම් ආදායම් එම වර්ෂ තුලදී අවතක්සේරු වී තිබුණි. වැරදි සහගත ගිණුම්කරණ පිළියම මගින් මූලික ගිණුම්කරණ මූලධර්ම උල්ලංඝනය කර තිබූ බව තවදුරටත් නිරීක්ෂණය විය.

(උ) ශ්‍රී ලංකන් ගුවන් සමාගම විසින් එකතුව රු මිලියන 160.5 ක නොපියවූ වවුවරවලට අදාල රු.මිලියන 6.7 ක පොළිය සලකා බලන වර්ෂයේදී ගිණුම්ගත කර නොතිබුණි.එහි ප්‍රතිඵලයක් වශයෙන් සලකා බලන වර්ෂයේදී උපචිත පොලිය හා ආදායම එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

2.2.2.4 නොසැසඳුනු වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ ගිණුම්පොත් අනුව පරීක්ෂාවට භාජනය වූ වර්ෂය අවසානයේදී සකසුරුවම් සමිතිය වෙත ගෙවීමට තිබුණු ශුද්ධ වටිනාකම රු.7,600,745 කි. කෙසේ වෙතත් සකසුරුවම් සමිතිය ලබාදුන් ශේෂ තහවුරු කිරීම් වලට අනුව එම වටිනාකම රු.42,460,782 කි. එබැවින් රු.34,860,037ක නොසැසඳුනු ශේෂයක් මෙම වාර්තා දෙක අතර තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) පිලිවෙලින් 2016 සහ 2015 වර්ෂ සඳහා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමෙහි මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කළ තෙල් ගබඩා කිරීම හා බෙදා හැරීමේ ගාස්තු (පර්යන්ත ගාස්තු , ප්‍රවාහන ගාස්තු සහ පොළි ගෙවීම් ආදී) සඳහා රු. මිලියන 177 ක් සහ රු. මිලියන 400.9 ක් නොසැසඳුනු වෙනස්කම් නිරීක්ෂණය විය.

(ඇ) 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා වෛද්‍ය වියදම් රු. 38,579,072 ක් වූ අතර විගණනයට ලබා දුන් විස්තරාත්මක උපලේඛණවලට අනුව එය රු. 57,951,039 කි. එබැවින් රු. 19,371,967 ක පැහැදිලි නොකළ වෙනසක් විගණනයේදී අනාවරණය විය.

(ඇ) වර්ෂ අවසාන ශේෂ සනාථ කිරීමට අනුව, 2007 සිට 2009 දක්වා කාල පරිච්ඡේදය අතරතුර තෙල් මිලදී ගැනීමට අදාලව සිදුව තිබූ ඉදිරි සුරැකුම් ගනුදෙනු සම්බන්ධයෙන් එකතුව ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 22.77 ක් හා ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 8.65 ක් පිළිවෙලින් මහජන බැංකුවට හා කොමර්ෂල් බැංකුවට ගෙවීමට තිබුණි.කෙසේ නමුත් එය සංස්ථාවේ ගිණුම්වලට ගෙන නොතිබුණි.

2.2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකතු කළඅගය මත බදු

සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්වය පිලිබඳ ප්‍රකාශනයේ සඳහන් වෙනත් ලැබිය යුතු ශේෂය තුල එකතුවක් ලෙස ගත් විට එකතු කල අගය මත බදු (වැට්) රු.623,573,943 ක් සඳහන් වූ අතර එම අගය තුල අයවිය යුතු වැට්, ආපසු ලබා ගත යුතු වැට් හා දේශීය මිලදිගැනුම් මත පිලිවෙලින් රු.326,394,420, රු.124,733,322 හා රු.172,446,201 ක් විය. කෙසේවෙතත් මේ සඳහා හේතූන් විගණනයට ඉදිරිපත් නොවිය. තවද එකතු කළ අගය මත බදු ලෙස අයවිය යුතු රු.326,394,420 ක මුදල 2010 වර්ෂයේ සිට දිගින් දිගටම නිරවුල් නොවී තිබුණු බව හඳුනාගෙන තිබුණි. තවදුරටත් ආපසු ගෙවිය යුතු රු.124,733,322 ක එකතු කළ අගය මත බදු මුදල තහවුරු කර ගැනීම සඳහා අදාල වන බදු ඉන්වොයිස් හා වෙනත් අදාල ආධාරක ලියවිලි ඉදිරිපත් නොවුණි.

තවද සංස්ථාවේ ගිණුම් පොත් වලට අනුව සාමාලෝචිත වර්ෂය තුලදී ජනනය වූ දේශීය මිලට ගැනුම් මත එකතු කළ අගය මත බදු ප්‍රමාණය රු.172,446,201කි. කෙසේ වෙතත් සාමාලෝචිත වර්ෂයට අදාලව අයකරගත යුතු එකතු කළ අගය මත බදු පිළිබඳව වාර්තා හෝ සංස්ථාව විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ එකතු කළ අගය මත බදු වාර්තා වල සඳහන් ඉදිරියට ගෙන ගිය එකතු කළ අගය මත බදු සහ සාමාලෝචිත වර්ෂයට අදාළ බදු ඉන්වොයිසි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) බනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනයන්ට අනුව අයවිය යුතු මුළු එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු පිලිවෙලින් රු. 623,573,943ක් හා රු.1,803,656,120ක් විය. කෙසේ වෙතත් ආදායම් බදු දෙපාර්තමේන්තුවේ වාර්තාවන්ට අනුව එම අගයන් පිලිවෙලින් රු.29,528,455ක් හා රු.2,831,220,633ක් විය. එහෙයින් එම සංඛ්‍යාවන් අතර නොසැසඳුනු ශේෂයන් පිලිවෙලින් රු.594,045,488ක් හා රු.1,027,564,513ක් විය. තවද ආදායම් බදු දෙපාර්තමේන්තුවේ වාර්තාවන්ට අනුව ගෙවිය යුතු එකතු කළ අගය මත බදු වටිනාකම

රු.3,336,528,365ක් බව සඳහන් වුවද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි ගෙවිය යුතු ශේෂයක් පෙන්නුම් නොකරයි. මේ සඳහා හේතු විගණනයට ඉදිරිපත් නොවිය.

(ඇ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අනුව වර්ෂයේ ආර්ථික සේවා ගාස්තු සඳහා කිසිදු ලැබිය යුතු හෝ ගෙවිය යුතු ශේෂයක් දක්නට නොමැත. කෙසේ වෙතත් ආදායම් බදු දෙපාර්තමේන්තුවේ වාර්තාවන්ට අනුව ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තුව රු. 55,800,000 ක් බව අනාවරණය විය. එම නිසා මූල්‍ය ප්‍රකාශනයන්හි ආර්ථික සේවා ගාස්තු වලට අදාලව නිරවද්‍යතාවය හා සම්පූර්ණත්වය විගණනයේදී සැක සහිත විය.

(ඈ) සංස්ථාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ අය විය යුතු ශුද්ධ ආදායම් බදු ශේෂය රු.3,959, 861,589 කි. කෙසේ වෙතත් ආදායම් බදු දෙපාර්තමේන්තුවේ වාර්තාවන්ට අනුව ලැබිය යුතු බදු ශේෂය රු.6,443,430,012 කි. එහෙයින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අනුව මුළු එකඟ නොවන ශේෂය රු.10,403,291,601කි. එම නිසා සමාලෝචිත වර්ෂය අවසාන මූල්‍ය තත්ත්වයේ ප්‍රකාශනයේ සටහන් වල විශ්වාසනීයත්ව භාවය, නිරවද්‍යතාවය හා සම්පූර්ණත්වය පිළිබඳව ගැටළු සහගත තත්ත්වයක් ඇති විය.

(ඉ) සංස්ථාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අනුව ගෙවිය යුතු රේගු බදු රු.5,119,928,266 කි. කෙසේ වෙතත් ශ්‍රී ලංකා රේගුවේ වාර්තා අනුව එය රු.5,707,652,279 කි. එහෙයින් 2016 දෙසැම්බර් 31 වන දිනට මෙම වාර්තා දෙක අතර වෙනස රු.587,724,013 ක් බව විගණනයේ දී අනාවරණය විය.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙනත් අය විය යුතු ශේෂයන් තුල රු.1,511,857,999 ක ආදායම් බදු දක්වා තිබූ අතර, එහි සංයුතිය පහත පරිදි වේ.

	මුදල

	රු.
වෙනත් අයවිය යුතු - ආදායම් බදු දෙපාර්තමේන්තුව	376,000,065
වෙනත් අය විය යුතු - ආදායම් බදු දෙපාර්තමේන්තුව	
රේගු දෙපාර්තමේන්තුව	1,135,857,934
එකතුව	1,511,857,999

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) ආදායම් බදු දෙපාර්තමේන්තුවට යොමු කළ බදු වාර්තා තුල ආදායම් බදු වැඩිපුර ගෙවීමක් හෝ ඉදිරියට ගෙන එන ලද ආදායම් බදු ශේෂයක් සඳහන් නොවීම.

(ii) මෙම සංඛ්‍යාවන් සෘජුවම වෙනත් අයවිය යුතු ආදායම් බදු දෙපාර්තමේන්තුව යටතේ වර්ග කිරීම විගණනයට පැහැදිලි නොවීය.

(iii) අනාවරණය වූ ශේෂයක් වන රු.376,000,065 දිගින් දිගටම 1998 වර්ෂයේ සිට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙනත් අයවිය යුතු ශේෂයන් තුල ඇතුලත් වුවකි. මෙහිදි එම ශේෂය දිගින් දිගටම පිය නොවි තිබීමට හේතූන් විගණනයට පැහැදිලි නොවීය.

(iv) ඉහත සඳහන් කළ වෙනත් අයවිය යුතු රු.1,135,857,934 ක ශේෂයක් 2012 වර්ෂයේ සිට ඉදිරියට ගෙන ආ ශේෂයක් වන අතර, අදාල තොරතුරු ඉදිරිපත් නොවීම නිසා සතුටුදායක ලෙස තහවුරු කර ගැනීමට නොහැකි විය.

එහෙයින් ඉහත සඳහන් කළ රු.1,511,857,999 ලැබිය යුතු එකතු ශේෂය සම්බන්ධයෙන් මා හට විශ්වාසනීයත්වය, නිවැරදි බව, තක්සේරු කල හැකි බව, සම්පූර්ණත්වය පිළිබඳව පිළිගත හැකි විශ්වාසයක් ලබා ගත නොහැකි වූ අතර, තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් විගණන සාක්ෂි නොතිබුණි.

(උ) මූල්‍ය ප්‍රකාශන වලට අනුව 2016 දෙසැම්බර් 31 දිනට උපචිත පොලි වියදම රු.313,820,185කි. කෙසේවෙතත් ලෙජරයට අනුව හර ශේෂය 04ක එකතුවක් වූ රු.1,617,112කින්, බැර ශේෂය 31 ක එකතුවක් වූ රු.13,763,193කින් සමන්විත රු.12,146,081ක ශුද්ධ අගයක් විය. තවද, මෙම ශේෂය 2010 වසරේ සිට එකතුවෙමින් පැවති ශේෂයක් වන අතර ආධාරක තොරතුරු නොතිබීම නිසා මෙහි නිරවද්‍යතාව, පැවැත්ම හා සම්පූර්ණත්වය සම්බන්ධව සෑහීමකට පත්වීමට නොහැකි විය.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

2016 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු මුළු වෙළඳ ණය ප්‍රමාණය වූ රු.මිලියන 33,387 න් පිළිවෙලින් රු.මිලියන 24,136.8 ක් සහ රු.මිලියන 9,250.2 ක් රාජ්‍ය ආයතන වලින් හා පුද්ගලික ආයතන වලින් සමන්විත විය . කෙසේ වෙතත් පෙර වර්ෂයේ හිඟ හිටි ශේෂය වන රු. මිලියන 18,787 සමග සැසඳීමේදී වර්ෂය අවසානයේදී මුළු ලැබියයුතු දෑ සියයට 78 කින් වැඩි වී තිබුණි. 2016 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු දෑ වල කාල විශ්ලේෂණය පහත දැක්වේ.

ගනුදෙනු වර්ගය	එකතුව	කාල විශ්ලේෂණය					
		වර්ෂයකට අඩු	වර්ෂ 1සිට 2 දක්වා	වර්ෂ 2සිට 3 දක්වා	වර්ෂ 3සිට 4 දක්වා	වර්ෂ 4 සිට5 දක්වා	වර්ෂ 5ට වැඩි
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
බෙදුම්කරුවන්	1,016,605,312	990,626,246	(599,010)	8,971,155	1,282,138	1,138,177	15,186,606
ගුවන්සේවා	9,263,688,816	9,257,815,945	217	38,394	1,803,327	1,617,303	2,413,630
විදුලි ජනක පිරියත	19,996,044,020	19,007,529,142	8,582,378	226,321,671	753,610,829	-	
රජයේ පාරිභෝගිකයන්	2,002,371,035	1,312,981,322	31,856,507	480,596,958	61,454,860	49,270,208	66,211,176
පුද්ගලික පාරිභෝගිකයන්	628,092,693	316,810,086	23,670,804	21,653,010	22,533,993	25,412,079	218,012,717
කෘෂි රසායනික	17,001,940	7,782,212	1,997,458		50,322	49,815	7,122,133
අනෙකුත්	462,891,297	458,684,841	-	-	-	106,198	4,100,258
ඒකතුව	**33,386,695,105**	**31,352,229,794**	**65,508,354**	**737,581,188**	**840,735,469**	**77,593,780**	**313,046,522**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදු කෙරේ .

(අ) කල් ඉකුත් වූ ශේෂ මත පොලි අයකිරීම්.

(i) සංස්ථාව විසින් ණය කාලසීමාව ඉක්ම වූ ලැබිය යුතු ශේෂ මත පොලි අයකිරීම සිදුකරනු ලැබේ . කෙසේ වෙතත් සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනපේක්ෂිත කාලසීමාවක් තුල ගෙවීම් සිදුකිරීම පාලනය කිරීමට ගත් අකාර්යක්ෂම තීරණය හේතුකොට ගෙන සංස්ථාව විසින් පොලි ගාස්තු ගණනය කිරීමට විධිමත් පද්ධතියක් සැලසුම් කිරීම , ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම සිදු නොකර තිබූ බව නිරීක්ෂණය විය.

(ii) පෙර විගණන වාර්තා වල සඳහන් වූ පරිදි පොළී ගාස්තු අතින් ගණනය කිරීමේදී වැරදි සිදු වී ඇති බැවින් දත්ත ක්‍රියාවලි පද්ධතිය භාවිත කිරීමට යෝජනා කරන ලදී. කෙසේ වෙතත් සමාගම විසින් එවැනි පාලන දුර්වලතා නිවැරදි කිරීමට හිතකර ක්‍රියාමාර්ග නොගැනීම මත වැරදි , සමාලෝචිත වර්ෂය තුලදී නිරීක්ෂණය විය.

(iii) 2015 වර්ෂයේ සිට බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලැබියයුතු ශේෂය වූ රු. 31,207,680 මත පොළී අයකර නොතිබුණි.

(ආ) ඉන්ධන සැපයිමේ ගිවිසුම්

(i) සංස්ථාව විසින් ඉන්ධන සැපයීම සඳහා විධිමත් ගිවිසුමකට එලඹ නොතිබුණි. විශේෂයෙන්ම,2016 දෙසැම්බර් 31 දිනට මුළු ණයගැති ශේෂය තුල ඇතුලත් ප්‍රධාන ගණුදෙනුකරුවන් 17 දෙනෙකුගේ හිඟහිටි ශේෂය වූ රු.මිලියන 27,636 ක් හෝ සියයට 82 කට අදාළව ගිවිසුමකට එළඹ නොතිබුණි.එම නිසා සංස්ථාව වෙත නීත්‍යානුකූල අයිතිය අඩුවීම හේතුවෙන් පැහැරහැරීමේ අවදානම ඉහළ මට්ටමක පවතින අතර බේරුම්කරනයේ දී යම් ගැටළුකාරී තත්ත්වයක් ඇතිවීමටද හේතුවේ.

(ii) 2015 සැප්තැම්බර් 30 දින ශ්‍රී ලංකා එයාර් ලයින්ස් සමාගම විසින් දේශීය මුදලින් රු.මිලියන 7.9ක් එදිනට පැවති හිඟහිටි ශේෂය පියවීම සඳහා විදේශ විනිමය (ඇ,ඒ.ඡ.ඩොා) නොසලකා හරිමින් ගෙවන ලදී. ඉන් පසුව සංස්ථාව එම දිනයේ පැවති අනුපාතය අනුව එක්සත් ජනපද ඩොලර් බවට පරිවර්තනය කර ඇති අතර අවශ්‍ය ගැළපීම් ගිණුම් පොත් වල සිදු කරන ලදී .ඒ අනුව, පසුකාලීනව, ශ්‍රී ලංකා එයාර් ලයින්ස් සමාගම විසින් එම ගනුදෙණුව මත ඇතිවූ විනිමය ලාභය වූ රු. 307,063,541 මුදල ආදායම ලෙස නොසලකා කටයුතු කරන ලෙසත් සම්පූර්ණ මුදල (විනිමය ලාභය

ඇතුළුව) අවසාන ගෙවීම ලෙස සලකන ලෙසත් සංස්ථාවෙන් ඉල්ලීමක් සිදුකරන ලදී. ඒ අනුව, පාර්ශව දෙක අතර ආයතන කොන්දේසිවලින් සමන්විත ණය ගිවිසුමක් නොතිබීම නිසා මෙවැනි ගැටළු ඇති වී තිබුණි.

තවද සංස්ථාව විසින් දල වශයෙන් පෙර හඳුනාගත් විනිමය ලාභය වූ රු.මිලියන 154 සමානව බෙදාගැනීමට එකඟවෙන ලදී. එසේ වුවත් මේ සම්බන්ධ ගැලපීම් මුල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබුණි.

(iii) දීගුකාලීන නිගහිටි ශේෂ තිබියදී වුවද ඛනිජ තෙල් නිෂ්පාදන පාරිභෝගිකයන් වෙත අඛණ්ඩව සැපයූ බවට නිරීක්ෂණය විය. උදා: ලංකා ගමනා ගමන මණ්ඩලය,යාපනය - මාර්ග සංවර්ධන අධිකාරිය,ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශයට ඛනිජ තෙල් නිෂ්පාදන කිරීම මගින් දිගුකාලීන නිගහිටි ශේෂ ලෙස පිළිවෙලින් රු.3,964,634 , රු.90,002,930 , සහ රු.6,243,570 තිබීම උදාහරණ ලෙස දැක්විය හැකිය.

(ඇ) කෙටිකාලීන ණය

සංස්ථාව විසින් ලබාගත් කෙටිකාලීන විදේශ ව්‍යවහාර මුදල් ණය සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(i) වයස් විශ්ලේෂනයට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයේදී වටිනාකම රු.මිලියන 76,488.442 (ඇ.එ.ජ.ඩො. මිලියන 504.062) ක්, එනම් මුලු කෙටිකාලීන විදේශ ව්‍යවහාර මුදල් ණය වලින් සියයට 39 ක් ලබා දී තිබූ ණය කාලසීමාව ඉක්මවා තිබුණි. එයින්, සියයට 52 ක් ආසන්න වශයෙන් වසරක කාලයකට වඩා වැඩි කාලයක් 2016 දෙසැම්බර් 31 දින වන විටත් නිහව පැවතුණි. 2015 ඔක්තෝබර් 01 සිට 2015 දෙසැම්බර් 31 දක්වා කාල පරාසය තුලදී එම කෙටිකාලීන විදේශ ව්‍යවහාර මුදල් ණය මහජන බැංකුවෙන් ලබාගෙන තිබුණි.

(ii) එකඟ වූ කාලසීමාව ඇතුලත එම ණය නොගෙවීම නිසා සංස්ථාවට ආසන්න වශයෙන් අමතර පිරිවැය රු. මිලියන 3,416 ක් පොලී ලෙස දැරීමට සිදුව තිබුණි. එම අමතර

පිරිවැය වූයේ, 2016 දෙසැම්බර් 31 දිනට ණය කාල සීමාව අවුරුද්දක් ඉක්මවා ඇති කෙටිකාලීන විදේශ ව්‍යවහාර මුදල් ණය සඳහා පමණි. කෙසේ වුවද ගණනය කිරීම, සම්පූර්ණ ප්‍රමාද වීමේ කාල සීමාවටම සිදු කලේ නම් එම ණය ප්‍රමාද වී පියවීමේ මුලු පිරිවැය තවදුරටත් වැඩිවනු ඇත. සමාලෝචිත වර්ෂය ආරම්භයේදී ඉහත සඳහන් කළ ණය පොලී අනුපාතයට වඩා අඩු ප්‍රතිලාභයක් උත්පාදනය කරන කෙටිකාලීන ආයෝජන රු. මිලියන 63,763 ක් තිබූ බව තවදුරටත් අනාවරණය විය.

මේ සම්බන්ධයෙන් සංස්ථාවේ කළමණාකරන අධ්‍යක්ෂකවරයාගේ ප්‍රකාශය පහත පරිදි වේ.

"ඔවුන් ලබාදුන් විදේශ ව්‍යවහාර මුදල් ණය පියවීම සඳහා ප්‍රමාණවත් ඇ.ඒ.ජ.ඩො. ප්‍රමාණයක් මිලදීගැනීමට බැංකුවට හැකියාවක් නොමැත".

ඒ අනුව, ණය ලබාගැනීම් මූලාශ්‍රයක් තෝරා ගැනීම සඳහා සුදුසු නිරවුල්කිරීමේ සැලැස්මක් පැවැතීම. විශේෂයෙන්ඉහළ පොලි වියදමේ බලපෑම අවම කිරීම හා විනිමය අනුපාතිකය අවප්‍රමාණ හේතුවෙන් ඇතිවන අලාභ ගැටලු සහගත වේ.

2.4 නීති ,රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති ,රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

නීති ,රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම
(අ) යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ පිළිබඳ 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය.	
(i) මාර්ගෝපදේශ 3.2	සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා අවම වශයෙන් බහිජ තෙල් කර්මාන්ත ක්ෂේත්‍රයේ සිටින එක් ප්‍රවීනතාවයක් හෝ ඇතුලත්ව නොතිබුණි.

(ii) මාර්ගෝපදේශ 7.4.4	ආයතනයේ මානව සම්පත් වල වෙනස්කම් පෙලට තබා ගැනීමට හැකිවීම, දේශීය හා විදේශීය සේවක ඵලදායිතාවය වැඩි දියුණු කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ කළමණාකරණ කමිටුවේ උපකමිටුවක් මඟින්, පුහුණු කමිටුවක් මඟින් පුහුණු අවශ්‍යතා ඇගයීමට ලක් කිරීම තවද. එම කමිටු දේශීය හා විදේශීය පුහුණු සඳහා පුද්ගලයින් තෝරා ගැනීමට ක්‍රියාපටිපාටියක් සකස් කල යුතුය. කෙසේවෙතත් එවැනි යාන්ත්‍රනයක් ක්‍රියාත්මක වී නොතිබුණි.
(iii) මාර්ගෝපදේශ 9.14	සංස්ථාවේ A ශ්‍රේණිවල නිලධාරීන්ට හැර බඳවාගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් (MSD) අනුමත කර නොතිබුණි.
(iv) මාර්ගෝපදේශ 9.3.1	ඉහල කළමණාකරන මට්ටමේ පුරප්පාඩු පිරවීමේදී අවදානම අවම කිරීමට විධිමත් අනුප්‍රාප්තික සැලැස්මක් සංස්ථාව නඩත්තු කර නොතිබුණි.
(v) මාර්ගෝපදේශ 9.5.1	පුහුණු සඳහා අයවැය සහ ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම පුහුණු කමිටුවක උපදෙස් පරිදි සකස් කල යුතුය. කෙසේ වෙතත් අදාල විටත් සංස්ථාව විසින් එවැනි පුහුණු අයවැයක් සකස් කර නොතිබුණි.
(vi) මාර්ගෝපදේශ 9.5.4	භාණ්ඩාගාර ලේකම්ගේ විශේෂ අනුමැතියකින් තොරව වාණිජ සංස්ථාවක් විසින් අභ්‍යන්තරින් උත්පාදනය කළ අරමුදල් සහ රජයේ ප්‍රතිපාදන විදේශ පුහුණු සඳහා යොදා නොගත යුතුය. කෙසේ වෙතත් සංස්ථාව විසින් එසේ විශේෂ අනුමැතියක් මෙම මාර්ගෝපදේශයට අනුව ලබා ගෙන නොතිබුණි.
(ආ) 1997 ඔක්තෝබර් 24 දිනැති අංක 124 දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛය	පුරප්පාඩු වූ තනතුරක රාජකාරි ආවරණය කිරීම මාස 03 ක කාල සීමාවකට සීමා විය යුතුය. කෙසේ වුවද, කළමණාකරු (විමර්ෂණ), අලෙවි කළමණාකරු (සිල්ලර) , කළමනාකරණ සහකාර ප්‍රාදේශීය කළමනාකරු (මධ්‍යම) වැනි A ශ්‍රේණියේ තනතුරු 08 ක් ඇතුළුව පුරප්පාඩු තනතුරු සඳහා නිලධාරීන් 14 ක් 2016 දෙසැම්බර් 31 වන දිනට මාස 07 සිට වසර 3 ක් දක්වා කාලපරිච්ඡේදයක් සඳහා රාජකාරි ආවරණය කර තිබුණි.

(ඇ) 2016 අප්‍රේල් 29 දිනැති අංක පීඊඩී 03/2016 සහ 2013 නොවැම්බර් 04 දිනැති අංක එෆ්පී/06/35/02/01 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය.	සමාලෝචිත වර්ෂය සඳහා සේවකයින්ගේ වැටුප් වෙනුවෙන් සංස්ථාව විසින් රු. 152,690,099 ක උපයන විට ගෙවීම් බදු ඔවුන්ගේ වැටුපෙන් අඩු නොකොට එහි වියදමක් වශයෙන් දරා තිබුණි.
(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය. මු.රෙ. 396	තෑරාගත් නියැදියට අනුව , අගය රු.මිලියන 3,652.74ක් වූ චෙක්පත් 1,619ක් නිකුත් කල නමුත් බැංකුවට 2016 දෙසැම්බර් 31 වන විටත් දිගුකාලයක සිට බැංකුව ඉදිරිපත්කර නොනිබුණි.කෙසේවෙතත්,2017 ජූලි 27 වන විටත් එම චෙක්පත් සම්බන්ධයෙන් කිසිදු ප්‍රත්‍යයක්ෂ ක්‍රියාමාර්ගයක් ගෙන නොනිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, පසුගිය වර්ෂයේ බදු පෙර ශුද්ධ අලාභය වූ රු.මිලියන 19,885.780 ට එරෙහිව සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මෙහෙයුම් කටයුතු මගින් රු.මිලියන 69,553.681 ක බදු පෙර ශුද්ධ ලාභයක් ලබා තිබූ අතර ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 89,439.461 ක වර්ධනයක් සිදු වී තිබුණි. ජාත්‍යන්තර වෙළඳපොළේ බනිජ තෙල් මිල ගණන්වල ස්ථාවර වීම නිසා ආනයන පිරිවැය ස්ථාවර වීම , දේශීය වෙළඳපොළේ බනිජ තෙල් ඉල්ලුම ඉහල යාම නිසා ඇතිවූ විකුණුම් වර්ධනය , 2016 වර්ෂයේ ඇ.එ.ජ.ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය හීන වීමේ ප්‍රවනතාවය අඩුවීම හා ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය වියදම්වල අඩු වීම වැනි කරුණු මෙම ලාභයට හේතු වී තිබුණි. රු.මිලියන 69,553.681 ක බදු පෙර ලාභයට අමතරව සමාලෝචිත වර්ෂය තුලදී සංස්ථාව රු.මිලියන153,184 ක දායකත්වයක් රටට ලබා දී තිබූ අතර පෙර වර්ෂයේ එය රු.මිලියන 100,175 ක් විය.
මෙම වර්ධනය සාරාංශ ගතකර පහත දැක්වේ.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

3.2.1 ලාභදායීත්වය

සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මෙහෙයුම්වලින් සියයට 29.6 ක ආන්තිකයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේදී සියයට 11.75 ක් වූ ආන්තිකය සමඟ සැසඳීමේදී සියයට 17.85 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. එසේම, සමාලෝචිත වර්ෂයේදී දළ ලාභය ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දළ ලාභය වූ රු. මිලියන 39,616 හා සැසඳීමේදී රු. මිලියන 57,004 කින් හෙවත් සියයට 144 කින් වැඩි වී තිබුණි. මෙම වර්ධනය සාරාංශ ගත කර පහත දැක්වේ.


විස්තරය	දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා		වෙනස වාසිදායක/ (අවාසිදායක)	
	2016	2015 නැවත සකසන ලද		
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන	ප්‍රතිශතය
ආදායම	423,061	376,734	46,327	12
විකුණුම් පිරිවැය	(326,441)	(337,118)	10,677	3
දළ ලාභය	**96,620**	**39,616**	57,004	144
අනෙකුත් ආදායම්	3,589	4,234	(645)	(15)
විකිණීමේ හා බෙදා හැරීමේ වියදම්	(14,412)	(13,401)	(1,011)	(7.5)
පරිපාලන වියදම්	(4,384)	(3,592)	(792)	(22)
මෙහෙයුම් ලාභය	**81,413**	**26,857**	54,556	203
විනිමය අනුපාත වෙනස්වීම්	(8,829)	(32,841)	24,012	73
මූල්‍ය වියදම්	(11,404)	(15,049)	3,645	24
මූල්‍ය ආදායම්	8,374	5,011	3,363	67
සුරැකුම් වියදම්	-	(3,864)	3,864	100
ආදායම් බදු පෙර ලාභය/(පාඩුව)	**69,554**	**(19,886)**	**89,440**	**450**

3.2.2 ශුද්ධ ලාභය/(අලාභය)ට එරෙහිව ශුද්ධ වත්කම්

2016 වර්ෂය සහ ඉකුත් වර්ෂ පහ සඳහා සංස්ථාවේ ශුද්ධ ලාභය/(පාඩුව) හා ශුද්ධ වත්කම් තත්ත්වය පහත සඳහන් වගුවෙහි හා රූප සටහනෙහි දැක්වේ.

වර්ෂය	ශුද්ධ ලාභය/(අලාභය)	වර්ෂය අවසානයට ශුද්ධ වත්කම් තත්ත්වය
	රු. මිලියන	රු. මිලියන
2011	(94,357)	(131,236)
2012	(97,181)	(228,545)
2013	(7,889)	(236,467)
2014*	1,129	(232,257)
2015*	(20,681)	(228,985)
2016	53,027	(185,847)

*නැවත සකසන ලද



3.2.3 වැදගත් ගිණුම්කරණ අනුපාත

ලැබී ඇති තොරතුරු අනුව, සංස්ථාවේ සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත දැක්වේ.

අනුපාත	2016	2015 නැවත සකසන ලද
ලාභදායීත්ව අනුපාත		
දළ ලාභ අනුපාතය (%)	22.84	10.52
මෙහෙයුම් ලාභ අනුපාතය (%)	19.24	7.13
ශුද්ධ ලාභ/(අලාභ) අනුපාතය (%)	12.53	(5.45)
ද්‍රවශීලතා අනුපාත		
ජංගම වත්කම් අනුපාතය (වාර ගණන)	0.34:1	0.31:1
ක්ෂණික වත්කම් අනුපාතය (වාර ගණන)	0.24:1	0.21:1
කාරක ප්‍රාග්ධනය (රු. මිලියන)	(249,297)	(295,098)
ආයෝජන අනුපාත		
වත්කම් මත ප්‍රතිලාභ (%)	27.82	(10.4)

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දළ ලාභ අනුපාතිකය සහ ශුද්ධ ලාභය අනුපාතය පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ පිළිවෙළින් සියයට 12.33 හා සියයට 17.98 ක ප්‍රතිශතයකින් වර්ධනය වී තිබුණි.

(ආ) 2016 වර්ෂයේ දී ඛනිජ තෙල් සංස්ථාවේ සෘණ කාරක ප්‍රාග්ධන තත්ත්වය පසුගිය වසරට සාපේක්ෂව සියයට 6 කින් වර්ධනය වී තිබුණි. මෙම ධනාත්මක තත්ත්වයට හේතු වූ ප්‍රධාන සාධක වූයේ වෙළඳ හා වෙනත් ලැබීම්,කෙටිකාලීන ආයෝජන වර්ධනය වීම සහ ණය ගැනීම් අඩු වීමයි.

4 මෙහෙයුම් සමාලෝචනය

4. 1 කාර්යසාධනය

(අ) සංස්ථාවේ ඇනිවී තිබුණු මූල්‍ය දුෂ්කරතාවලට මුහුණ දීම සඳහා 2014 සැප්තැම්බර් දක්වා ඛනිජ තෙල් නිෂ්පාදනවල දේශීය සිල්ලර මිල ගණන් අඛණ්ඩව ඉහළට සංශෝධනය කර තිබුණි. එසේම ජාත්‍යන්තර ඉන්ධන මිල අඩු වීමට සාපේක්ෂව 2014 වර්ෂය තුලදී දෙවරක් හා 2015 වර්ෂය තුලදී එක් වරක් මිල ගණන් අඩු කර තිබුණි. එසේ වුවද, ජාත්‍යන්තර වෙළඳ පොලේ සත්‍ය මිල අඩු වීම ඉහත මිල වෙනස් වීම් තුලින් සම්පූර්ණයෙන් පෙන්නුම් නොකෙරුණි. තවද පහත දැක්වෙන ඛණිජ තෙල් නිෂ්පාදනයන්ගෙන් සමාලෝචිත වර්ෂයේදී හා පසුගිය වසර 04 ක කාල සීමාව තුල සංස්ථාව අඛණ්ඩව පාඩු ලබා තිබුණි.

අංශය	වර්ෂය සඳහා ශුද්ධ අලාභය				
	2016	2015	2014	2013	2012
	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන
විදුලිබල උත්පාදන					
දැව් තෙල් 1500	-	252	299	1,240	34,959
කර්මාන්ත හා දේශීය					
දැව් තෙල් 1500	-	262	69	350	2,003
දේශීය භූමිතෙල්	2,982	3,860	2,715	2,449	3,525
අපනයන					
නැප්තා	1,580	827	1,799	-	-
දැව් තෙල්	727	5,346	1,627	-	-
නැව් තෙල්					
දැව් තෙල්	68	-	-	-	-

තවදුරටත් සංස්ථාව රු. මිලියන 8,251 ක් හා රු. මිලියන 1,291 ක අලාභ පිළිවෙලින් පෙට්‍රල් 92 ඔක්ටේන් හා පෙට්‍රල් 95 ඔක්ටේන් සඳහා දරා තිබුණි.

2016 වසර සඳහා ඛනිජතෙල් නිෂ්පාදන මත ලාභදායිත්වය (ලීටරයකට)

නිෂ්පාදනය	විකුණුම් මිල ලීටරයකට	ගනුදෙනුකරුගේ කොමිස් මුදල හැර විකුණුම් ආදායම ලීටරයකට	විකුණුම් පිරිවැය ලීටරයකට	දල ලාභය ලීටරයකට	පිරිවැයෙහි අන්තර්ගත සම්පූර්ණ බදු වටිනාකම ලීටරයකට	මුළු පිරිවැය ලීටරයකට	ශුද්ධ *ලාභය/* (අලාභය) ලීටරයකට	සමස්ථ ශුද්ධ ලාභය/ (අලාභය) වසරට
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු. මිලියන
පෙට්‍රල් 95	128.00	124.15	95.29	28.86	67.87	133.06	**(8.91)**	(1,291)
පෙට්‍රල් 92	117.00	113.49	84.29	29.20	57.89	120.84	**(7.35)**	(8,251)
ඔටෝ ඩීසල්	95.00	92.83	60.37	32.46	17.22	76.02	**16.81**	31,128
සුපර් ඩීසල්	110.00	107.20	66.46	40.74	24.93	83.62	**23.58**	1,761
භූමිතෙල්	49.00	47.77	56.38	(8.61)	-	65.59	**(17.82)**	(2,982)*

* භූමිතෙල් සහනාධාරය වශයෙන් රු.මිලියන 2,982ක් වූ භූමිතෙල් අලාභය භාණ්ඩාගාරයෙන් ලැබියයුතු සහනාධාරයක් ලෙස මුල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර තිබුණි.

(ආ) ද්‍රව ගෑස් විකිණීම සම්බන්ධයෙන් පුද්ගලික ගෑස් සමාගමක් සහ සංස්ථාව අතර ගිවිසුමක් අත්සන් කරන ලද අතර 2006 ඔක්තෝබර් 20 දින කල් ඉකුත් වී තිබිණි. පසුගිය විගණන වාර්තා වල සඳහන් පරිදි ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් එම සමාගමට ද්‍රව ගෑස් වායුව සපයා තිබුනේ නව ගිවිසුමක් අත්සන් කිරීම හෝ කලින් එකඟතාව අලුත් කිරීමකින් තොරවය. ඊට අමතරව, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සමඟ ගිවිසුමකට නොඑළඹ වෙනත් පුද්ගලික සමාගමකට ද්‍රව ගෑස් වායුව සපයා තිබුණි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය(ERP)

(i) ලංකා ඛනිජතෙල් ගබඩා පර්යන්ත සමාගම (CPSTL) විසින් භදුන්වා දෙන ලද ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය (ERP) පිළිබඳව අදාළ පාර්ශවයන්ගේ වගකීම් සම්බන්ධයෙන් සංස්ථාව, ලංකා ඛනිජතෙල් ගබඩා පර්යන්ත සමාගම සහ ලංකා ඉන්දියන් තෙල් සමාගම අතර ගිවිසුමක් හෝ අවබෝධතා ගිවිසුමක් නොතිබූ බව නිරීක්ෂණය විය. එසේම, මෙම පද්ධතිය විශේෂයෙන් ඉන්ධන තොග සමාලෝචනය කිරීමේ කටයුතු සඳහා ප්‍රමාණවත් ලෙස උපයෝජනය කර නොතිබුණි.

(ආ) මාසික උපයෝගිතා ගාස්තු (MUF) අය කර ගැනීම

2013 ඔක්තෝබර් 29 දින නිකුත් කරන ලද අංක 38/1140 දරණ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව, 2014 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සංස්ථාව සතු බෙදාහරින්නන්ගේ (CODO) ඉන්ධන පිරවුම්හල් හා භාණ්ඩාගාරය සතු (TODO) බෙදාහරින්නන්ගේ ඉන්ධන පිරවුම්හල් වලින් මාසික උපයෝගිතා ගාස්තු අයකර ගැනීම සඳහා අනුමැතිය ලබා දී තිබුණි. කෙසේ වෙතත් වහාම ක්‍රියාත්මක වන පරිදි මාසික වෘත්තීමය ගාස්තු (MOR) ගෙවන බෙදා හරින්නන්ගෙන් ද මාසික උපයෝගිතා ගාස්තු (MUC) අය කල යුතුය. එම නිසා පසුගිය වර්ෂය තුල (මාස 12ක කාල සීමාව තුල) උපයන ලද සාමාන්‍ය මාසික කොමිස් මුදලෙන් මාසික සියයට 35ක ප්‍රතිශතයක් MUF ලෙස ගණනය කල යුතුය. තවදුරටත් කුඩා පරිමාණ බෙදාහරින්නන්ගේ පැවැත්ම උදෙසා පහත ආකාරයට අඩු කිරීම් ප්‍රදානය කර තිබුණි.

මාසික කොමිස් වර්ගය	අඩු කිරීම් ප්‍රතිශතය
රු.500,000ට අඩු	70
රු.500,001 – රු.1000,000	50
රු.1,000,001 – රු.1,500,000	25
රු.1,500,001ට වැඩි	0

මාස 13කට වැඩි සැලකිය යුතු ප්‍රමාදයකින් පසුව අලෙවි කළමණාකාර (සිල්ලර) විසින් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 2014 දෙසැම්බර් 11 දින අංක 16/1154 හරහා අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුවත් කර තිබුණි. *"2014 ජනවාරි 01 දින සිට මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම පිළියෙල කිරීමේ ප්‍රමාදයක් නිසා ප්‍රායෝගික නොවේ. CODO ගිවිසුම් අවසන් කිරීමේ කටයුතු සම්පූර්ණ කරමින් පවත්නා අතර එම කටයුතු අවසන් වූ වහාම CODO/TODO යන දෙවර්ගයේ ම බෙදාහරින්නන් සඳහා මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අලෙවිකරන අංශය අපේක්ෂා කරයි."*

කෙසේ වෙතත් ,අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2016 පෙබරවාරි 16 දින අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකා අංක 11/1179 මගින් අදාල ගිවිසුම් සඳහා අවශ්‍ය ගැලපුම් සිදුකිරීමට අනුමැතිය ලබා දී ඇති අතර ඉහත සඳහන් කළ ප්‍රභේදයන් දෙවර්ගයටම අදාල බෙදාහරින්නන්ගෙන් (2016 වර්ෂය සඳහා මාසික උපයෝගීතා ගාස්තු අයකර ඇත්තේ 2016 බෙදාහරින්නන් 248 දෙනෙකු අතරින් 11 දෙනෙකුගෙන් පමණි.) 2017 ඔක්තෝබර් 31 තෙක්ම මාසික උපයෝගීතා ගාස්තු අයකිරීමට පියවර ගෙන නොතිබුණි. මෙම අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුකූල නොවීම හේතුවෙන් 2014 වර්ෂයේ සිට සංස්ථාව වසරකට රු. මිලියන 300 ට වැඩි පාඩුවක් දැරීමට සිදු වී තිබුණි.

(ඇ) **වෛද්‍යාධාර යෝජනාක්‍රමය**

විගණනයට සපයන ලද තොරතුරු වලට අනුව, සීමාසහිත ලංකා ඛනිජතෙල් සේවක සකසුරුවම් සමිතිය (CPCTSL) 1981 දෙසැම්බර් 31 දින සමිති ආඥා පනතේ 123 (3) (අ) වගන්තිය යටතේ ලියාපදිංචි කර තිබූ අතර එය ලාභ නොලබන සංවිධාන සඳහා වූ නිර්දේශිත පොදු පරිවය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රකාශයේ නිර්වචනයට අනුව ලාභ නොලබන ආයතනයක් (රාජ්‍ය නොවන සංවිධාන) ලෙස ක්‍රියාත්මක වෙමින් පවති. ලංකා ඛනිජ තෙල් සංස්ථාව සහ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම යන ආයතන දෙකේම සියලුම ස්ථිර සේවකයින් සකසුරුවම් සමිතියේ සාමාජිකයන් වේ. සකසුරුවම් සමිතියේ මූලික අරමුණු වන්නේ විශ්‍රාම ප්‍රතිලාභ සැපයීම,සාමාජිකයින්ගේ මරණය සිදුවන අවස්ථාවලද ඥාතීන්ට මූල්‍ය ආධාර ලබා දීම, සුදුසුකම් සහිත පවුලේ සාමාජිකයින් මිය යාමකදී සාමාජිකයන්ට මූල්‍ය ආධාර ලබාදීම, වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ මූල්‍ය ආධාර ලබාදීම සහ ණය පහසුකම් සාමාජිකයින්ට ලබාදීම වේ.

සකසුරුවම් සමිතිය විසින් එහි සාමාජිකයින් ලෙස සංස්ථාවේ හා තොග ගබඩා පර්යන්ත සමාගමේ සේවකයින් පහත ප්‍රධාන ප්‍රතිලාභ ලබා දෙනු ඇත.

(i) විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම (සෑම සම්පූර්ණ කරන ලද සේවා වර්ෂයක් සඳහාම අර්ධ මාසික වේතනයක්)

(ii) සංස්ථාව හා තොග ගබඩා පර්යන්ත සමාගම වෙනුවෙන් වෛද්‍යාධාර යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

සකසුරුවම් සමිතියේ ශුද්ධ ඌණතාවයකට දායක වූ 2015 වර්ෂය අවසානයේ දී පැවැති රු.1,473,714,266 ක් වූ සෘණාත්මක සමුච්චිත සංචිත හේතුවෙන් වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය අඛණ්ඩව ක්‍රියාත්මකවීමට නොහැකි බව 2016 පෙබරවාරි 23 දින පැවැති රැස්වීම් වාර්තාවේ සඳහන් විය. අනතුරුව, 2016 අගෝස්තු 11 දිනැති අංක 08/1186 දරණ අධ්‍යක්ෂක මණ්ඩල තීරණය අනුව, වෛද්‍යාධාර යෝජනා ක්‍රමය කළමණාකරනය කිරීම සංස්ථාව විසින් 2016 ජූලි 01 සිට අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සහ මූලික හිමිකම් ලබාදීම සඳහා වැය වන පිරිවැය මාස 06ක කාලයක් හෝ සුදුසු වෛද්‍ය රක්ෂණ සපයන්නෙකු තෝරා ගන්නා තෙක් සංස්ථාව විසින් දරා ගැනීමට අනුමැතිය ලබා දී තිබුණි.

වෛද්‍යාධාර යෝජනා ක්‍රමය සම්බන්ධ පහත දැක්වෙන නිරීක්ෂණයන් සිදු කරන ලදි.

(i) සකසුරුවම් සමිතිය පිළිබඳව 2017 ජූලි 19 දින කැඳ වූ තොරතුරු සම්බන්ධයෙන් සිහි කැඳවීම් දෙකක් නිකුත් කර තිබුණද විගණනය සඳහා ඉල්ලුම් කළ තොරතුරු සංස්ථාව ලබා දී නොතිබුණි. සකසුරුවම් සමිතිය සමඟ ඇති ගණුදෙනු හා ඉල්ලුම් කළ තොරතුරු ලබා නොදීමේ හේතුවෙන් විගණනයේ දී සැක සහිත තොරතුරු ලබා නොදීමේ හේතූන් විගණනයේ දී සැක සහිත විය.

(ii) 2016 අගෝස්තු 11 දින අංක 08/1186 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව, වෛද්‍යාධාර ක්‍රමය කළමණාකරනය කිරීම සංස්ථාව විසින් 2016 ජූලි 01 සිට අඛණ්ඩව ක්‍රියා කිරීමට තිබියදීත්, වෛද්‍යාධාර යෝජනා ක්‍රමය කළමණාකරනය කිරීමට කිසිදු ප්‍රතිපත්තියක් හෝ ක්‍රියාපටිපාටියක් මේ දක්වා විගණනයේ දී අනාවරණය නොවීය. තවදුරටත් එම මණ්ඩල තීරණයට පටහැනිව 2016 ජූලි 01 දිනෙන් පසුව කාලච්ඡේදය සඳහා සම්බන්ධ අගය රු.41,237,505 ක වෛද්‍ය බිල්පත් සකසුරුවම් සමිතිය විසින් සංස්ථාවෙන් ප්‍රතිපූර්ණය කර ගෙන තිබුණි.

(ඈ) තෙල් ප්‍රවාහන නල මාර්ග ජාලය

කොළඹ වරාය සිට කොළොන්නාව බණිජතෙල් ගබඩා පර්යන්තය දක්වා පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් සහ දැවිතෙල් වැනි බණිජ තෙල් නිමි නිෂ්පාදිත ප්‍රවාහනය කිරීමට දශක කිහිපයකට පෙර ස්ථාපනය කළ නල මාර්ග අළුත්වැඩියා කළයුතු තත්ත්වයේ පවතින අතර ඉන් නල මාර්ග කිහිපයක් අළුත්වැඩියා කිරීමට නොහැකි තත්ත්වයට දිරාපත්වීම හේතුවෙන් දැනටමත් අත්හැර දමා තිබුණි. බනිජ තෙල් නිෂ්පාදනවල ජාතික අවශ්‍යතාවයෙන් විශාල ප්‍රමාණයක් මෙම දිරාපත් වූ නල මාර්ග තුලින් කොලොන්නාව ඉන්ධන ගබඩා පර්යන්තයට ගෙන යන බැවින් මෙම නල මාර්ග අළුත්වැඩියා කිරීම හා නවීකරණය කිරීම වහා කළ යුතු අවශ්‍යතාවයක් වී ඇත. එම අබලන් වූ නල මාර්ග තුලින් ආනයනික පිරිපහදු කළ බනිජ තෙල් නිෂ්පාදන ප්‍රවාහනය කිරීම නිසා උග්‍ර ඉන්ධන අර්බුදයක් සමඟ මුළු රටම අකර්මණ්‍ය වීමේ අවදානම විගණනයේදී බැහැර කළ නොහැක.

මේ සම්බන්ධව සංස්ථාවේ සභාපතිවරයා පහත පරිදි අදහස් දක්වා තිබුණි.

"පිළිවෙලින් විෂ්කම්භය අඟල් 18 හා අඟල් 14 සහිත මාරුකිරීමේ නල 02 ක් ඉදිකිරීමට ටෙන්ඩර් කැඳවීමට පියවර ගෙන ඇත.මෙම නල ඩොල්ෆින් ටැංකර් බර්ත්(DTB) සිට ආරම්භ කර (නව ලෝඩින් ආර්ම් දෙකක් සහිත) ලංකා බණිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ (CPSTL) කොලොන්නාව තෙල් ස්ථාපිතයෙන් අවසන් වේ. මීට අමතරව, මේ වන විට අලුත්වැඩියා කරමින් පවතින අඟල් 12 නලයද, Horizontal Drillings අවශ්‍යකරන කොටස් සිදුකර සම්පූර්ණ කරයි."

මුතුරාජවෙල පර්යන්තයේ සිට කි.මී. 7.2ක් හා මුහුදු වෙරළේ සිට කි.මී. 6ක් පමණ දුරින් මුහුද මැද පිහිටුවා ඇති සිංගල් පොයින්ට් බෝයි මූරින් පහසුකම මාර්ගයෙන් මුතුරාජවෙල ස්ථාපිතයට සැපයීම් සිදු කෙරෙන අතර, මුහුදු රළ තත්ත්වය ඉතා දැඩිවන අවස්ථාවලදී හෝ අදාල පහසුකම පිළිබඳ නඩත්තු කටයුතු සිදුවන අවස්ථාවලදී වෙනත් විකල්ප සැපයුම් මාර්ගයක් නොවීය. නිෂ්පාදිත අන්තර් පර්යන්ත මාරු කිරීම සඳහා මුතුරාජවෙල පර්යන්තය හා කොළොන්නාව ස්ථාපිතය අතර සම්බන්ධකමක් නොවීම හේතුවෙන් එම පර්යන්ත දෙකෙහිම ප්‍රශස්ථ උපයෝජනයට බාධා මතුවී තිබුණි.

"රට හරහා නල මාර්ග ව්‍යාපෘතිය" ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2012 සැප්තැම්බර් 13 දින ලබා දී තිබුණද, එම ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. කොළඹ වරායේ සිට කොලොන්නාව පර්යන්තය දක්වා දිවෙන රට හරහා නල මාර්ග ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය පහත දැක්වේ.

නලයේ ප්‍රමාණය (අඟල්)	නිෂ්පාදනය	වත්මන් තත්ත්වය
10	ඩීසල්	ක්‍රියාත්මක තත්ත්වයේ පවතී.
10	අනෙකුත් පිරිපහදු කළ ඉන්ධන (Other White Oil)	අක්‍රීයව පවතී
10	නැප්තා	අක්‍රීයව පවතී
12	නැප්තා	අක්‍රීයව පවතී. CPSTL ආයතනය විසින් ප්‍රතිස්ථාපනය කරමින් පවතී.
14	දැවිතෙල්	ක්‍රියාත්මක තත්ත්වයේ පවතී.

සංස්ථාවේ වාර්තාවන්ට අනුව නල පද්ධතියෙහි ඇති කාන්දුවීම් (PLT) හේතුවෙන් සහ පමාකුලී අයකිරීම් නිසා සලකා බලන වර්ෂයේදී සංස්ථාවට දැරීමට සිදු වී තිබූ මුළු පිරිවැය රු. 1,096,304,695 ක් වූ අතර මේ තුල අන්තර්ගත නල පද්ධතියෙහි ඇති කාන්දුවීම් නිසා හටගත් අලාභය වන රු.173,504,644 දැරීමට සිදු වී තිබුණේ ප්‍රධාන වශයෙන්ම නල පද්ධතියෙහි ඇති ගැටලු සහගත තත්වයන් හේතුවෙනි. මාගේ පසුගිය විගණන වාර්තාවලින්ද මෙම අඩුපාඩු පිළිබඳව කිහිපවරක්ම පෙන්වා දුන්නත් සංස්ථා කළමනාකාරිත්වය විසින් නල පද්ධතිවල ගැටලු සහගත තත්ත්වයන්ගෙන් ඇතිවන අලාභ අවම කර ගැනීමට සාධනීය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) ත්‍රිකුණාමලයේ තෙල් ගබඩා ටැංකි සංකීර්ණය

සණ මීටර 12,500(මෙට්‍රික් ටොන් 10,000) ධාරිතාවයෙන් යුත් තෙල් ටැංකි 100කින් සහ වෙනත් පහසුකම්ද ඇතුලත්ව 1930 දී මෙය ඉදිකර තිබුණි. වපසරියෙන් හෙක්ටයාර් 358.553ක් වන අතර තෙල් ටැංකි සංකීර්ණය ශ්‍රී ලංකා රජය විසින් බ්‍රිතාන්‍යය රජයේ නාවික කොමසාරිස්වරුන්ට වසර 999ක බද්දකට නිදහසට පෙර ලබා දී තිබුණි.1961 දී ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම මත ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ස්ටර්ලින් පවුම් 250,000ක් වාරික තුනකින් ගෙවීමෙන් අනතුරුව ඉඩම, ටැංකි සංකිර්ණය,ගොඩනැගිලි සහ අනෙකුත් පහසුකම් පිළිබඳ හිමිකම 1964 අප්‍රේල් 01 දින සිට පවරා ගන්නා ලදී. නමුත් ඉහත ඉඩම සඳහා නීතීමය ලියවිල්ලක් රජයෙන් ලබා ගෙන නොතිබුණි.

2003 දී ශ්‍රී ලංකා රජය ලංකා ඉන්දියන් තෙල් සමාගම සහ සංස්ථාව සමඟ ගිවිසුමට එළඹ තිබූ අතර, ගබඩා පහසුකම් සහ ඉඩම වර්ෂ 35 ක කාල පරිච්ඡේදයකට ලංකා ඉන්දියන් තෙල් සමාගමට බදු දීමට සංස්ථාව එකඟ වී තිබුණු අතර එම ගිවිසුමට එළඹී දින සිට මාස 06ක් ඇතුළත කල්බදු ගිවිසුම ක්‍රියාත්මක කළ යුතුව තිබුණි. කෙසේ වුවද, සංස්ථාව මෙතෙක් කිසිදු කල්බදු ගිවිසුමකට එළඹ නොතිබුණි.

1942 වර්ෂයේදී යුද්ධය හේතුවෙන් එක් තෙල් ටැංකියක් සම්පූර්ණයෙන් විනාශ වී තිබුණි. දැනට පවතින 99 ක් වූ මුළුතෙල් ගබඩා ටැංකි අතුරින් ටැංකි 14 ක් ලංකා ඉන්දියන් තෙල් සමාගම විසින් භාවිතා කරනු ලබන අතර ඉතිරි ටැංකි 85 අතහැර දමා තිබුණි. 2015 මාර්තු මාසයේදී ඉන්දීය අග්‍රාමාත්‍යවරයාගේ ශ්‍රී ලංකා සංචාරය අතරතුර ලංකා ඉන්දියන් තෙල් සමාගම හා ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව එකතු වී වින වරායේ ඇති ටැංකි සංවර්ධනය කිරීමට එකඟ වී තිබුණි. සංස්ථාව සහ ලංකා ඉන්දියන් තෙල් සමාගම සමඟ එකාබද්ධව තෙල් ටැංකි මෙහෙයවීමට 2016 ජූලි 13 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබූ අතර 2016 ජූලි 13 දින පැවැති ආර්ථික කලමණාකරණ අමාත්‍ය මණ්ඩලය(CCEM),හවුල් ව්‍යාපාරයක් ලෙස සංවර්ධනය කිරීමට අදාල උපදේශකයකු පත්කර ගැනීමට අනුමැතිය ලබා දී තිබුණි.
සංස්ථාවේ සභාපති මේ සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි ප්‍රකාශ කරන ලදී.

"කොළොන්නාවේ ස්ථාපිත ගබඩාවල පවතින සීමාවන්ට විසඳුමක් ලෙස ත්‍රිකුණාමලය තෙල් ටැංකි යොදාගන්නේ කෙසේද යන්න පිළිබඳව මෙම ගැටළුව සාකච්ඡා කර ඇත. කෙසේ වෙතත්, ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ඇති ද්විපාර්ශ්වික ගිවිසුමට අනුව මෙම ටැංකිවල හිමිකම තීරණය කිරීමට ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත දැනුම් දී තිබේ. ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ටැංකි 16 ක් නවීකරණය කිරීමට හා ත්‍රිකුණාමලය සිට ආසන්න ප්‍රදේශවලට ඉන්ධන සැපයීම සඳහා සැලසුම් කර ඇති අතර රටේ ඉන්ධන හිඟය අවම කිරීම සහ බෙදා හැරීමේ පිරිවැය අඩු කිරීම සඳහා සෘජු ලෙස දායක වනු ඇත. එකවර ටැංකි කීපයක් හිමිකර ගැනීමට සහ ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දුනහොත්, මාස කිහිපයක් ඇතුළත නල මාර්ගයේ ඉදිකිරීම් හා අදාළ නවීකරණයන් ආරම්භ කිරීමට සංස්ථාව සූදානම්ව සිටී. "

(ඉ) ඛනිජ තෙල් සංස්ථාව හා ලංකා ඛණිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම අතර සේවා ගිවිසුම

ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම (CPSTL) සහ සංස්ථාව අතර සේවා ගිවිසුමක් ලබාගත නොහැකි වූ අතර එමනිසා, එකිනෙක ආයතන මඟින් සපයන සේවාවන් පැහැදිලිව අර්ථකථනය කර නොතිබුණි. එසේම, ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම විසින් ඛනිජ තෙල් නිෂ්පාදන නියමිත ගුණත්වයෙන් හා ප්‍රමාණයෙන් සපයන බවට තහවුරු කර ගැනීම සඳහා සංස්ථාව විසින් කාර්යසාධන දර්ශක ඇතුළුව අධීක්ෂණ ප්‍රතිපත්ති හා ක්‍රියා පිළිවෙත් සුදුසු ලෙස සැලසුම් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඊ) තොග සමාලෝචන කමිටුව

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම (CPSTL) ජේසීටී(JCT) ඔයිල් බැංකුව හා ලංකා ඉන්දියානු ඔයිල් සමාගම් හා ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාජිකයන් සහ රේඛීය අමාත්‍යාංශයේ නිලධාරියෙකුගෙන් තොග සමාලෝචන කමිටුව සමන්විත වූ අතර, එහි රැස්වීම් සෑම සතියකම පවත්වා තිබුණි. කෙසේ වෙතත් තොග මට්ටම් එනම්, යළි ඇණවුම් මට්ටම, උපරිම මට්ටම, අවම මට්ටම, යළි ඇණවුම් ප්‍රමාණය ආදිය සම්බන්ධයෙන් වාර්තා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් පවත්වා නොතිබුණි. ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම ඉදිරිපත් කරන ලද තොග පවත්වා ගැනීමේ වාර්තාව පදනම් කරගෙන පමණක් ඛනිජ තෙල් නිෂ්පාදිත ඇණවුම් කළ යුතු ප්‍රමාණය තීරණය කර තිබුණි. ඛනිජ තෙල් නිෂ්පාදිත තොග පවත්වා ගැනීම සම්බන්ධයෙන් වෙනත් කිසිදු වාර්තාවක් සමාලෝචන කාර්යයන් සඳහා ඉහත කමිටුවට ඉදිරිපත් කර නොතිබුණි. කෙසේවුවද 2010 වර්ෂයේ සිට හඳුන්වාදුන් පරිගණක ගිණුම්කරණ පද්ධතිය යටතේ නිෂ්පාදනය කිරීමට අදාල අවශ්‍ය තොග සම්බන්ධ වාර්තාවන්ට අදාල අතිරේක දත්ත ලබා ගැනිමට සංස්ථාවට නොහැකි වී තිබුණි.

(උ) මුතුරාජවෙල පර්යන්තය උපයෝජනය කිරීම

පෙර විගණන වාර්තාවල අඛණ්ඩව වාර්තා කර තිබුණද ඛනිජ තෙල් නිෂ්පාදිත නිකුත් කිරීමේදී මුතුරාජවෙල පර්යන්තය ප්‍රශස්ථ මට්ටමකින් භාවිතා නොකරන බව අනාවරණය විය. ඒ අනුව කරන ලද ආයෝජනයෙන් පහත සඳහන් ප්‍රතිලාභ සංස්ථාව අත්කර ගෙන නොතිබුණි.

- වරාය ගාස්තු ඉහිරි කර ගැනීම
- නැව් තබා ගැනීමේ කාලය අවම කර ගැනීම
- නැව් ප්‍රමාද ගාස්තු අඩු කර ගැනීම
- බෙදා හැරීමේ පිරිවැය අවම කර ගැනීම
- මානව සම්පත් පිරිවැය අවම කර ගැනීම
- නල මාර්ග මඟින් ඉන්ධන මුදා හැරීමේ බෙදා හැරීම් පාඩුව ඉහිරි කර ගැනීම
- බවුසර් මඟින් ඉන්ධන ප්‍රවාහනයේ අවභිරතා අඩු කර ගැනීම

4.3 ධීවර ඉන්ධන සහනාධාර වැඩසටහන

ඉන්ධන මිල සංශෝධනය කිරීම තුළින් ධීවර කර්මාන්තයට වූ අහිතකර බලපෑම අවම කිරීමේ අරමුණින් රජය විසින් 2012 මාර්තු සිට ධීවර යාත්‍රා හිමියන්ට ඉන්ධන සහනාධාර ලබාදීමේ වැඩසටහනක්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහයෝගීතාවයෙන් ක්‍රියාත්මක කර තිබුණි. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ඉන්ධන සහනාධාර කූපන්පත් ධීවර යාත්‍රා හිමියන් අතර බෙදාහැර තිබූ අතර,එය 2013 සැප්තැම්බර් සිට නවත්වා තිබුණි. ධීවර කූපන් සඳහා ඉන්ධන නිකුත් කිරීමට සංස්ථාව විසින් බෙදාහරින්නන් තෝරාගෙන තිබූ අතර ඒ අනුව, යාත්‍රා හිමියන් විසින් එම කූපන්පත් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ තෝරාගත් ප්‍රාදේශීය බෙදුම්කරුවන් වෙත ඉදිරිපත් කර ඉන්ධන ලබාගෙන තිබුණි. බෙදුම්කරුවන් විසින් සංස්ථාව වෙත එම කූපන්පත් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සංස්ථාව විසින් අදාල වටිනාකම බෙදුම්කරුවන්ට පියවීම සිදුකර තිබුණි. ඒ අනුව, සංස්ථාව විසින් දරන ලද වටිනාකම ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මඟින් මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණි. පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ලැබී ඇති තොරතුරු වලට අනුව ධීවර කූපන් වැඩසටහන යටතේ 2016 දෙසැම්බර් 31 දිනට සංස්ථාව විසින් බෙදුම්කරුවන් වෙත ගෙවා තිබූ වටිනාකම රු. 4,367,320,839 ක් (2015 දෙසැම්බර් 31 දිනට රු.4,371,312,889) විය.කෙසේ වුවත් වාරික තුනක් යටතේ සංස්ථාව විසින් මහා භාණ්ඩාගාරයෙන් රු. 4,549,775,000 ක් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණි.

(ආ) සංස්ථාව විසින් රු. 182,454,161 ක් වැඩිපුර ප්‍රතිපූර්ණය කරගෙන තිබූ නමුත් එය මහා භාණ්ඩාගාරය වෙත පියවා නොතිබුණි.

(ඇ) සංස්ථාවේ ධීවර සහනාධාර ක්‍රියාවලිය සම්බන්ධයෙන් පහත දුර්වලතා නිරීක්ෂණය විය

(i) ධීවර කුපන්පත් සඳහා ලබා ගත යුතු ඉන්ධන ප්‍රමාණය ධීවර යාත්‍රා හිමියන් විසින් ලබා ගෙන නොතිබූ අතර ඒ වෙනුවට ඔවුන් විසින් සහනාධාර කුපන්පතේ මුහුණත වටිනාකමට(සහනාධාරයට) සමාන ඉන්ධන ප්‍රමාණයක් පමණක් ලබාගෙන තිබුණි.

(ii) ධීවර යාත්‍රා හිමියන් විසින් තෙල් ලබාගැනීම වෙනුවට ඉන්ධන කුපන්පත් වට්ටම් කර බෙදුම්කරුවන් වෙතින් මුදල් ලබාගෙන තිබුණු අතර බෙදුම්කරුවන් විසින් එම කුපන්පත් සංස්ථාව වෙත ඉදිරිපත් කර කුපන්පත්වල සම්පූර්ණ වටිනාකම ප්‍රතිපූර්ණය කර තිබුණි.

(iii) ප්‍රතිපූරණය කළයුතු මුදලට වඩා වැඩිපුර බෙදුම්කරුවන්ගේ ගිණුම් වලට මුදල් බැර කර තිබූ අවස්ථා තිබුණි. නියැදි පරීක්ෂාවට අනුව 2015 දෙසැම්බර් 31 දිනට ප්‍රතිපූරණය කළයුතු මුදලට වඩා වැඩිපුර රු. 9,759,350 ක් බෙදුම්කරුවන්ගේ ගිණුම් වලට බැරකර තිබුණි. කෙසේ වෙතත්, මේවායින් කොටසක් පසුව අයකරගෙන තිබුණි.

(iv) සමහර අවස්ථාවල ධීවර කුපන්පත් ලබාගැනීමකින් තොරව බෙදුම්කරුවන්ගේ ගිණුම් වලට මුදල් බැරකර තිබුණු අතර පසුව ඒ සඳහා හිලව් කිරීමට කුපන්පත් ඉදිරිපත් කර තිබුණි. එවැනි අවස්ථාවක් නම්, සංස්ථාව විසින් රු. 24,310,000 ක වටිනාකමක් බෙදුම්කරුවන්ගේ ගිණුම්වලට බැරකර මාස 01 සිට මාස 12 දක්වා කාලයක් තුල ජර්නල් සටහන් මගින් නිවැරදි කර හෝ පසුව ලැබෙන කුපන්පත් වලින් හිලව් කරගෙන තිබුණි.

(ඈ) ධීවර කුපන්පත් වලට තෙල් බෙදාහැරීම සඳහා නුසුදුසු බෙදුම්කරුවන් තෝරාගෙන තිබූ අවස්ථා නිරීක්ෂණය විය. උදාහරණ ලෙස, මාතර වෙරළ සිට කිලෝ මීටර් 24 ක් දුරින් හක්මන ප්‍රදේශයේ පිහිටා ඇති ඉන්ධන පිරවුම්හලක් ධීවර කුපන් සඳහා තෙල් බෙදාහැරීමට තෝරාගෙන තිබුණි.

(ඉ) ධීවර යාත්‍රා හිමියන්ට සත්‍ය වශයෙන් නිකුත් කළ සහනාධාර කූපන්පත් වටිනාකම හා බෙදුම්කරුවන් විසින් සංස්ථාව වෙත මුදල් ලබාගැනීම සඳහා ඉදිරිපත් කළ කූපන්පත් වටිනාකම අතර වෙනස රු. 85,878,751 ක් විය.

(ඊ) බෙදුම්කරුවෙකු වෙත පියවන ලද ඉන්ධන බිල්පත් වටිනාකම් පිළිබඳව සිදුකළ පරීක්ෂණයකදී පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ධීවර කූපන් ක්‍රමවේදය අනුව, බෙදුම්කරුවන්ට වෙනත් දිස්ත්‍රික්කයක ධීවර යාත්‍රා හිමියන්ට තෙල් නිකුත් කිරීමට නොහැකි විය. එසේ වුවත් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පිහිටුවා තිබූ ඉහත බෙදුම්කරුගේ පිරවුම්හල, ඔහු විසින් මුලතිව් හා යාපනය දිස්ත්‍රික්කවල ධීවර යාත්‍රා හිමියන්ගේ ධීවර කූපන්පත් වට්ටම් මුදලකට ලබාගෙන (තෙල් නිකුත් නොකර), මුදල් ලබාගැනීම සඳහා සංස්ථාව වෙත ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව රු. 17,508,875 ක වටිනාකමකින් යුතු ධීවර කූපන්පත් මුදල් ලබාගැනීම සඳහා සංස්ථාව වෙත ඉදිරිපත් කර තිබූ නමුත් සංස්ථාව විසින් එම මුදල් පියවා නොතිබුණි. තවද 2016 ජූනි 30 දිනට රු. 6,281,250 ක් වටිනාකමැති කූපන්පත් සංස්ථාව භාර නොගැනීම නිසා බෙදුම්කරු භාරයේ රඳවාගෙන තිබුණි.

(ii) මේ සම්බන්ධව සිදු කළ අභ්‍යන්තර විගණන විමර්ශනයට අනුව, මෙම බෙදුම්කරු ඉදිරිපත් කළ රු.2,658,015ක් වටිනාකමැති ව්‍යාජ කූපන්පත් වෙනුවෙන් සංස්ථාව මුදල් ගෙවා තිබුණි. කෙසේ නමුත් සංස්ථාව විසින් මෙයට වගකිවයුතු නිළධාරීන් සම්බන්ධව කිසිදු විමර්ෂණයක් ආරම්භ කර නොතිබුණි.

4.4 ඉදිරි සුරැකුම් ගණුදෙනු

ක්‍රියාත්මක කරන ලද විගණන පරීක්ෂාවන්ට අනුව, 2007 සිට 2009 දක්වා වූ කාල සීමාව තුල සිදු කරන ලද තෙල් මිලදී ගැනීම් වලට අදාලව සිදු කළ ඉදිරි සුරැකුම් ගණුදෙනු හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට රටට දැරීමට සිදු වූ පාඩුව රු.මිලියන 14,028කි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් අනාවරණය විය.

(අ) ඉහත සඳහන් කළ පරිදි සංස්ථාව විසින් ඉදිරි සුරැකුම් ගිවිසුම් සඳහා බෙරුම් කරන ක්‍රියාවලියට අදාලව වාණිජ බැංකු කිහිපයක් සමඟ ගිවිසුම් වලට එළැඹ ඇති අතර, 2013 ජූනි 03 දින ස්ටැන්ඩඩ් චාර්ඩඩ් බැංකුව වෙත ඇ.ඩො.මිලියන 60ක් (රු.මිලියන 7,713ක්) හා 2016 අගෝස්තු 04 දින Deutsch AG බැංකුව වෙත ඇමරිකන් ඩොලර් මිලියන 27ක් (රු.මිලියන 3,881) ගෙවමින් පාර්ශවයන් දෙක අතර ඔප්පු නිරාකරණය කිරීමට එළඹ විගණනයට සැපයූ තොරතුරු අනුව, 2016 දෙසැම්බර් 31 දිනට සංස්ථාවට දැරීමට සිදු වූ අලාභය රු.මිලියන 13,641 ක් විය.

(ආ) 2011 සිට 2014 වර්ෂය දක්වා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රු.මිලියන 941.2 ක මුදලක් ඉදිරි සුරැකුම් ගණුදෙනු වලට අදාල නීති වියදම් ලෙස දරා ඇති අතර, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දැරූ රු.මිලියන 567.5ක මුදලෙන් රු.මිලියන 370.6 ක් සංස්ථාවෙන් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණි. කෙසේ වෙතත් රු.මිලියන 3.1 මුදලක් 2016 දෙසැම්බර් 31 වන විටද ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

(ඇ) තවද, කොමර්ෂල් බැංකුව විසින් කොළඹ වාණිජ මහාධිකරණයේ ඇමරිකන් ඩොලර් 8,648,300 අය කර ගැනීමට නඩුවක් ගොනු කර තිබුණි.

(ඈ) 2008 වර්ෂයේ සිට අනිවාර්ය නිවාඩු යැවූ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මූල්‍ය) සම්බන්ධව විධිමත් විමර්ෂණයක් ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව ඔහුගේ සේවය 2016 අගෝස්තු 04 අවසන් කරන ලදි. කෙසේ වෙතත් සංස්ථාව විසින් මෙම ගණුදෙනු සඳහා වගකිවයුතු පුද්ගලයන්ට එරෙහිව වෙනත් විමර්ෂණයක් අරම්භ කර නොතිබුණි.

4.5 දඩ මුදල් ගෙවීම

පෙර වර්ෂයේ විගණන වාර්තාවේ වාර්තා වූ පරිදි සංස්ථාව විසින් 2014 ජූනි 20 දින නැව් තෙල් මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම උදෙසා මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමේ පදනම යටතේ 2002 වසරේ සිට ගෙවිය යුතු ශේෂයක්ව පැවති රු 57,736,913 ක් රේගු දෙපාර්තමේන්තුවට ගෙවා තිබුණි. කෙසේ වෙතත් රේගු දෙපාර්තමේන්තුව විසින් මෙම ගෙවීම දඩ මුදලක් ලෙස හඳුනාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) මෙම විගණන වාර්තාවේ දිනය වන විටත් සංස්ථාව විසින් ගෙවූ වටිනාකම මහා භාණ්ඩාගාරයෙන් හෝ තෙල් සපයන ව්‍යාපාර ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

(ආ) ලැබී ඇති තොරතුරු වලට අනුව මෙම ගෙවීමෙන් සියයට 50 ක් හෝ රු 28,868,456 ක් රේගු නිළධාරීන් අතර බෙදා දී තිබූ අතර තවත් සියයට 20 ක් හෝ රු 11,547,383 ක් රේගු නිළධාරීන්ගේ සුභසාධක අරමුදලට බැර කර තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) රාජ්‍ය ආයතන අතර මෙවැනි ආකාරයේ ගනුදෙනු හිලවු කර ගැනීමට අවස්ථාව පැවතියත් රේගු ආඥා පනතේ 154 හා 165 වගන්ති වලට අනුව සංස්ථාව විසින් මේ වෙනුවෙන් කිසිදු අභියාචනයක් ඉදිරිපත් කර නොතිබුණි.

4.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

4.5.1 පිරිපහදුවේ ක්‍රියාකාරිත්වය

1969 වර්ෂයේදී ස්ථාපිත, වර්ෂ 47 ක් පැරණි වූ මෙම පිරිපහදුවෙන් රටේ වැඩිවන ඛණිජතෙල් නිෂ්පාදිත අවශ්‍යතාවය සැපයීමට නොහැකි වී ඇති අතර, ඉතා අඩු පිරිවැයකට ඉන්ධන නිපදවීම සඳහා පහසුකම් ඇති සහ එමගින් පිරිපහදු මෙහෙයුම් කාර්යක්ෂමව උපරිම කිරීමට හැකිවන වෙනත් නවීන ලෝකයේ උසස් තාක්ෂණයන් සහිතව පහළ නිෂ්පාදන තුලින් පෙට්‍රල්, ඩීසල් වැනි ඉහළ වටිනාකම් ඇති නිෂ්පාදන ලබා ගැනීමට හැකි වන පරිදි මෙහෙයුම් කෙරෙන පිරිපහදු සමඟ සැසඳීමේ දී මෙම පිරිපහදුව ඉතා අඩු කාර්යක්ෂමතාවයකින් මෙහෙයුම් සිදු කෙරේ. කෙසේ වුවද, පිරිවැය ඵලදායිතා ආකාරයෙන් ඛණිජ තෙල් නිෂ්පාදිත වෙළඳපොළට සැපයීම තහවුරු කර ගැනීම සඳහා යෝජිත සපුගස්කන්ද තෙල් පිරිපහදුව පුළුල් කිරීම හා නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය (SOREM) ක්‍රියාත්මක කිරීමට සංස්ථාවට මෙතෙක් නොහැකි වී ඇත. මෙම අරමුණ සඳහා මූලික ශක්‍යතා අධ්‍යයනය අවසන් වී ඇති අතර අවශ්‍ය ඉඩම් ප්‍රමාණය (අක්කර 35) අත්පත් කර ගෙන ඇති නමුත් මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය ශක්තියක් නොමැති වීම හේතුවෙන් සංස්ථාවට මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නොහැකි වී ඇත. පිළි ගෙවුම් කාලය වසර අටකට සහ පිරිවැය එක්සත් ජනපද ඩොලර් බිලියන 2.1 කට ඇස්තමේන්තු කර ඇති මෙම ව්‍යාපෘතියේ ශුද්ධ වර්තමාන අගය එක්සත් ජනපද ඩොලර්.1,535 ක් විය හැක. තවද, සංස්ථාව මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් වියදම් වශයෙන් දරන ලද, 2016 දෙසැම්බර් 31 දිනට දේපළ පිරියත හා උපකරණ යටතේ වත්කම් හා ප්‍රාග්ධන ව්‍යාපෘතිවල නොනිමි වැඩ වශයෙන් දක්වා තිබූ රු. මිලියන 837ක මුදල අනාර්ථික ගනුදෙනුවක් බව නිරීක්ෂණය විය.

4.5.2 පිරවුම්හල් අධීක්ෂණය කිරීම

ප්‍රමාණ ශෝධනය (Calibration) කිරීමේ නිරවද්‍යතාව පරීක්ෂා කිරීමෙන් අනතුරුව මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව (MUSSD) සහ බනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් බෙදා හැරීමේ පොම්ප මුද්‍රා තැබීමට පියවර ගත යුතු වුවත් මෙම කාර්යය නිසි පරිදි සිදු කර නොමැති බව හෙළි වී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, විගණනයේදී, බොහෝ අවස්ථාවලදී බෙදාහැරීමේ පොම්ප හරහා නියමිත අවම ප්‍රමාණය වන 0.25 ට වඩා අඩුවෙන් ඉන්ධන නිකුත් කර තිබූ බව නිරීක්ෂණය විය.

ප්‍රාදේශීය සුපරීක්ෂකවරුන් විසින් පිරවුම්හල් අධීක්ෂණය ප්‍රමාණවත් ලෙස සිදු කර නොතිබුණි. එනම්, දිගු කාල සීමාවක් තිස්සේ ප්‍රාදේශීය අධීක්ෂකයකු පිරවුම්හල් වෙත නොපැමිණීම, කැඩුණු වායු පොම්පය දිගු කාල සීමාවක් තිස්සේ සකස් කිරීම සඳහා ක්‍රියා කර නොතිබීම, දෛනික විකුණුම් වාර්තා නිසියාකාරව අධීක්ෂණය කර නොමැති වීම සහ සිල්ලර ශාඛා පරීක්ෂක වාර්තාව (Retail Outlet Inspection Report) නිසියාකාරව සකස්කර නොතිබීම ආදිය වේ.

4.6. වත්කම් කළමනාකරණය

පහත සඳහන් වත්කම් අත්පත්කර ගත් දින සිටම නිශ්කාර්යව පැවතුණි.

(අ) **වනාතමුල්ලේ පිහිටි හල්ගහකුඹුර ඉඩම** - එල්පී ගෑස් ව්‍යාපෘතිය සහ ක්‍රීඩා භූමියක් සඳහා රු.මිලියන 10.6කට මෙම ඉඩම අත්කර ගෙන තිබුණි. එසේ වුවත්, මෙම ඉඩම නීති විරෝධී පදිංචිකරුවන් (දුර්වාසීන්) 700 කට වඩා අත්පත් කර ගෙන තිබුණි.

(ආ) **මාඝේන ඉඩම** - ලබා ගත හැකි වූ ලියවිලි අනුව, සංස්ථාව විසින් මෙම ඉඩම අත්පත් කර ගැනීමට රු. මිලියන 0.625ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද, මෙම ඉඩම සංස්ථාවේ පොත්වල ගිණුම්ගත කර නොතිබූ අතර 1986 වර්ෂයේ සිට එය පෙර අයිතිකරු විසින් භාවිතා කරමින් පැවතුණි.

(ඇ) ආයෝජන - 2016 දෙසැම්බර් 31 දිනට කොටස් වෙළඳපලේ ලියාපදිංචි කළ හා ලියාපදිංචි නොකළ සමාගම් හතරක සිදුකර තිබුණු ආයෝජනයෙහි ධාරණ අගය රු. මිලියන 35.125ක් විය. කෙසේ වෙතත් දිගු කාලයක සිට මේවායින් කිසිදු ලාභාංශයක් සංස්ථාවට ලැබී නොතිබුණි. තවද, රු. මිලියන 5ක් ආයෝජන කර ඇති ජාත්‍යන්තර බනිජ තෙල් සමූපකාර සංගමයේ පැවැත්ම පිළිබඳව සාක්ෂි ලබාගත නොහැකි විය.

4.7 අනෙකුත් ආයතන සඳහා මුදා හරින ලද සම්පත්

යහපාලනය උදෙසා වූ රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ සංග්‍රහයේ 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සහ 2004 ජනවාරි 08 දිනැති අංක 21 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සහ අතිගරු ජනාධිපති නිකුත් කළ 2006 ජනවාරි 04 දිනැති අංක CSA/PI/40 හා 2010 මැයි අංක CS/1/17/1 දිනැති ලිපිය මගින් දක්වා ඇති උපදෙස්වලට පටහැනිව සංස්ථාව විසින් පහත සම්පත් වෙනත් ආයතන වෙත නිදහස් කර තිබූ අතර සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් පාරිතෝෂික සහ අනෙකුත් දීමනා නිදහස් කළ කාර්ය මණ්ඩලයට සහ වාහන සඳහා ඉන්ධන හා නඩත්තු වියදම් දරා තිබුණි. විස්තර පහත පරිදි වේ.

	සංස්ථාව විසින් දරන ලද වියදම			නිදහස් කළ සම්පත් ප්‍රමාණය		
	2016	**2015**	**2014**	**2016**	**2015**	**2014**
	රු.	රු.	රු.			
මානව සම්පත්	8,531,754	3,452,737	46,261,907	9	11	56
වාහන	20,613	641,375	3,695,910	2	3	7
එකතුව	**8,552,367**	**4,094,112**	**49,957,817**	**11**	**14**	**63**

4.8 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පුරප්පාඩු පිරවීම

සංස්ථාවේ අනුමත සේවක සංඛ්‍යාව 3284 ක් වුවත් 2016 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු 722ක් හෝ සියයට 22 ක් පැවතුණි. එම පුරප්පාඩු අතරින් තනතුරු 135 ක් හෝ සියයට 30ක් විධායක මට්ටමේ තනතුරු වූ අතර එයට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි(තාක්ෂණික සේවා සහ ආයතනික කටයුතු) නියෝජ්‍ය පිරිපහදු කළමණාකරු (නඩත්තු හා ව්‍යාපෘති), ප්‍රධාන අභ්‍යන්තර විගණක ආදී තනතුරු ඇතුලත් වේ. ඒ අනුව සංස්ථාවේ ඉහල කලමණාකාරිත්වයේ ප්‍රධාන තනතුරු මාස 7 සිට මාස 46 දක්වා පරාසයක පුරප්පාඩුව

පවතී. ඊට අමතරව කළමණාකරු (ලේකම් /අධ්‍යක්ෂක මණ්ඩල ලේකම්) 2012 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතී. එබැවින් දීර්ඝ කාලයක සිට ඉහල කළමනාකරණයේ ප්‍රධාන තනතුරු පියවීම සඳහා හිතකර පියවර නොගැනීම විගණනයට ගැටළු සහගත විය.

(ආ) 2016 වර්ෂය තුල බදවා ගැනීම්

2017 අප්‍රේල් 04 දිනැති අංක එම්පිආර්ඩී/අයිඒ/2/6(1) දරන ලිපිය මගින් පොදු ව්‍යාපාර පිලිබඳ කාරක සභාව (කෝප්) වෙත විගණකාධිපතිට පිටපතක් සහිතව ලබා දී ඇති තොරතුරු අනුව 2016 වර්ෂයේදී සම්පූර්ණ බදවා ගැනීම් 98ක් ලෙස දක්වා තිබුණද සත්‍ය බදවා ගැනීම් 94ක් පමණක් විය.ඒ අනුව COPE වෙත ඉදිරිපත් කර තිබූ වාර්තාව. එමනිසා, කෝප් කමිටුවට ඉදිරිපත් කළ වාර්තාවේ සඳහන් වන මෙම තනතුරු තුනට අදාල බදවා ගැනීම් 17 සඳහන් නොවූ අතර බදවා ගැනීම් 21ක් වැඩියෙන් දක්වා තිබුණි. එබැවින් කෝප් කමිටුවට ඉදිරිපත් කළ තොරතුරු වල නිවැරදිතාවය පිළිබඳව විගණනයට සැකසහිත විය.

(ඇ) බදවා ගැනීම් සඳහා ප්‍රචාරණය

බදවා ගැනීමේ හා උසස් කිරීම් සඳහා වන නිර්ණායක හා ලකුණුදීමේ පරිපාටි සංශෝධන 3 අනුව (අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015 මැයි 26 දින අනුමත කළ 1/1163 අනුව) සියලු අභ්‍යන්තර හා බාහිර දැන්වීමේ A-1 හෝ ඊට වැඩි ශ්‍රේණි සඳහා මානව සම්පත් කළමනාකරුගේ කාර්යයන් යටතේ සහ සභාපති හෝ කළමනාකරණ අධ්‍යක්ෂකගේ අත්සනින් යුතුව නිකුත් කළ යුතු අතර A-2 සහ ඊට ශ්‍රේණි සඳහා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මානව සම්පත් සහ පරිපාලන) හෝ මානව සම්පත් කළමනාකරුගේ අත්සන යටතේ දැන්වීම් නිකුත් කළ යුතුය.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(I) සංස්ථාවේ වෙබ් අඩවියේ ඉහත පටිපාටියට පටහැනිව පුරප්පාඩු කිහිපයක් ප්‍රචාරණය කර තිබුණි. තව දුරටත් සංස්ථාවේ සභාපති විසින් තොරතුරු තාක්ෂණික කළමණාකරු වෙත කිසිදු යොමු කිරීමක් නොකර කෙලින් ම දත්ත විශ්ලේෂක (තොරතුරු තාක්ෂණ අංශය) වෙත දෙන ලද වාචික උපදෙස් මත බොහෝ දැන්වීම් වෙබ් අඩවියෙහි ප්‍රචාරණය කිරීම හා ඉවත් කිරීම සිදුකර තිබුණි.

(II) පුරප්පාඩු වෙබ් අඩවියේ ප්‍රචාරණය කර තිබුණත් එම දැන්වීම බැලීමට සහ ඉල්ලුම් කිරීමට ප්‍රමාණවත් කාලයක් ප්‍රදර්ශනය කර නොතිබුණි. සමහර දැන්වීම් වෙබ් අඩවියේ පැය 3 හෝ 5 කට වඩා අඩු කාලයක් ප්‍රදර්ශනය කර තිබුණු බව අනාවරණය විය. එබැවින් ඉහත තනතුරු වලට සුදුසු පුරවැසියකුට අයදුම් කිරීමට සමාන අවස්ථාවන් වලක්වා තිබුණි.

(III) 2016 පෙබරවාරි 29 දින සිංහල පුවත්පත් දැන්වීම් අනුව සංස්ථාව ඉදිරි සියලු අනාගත පුරප්පාඩු දැන්වීම් අනුව සංස්ථාව ඉදිරි සියලු අනාගත පුරප්පාඩු දැන්වීම් සංස්ථාවේ වෙබ් අඩවියේ පමණක් පළ කරන බව දන්වා තිබුණි.කෙසේ වෙතත් බඳවා ගැනීම් සඳහා වූ දැන්වීම් අයදුම් කිරීමට තිබූ අවසන් දිනට පෙර වෙබ් අඩවියෙන් ඉවත් කර තිබුණි.උදාහරණයක් ලෙස සාමාන්‍ය කම්කරු සඳහා වූ දැන්වීම් 2016 ජූලි 04 දින ඉවත් කර තිබුණත් එහි අවසන් දිනය ලෙස සඳහන් වුයේ 2016 ජුලි 13 දිනය.

(ඇ) කළමනාකාරණ සහකාර බඳවා ගැනීම (ගිණුම් හා විගණන)

2017 ජනවාරි 01 දින සංස්ථාව විසින් කළමනාකරණ සහකාර (ගිණුම් හා විගණන) 19 දෙදෙනෙකු බඳවා ගෙන තිබුණි.පහත සඳහන් කරුණු මේ සම්බන්ධයෙන් අනාවරණය විය.

(i) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ (MSD) පූර්ව අනුමැතියකින් තොරව එම කළමනාකරණ සහයකයින් බඳවා ගෙන තිබුණි.

(ii) සංස්ථාවේ බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පටිපාටිය (SORAP) බී-3 ශ්‍රේණි සඳහා වන කොන්දේසි වලට පටහැනිව කිසිදු ලිඛිත විභාගයකින් තොරව මෙම බඳවා ගැනීම සිදු කර තිබුණි.

(iii) සංස්ථාවේ සභාපති විසින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මානව සම්පත් හා පරිපාලන) හරහා මානව සම්පත් කළමනාකරු වෙත 2016 ඔක්තෝබර් 02 දිනැති ලිපිය මඟින් මෙම බඳවා ගැනීම්, සම්මුඛ පරීක්ෂණයක් මත බඳවා ගන්නා ලෙස දන්වා තිබුණි. කෙසේ වෙතත් 2013 දෙසැම්බර් 11 දිනැති ගැසට් නිවේදන අංක 1840/34 අනුව හා සංස්ථාවේ බඳවා ගැනීමේ හා උසස්කිරීමේ ක්‍රියාපටිපාටිය අනුව කළමනාකරණ සහකාර තනතුර සඳහා වන බාහිර බඳවා ගැනීම් සඳහා ලිඛිත පරීක්ෂණයක් පැවැත්විය යුතුය.

(iv) සංස්ථාවේ බඳවා ගැනීමේ හා උසස්කිරීමේ ක්‍රියාපටිපාටිය ඉල්ලා ඇති පරිදි තෝරා ගනු ලබන නිලධාරීන්ගේ අදාල ක්ෂේත්‍රයන්හි වසර පහක පළපුරුද්ද තහවුරු කර ගැනීම සඳහා ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

(v) අයදුම්කරුවකු විසින් සේවා සහතික දෙකක් විවිධ ආයතනයන්හි එකම කාල පරිච්ඡේදයකට අදාල ව ලබා තිබුණු බව අනාවරණය විය.තවදුරටත් සංස්ථාව විසින් තෝරාගනු ලැබූ අයදුම්කරුවන් ඉදිරිපත් කළ සේවා සහතික වල නිවැරදිතාවය පිළිබඳව සනාථ කර ගෙන නොතිබුණි.

(vi) සංස්ථාවේ බඳවා ගැනීමේ හා උසස්කිරීමේ පටිපාටිය අනුව අධ්‍යාපන හා වෘත්තිය සුදුසුකම් සහතිකපත් අදාල ආයතන තුලින් බඳවාගත් දින සිට මාස 6ක් ඇතුලත තහවුරු කර ගත යුතුය. කෙසේවෙතත් 2017 ඔක්තෝබර් 30 දින විටත් එසේ තහවුරු කර ගැනීමක් සිදුකර නොතිබුණි.

(ඉ) සාමාන්‍ය කම්කරු බඳවා ගැනීම

ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව ඉහත තනතුරු සඳහා අයදුම්පත් 6853 ක් ඉල්ලුම් කර තිබූ අතර ඉන් 156 දෙනෙකු පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවා තිබුණි. කෙසේ වෙතත් අයදුම්පත් කෙටි ලැයිස්තුගත කිරීමේ පදනම විගණනයට ඉදිරිපත් නොකෙරිණි. තවදුරටත් ප්‍රචාරණය දැන්වීමේ ලිඛිත විභාගයක් පවත්වා බඳවා ගැනීම් සිදු කරන බව දක්වා තිබුනත් කිසිදු ලිඛිත විභාගයක් පවත්වා නොතිබුණි. සංස්ථාවේ කළමණාකරණ අධ්‍යක්ෂක විසින් මේ සම්බන්ධයෙන් පහත ප්‍රකාශය ඉදිරිපත් කරන ලදි.

" සංස්ථාවට 2016 ජූලි 13 දිනට අයදුම්පත් 6853 ක් ලැබී තිබුණි. පුරප්පාඩු 18ක් පිරවීම සඳහා විශාල අයදුම්පත් ප්‍රමාණයක් සලකා බැලීම ප්‍රායෝගික නොවන නිසාත්, වෙනත් ප්‍රායෝගික විසඳුමක් නොමැති නිසාත් හිටපු සභාපති/ කළමණාකරන අධ්‍යක්ෂකගේ උපදෙස් මත පළමු දින 04 තුල ලැබූ අයදුම්පත් වලින් අයදුම්පත් 156ක් සලකා බලන ලෙස උපදෙස් දෙන ලදි".

(ඊ) පුහුණුව

සංස්ථාව විසින් අනුමත විදේශ පුහුණු ප්‍රතිපත්තියක් හා මාර්ගෝපදේශයක් මෙම විගණන වාර්තාවේ දිනවන විටත් හඳුන්වා දී නොතිබුණි. එම නිසා සංස්ථාව විසින් අවිධිමත් පදනමක් මත දේශීය හා විදේශීය පුහුණුවීම් සඳහා නිලධාරීන් තෝරා ගන්නා බව අනාවරණය විය. ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ (MPRD) , 2017 මාර්තු 29 දිනැති අංක MPRD/ADM/15/02/40 (com) ලිපිය අනුව විදේශ පුහුණුවීම් සම්බන්ධයෙන් ඇති ගැටළු නිවැරදි කර ගන්නා ලෙස සංස්ථාවේ කළමනාකරණයට උපදෙස් ලබා දී තිබුණි.

4.9 මතබේදයට තුඩු දෙන ගනුදෙනු

4.9.1 මහා භාණ්ඩාගාරයට අරමුදල් මාරු කිරීම

මුදල් අමාත්‍යාංශය විසින් සිදු කළ ඉල්ලීමකට අනුව, වර්ෂයකට රු.මිලියන 10,000 බැගින් 2014 සහ 2016 වර්ෂ තුලදී මුළු එකතුව රු. මිලියන 20,000ක් සංස්ථාව විසින් මහා භාණ්ඩාගාරයට ගෙවා තිබුණි.

2014 වර්ෂයේ දී ගෙවූ ඉහත සඳහන් කළ රු.මිලියන 10,000 2014 වර්ෂය සඳහා රු.මිලියන 250ක්, 2015 වර්ෂය සඳහා රු මිලියන 750ක් සහ 2016 සිට 2024 කාලපරිච්ඡේදය සඳහා වර්ෂයකට රු.මිලියන 1,000 බැගින් වියදමක් ලෙස කපාහැරීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඔහුගේ 2014 දෙසැම්බර් 30 දිනැති ලිපිය මඟින් සංස්ථාවට උපදෙස් ලබා දී තිබුණි. කෙසේ නමුත් ඉහත සඳහන් කළ ගිණුම්කරණ පිළිවෙතහි මූල්‍යමය බලපෑම් සැලකිල්ලට නොගෙන, මහා භාණ්ඩාගාරය විසින් දුන් උපදෙස් වලට සංස්ථාව පූර්ණ ලෙස අනුකූල වී තිබුණි.

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2016 දෙසැම්බර් 16 දින ඔහුගේ ලිපි අංක PE/RE/SP/2016 මගින් මහා භාණ්ඩාගාරයට බැඳුම්කර නිකුත් කිරීමට බලය දීමට රු මිලියන 10,000ක් ඒකාබද්ධ අරමුදලට ඉතා ඉකිමණින් පැවරීමෙන් සංස්ථාවේ 2017 ශේෂ පත්‍රය ඒ සමාන අගයකින් ශක්තිමත් කිරීම සඳහා සංස්ථාව වෙත උපදෙස් ලබා දීම ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත දැනුවත් කර තිබුණි.

භාණ්ඩාගාරයේ යෝජනාව අනුව බනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය තත්ත්වය ශක්තිමත් කිරීමේ ආකාරය වූ එහි මුදල් ඉවත් කිරීම මඟින් ව්‍යාපාර පවත්වා ගැනීමේ තත්ත්වයක් තුළ මූල්‍ය තත්ත්වය ශක්තිමත් කරනු වෙනුවට රු.බිලියන 186ක් වූ සෘණාත්මක ශුද්ධ වත්කම් තත්ත්වය තව දුරටත් පිරිහී යනු ඇත.

ඉහත ගණුදෙනුව ගිණුම්ගත කිරීමේ ක්‍රමවේදය සම්බන්ධව සංස්ථාව හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව අතර සන්නිවේදනයන් කිහිපයකින් පසු, අවසානයේ 2017 ඔක්තෝබර් මාසයේ දී සංස්ථාවට උපදෙස් ලබා දී තිබුණේ එය 2016 වර්ෂයේ ලාභයෙන් රජයට ගෙවන ලද ලාභාංශ ලෙස සලකන මෙන් සහ එමෙන්ම 2016 වර්ෂයේ ලාභය මත කිසියම් බදු ප්‍රමාණයක් ඉතිරිව තිබේ නම් වසර 3ක් තුල සමාන මාසික වාරික වලින් ගෙවීමට උපදෙස් ලබා දී තිබුණි.

5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණනය ඕනෑම ආයතනයක කළමනාකරණයට වැදගත් සේවාවක් සපයයි.

වංචා විමර්ශනය හා අනාවරණය, අභ්‍යන්තර පාලනය පරීක්ෂා කිරීම සහ සංවිධාන ප්‍රතිපත්ති සහ රජයේ රෙගුලාසි සමඟ අනුකූලතාවය නියාමනය කිරීම අභ්‍යන්තර විගණනයේ සේවාවන් වේ.එහෙයින් අභ්‍යන්තර විගණන කටයුතු සංවිධානයක සංවර්ධනයෙහිලා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) අභ්‍යන්තර විගණන අංශයේ අනුමත සේවක සංඛ්‍යාව වූ තනතුරු 42 අතරින් තනතුරු 09 ක් හෝ සියයට 21 ක් 2016 දෙසැම්බර් 31 දිනම පුරප්පාඩුව පැවතුණි.ඒ අතරින් තනතුරු 07ක් හෝ සියයට 54ක් ජ්‍යෙෂ්ඨ නිලධාරි මට්ටමිවල විය.

(ආ) සංස්ථාවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලය වෙත සෘජුව වගකිව යුතු වුව ද සංස්ථාවේ සංවිධාන සැලැස්මට අනුව ප්‍රධාන අභ්‍යන්තර විගණක සංස්ථාවේ කළමණාකරණ අධ්‍යක්ෂ වෙත සෘජුව වගකියනු ලැබේ.

(ඇ) ඉහත සාධක නිසා සංස්ථාවේ අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රමානුකූලව 2011 වර්ෂයේ මැද භාගයේ සිට අකර්මණ්‍ය වී තිබුණු බව අනාවරණය විය.

5.2 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත සහ තථ්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සංස්ථාවේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

ප්‍රධාන ක්ෂේත්‍රය	නිරීක්ෂණ
(අ)මානව සම්පත් පාලනය	බඳවා ගැනීම් පරිපාටිය අනුමත කර ගැනීමට අපොහොසත් වීම.
(ආ) මූල්‍ය පාලනය	සංස්ථාවේ ප්‍රධාන අරමුණු සඳහා මුදල් යෙදවීම ක්‍රියාත්මක කිරීම ප්‍රමාණවත් පරිදි පවත්වාගෙන ගොස් නොතිබුණි. සංස්ථාවේ ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමට අරමුදල් භාවිතා කිරීම ප්‍රමාණවත් ආකාරයෙන් පවත්වාගෙන ගොස් නොතිබුණි.
(ඇ) වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ	නියමිත කාලයේදී හිඟ හිටි මුදල් එකතු කිරීම සහ ණය ගෙවීම් පැහැර හැරීමේ අවධානම අඩු කිරීම සම්බන්ධයෙන් වූ පාලනයන්ගේ දුර්වලතා පැවතීම.
(ඈ) ප්‍රසම්පාදනය	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන් සමඟ අනුකූල වීම.
(ඉ) සම්පත් උපයෝජනය	චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව සම්පත් ඵලදායීව යෙදවීම.

(ඊ) තොරතුරු පද්ධති පාලනය

ප්‍රවර්තන වර්ෂය තුළ පෙර වර්ෂයන් සඳහා SAP පද්ධතිය තුළ ජර්නල් සටහන් කිරීමට නිලධාරීන්ට අවස්ථා පවතින බැවින්, SAP පද්ධතිය තුළ අනෙකුත් මොඩියුල සංශෝධනය කිරීමේ හැකියාව විගණනයේදී බැහැර කළ නොහැකිය.

තවද, SAP පද්ධතිය තුල එකම ගනුදෙනුකරු නමින් ගිණුම් කිහිපයක් ඇතුලත් කර තිබුණි. එබැවින්, බනිජ තෙල් නීතිගත සංස්ථාවේ අභ්‍යන්තර පාලනයන් හා ණය සීමාවන් අවභාවිතය, ණය කාලසීමාව හා අදාළ ණයගැති පාලනයන්ට අදාලව හානි පමුණුවීමට ඇති හැකියාව තිබීම.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
වැඩ බලන විගණකාධිපති

දස වසරක සාරාංශය

	2007	2008	2009	2010	2011	2012	2013	2014 (යළි ප්‍රකාශිත)	2015 ((යළි ප්‍රකාශිත)	2016
තොග නිෂ්පාදනවල දේශීය අලෙවිය										
(අ) අගය රු .මි										
පෙට්‍රල්	46,580	66,434	60,055	65,158	90,499	117,600	132,398	140,885	127,879	145,476
ඔටෝ ඩීසල්	113,737	151,070	119,046	122,360	165,800	246,441	216,420	244,407	174,984	206,545
සුපර් ඩීසල්	468	885	866	1,170	1,588	3,540	4,152	5,104	5,998	8,006
භූමිතෙල්	12,459	14,000	9,755	10,711	12,804	18,100	16,803	15,366	9,831	8,605
දැව් තෙල්	43,941	66,220	33,157	35,792	49,991	84,790	60,651	70,021	34,841	52,971
එකතුව	217,185	298,609	222,879	235,191	320,682	470,471	430,424	475,783	353,533	421,603
(ආ) ප්‍රමාණය - මෙට්‍රික් ටොන් දහස්										
පෙට්‍රල්	382	384	416	484	563	619	640	687	838	965
ඔටෝ ඩීසල්	1,450	1,371	1,427	1,422	1,849	1,930	1,559	1,757	1,579	1,875
සුපර් ඩීසල්	5	7	9	11	14	22	25	31	47	63
භූමිතෙල්	169	151	151	165	147	143	126	122	130	138
දැව් තෙල්	985	995	1,096	1,004	1,093	1,187	668	722	512	626
එකතුව	2,991	2,908	3,099	3,086	3,666	3,901	3,018	3,319	3,106	3,667
(ආ) ඛනිජ තෙල් නිෂ්පාදනවල සිල්ලර අලෙවි මිල										
(දෙසැම්බර් 31 දිනට කොළඹ ලීටරයකට මිල)										
පෙට්‍රල් - ඔක්ටේන් 92	92.00	120.00	115.00	115.00	125.00	159.00	162.00	150.00	117.00	117.00
ඔටෝ ඩීසල්	60.00	70.00	73.00	73.00	76.00	115.00	121.00	111.00	95.00	95.00
සුපර් ඩීසල්	65.30	85.30	88.30	88.30	98.30	142.00	145.00	133.00	110.00	110.00
භූමිතෙල්	48.00	50.00	51.00	51.00	61.00	106.00	106.00	81.00	49.00	44.00
දැව් තෙල් 800"	44.40	33.90	34.90	40.00	52.20	92.20	92.20	92.20	80.00	80.00
දැව් තෙල් 1500"	43.30	31.70	32.70	40.00	50.00	65.00	90.00	90.00	80.00	80.00
දැව් තෙල් 3500"	41.00	25.00	26.00	40.00	50.00	65.00	90.00	90.00	80.00	-
මෙහෙයුම් ප්‍රතිඵල										
ආදායම	238,364	341,670	237,663	256,329	356,442	512,910	490,381	525,182	376,734	423,061
අලෙවි පිරිවැය	(222,763)	(334,849)	(232,271)	(269,316)	(420,227)	(540,439)	(464,374)	(499,956)	(337,119)	(326,441)
දළ ආන්තිකය	15,601	6,821	5,392	(12,987)	(63,785)	(27,529)	26,007	25,226	39,615	96,620
ශුද්ධ මෙහෙයුම් වියදම් සහ පොළිය	(11,617)	(21,557)	(16,745)	(13,936)	(30,572)	(62,041)	(33,897)	(24,532)	(55,637)	(27,067)
හෙජින් වියදම්	-	-	-	-	-	(7,612)	-	-	(3,864)	-
බදුවලට පෙර ලාභය/(පාඩුව)	3,984	(14,736)	(11,353)	(26,923)	(94,357)	(97,182)	(7,890)	694	(19,886)	69,553

රු මි	2007	2008	2009	2010	2011	2012	2013	2014 (යළි ප්‍රකාශිත)	2015 (යළි ප්‍රකාශිත)	2016
ස්කන්ධ සහ වගකීම්										
ප්‍රාග්ධනය	1,000	1,000	1,000	1,000	3,500	3,500	3,500	3,500	28,487	28,487
සංචිත	12,568	(2,416)	(14,038)	(38,369)	(134,736)	(232,045)	(239,967)	(236,791)	(257,472)	(214,334)
L/T වගකීම	13,728	10,908	32,779	28,478	27,646	1,998	1,351	703	342	266
පාරිතෝෂික	541	567	735	746	626	547	538	664	861	754
එකතුව	27,837	10,059	20,476	(8,145)	(102,964)	(226,000)	(234,578)	(231,924)	(227,782)	(184,827)
නියෝජනය කළේ										
WIP ඇතුළු ස්ථාවර තැන්පතු	4,374	4,624	5,041	8,280	8,850	9,599	13,136	13,676	13,915	13,547
ආයෝජන	2,547	2,542	2,542	2,542	5,042	5,058	5,044	14,942	41,725	40,595
ශුද්ධ ජංගම වත්කම්	20,916	2,893	12,893	(18,967)	(116,856)	(240,657)	(252,758)	(260,542)	(283,422)	(238,969)
එකතුව	27,837	10,059	20,476	(8,145)	(102,964)	(226,000)	(234,578)	(231,924)	(227,782)	(184,827)
සාරාංශගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය										
මෙහෙයුම් කටයුතුවලින් ලද/(භාවිතා කළ) ශුද්ධ මුදල් ප්‍රවාහය	37	(1,228)	41,840	(24,169)	(102,756)	(68,408)	(13,920)	(1,817)	9,247	54,532
ආයෝජන කටයුතුවලින් ලද/(භාවිතා කළ) ශුද්ධ මුදල් ප්‍රවාහය	1,166	41	(309)	(3,376)	(644)	1,148	(7,547)	(1,826)	(23,385)	(6,010)
මූල්‍ය කටයුතුවලින් ලද/(භාවිතා කළ) ශුද්ධ මුදල්	(3,326)	(1,001)	(21,340)	(4,379)	119,017	62,540	7,232	28,745	41,036	(81,200)
මුදල් හා මුදල් සමාන දෑ තුළ ශුද්ධ වැඩිවීම්/(අඩුවීම්)	(2,123)	(2,188)	20,191	(31,924)	15,617	(4,720)	(14,235)	25,102	26,897	(32,678)
වසර ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ	12,084	9,961	7,772	27,963	(3,961)	11,656	6,936	(7,299)	17,803	44,700
වසර අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ	9,961	7,772	27,963	(3,961)	11,656	6,936	(7,299)	17,803	44,700	12,022
ගිණුම්කරණ අනුපාතික										
ලාභදායිතා අනුපාතික										
දළ ලාභ අනුපාතිකය	6.5%	2.0%	2.3%	-5.1%	-17.9%	-5.4%	5.3%	4.8%	10.5%	22.8%
ශුද්ධ ලාභ අනුපාතිකය	1.2%	-4.4%	-4.9%	-10.5%	-26.5%	-18.9%	-1.6%	0.0%	-5.3%	16.4%
මෙහෙයුම් අනුපාතිකය										
ආදායමට පිරිවැය අනුපාතිකය	97.9%	102.6%	102.7%	109.4%	121.8%	108.9%	97.8%	97.7%	93.0%	80.9%
ඉන්වෙන්ට්‍රි අනුපාතිකය	6.65	9.34	8.13	8.04	10.70	10.89	7.30	7.77	6.44	8.53
පොළී ආවරණයි	2.28	(3.66)	(1.39)	(2.93)	(9.48)	(3.88)	0.57	1.05	(0.32)	7.10
ද්‍රවශීලතා අනුපාතික										
ජංගම වත්කම් අනුපාතිකය	1.22	0.98	1.06	0.82	0.58	0.43	0.39	0.34	0.31	0.34
ක්ෂණික අනුපාතිකය	0.64	0.69	0.86	0.57	0.45	0.28	0.24	0.19	0.21	0.24

මූල්‍ය යෙදුම්වල පදමාලාව

ගිණුම්කරණ ප්‍රතිපත්ති - මූල්‍ය ප්‍රකාශ සැකසීමේදී හා ඉදිරිපත් කිරීමේදී අස්ථිත්වයක් මගින් උපයෝගී කරගනු ලබන නිශ්චිත මූලධර්ම, පදනම්, සම්මුති, රීති සහ පරිචයන්.

උපචිත පදනම- මුදල් හෝ මුදල් සමාන දෑ ගෙවීම් රිසිටිපත් ලැබෙන තෙක් රැඳී නොසිට ගනුදෙනු සහ අනෙක් සිද්ධිවල ප්‍රතිඵල හඳුනාගැනීම

මුදල් සමාන දෑ- අගයේ නොගිණිය හැකි වෙනස්වීමේ අවදානමක් සහිත සහ මුදල්වලට ඉක්මණින් පරිවර්තනය කරගත හැකි ටි කාලීන ඉහළ ද්‍රවශීලතාවකින් යුත් ආයෝජන

අසම්භාව්‍ය වගකීම් - අනාගතයේ සිදු විය හැකි හෝ නොහැකි සිද්ධි මගින් තීරණය වන මූල්‍ය ප්‍රතිඵල සහිත මූල්‍ය තත්ව ප්‍රකාශවල ඇති තත්වයන් හෝ අවස්ථාවන්

ජංගම අනුපාතිකය - ලද හැකි ජංගම වත්කම් සමග ජංගම වගකීම් හිලව් කළ වාර ගණන මනිනු ලබයි.

ණයකරුවන්ට පිරිවැටුම- පාරිභෝගිකයන් වෙත ලබාදුන් ණය මන්යි. (දින මගින් දක්වා ඇතිනම් සාමාන්‍ය ණය පියවීමේ සාමාන්‍යය)

වාර්තාකරණ දිනයට පසු සිද්ධි - මූල්‍ය තත්ව ප්‍රකාශ දිනයට පසුව සහ මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීමට බලය ලැබුණු දිනට පසු සිදුවූ වැදගත් සිද්ධි

සාධාරණ අගය- අතේ දුරින් සිදුවන ගනුදෙනුවකදී දැනුම්වත්, කැමති පාර්ශ්ව සමග වත්කමක්

හුවමාරු කරගත හැකි හෝ වගකීමක් පියවිය හැකි මුදල් ප්‍රමාණය.

පොළී ආවරණය- පොළිය සහ බදුවලට පෙර ලාභය මගින් පොළී ගාස්තු ආවරණය කෙරෙන ප්‍රමාණය මනිනු ලබයි.

ප්‍රතිපාදන- අවිනිශ්චිත වේලාවක හෝ ප්‍රමාණයක් වගකීම

අදාළ පාර්ශව -මූල්‍ය සහ මෙහෙයුම් තීරණ/ප්‍රතිපත්ති ගැනීමේදී එක් පාර්ශවයකට තවත් පාර්ශවයක් පාලනය කිරීමට හෝ පැහැදිලිව බලපෑම් කළ හැකි වන්නාවූ පාර්ශව

ඛණ්ඩ- මෙහෙයුම්වල ස්වභාවය සහ සමානත්වය මත කාණ්ඩ කළ ගනුදෙනුකාර ව්‍යාපාර ඒකක

කාරක ප්‍රාග්ධනය - එදිනෙදා මෙහෙයුම් මූල්‍ය යනය කිරීමට අවශ්‍ය ප්‍රාග්ධනය (ජංගම වත්කම් අඩුකළ ජංගම වගකීම්)